Regarding the IMF agreement, about which you raised yesterday, the Hon. President informed me that even the Cabinet has not been briefed about those discussions. Though they say it has been agreed upon with the officials, it has to be approved by the Board of the IMF. Before that, the Hon. President has to have some discussions with the other creditor countries and then, their report also has to be added to that. Until such time, it will not be decided by anybody. Before that, there will be a Cabinet briefing. Even the Cabinet has not been informed yet. The Cabinet will be briefed very soon once he receives all the details. For a briefing, even the Speaker and the Opposition will be invited and any other interested parties can also participate. That is what he told me in the morning, to inform you that this has not been finalized or approved by the Board.

Some more things have to be added and some more things have to be revised. So, wait till the Cabinet briefing is done because the Cabinet has not yet been informed by anybody. Therefore, please bear with that.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

Hon. Speaker, my argument is this. There was an agreement.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Yes, true. That will be adhered to.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

Nothing has been signed. But, when they met, there was an agreement of the minds. I cannot explain it to you in any other way. There was an agreement on what should be done.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

What he told me was, it is not an agreement. It is an -

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

My point is, once the Cabinet approves -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

The Cabinet has not approved yet. That is what he said. Before that, it has to be briefed to the Cabinet. That is what he told me.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

If the Cabinet approves, it will be too late for Parliament to discuss. That is what I am saying.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

It has not been approved by the Cabinet. That is what he said.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Then, an assurance must be given that before Cabinet approval, it will be submitted to Parliament.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
That is what he gave you.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
All right. If you say so, it is okay.

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු ප්‍රසන්න රණතුංග මහතා (නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க - நகர அபிவிருத்தி மற்றும் வீடமைப்பு அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Prasanna Ranatunga - Minister of Urban Development and Housing and Chief Government Whip)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් රෙගුලාසි ඉදිරිපත් කරමි.

(i) 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1), 6 සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2022 අගෝස්තු 23 දිනැති අංක 2294/29 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද රෙගුලාසි;

(ii) 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1), 6 සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2022 අගෝස්තු 23 දිනැති අංක 2294/30 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද රෙගුලාසි මම ඉදිරිපත් කරමි.

මෙම රෙගුලාසි රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

2021 අංක 30 දරන විසර්ජන පනතේ 6(1) වගන්තිය යටතේ 2022.08.01 සිට 2022.08.31 දක්වා ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ වැය ශීර්ෂ අංක 240 යටතේ පරිපූරක සහාය සේවා සහ හදිසි අවශ්‍යතා වගකීම් ව්‍යාපෘතිය මඟින් සිදු කරන ලද පරිපූරක වෙන්කිරීම් පිළිබඳ සටහන.- [අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවට ගරු ප්‍රසන්න රණතුංග මහතා]

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

- 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය යටතේ හොරයිසන් කොලේජ් ඔෆ් බිස්නස් ඇන්ඩ් ටෙක්නොලොජි (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය විසින් ප්‍රදානය කරන ගිණුම්කරණය සහ මූල්‍ය පිළිබඳ කළමනාකරණ ගෞරව උපාධිය සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2022 මාර්තු 30 දිනැති අංක 2273/43 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය; සහ

- 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය යටතේ ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් ඉන්ෆොමේෂන් ටෙක්නොලොජි (ගැරන්ටි) ලිමිටඩ් ආයතනය විසින් ප්‍රදානය කරන සමාජ විද්‍යාව පිළිබඳ අධ්‍යාපනවේදී ගෞරව උපාධිය සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2022 මාර්තු 30 දිනැති අංක 2273/44 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය.- [අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවට ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා]

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා වාර්තා
## அமைச்சுசார் ஆலோசனைக் குழு அறிக்கைகள்
## MINISTERIAL CONSULTATIVE COMMITTEE REPORTS

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමා)**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா - துறைமுகங்கள், கப்பற்றுறை மற்றும் விமான சேவைகள் அமைச்சர்)
(The Hon. Nimal Siripala de Silva - Minister of Ports, Shipping and Aviation)
ගරු කථානායකතුමනි, වරාය, නාවික හා සිවිල් ගුවන් සේවා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කරන ලද පහත සඳහන් නියෝගය සහ වාර්තා සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

(i) 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනතේ 66 වන සහ 69 වන වගන්ති යටතේ වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝගය;

(ii) 2020 වර්ෂය සඳහා (සීමාසහිත) ජය කන්ටේනර් ටර්මිනල්ස් සමාගමේ වාර්ෂික වාර්තාව;

(iii) 2020 වර්ෂය සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරියේ වාර්ෂික වාර්තාව;

(iv) 2020 වර්ෂය සඳහා සිවිල් ගුවන් සේවා අධිකාරියේ වාර්ෂික වාර්තාව;

(v) 2017/2018 වර්ෂය සඳහා ශ්‍රී ලංකා නැව් සංස්ථාවේ වාර්ෂික වාර්තාව;

(vi) 2018/2019 වර්ෂය සඳහා ශ්‍රී ලංකා නැව් සංස්ථාවේ වාර්ෂික වාර්තාව; සහ

(vii) 2019 වර්ෂය සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරියේ වාර්ෂික වාර්තාව.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා (ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன - போக்குவரத்து மற்றும் நெடுஞ்சாலைகள் அமைச்சரும் வெகுசன ஊடக அமைச்சரும்)
(The Hon. (Dr.) Bandula Gunawardana - Minister of Transport and Highways and Minister of Mass Media)

ගරු කථානායකතුමනි, ජනමාධ්‍ය කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කරන ලද පහත සඳහන් පනත් කෙටුම්පත සහ වාර්තා සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

(i) 1982 අංක 06 දරන ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පත;

(ii) 2018 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ වාර්ෂික වාර්තාව;

(iii) 2018 වර්ෂය සඳහා ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සහ ගිණුම්;

(iv) 2019 වර්ෂය සඳහා ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සහ ගිණුම්;

(v) 2019 වර්ෂය සඳහා ශ්‍රී ලංකා පදනම් ආයතනයේ වාර්ෂික වාර්තාව හා ගිණුම්;

(vi) 2020 වර්ෂය සඳහා සීමාසහිත ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලයේ වාර්ෂික වාර්තාව; සහ

(vii) 2018 වර්ෂය සඳහා ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ වාර්ෂික වාර්තාව.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)

ගරු කථානායකතුමනි, පොඩි පැහැදිලි කිරීමක් කරන්න අවස්ථාව ලබා දෙන්න කියා මම ඔබතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න ඇසීමට පෙර මේ කාරණය කෙරෙහි මම ඔබතුමාගේත්, රජයේත් අවධානය යොමු කරවන්න කැමතියි. ඊයේ දිනයේ තිනියාවල පාලිත නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ ප්‍රමුඛ මහා සංඝ රත්නයත්, තවත් ආගමික නායකයන් ගණනාවකුත් අපි හමු වීමට විපක්ෂ නායක කාර්යාලයට පැමිණියා. අපේ රටේ පන්සල් ඇතුළු අනිකුත් ආගමික සිද්ධස්ථාන 48,000ක් තිබෙනවාය කියන කාරණයත් මතක් කරලා, අද වන විට දරා ගන්න බැරි ආකාරයට විදුලි බිල වැඩිවෙලා තිබීම ගැන උන්වහන්සේලා ඇතුළු අනිකුත් ආගමික නායකයක් දැඩි ලෙස කරුණු ඉදිරිපත් කළා.

ගරු කථානායකතුමනි, ඔබතුමාත් ජනතාව අතර ගැවසෙන පුද්ගලයෙක්. ඒ නිසා ඔබතුමාත් දන්නවා, සාමාන්‍ය ජනතාවටත් දරා ගන්න බැරි තරමට මේ වනකොට විදුලි බිල ඉහළ ගිහින් තිබෙන බව. ආර්ථිකයේත්, ජන සමාජයේත් යම් යම් ප්‍රතිව්‍යුහගත කිරීම් කරන්න සිදු වන බව අපි පිළිගන්නවා, ගරු කථානායකතුමනි. හැබැයි, මේ වනතුරු ඒ සම්බන්ධයෙන් කටයුතු කළ ආකාරය සම්පූර්ණයෙන්ම වැරැදියි. ඔබතුමාට මම කියන්න කැමතියි, ද්විපාර්ශ්වික ආධාරක රටවල් සහ ආධාරක ආයතනවලින් - from your bilateral donors - bridging finance ගන්න අවස්ථාව තිබෙන බව.

ඒ වාගේම, බහුපාර්ශ්වීය ආධාරකරුවන් - multilateral donors - ඉන්නවා. ගරු කථානායකතුමනි, විදුලි බිලේ යම්කිසි සංශෝධනයක් කරන්න පෙර මේ bridging finance අරගෙන, ජන සමාජයේ අසරණභාවයට පත් වෙච්ච, සහන ලබා දිය යුතු කොට්ඨාසවලට සෘජු සහනාධාරයක් - direct subsidy එකක් - ලබා දීම වාගේම, ආගමික සිද්ධස්ථාන 48,000වත් යම්කිසි සෘජු සහනාධාරයක් ලබා දෙන්න ඕනෑ. ඒ කටයුත්ත කළාට පස්සේ තමයි මේ යම් යම් සංශෝධන සිදු කරන්න ඕනෑ. දැන් රජය කරලා තිබෙන්නේ එහි අනෙක් පැත්ත; කනපිට. එනම්, bridging finance හරහා සහනාධාරය ලබා දෙන්න පෙර විදුලි බිල සංශෝධනය කරලා තිබෙනවා; තම තමන්ට ඕනෑ විධියට IMF එකත් එක්ක Staff-level Agreement එකකට ඇවිල්ලා තිබෙනවා. ඒවා හෙළිදරව් කරන්නත් මැළිකමක් දක්වනවා. මේ කළ දේ ඉතාම වැරදියි.

ඊළඟ කාරණාව මෙයයි, ගරු කථානායකතුමනි. විහාරස්ථාන ඇතුළු සියලු ආගමික සිද්ධස්ථානවලටත්, මේ රටේ ජනතාවටත් පුනර්ජනනීය බලශක්තිය ලබා දෙන solar panel සවි කිරීම වැනි ක්‍රමවේද ක්‍රියාත්මක කිරීමේදී ඒවාට ජාත්‍යන්තර ආධාර ලබා ගන්න පුළුවන්. ඒක සත්‍ය වශයෙන්ම කරන්න පුළුවන් දෙයක්. මේ බංකොලොත් රටටත්, බංකොලොත් ආණ්ඩුවටත් ඒක කරන්න පුළුවන්. හැබැයි, ඒක කරන්න නම්, අධිෂ්ඨානය තිබෙන්න ඕනෑ, සැලසුම් තිබෙන්න ඕනෑ, සම්බන්ධතා තිබෙන්න ඕනෑ, ඔය කථා කරන දේවල් ක්‍රියාවට නංවන්න හැකියාව තිබෙන්න ඕනෑ. ගෞරවනීය මහා සංඝ රත්නය විවේචනයට ලක් කරන්නේ නැතුව කටයුතු කරන්න කියා මම බොහොම ගෞරවයෙන් ඉල්ලීමක් කරනවා. අපි හැමෝම දැනගන්න ඕනෑ චීවරයට ගරු කරන්න.

ගරු කථානායකතුමනි, "V8 හාමුදුරුවරු" කියලා මොකක් දෝ කථාවක් කියා තිබුණා. අපි ඒ ප්‍රකාශය තරයේ හෙළා දකිනවා. එසේ ප්‍රකාශ කිරීම බොහොම වැරදියි. මහා සංඝ රත්නයට අපි ගරු කරන්න ඕනෑ. ත්‍රෛනිකායික මහා නායක හිමිපාණන් වහන්සේලාත් ජනාධිපතිතුමා ප්‍රමුඛ ආණ්ඩුවෙන් ලිඛිතව ඉල්ලීමක් කර තිබෙනවා. මේ ආණ්ඩුව මේ කාර්යය කනපිට පෙරළා තිබෙන්නේ. මෙහිදී ඉස්සෙල්ලාම කළ යුත්තේ bridging finance හරහා සහනාධාරය ලබා දෙන්න කටයුතු කිරීමයි. මේ ප්‍රතිව්‍යුහගත කිරීම - restructuring - තුළින් හානියට පත් වන ජන කොට්ඨාස ටික හඳුනාගෙන, ඒ අයට මේ තුළින් යම් කිසි තිගැස්මක් - shock එකක් - ඇති වනවා නම්, ඒකෙන් ඒ ගොල්ලන්ව cushion කරලා, ඒ ගොල්ලන්ට රැකවරණය සලසලා ඊට පස්සේ තමයි මේ වෙනස කරන්න ඕනෑ. නමුත්, ආණ්ඩුව ඉස්සෙල්ලාම කළේ, ප්‍රතිව්‍යුහගත කිරීම හරහා මිල වැඩි කිරීමයි; බිල වැඩි කිරීමයි. කනපිට පෙරළලා කටයුතු කිරීමක් තමයි මේ කර තිබෙන්නේ. ඒ නිසා මම බොහොම ගෞරවයෙන් ඉල්ලීමක් කරනවා. Restructuring ගැන අපට ප්‍රශ්නයක් නැහැ. නමුත්, ජනතාවාදී, ජනතා කේන්ද්‍රීය ප්‍රතිව්‍යුහගතකරණයකට අපට යන්න සිදු වනවා. Public-private partnershipsවලට යන්න වනවා, Joint venturesවලට යන්න වෙනවා. ඒ යථාර්ථය අපි අවබෝධ කරගෙන තිබෙන්නේ. හැබැයි, ඒ හැම දේම කරනකොට මිනිසුන්ගේ පැත්තෙන් හිතලා කටයුතු කරන්න ඕනෑ. මොකද, ඉහළ තැන්වලට ගියාම බොහෝ අයට තේරෙන්නේ නැහැ, පහළ තලයේ මිනිසුන්ගේ හැඟීම්.

ගෞරවනීය මහා සංඝ රත්නය ඊයේ බොහොම දැඩි ලෙස ප්‍රකාශ කළා, මේ පිළිබඳව බොහොම බරපතළ තීන්දුවක් ගන්නවා කියලා. ඇත්ත වශයෙන්ම අපිත් හිට ගන්නේ ගෞරවනීය මහා සංඝ රත්නය පැත්තේ; ආගමික සිද්ධස්ථාන පැත්තේ. අපි ආගමික සිද්ධස්ථාන පාවිච්චි කරලා දේශපාලනය කරන්න හදනවා කියලා නම් කවුරුවත් කියන්න හදන්න එපා.

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

ගරු කථානායකතුමනි, ඔබතුමාත් දන්නවා, නාග රාජ රංගනය නිසා; කැලණි රජමහා විහාරස්ථානය කේන්ද්‍ර කරගෙන ඉතා නින්දිත ආකාරයට කරපු ඒ ඉතා පහත් මට්ටමේ නීච දේශපාලනය නිසා බුදු දහමට ලොකු කැලලක් ඇති වුණු බව.

ගරු කථානායකතුමනි, අපි මේ ප්‍රශ්නය ඉදිරිපත් කරන්නේ, ගෞරවනීය මහා සංඝ රත්නය වෙනුවෙන්, ආගමික නායකයන් වෙනුවෙන්, ආගමික සිද්ධස්ථාන 48,000 වෙනුවෙන් වාගේම මේ රටේ සාමාන්‍ය ජනතාව වෙනුවෙන්.

ගරු කථානායකතුමනි, සමාජයේ මෙය decilesවලට වෙන් කර තිබෙන බව ඔබතුමා දන්නවාද? දහයේ කොටස්වලට වෙන් කර තිබෙනවා. දුප්පත්කමට මුහුණ දෙන කණ්ඩායම් හැටියට වෙනදාට අපි අහලා තිබෙන්නේ deciles 3ක්, 4ක් වාගේ. දැන් 3ක්, 4ක් නොවෙයි, ඒ ප්‍රමාණය deciles 6ක්, 7ක් දක්වා වැඩි වෙලා තිබෙනවා. රටේ සියයට 60ක්, 70ක් දුප්පත් තත්ත්වයට පත් වෙලා තිබෙනවා. තත්ත්වය ඒ තරමටම බැරෑරුම්. ඒ නිසා මම රජයෙන් ඉල්ලීමක් කරනවා, කරුණාකර, bridging finance ටික ලබාගෙන මිනිසුන්ට සහන ලබාදීලා, ඉන් පස්සේ මේ ප්‍රතිව්‍යුහගත කිරීම් කරන්න කියලා. ඒ වාගේම, ආගමික සිද්ධස්ථාන කේන්ද්‍ර කරගෙන පුනර්ජනනීය බලශක්තිය රටට ලබාදෙන වැඩ පිළිවෙළ ඉතාම ඉක්මනින් ක්‍රියාත්මක කරන්න කියාත් ඉල්ලා සිටිනවා. විපක්ෂයේ අපිත් ඒ වැඩසටහනට සක්‍රියව දායක වන්න සූදානම්.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, මහනුවර මල්වතු, අස්ගිරි ප්‍රධාන විහාරස්ථානවල භික්ෂූන් වහන්සේලාත් මගෙන් ඉල්ලීමක් කළා, විදුලි බිල වැඩි වීම පිළිබඳව පාර්ලිමේන්තුවේ අවධානය යොමු කරවන්න කියලා. විදුලි බිල සියයට 450කින් - by 450 per cent - වැඩි කරලා. අපේ රටේ ව්‍යවස්ථාව අනුව, බෞද්ධාගමට ප්‍රමුඛස්ථානය හිමි වනවා. අනෙකුත් ආගම්වලටත් ඒ හා සමාන ආරක්ෂාවක් දෙන්න ඕනෑ. බුද්ධ ශාසනය ඇතුළු සියලු ආගම් විනාශ කරන වැඩ පිළිවෙළක් තමයි මේ මිල වැඩි කිරීම තුළ සිදු වන්නේ. අනෙක, ගරු කථානායකතුමනි, මෙහෙම වැඩි කිරීමක් කරන්න කලින් අපේ නායක ස්වාමීන් වහන්සේලා හම්බ වෙලා සාකච්ඡා කරන්න තිබුණා. හිතුවක්කාර විධියට ඒ කටයුතු කරන්න බැහැ නේ. ඔබතුමා ඒක දන්නවා නේ. නීතියේ සිද්ධාන්තයක් තමයි, මෙවැනි කටයුතුවලදී ඒ අදාළ පුද්ගලයන්ගෙන් අහන්න ඕනෑ කියන එක. *Audi alteram partem* කියන්නේ, ප්‍රශ්නයට මුහුණ දෙන කෙනාගෙන් අහන්න ඕනෑ කියන එකයි. අඩු ගණනේ සමිතියකින්වත් අහන්න ඕනෑ.

නමුත්, ඒ කිසිම දැනුම්දීමකින් තොරව විදුලි බිල මේ විධියට සියයට 450කින් වැඩි කළාම කොහොමද දරා ගන්නේ? ගරු කථානායකතුමනි, දකුණේ බෞද්ධ නායකයෙකු හැටියට මේ ගැන ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියා මා ඉල්ලා සිටිනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatilleka)

ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්නය සුළුකොට තකන්නේ නැතිව, ත්‍රෛනිකායික මහා නායක ස්වාමීන් වහන්සේලා කරපු ඒ ඉල්ලීම අහක දමන්නේ නැතිව එය විසඳන්න කටයුතු කළ යුතුයි. මොකද, සම්බුද්ධ ශාසනයේ චිරස්ථිතිය වෙනුවෙන් වැඩ කරන්න තමයි හැම ආණ්ඩුවක්ම ක්‍රියා කරන්නේ. විශේෂයෙන්ම මේ ආණ්ඩුව පන්සල්වලින් ලොකු ආශීර්වාදයක් අරගෙනයි බලයට ආවේ. මේ ප්‍රශ්නය සුළුකොට තකන්නේ නැතිව අවශ්‍ය කටයුතු කරන්න. ගාලු දිස්ත්‍රික්කයේ පන්සල්වලට ගියාම හැම ස්වාමීන් වහන්සේ නමක්ම පක්ෂ දේශපාලනයෙන් තොරව කියනවා, විදුලි බිලේ වැඩිවීම දරාගන්න බැහැ කියලා. ඒ නිසා මේ ගැන කාරුණික අවධානය යොමු කරන්න, නිහතමානීව මේ ප්‍රශ්නය දිහා බලන්න කියලා මම ඉල්ලා සිටිනවා.

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 1 -3/2022- (1), ගරු ගයන්ත කරුණාතිලක මහතා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatilleka)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

ගරු කථානායකතුමනි, සංචාරක හා ඉඩම් අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 2 -28/2022- (1), ගරු බුද්ධික පතිරණ මහතා.
*[සභා ගර්භය තුළ නැත.]*

## හන්තාන සිට සුදුහුම්පොළ දක්වා ඇළ මාර්ගය: අවහිර වීම
## ஹந்தானையிலிருந்து சுதுஹும்பொல வரையான கால்வாய்: தடைப்படுதல்
## CANAL FROM HANTHANA TO SUDUHUMPOLA: BLOCKAGE

296/2022

3. **ගරු වසන්ත යාපාබණ්ඩාර මහතා**
(மாண்புமிகு வசந்த யாப்பாபண்டார)
(The Hon. Wasantha Yapabandara)

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) හන්තාන සිට සුදුහුම්පොළ දක්වා ජලය බැස යන ඇළ මාර්ගයක් තිබෙන බවත්;

(ii) එම ඇළ මාර්ගය අවහිර වන අයුරින් ඇතැම් ස්ථානවල අනවසර ඉදිකිරීම් සිදු කර ඇති බවත්;

(iii) වර්ෂා කාලයේදී එම ඇළ මාර්ගය අවහිර වීම හේතුවෙන් අවට ප්‍රදේශවාසීන්ගේ නිවාස ජලයෙන් යටවන බවත්;

එතුමා දන්නේද?

(ආ) ඉහත සඳහන් ඇළ මාර්ගය අවහිර වීම හේතුවෙන් ජල ගැලීම්වලට මුහුණ දෙන සුදුහුම්පොළ ප්‍රදේශය අවට පදිංචිකරුවන්ට ලබා දෙනු ලබන ස්ථිර විසඳුම කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

நகர அபிவிருத்தி மற்றும் வீடமைப்பு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) ஹந்தானை முதல் சுதுஹும்பொல வரை நீர் பாய்ந்தோடும் கால்வாயொன்று உள்ளதென்ப தையும்;

(ii) மேற்படி கால்வாய் தடைப்படும் வகையில், சில இடங்களில் அனுமதியற்ற கட்டுமானங்கள் மேற் கொள்ளப்பட்டுள்ளன என்பதையும்;

(iii) மழைக் காலங்களில் மேற்படி கால்வாய் தடைப் படுவதனால் அதனைச் சூழவுள்ள மக்களின் வீடுகள் நீரில் மூழ்கின்றன என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) மேற்படி கால்வாய் தடைப்படுவதன்மூலம் ஏற்படு கின்ற வெள்ளப்பெருக்கினால் பாதிக்கப்படும் சுதுஹும்பொல பிரதேசத்தைச் சூழவுள்ள குடியிருப் பாளர்களுக்கு வழங்கப்படும் நிரந்தரத் தீர்வு யாதென்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Urban Development and Housing:

(a) Is he aware that -

(i) there is a canal from Hanthana to Suduhumpola;

(ii) unauthorized constructions have been done in certain locations blocking the canal; and

(iii) the houses of the residents of the area get flooded during the rainy season due to the blockage of the canal?

(b) Will he inform this House of the permanent solution that will be given to the residents of the Suduhumpola area who get affected by floods due to the blockage of the aforesaid canal?

(c) If not, why?

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්. (හල්ඔය)

(ii) ඔව්. (149ක් පමණ)

(iii) ඔව්.

මහනුවර දිස්ත්‍රික් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් මූලික අධ්‍යයනයක් සිදු කර එසේ ජලයෙන් යට වීමට පහත සඳහන් හේතු හඳුනාගෙන ඇත.

I හන්තාන සිට මැද ඇළ දක්වා පවතින හල්ඔය අවහිර වීම හේතුවෙන් මෙලෙස ආපදාවට ලක් වීම.

II හල්ඔය සම්පූර්ණයෙන් වැසී යන ලෙස අනවසර ගොඩනැඟිලි කොටස් ඉදිකර තිබීම.

III හල්ඔය හරහා විවිධ ස්ථානවල අනවසරයෙන් ප්‍රවේශ පාලම් ඉදිකිරීම.

IV ඔය වෙත ජලය ගලා එන කානු ප්‍රමාණවත් නොවීම.

V අපද්‍රව්‍ය ඔය වෙත බැහැර කිරීම.

VI රොන්මඩ තැන්පත් වීම.

VII හල්ඔය මැද ඇළට සම්බන්ධ වන ස්ථානය පටු වීම.

(ආ) මෙම ඔය මහනුවර මහ නගර සභාව සතු ජල මාර්ගයකි. වසර ගණනාවක් තිස්සේ නිසි අවසරයකින් තොරව ඇතැම් ඉදිකිරීම් සිදු කර ඇත.

මෙම ආපදා තත්ත්වය, අනවසර ඉදිකිරීම හේතුවෙන් සිදු වී ඇති බැවින් මේ සම්බන්ධව මහනුවර මහ නගර සභාව, නාගරික සංවර්ධන අධිකාරිය, ජාතික ගොඩනැඟිලි පර්යේෂණ සංවිධානය හා දිස්ත්‍රික් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය ඒකාබද්ධව විස්තරාත්මක අධ්‍යයනයක් සිදු කර පහත සඳහන් ක්‍රියා මාර්ග අනුගමනය කරන ලෙස මහනුවර මහ නගර සභාවට නිර්දේශ කර ඇත.

I. හල්ඔය සම්පූර්ණයෙන් ආවරණය වන ලෙස හා රක්ෂිතය ආවරණය වන ලෙස ඉදිකර ඇති අනවසර නිවාස කොටස් හා ප්‍රවේශ පාලම් ඉවත් කිරීම.

II. හල්ඔයට බාධා වන ලෙස මහනුවර මහා නගර සභාව විසින් ඉදිකර ඇති අපජල ටැංකි වෙනත් ස්ථානවල ඉදිකිරීම.

III. හල්ඔය පළල් කර ඔයෙහි තැන්පත් වී ඇති රොන්මඩ සහ වැලි ඉවත් කිරීම.

IV. හල්ඔය මැද ඇළට සම්බන්ධ වන ස්ථානය පළල් කිරීම.

V. හල්ඔයට සම්බන්ධ ඇළ මාර්ග පළල් කිරීම.

(ඇ) අදාළ නොවේ.

**ගරු වසන්ත යාපාබණ්ඩාර මහතා**
(மாண்புமிகு வசந்த யாப்பாபண்டார)
(The Hon. Wasantha Yapabandara)
ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

සුදුහුම්පොළ - නාගස්තැන්න ඇළ සුදුහුම්පොළ හන්දිය දක්වා ඇවිත් මැද ඇළට වැටෙනවා. ඊට පස්සේ ඒක දිගටම ගලාගෙන එනවා මහවැලි ගඟට. ගරු කථානායකතුමනි, නාගස්තැන්න කොටසත්, මැද ඇළ කියන කොටසත් කියන දෙකම සාමාන්‍ය වර්ෂාවකට පවා විශාල වශයෙන් යට වෙනවා. හන්තාන පැත්තේ ඉඳලා එන ජල මාර්ග සියල්ල එකතු වෙලා සුදුහුම්පොළ කියන ප්‍රදේශය ජලයෙන් යට වන තත්ත්වයට පරිවර්තනය වනවා. මෑතකත් ඒ වාගේ දරුණු තත්ත්වයක් උදා වෙලා ප්‍රදේශවාසීන් විශාල පිරිසක් අසරණභාවයට පත් වුණා.

ඇත්තටම නාගරික සංවර්ධන අධිකාරියත්, මහනුවර මහ නගර සභාවත් එකතු වෙලා ඒ ඇළ නඩත්තු නොකිරීමේ ගැටලුව තමයි ප්‍රධාන වශයෙන්ම තිබෙන්නේ. ඒ කාරණය කෙරෙහි අපේ ගරු අමාත්‍යතුමාගේ අවධානය යොමු වීම ගැන මා සතුටු වෙනවා. ගරු කථානායකතුමනි, එම ඇළ මාර්ගයේ කුණු රැඳීම සහ නඩත්තු නොකිරීමේ තත්ත්වය හේතුවෙන් සුදුහුම්පොළ ප්‍රදේශය දිගින්

[ගරු වසන්ත යාපාබණ්ඩාර මහතා]

දිගටම ජලයෙන් යට වීමේ ගැටලුව ඇති වී තිබෙනවා. එම ගැටලුවෙන් එම ප්‍රදේශවාසීන් මුදා ගැනීම සඳහා ඒ ඇළ නඩත්තු කිරීමේ කටයුත්ත අඛණ්ඩව -අඩු ගණනේ මාස තුනකට සැරයක්වත්- කරන්න පුළුවන් නම්, ඒ ප්‍රදේශයේ ජනතාව ආරක්ෂා කරගන්න පුළුවන් කියන එකයි මගේ අදහස. මම ගරු අමාත්‍යතුමාගේ අහනවා, ඒ සඳහා මහ නගර සභාව සමඟ ඒකාබද්ධ ව්‍යාපෘතියක් ආරම්භ කිරීම ප්‍රමාද කරන්නේ ඇයි කියලා.

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

එය ප්‍රමාද කිරීමක් නැහැ, ගරු මන්ත්‍රීතුමනි. ගරු කථානායකතුමනි, ඒ සම්බන්ධයෙන් විද්‍යාත්මක වාර්තාවක් ලබාගෙන තිබෙනවා. ඒ අනුව ඒ සම්බන්ධව කටයුතු කරන්න මහ නගර සභාවට උපදෙස් දී තිබෙනවා. ඉදිරියේදී නාගරික සංවර්ධන අධිකාරියේ අධීක්ෂණය යටතේ එම කටයුතු කරන්න බලාපොරොත්තු වෙනවා. මා ළඟ තිබෙන, මේ පිළිතුරට අදාළ පසුබිම් වාර්තාවේත් කරුණු සඳහන් වෙලා තිබෙනවා. මේ පසුබිම් වාර්තාවත් ඔබතුමාගේ අවධානය පිණිස ලබා දෙන්න මට පුළුවන්.

**ගරු වසන්ත යාපාබණ්ඩාර මහතා**
(மாண்புமிகு வசந்த யாப்பாபண்டார)
(The Hon. Wasantha Yapabandara)

මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි, ගරු කථානායකතුමනි.

නාගරික සංවර්ධන අධිකාරියත් මැදිහත් වෙලා මහනුවර නගරය පුරා කරන ලද ඉදිකිරීම් ගණනාවක් අද වනකොට අවිධිමත් අන්දමට අත් හැර දමා තිබෙනවා. ගරු කථානායකතුමනි, කාලයක් නාගරික සංවර්ධන අධිකාරිය යටතේ ක්‍රියාත්මක වෙමින් තිබුණා, ගුඩ්ෂෙඩ් බස් නැවතුම්පොළ ව්‍යාපෘතිය. ගුඩ්ෂෙඩ් බස් නැවතුම්පොළ ව්‍යාපෘතියේ ඉදිකිරීම් මේ වනකොට සම්පූර්ණයෙන් නතර කර දමා තිබෙනවා. ගුඩ්ෂෙඩ් බස් නැවතුම්පොළ ස්ථාන හයක ස්ථාපිත කර තිබෙනවා. ඒ කියන්නේ, එම බස් නැවතුම් පොළ අද වන කොට ස්ථාන හයකට විතැන් කර තිබෙනවා. එම ප්‍රදේශයේ ගුඩ්ෂෙඩ් බස් නැවතුම්පොළ ආශ්‍රිත එම ස්ථාන අවිධිමත් අන්දමට පැවතීම නිසා ප්‍රදේශවාසීන්, මගී ජනතාව ඇතුළු මහ ජනතාව අපහසුතාවට පත්ව තිබෙනවා. ඒ වාගේම, බස් රථ ධාවනය කරන රියැදුරු මහත්වරුන්ට එහි බස් රථයක් park කරගන්න පවා අවස්ථාවක් නැහැ.

ඒ අය ඉල්ලීමක් කර තිබෙනවා, එම ඉදිකිරීම සිදු වෙන්නේ නැත්නම් කරුණාකර ඒ අයගෙන් රුපියල් 100ක ගාස්තුවක් අය කරලා හෝ මේ අවස්ථාව ලබා දෙන්න කියලා. මොකද, ඒ අයට තමන්ගේ බස් රථ park කරන්න තිබෙන අවස්ථා අඩුයි. ගරු කථානායකතුමනි, ඒ වාගේම නාගරික සංවර්ධන අධිකාරියේත් මැදිහත්වීම යටතේ "සියක් නගර" ව්‍යාපෘතිය ආරම්භ වුණා. දැනට එම නගර සියල්ලේම සංවර්ධන කටයුතු නතර වෙලා තිබෙනවා. විශේෂයෙන්ම ඒ වැඩසටහන යටතේ සංවර්ධනය කරන්න අපේ ප්‍රදේශයෙන් තෝරා ගත්තා මුරුතලාව නගරය. මේ මුරුතලාව නගරය නෙල්ලිගල පූජා භූමියට යන ප්‍රවේශ මාර්ගයේ තිබෙන්නේ. එහි සංවර්ධන කටයුතු අතහැර දමා තිබෙන නිසා දැඩි මාර්ග තදබදයක් ඇතිවෙලා තිබෙනවා. ඒ වාගේම, සුදුහුම්පල ගිනි නිවන ස්ථානය අසලින් යන four-lane ව්‍යාපෘතිය පටන් ගත්තා. නමුත්, දැන් ඒකත් නතරවෙලා තිබෙනවා. ගරු කථානායකතුමනි, ගැටඹේ ගුවන් පාලම ඇතුළු මේ ස්ථාන සියල්ලේම වැඩ කටයුතු දැන් අතහැර දමා තිබෙනවා. මේ දේවල් නිසා පසුගිය දිනක කුරුණෑගල මලියදේව විද්‍යාලයේ ශිෂ්‍යයාට අත්වුණු ඉරණම වාගේ තත්ත්වයක් මේ ප්‍රදේශවාසී මගී ජනතාවටත් අත් වෙන්න පුළුවන්. නාගරික සංවර්ධන අධිකාරිය සමහර ඒවාට සෘජුව සම්බන්ධ ඇති; සමහර ඒවාට වක්‍රව සම්බන්ධතාවක් ඇති. ගරු ඇමතිතුමනි, මහනුවර නගරයේ තිබෙන අවිධිමත් ඉදිකිරීම් පිළිබඳව ඔබතුමාත් දන්නවා. ඒ නිසා, මේවාට විසඳුම් ලබා දෙන්නේ කුමන ආකාරයට ද කියලා ඔබතුමා කරුණාකර අපට කියන්න. "අරමුදල් නැති නිසා මේවා කරන්න විධියක් නැහැ" කියලා ඔබතුමා කියයි. නමුත් මේ ආකාරයට භාගෙට නතර කරලා තිබෙන සංවර්ධන වැඩ කටයුතු සම්බන්ධයෙන් ගන්නා වූ ක්‍රියා මාර්ගය මොකක්ද, ගරු ඇමතිතුමනි? දැන් තිබෙන තත්ත්වය අනුව මලියදේව විද්‍යාලයේ ශිෂ්‍යයාට සිදු වුණු ආකාරයේ අවාසනාවන්ත සිදුවීමක් ඉදිරියේදී සිදු වෙන්න ඉඩකඩ නැද්ද?

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

ගරු කථානායකතුමනි, මේ ගැටලුව මහනුවරට පමණක් ඇති වෙච්ච දෙයක් නොවෙයි. පොදුවේ රට පුරාම ක්‍රියාත්මක වන සංවර්ධන ක්‍රියාවලියේ - ඉදිකිරීම්වල - යම් නතරවීමක් තිබෙනවා. මේ සම්බන්ධයෙන් පසුගිය දවස්වල අපේ අමාත්‍යාංශය මුදල් අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කළා. අපි ලබන අවුරුද්දේ ක්‍රියාත්මක කරන සැලැස්ම තුළ ප්‍රමුඛතා හඳුනාගෙන කටයුතු කිරීම සඳහා තමයි යෝජනා ඉදිරිපත් කරන්න කිව්වේ. මේ සම්බන්ධව UDA එකත් එක්ක සාකච්ඡා කරලා, ඔබතුමා ඉදිරිපත් කළ ප්‍රශ්නය සම්බන්ධව අවධානය යොමු කරන්නම්, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු වසන්ත යාපාබණ්ඩාර මහතා**
(மாண்புமிகு வசந்த யாப்பாபண்டார)
(The Hon. Wasantha Yapabandara)

ගරු කථානායකතුමනි, තව එක කාරණයක් කියන්න මට අවස්ථාව දෙන්න.

ගරු ඇමතිතුමනි, ගැටඹේ පන්සල් මළුව අද ගිලා බහින තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. මොකද, මහවැලි ගඟත් එක්ක ඉදිකිරීමක් කරන්න ලොකු බැම්මක් බැඳීමට හැරීමක් කර තිබෙනවා. ඒ නිසා එම මාර්ගයත් විශාල අවදානමකට ලක් වෙලා තිබෙනවා. මේ නිසා ගැටඹේ පූජා භූමියත් ලොකු අවදානමක තිබෙන්නේ. ගරු රොෂාන් රණසිංහ ඇමතිතුමාත් එතැනට ගිහින් තිබුණා, ඒ ගැන බලන්න. ඒ පන්සලේ නායක ස්වාමීන් වහන්සේත් මේ පිළිබඳව නිතර විමසීම් කරනවා. මේ අවදානම් තත්ත්වය වළක්වා ගැනීම සඳහා නාගරික සංවර්ධන අධිකාරියට කඩිනම් පියවරක් ගන්න පුළුවන් ද කියලා මම දැනගන්න කැමැතියි.

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

පසුගිය සතියේ ගරු රොෂාන් රණසිංහ ඇමතිතුමා එම ස්ථානයේ නිරීක්ෂණ චාරිකාවකට ගිහින් තිබුණා. ඔබතුමා ඉදිරිපත් කළ ප්‍රශ්නය පිළිබඳව නාගරික සංවර්ධන අධිකාරියත් එක්ක සාකච්ඡා කරලා, ලබන අවුරුද්දේ ප්‍රමුඛතා ලේඛනය හදන කොට අපට ඒ සඳහා කටයුතු කරන්න පුළුවන්.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, මහනුවර මධ්‍යම බස් නැවතුම් පොළේ කටයුතු පසුගිය රජය කාලයේ තමයි පටන් ගත්තේ. ඒකට ජාත්‍යන්තර ආධාරත් ලැබුණා. ජාත්‍යන්තර ආධාර ලැබුණාට රජයෙනුත් යම්කිසි මුදලක් යොදවන්න ඕනෑ නේ. ජාත්‍යන්තරය

සියයට සියයක් ආධාර දෙන්නේ නැහැ නේ. නමුත් ඒ මුදල යොදවන්න බැරිව දැන් ඒ කටයුතු හිරවෙලා තිබෙන්නේ. දැන් bus stand එක හැදෙන්නේත් නැහැ. එතැන දැන් මඩ ගොහොරුවක් තිබෙන්නේ.

අනෙක් කාරණය මේකයි, ගරු කථානායකතුමනි. මම ගැටඹේ ළමා ක්‍රීඩාංගණයක් පටන් ගත්තා. ඒකට උඩින් පාලමක් හදන්න ගත්තා. නමුත් දැන් පාලමේ වැඩ කටයුතු නවත්වා තිබෙනවා. ඒක නිසා දැන් ක්‍රීඩාංගණයත් නැහැ. මේක මහා විනාශයක්.

ගරු ඇමතිතුමනි, දැන් ගැටඹේ විහාරස්ථානය ගැනත් කථා කළා. මමයි ඒක පූජා භූමියක් කළේ. ඇත්ත වශයෙන්ම අපි ඒ ස්ථානය ආරක්ෂා කර ගන්න ඕනෑ. මෙම ස්ථානය ඓතිහාසික ගන්නෝරුව සටනට සම්බන්ධ ස්ථානයක්. ඒ නිසා ඒ ස්ථානය අපි ආරක්ෂා කර ගන්න ඕනෑ. මුදල් ප්‍රශ්න තිබෙන බව මා දන්නවා. 2023 අය වැය ලේඛනයෙන් හෝ මුදල් ලබාගෙන මේ සම්බන්ධයෙන් කටයුතු කරන්න කියලා මා ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

ගරු මන්ත්‍රීතුමනි, විදේශ ආධාර ලබාගෙන ක්‍රියාත්මක කරන සංවර්ධන ව්‍යාපෘති සඳහා බාධාවක් නැහැ. ඒ සඳහා රජයේ කොටස ලබාදෙන එකඟතාවකට අපි පැමිණ තිබෙනවා. ඒ නිසා ලබන වර්ෂය තුළදී අපට ඒ වැඩ කටයුතු ආරම්භ කරන්න පුළුවන්.

## පරිසර දූෂණය සම්බන්ධයෙන් ලැබී ඇති පැමිණිලි: රත්නපුර දිස්ත්‍රික්කය
சுற்றாடல் மாசுபடுதல் சம்பந்தமான முறைப்பாடுகள்: இரத்தினபுரி மாவட்டம்
COMPLAINTS RECEIVED ON ENVIRONMENTAL POLLUTION: RATNAPURA DISTRICT

342/2022

**4. ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)
පරිසර අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2019 වර්ෂයේදී රත්නපුර දිස්ත්‍රික්කයේ සිදු වූ පරිසර දූෂණයට අදාළව මධ්‍යම පරිසර අධිකාරිය වෙත ලැබී ඇති පැමිණිලි සංඛ්‍යාව කොපමණද;

(ii) පැමිණිලි වර්ගීකරණය අනුව ඒ අතරින් වැඩි වශයෙන් ලැබී ඇති පැමිණිලි වර්ගය කවරේද;

(iii) ඉහත (i) හි සඳහන් පැමිණිලි අතරින් මධ්‍යම පරිසර අධිකාරියේ පූර්ණ අනුමතිය ලබා දී ඇති ආයතන සම්බන්ධයෙන් ලැබී ඇති පැමිණිලි සංඛ්‍යාව කොපමණද;

(iv) එම ආයතන මධ්‍යම පරිසර අධිකාරියේ නීති රීති අනුව කටයුතු කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) රත්නපුර මහ නගර බලප්‍රදේශය තුළ ස්ථාපිත කර ඇති කර්මාන්තශාලාවලින් සිදු කරනු ලබන පරිසර දූෂණය සම්බන්ධයෙන් පරීක්ෂා කර තිබේද;

(ii) ජලයට බැර ලෝහ එකතුවීම, වායු දූෂණය සහ ශබ්ද දූෂණය සම්බන්ධයෙන් මධ්‍යම පරිසර අධිකාරිය විසින් පරීක්ෂාවට ලක් කරන ලද ආයතන කවරේද;

(iii) එම පරීක්ෂා කිරීම් අනුව එළඹ ඇති නිගමන කවරේද;

(iv) ජාතික පාරිසරික පනත අනුව ලබා දී ඇති උපදෙස් නොසලකා කටයුතු කිරීම හේතුවෙන් මේ වනවිට නීතිමය පියවර ගෙන ඇති ආයතන සංඛ්‍යාව කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

சுற்றாடல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2019ஆம் ஆண்டில் இரத்தினபுரி மாவட்டத்தில் நிகழ்ந்த சுற்றாடல் மாசுபடுதலுடன் சம்பந்தப் பட்டதாக மத்திய சுற்றாடல் அதிகாரசபைக்குக் கிடைத்துள்ள முறைப்பாடுகளின் எண்ணிக்கை யாது என்பதையும்;

(ii) முறைப்பாட்டு வகைப்படுத்தலுக்கமைய, அத் தகைய முறைப்பாடுகளில் எவ்வகை முறைப் பாடுகள் அதிகம் கிடைத்துள்ளன என்பதையும்;

(iii) மேற்படி (i)இல் குறிப்பிடப்பட்டுள்ளவாறு, அம் முறைப்பாடுகளில் மத்திய சுற்றாடல் அதிகார சபையின் முழுமையான அங்கீகாரம் அளிக்கப் பட்டுள்ள நிறுவனங்கள் தொடர்பில் கிடைத் துள்ள முறைப்பாடுகளின் எண்ணிக்கை யாது என்பதையும்;

(iv) அந்நிறுவனங்கள் மத்திய சுற்றாடல் அதிகார சபையின் சட்டவிதிகளுக்கு அமைவாகச் செய லாற்றி உள்ளனவா என்பதையும்;

அவர் இச்சபையில் தெரிவிப்பாரா?

(ஆ) (i) இரத்தினபுரி மாநகர சபையின் ஆளுகைப் பிரதேசத்தினுள் அமைக்கப்பட்டுள்ள தொழிற் சாலைகளால் ஏற்படுகின்ற சுற்றாடல் மாசுபாடு குறித்து ஆராயப்பட்டுள்ளதா என்பதையும்;

(ii) தண்ணீரில் பார உலோகங்கள் கலப்பு, வளி மாசுபாடு மற்றும் ஒலி மாசுபாடு தொடர்பாக மத்திய சுற்றாடல் அதிகாரசபையினால் பரி சோதனைக்கு உட்படுத்தப்பட்ட நிறுவனங்கள் யாவை என்பதையும்;

(iii) அத்தகைய பரிசோதனைகளின்படி எடுக்கப் பட்டுள்ள முடிவுகள் யாவை என்பதையும்;

(iv) தேசிய சூழல் சட்டத்திற்கு அமைய வழங்கப் பட்டுள்ள அறிவுறுத்தல்களை மீறிச் செயற் பட்டுள்ளதன் காரணமாக, தற்போது சட்ட நடவடிக்கை எடுக்கப்பட்டுள்ள நிறுவனங்களின் எண்ணிக்கை யாது என்பதையும்;

அவர் இச்சபையில் தெரிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Environment:

(a) Will he inform this House -

(i) the number of complaints received by the Central Environmental Authority with regard to environmental pollution in the Ratnapura District in 2019;

[ගරු හේෂා විතානගේ මහතා]

(ii) the type of complaints received most according to the categorization of complaints;

(iii) the number of complaints received with regard to the institutions that have been granted full approval of the Central Environmental Authority, out of the complaints mentioned in (i) above; and

(iv) whether the aforesaid institutions have acted according to the rules and regulations of the Central Environmental Authority?

(b) Will he also inform this House -

(i) whether investigations have been carried out on the environmental pollution taking place due to the factories established within the Ratnapura Municipality;

(ii) the institutions that have been scrutinized by the Central Environmental Authority with regard to contamination of water with heavy metal, air pollution and sound pollution;

(iii) the conclusions reached upon the said examinations; and

(iv) the number of institutions prosecuted on the charges of violating the National Environmental Act?

(c) If not, why?

**ගරු නසීර් අහමඩ් මහතා (පරිසර අමාත්‍යතුමා)**
(மாண்புமிகு நஸீர் அஹமட் - சுற்றாடல் அமைச்சர்)
(The Hon. Naseer Ahamed - Minister of Environment)
Hon. Speaker, the Answer is as follows:

(a) (i) The Central Environmental Authority has reported that 92 complaints were received pertaining to environmental pollution occurred in the Ratnapura District in the year 2019.

(ii) The Authority has also reported that the highest number of complaints received were public complaints pertaining to matters regulated by the laws and regulations of the Central Environmental Authority belonging to Group "A" according to the following classification of the complaints.

| Complaint Category | Number of Com- |
|---|---|
| Complaints of Group "A" | 52 |
| Complaints of Group "B" | 37 |
| Complaints of Group "C" | 03 |

- **Complaints belonging to Group "A"** - Complaints from the general public pertaining to matters regulated by the laws and regulations of the Central Environmental Authority.
- **Complaints belonging to Group "B"-** Complaints from the general public pertaining to matters regulated by the laws and regulations of other institutions, regarding which recommendations are given by the Central Environmental Authority. Example: Illegal gemming, sand mining and reclaiming of low-lying lands.
- **Complaints belonging to Group "C" -** Complaints from the general public pertaining to matters directly relevant to institutions other than the Central Environmental Authority. Example: Incineration of domestic refuse, releasing domestic wastewater directly to common drains, illegal constructions, reclaiming paddy lands, incineration of polythene and plastic and loud noise (at places of religious worship, business premises where loudspeakers or generators are used.)

(iii) Number of complaints is 52.

(iv) The details pertaining to this aspect is given in Annex 01 by the Central Environmental Authority. I **table*** Annex 01.

(b) (i) The Central Environmental Authority has reported that such inspections have been carried out.

(ii) The institutions so subjected to inspection by the Central Environmental Authority are listed in Annex 02. I table* Annex 02.

(iii) The Central Environmental Authority has given information pertaining to this in Annex 02.

- The inspection focuses on verifying whether the industrial activity is carried out according to the standards and specifications set by the Central Environmental Authority.
- If any breach of conditions (applicable standards and specifications) appertaining to the licence issued occurs, instructions are issued and a relief period is given in order to correct the courses of action.
- In the event of failure to act according to the instructions so given, the Central Environmental Authority will take legal action against such institutions.

(iv) The number of institutions against which legal action has been taken - 08

---

* පුස්තකාලයේ තබා ඇත.
* நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.
* *Placed in the Library.*

- Vehicle Service Centre - Mr. L.D.G. Nupun Sandaruwan, New Senra Service, 149/47, Grass Croft Road, Bandara nayaka Mawatha, Ratnapura.
- Vehicle Service Centre - Mr. H.H.C.S. Dharmawardhana, C and C Service, No. 73, Veralupe Old Road, Ratnapura.
- Vehicle Service Centre - Mr. Chaminda Rukshan Samaraweera, Bandaranayaka Mawatha, Ratnapura.
- Mr. W. Jinadasa, J.H. Engineers, No. 585, Hidellana, Ratnapura.
- Mr. W.K.A.L. Fernando, Visiri Painting Work Garage, No. 37, Playground Road, Mudduwa, Ratnapura.
- Mr. B.A.D.T. Jayarathna, Thejana Lathe Works and Engineers, No. 56, Goluwa vila, Ratnapura.
- Mr. P.G.C.A. Pothupitiya, Minipura Engineering Works, No. 36/B, Inner Circular Road, Ratnapura.
- Mr. B.A. Akila Sampath de Silva, Hidellana, Ratnapura.

(c) Does not arise.

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)

ගරු කථානායකතුමනි, මම අහපු ප්‍රශ්නයට ගරු ඇමතිතුමා සාර්ථක පිළිතුරක් ලබා දුන්නා. නමුත්, මම ඇහුවේ පරිසර දූෂණය සිදුවන මහා පරිමාණ කර්මාන්ත සම්බන්ධයෙන් මධ්‍යම පරිසර අධිකාරිය ගන්නා වූ ක්‍රියාමාර්ග පිළිබඳවයි.

මා නියෝජනය කරන රත්නපුර දිස්ත්‍රික්කය ගත්තාම, එම දිස්ත්‍රික්කයේ පතලක් කපන්න ගිහිල්ලා එය මධ්‍යම පරිසර අධිකාරියේ නීති රීතිවලට අනුකූල නොවුණා නම්, නඩු දමනවා. නමුත්, ඒ සඳහා නඩු දමන එක සාධාරණද කියලා මේ වෙලාවේ පොඩ්ඩක් හිතන්න වෙනවා. මොකද, අද මිනිසුන්ට තිබෙන ආර්ථික අපහසුතා නිසා මේ කටයුතුවල යම් කිසි නියාමනයක් කරලා පතල් කර්මාන්තය වෙනුවෙන් මිනිසුන්ට යම් සහනයක් ලබා දිය යුතුයි කියා මම විශ්වාස කරනවා. ඒ වාගේම ඒ වෙනුවෙන් මධ්‍යම පරිසර අධිකාරියේ මැදිහත් වීමත් අතිශය වැදගත් කියන කාරණයත් මම මතක් කරනවා.

ගරු ඇමතිතුමනි, මම එක කරුණක් විතරක් ඔබතුමාගේ අවධානයට යොමු කරන්නම්. මහින්ද අමරවීර මැතිතුමා පරිසර අමාත්‍යවරයා වශයෙන් කටයුතු කළ අවස්ථාවේත් මම මේ ප්‍රශ්නය එතුමාට යොමු කළා. එතුමාත් එදා මට සාධාරණ උත්තරයක් ලබා දෙනවා කිව්වාට, එය ලබා දෙන්න බැරි වුණා. එතුමාට ඒ ගැන කරන්න දෙයක් නැතිව ඇති. මම මේ කථා කරන්නේ, ඇඹිලිපිටිය නගරය ආසන්නයේ තිබෙන ඒස් පවර් ඇඹිලිපිටිය (පුද්ගලික) සමාගම ගැන. එම සමාගමෙන් අපි විදුලිය මෙගාවොට් 100ක් පමණ මිලදී ගන්නවා. ඒ agreement එක ඉවර වුණාට පස්සේ අලුත් agreement එකකට ඇවිල්ලාද කියලා මම දන්නේ නැහැ, ගරු කථානායකතුමනි. නමුත්, ඒ ප්‍රදේශයේ ජනතාව දැන් දැඩි අපහසුතාවකින් ජීවත් වෙන්නේ. රජයේ ඉඩමක තමයි මේ ව්‍යාපෘතිය කරගෙන යන්නේ. ඒක අවුරුදු 10කින් රජයට පවරාගන්න තිබුණු සමාගමක්. එවකට හිටපු විදුලිබල ඇමතිවරුන්ගේ නොමනා ක්‍රියා කලාපය නිසා -අත යට මුදල් ගනුදෙනු නිසා- එය රජයට පවරා ගැනීමක් සිදු වුණේත් නැහැ. ඒක රජයට විශාල මුදලක් ලබා ගන්න පුළුවන් ව්‍යාපෘතියක්. නමුත්, දැනට ඒකෙන් සිදුවන පරිසර හානිය පිළිබඳව කිසිම තක්සේරුවක් සිදු කර නැහැ. ගරු ඇමතිතුමාටත් මම මේ ගැන කිව්වා. මා ජීවත් වන ප්‍රදේශය ආසන්නයේ තමයි මේ සමාගම තිබෙන්නේ. අඩුම තරමින් පාසල් දරුවෙකුගේ සුදු ඇඳුමක් සෝදලා වේළෙන්න වැලකට දමන්න බැහැ, කළු පාට dots වැටෙනවා. ඒ තරම් විශාල පරිසර හානියක් මේ තුළින් සිදුවෙනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමා මේ ගැන දන්නේත් නැතිව ඇති. නමුත්, ඒ සමාගම සඳහා ලබා දිය යුතු පරිසර සහතිකය නම් හැම වතාවකදීම ලබා දෙනවා. එතකොට, මේ නිලධාරින් ජනතාවගේ අඳෝනා, ප්‍රශ්න ආදී සියල්ල යටපත් කර එය ලබා දෙනවා. ඒකට හේතුව තමයි, දැන් අපේ රටේ විදුලිබල ප්‍රශ්නයක් තිබෙන නිසා මේ දවස්වල ඒ ගැන කථා කරලා වැඩක් නැහැ කියලා හිතන එක. ඒ වුණත් මම ඉල්ලීමක් කරනවා, අපේ සමාජයේ තවත් කොටසකට විඳින්න සිදුවන ඒ ගැහැට පිළිබඳව යම් අවධානයක් යොමු කරලා අඩුම ගණනේ දැනට තිබෙන පරිසර ආරක්ෂක නීති තවත් නියාමනය කරලා, මුදල් ඉපැයීමේ පරමාර්ථයට එහා ගිය, සමාජය ආරක්ෂා කිරීමේ වැඩසටහනකට එම සමාගම අනුගත කරවන්න කියලා. මම කියන්නේ ඒ සමාගම වහන්න කියලා නොවෙයි. අඩුම තරමින් එම ස්ථානයේ සිදුවන පරිසර හානිය අවම කර ගන්නවත් කටයුතු කරන්න කියලායි මම කියන්නේ.

**ගරු නසීර් අහමඩ් මහතා**
(மாண்புமிகு நஸீர் அஹமட்)
(The Hon. Naseer Ahamed)

Hon. Member, I will look at the option of appointing a committee to see whether they could find a solution without going to court.

With regard to Ace Power Embilipitiya (Pvt.) Limited, I would be happy to invite you for a discussion with the Central Environmental Authority and also the Hon. Minister of Power and Energy, who is here. We could discuss, see what the options are and take a decision with regard to the 100 megawatt power project that you mentioned.

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)

ගරු කථානායකතුමනි, ගරු සෞඛ්‍ය ඇමතිතුමාත් මේ වෙලාවේ සභාවේ සිටින නිසා මගේ දෙවැනි අතුරු ප්‍රශ්නයේ වෙලාව මම යොදාගන්නවා, අතිශය කාලීන ප්‍රශ්නයක් අහන්න. මේ ප්‍රශ්නය පරිසර දූෂණයටත් වඩා වැදගත් වෙනවා. ගරු කථානායකතුමා මට වේලාව දෙන්නේ නැති නිසා මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න තිබෙන වෙලාවේ මේ ප්‍රශ්නය අහනවා.

ගරු සෞඛ්‍ය ඇමතිතුමනි, ඊයේ ඔබතුමා මේ උත්තරීතර පාර්ලිමේන්තුවේදී ප්‍රකාශයක් කළා. ගරු කථානායකතුමනි, මා විශ්වාස කරනවා, කැබිනට් අමාත්‍යවරුන්ගේ ප්‍රකාශත් එක්ක තමයි මේ රටේ මිනිස්සු විශ්වාසයක් තහවුරු කර ගන්නේ කියලා. නමුත්, ගරු ඇමතිතුමනි, ඊයේ කරපු ඒ ප්‍රකාශය ඔබතුමා සම්පූර්ණයෙන්ම බැහැර කරලා "අරුණ" පුවත් පතට චෝදනා කළා. ඒ වාගේම ඔබතුමා මහජන සෞඛ්‍ය පරීක්ෂක මහත්වරුන්ටත් චෝදනා කළා; ඔවුන්ට මේ වනවිට සිතාසි පවා නිකුත් කරලා තිබෙනවා, නමුත් අද තහවුරු වෙලා තිබෙනවා, මව්වරුන්ට ලබා දුන් එම ත්‍රිපෝෂවල ඇෆ්ලටොක්සින් තිබෙනවා කියලා. ගරු ඇමතිතුමනි, එතකොට ඔබතුමාගේ ප්‍රකාශය සාවද්‍ය ප්‍රකාශයක් වෙනවා. එම නිසා ඔබතුමා ඊයේ පාර්ලිමේන්තුවේදී

[ගරු හේෂා විතානගේ මහතා]

මේ රටේ ජනතාවට ලබා දුන් පිළිතුර සාධාරණ පිළිතුරක් නොවෙයි. මම මේවා කියන්නේ ඔබතුමා අපහසුතාවට පත් කරන්න නොවෙයි. සෞඛ්‍ය රාජ්‍ය ඇමතිතුමියත් වෛද්‍යවරියක්. මේ රටේ ජනතාවට සිදුවෙලා තිබෙන අපහසුතාව නිසා, ගරු රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමිය ඊයේ මතු කළේ ඒ ජනතාව වෙනුවෙන් හඬක්. හැබැයි, අදටත් අපි ඒ සත්‍යය වහලා දාලා, ඒකට උත්තරයක් සොයන්නේ නැතුව ඉන්නවා. නිලධාරින් අද අරගෙන තිබෙන ක්‍රියාමාර්ගත් එක්ක රටේ මතුවෙලා තිබෙන ප්‍රශ්නයට සැබෑ පිළිතුරක් අපි ඔබතුමාගෙන් අපේක්ෂා කරනවා.

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා (සෞඛ්‍ය අමාත්‍ය සහ ජල සම්පාදන අමාත්‍යතුමා)**
(மாண்புமிகு கெஹெலிய றம்புக்வெல்ல - சுகாதார அமைச்சரும் நீர் வழங்கல் அமைச்சரும்)
(The Hon. Keheliya Rambukwella - Minister of Health and Minister of Water Supply)

ගරු කථානායකතුමනි, මේ කාරණය සම්බන්ධයෙන් මා ළඟ තිබෙනවා, පින්තූරයක්. මම ඒ පින්තූරය අද **සභාගත*** කරනවා.

සැප්තැම්බර් 20වන දා ඇති වූ තත්ත්වය පිළිබඳව මම කියන්න ඕනෑ. ත්‍රිපෝෂ substitute කිරීමට, නව නිෂ්පාදනයක් හඳුන්වා දීම සඳහා තව ආයතනයක් ආරම්භ කරපු අවස්ථාවේ සියලු මාධ්‍ය ආයතන ප්‍රධානීන්ට ආරාධනා කරලා තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියන ඔය කියන ප්‍රශ්නය වුණේ, අද නොවෙයි, ඊයේ නොවෙයි, මීට මාස එකහමාරකට ඉස්සෙල්ලා. දැනට මාස එකහමාරකට ඉස්සෙල්ලා ඉදිරිපත් වූ ඒ කරුණුවලට අදාළව අවශ්‍ය ප්‍රමාණයට කටයුතු කරමින් සිටිනවා. මේ ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ් එකේ තරගකාරිත්වය පෞද්ගලික අංශයත් එක්ක යනකොට, ඒ සියලු අය ගෙන්වලා කථා කළා. මම මේ කියන්නේ ඔබතුමන්ලා ගේ දැන ගැනීම පිණිස. ඒ නිසා මේක වෙළෙඳ ව්‍යාපාරයක් නිසා ඇති වූ ප්‍රතිඵලයක් හැටියට තමයි අපි දකින්නේ. ඔබතුමන්ලා මහ ජනතාව වෙනුවෙන් පෙනී සිටින නියෝජිතයන් හැටියට මේ සම්බන්ධයෙන් වර්තමාන තත්ත්වය සොයා බලන්න කියලා මම ඉතාම කාරුණිකව ඉල්ලා සිටිනවා.

විශේෂයෙන්ම මේ ප්‍රශ්නය සම්බන්ධයෙන් මම කරුණු දෙකක් සඳහන් කළා. ඒ, යම් පුවත් පතක තිබුණු ප්‍රචාරක වැඩ පිළිවෙළ සහ ඊට පෙර, කෘෂිකර්ම අංශයේ කාබනික පොහොර සහ රසායනික පොහොර අතර පැවැති සට්ටනයත් එක්ක ඇති වූ ප්‍රතිඵලය. ඒ තත්ත්වය නිසා අප බඩඉරිඟුවලින් ස්වයංපෝෂිත වෙලා තිබුණු තත්ත්වය සම්පූර්ණයෙන්ම නැති වෙලා ගියා; බඩඉරිඟු වගාවට අවශ්‍ය අමුද්‍රව්‍ය නැතිව ගියා. ඒ නිසා තමයි අපට ඉන්දියාවෙන් බඩඉරිඟු ගෙන්වන්න සිදු වුණේ. ඉන්දියාවෙන් බඩඉරිඟු ගෙන්වන කොට මේ ඇෆ්ලටොක්සින් කියන පිළිකා කාරකය පිළිබඳ ප්‍රශ්නය විශාල ලෙස මතු වෙනවා. එය රටේ නිෂ්පාදනවලටත් බලපානවා.

ඔබතුමා කියන තත්ත්වය තුළ මේ සම්බන්ධ ප්‍රකාශ කරපු අයට කරුණු ඉදිරිපත් කරන්න කියලා ඊයේ නිල වශයෙන් ලිපියක් යවලා තිබෙනවා. ඒකට අදාළව කරුණු ඉදිරිපත් කළාට පස්සේ, ඔහුගේ ඒ ප්‍රකාශය පදනම් කරගෙන තිබෙන පුවත් පත් සාකච්ඡාව සහ උදේ වරුවේ පවත්වන පුවත් පත් ප්‍රකාශ සම්බන්ධ සවිස්තර කරුණු මම ඉදිරිපත් කරනවා කියලා ගරු කථානායකතුමනි ඔබතුමාටත්, විපක්ෂ නායකතුමාටත් මම පොරොන්දු වුණා. ඊයේ දවල් වන විටම ඒ සම්බන්ධ විස්තරයක් ඉදිරිපත් කරලා ඒ සම්බන්ධ පැහැදිලි කරන්න එන්න කියලා කිව්වාම, ඔවුන් කිව්වේ, "මෙතැන ප්‍රශ්නයක් තිබෙන බව පෙනෙන නිසා ඔවුන්ගේ නීතිඥවරුන්ගෙන් උපදෙස් අරගෙන එන්නම්" කියලා. මේ ප්‍රශ්නය ඒ තැනට ගිහිල්ලා තිබෙනවා. අපි මේ ගැන බොහොම පැහැදිලිව මේ කරුණු කියන්න ඕනෑ. මේ අමුද්‍රව්‍යවල හිඟයක් තිබෙනවා. ඇෆ්ලටොක්සීන් සම්බන්ධව ප්‍රශ්නයක් තිබෙනවා. හැබැයි, ඒකත් එකක්ම ගැට ගැහුණු දෙයක් තිබෙනවා. මම දන්නේ නැහැ ඒක දේශපාලනමය අවශ්‍යතාවක් ද, වෙළෙඳ ව්‍යාපාරයක අවශ්‍යතාවක් ද කියලා. ඒ සම්බන්ධවත් බොහෝ කරුණු ගණනාවක් තිබෙනවා.

ඒ වාගේම ගරු කථානායකතුමනි, හම්බන්තොට, සූරියවැව ප්‍රදේශයේ දරුවන් සියයට 80කට මන්දපෝෂණය තිබෙනවා කියලා ඊයේ කිව්වා. අද මන්දපෝෂණය සම්බන්ධයෙන් ඉදිරිපත් කර තිබෙන වාර්තාව මම **table*** කරන්නම්.

අද වනවිට මන්දපෝෂණ තත්ත්වය සියයට 5කටත් වඩා අඩුයි කියලා සහතික කරනවා, අධ්‍යක්ෂවරයා සහ කලාප ලේකම්තුමිය. බොහොම පැහැදිලිව සහතික කරලා තිබෙනවා. දැන් මෙතැන ප්‍රශ්නය තිබෙන්නේ මේකයි. "මොන පදනමක් මත ද දරුවන් සියයට 80කට මන්දපෝෂණය කියලා කිව්වේ" කියලා එතුමාගෙන් ඇහුවාම කිව්වා, "එන ළමයින්ගේ බරයි, උසයි බලලා කිව්වා" කියලා. මෙවැනි ප්‍රාථමික තත්ත්වයකට ගිහිල්ලා කරන ප්‍රාථමික ප්‍රකාශ තුළ ඔබතුමන්ලා ඉඳගෙන මේ විධියට විවේචනයට ලක් කරනවා නම් මම හිතනවා, පාර්ලිමේන්තුව තුළ ඇති කරන කමිටුවකින් හෝ මේ ගැන විවෘතව කථා කළ යුතුයි කියලා. මේ ගැන අපට හංගන්න දෙයක් නැහැ.

මම එක වෛද්‍යවරයෙක් ගැන කියන්නම්. එතුමා අපෙන් නාම යෝජනා ඉල්ලපු වෛද්‍යවරයෙක්. එතුමාට නාම යෝජනා දෙන්න බැරිව ගියා. නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමා ඒක හොඳාකාරවම දන්නවා. ඔහු දැන් හතර වතාවක් පමණ එළියට ඇවිල්ලා කියනවා, මේක අඩුයි, මේක අඩුයි කියලා. හැබැයි, අධ්‍යක්ෂතුමාගෙන් මම වාර්තාවක් ගෙන්වා ගත්තා. ඒ අඩුයි කියපු සියලු දේ ප්‍රමාණවත්ව තිබෙනවා. හැබැයි, ඒකට publicity දෙන්නේ නැහැ; ඒ ගැන පත්තර විස්තරයෙන් කියවන්නේ නැහැ.

ඒ නිසා සෞඛ්‍ය අංශයේ කටයුතු ගැන කථා කිරීමේදී පුවත් පතක් සමඟ ගැති වෙච්ච වෙළඳ දැන්වීම් එක්ක ගැට ගැසෙන කරුණු සම්බන්ධව මීට වඩා වුවමනාවෙන් කරුණු ඉදිරිපත් කරන්න, එහෙම නැත්නම් සොයා බලන්න කියලා මම තමුන්නාන්සේලාගෙන් ඉල්ලා සිටිනවා. අමාත්‍යවරයා හැටියට මම ඕනෑම වෙලාවක, ඕනෑම අවස්ථාවක ඒ සම්බන්ධයෙන් විවෘත සාකච්ඡාවක් පැවැත්වීමට සූදානම්. අමාත්‍යාංශයට ඇවිල්ලා හෝ පාර්ලිමේන්තුවේදී හෝ කමක් නැහැ, ඒ සම්බන්ධයෙන් බොහොම පැහැදිලිව උත්තර දීමට මම සූදානම්.

හම්බන්තොට සිටින දරුවන්ගේ තත්ත්වය ගැනත් ඒ පුද්ගලයා කියා තිබෙනවා. නමුත්, ඒ සම්බන්ධ විද්‍යාත්මක පදනම ඔහුට කියන්න බැහැ. එවැනි ප්‍රකාශයක් කිරීමට ඔහු පදනම් කර ගත්ත කාරණා මොනවාද කියලා අපි ලිඛිතව ඉල්ලා තිබෙනවා. නමුත්, ඔහුට ඒ කරුණු ඉදිරිපත් කරන්න බැරි තත්ත්වයක් තමයි තිබෙන්නේ. ඒ නිසා අපි ඒවා මෙතැන කියාගෙන රටේ සමාජයට යම් පණිවුඩයක් දෙන්න යනවා නම්, ඒක හරිද, වැරැදිද කියන එක තමන්ගේ හෘදය සාක්ෂියත් එක්ක බේරා ගන්න ඕනෑ ප්‍රශ්නයක්.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

** ලියවිල්ල ඉදිරිපත් නොකරන ලදී.*
*ஆவணம் சமர்ப்பிக்கப்படவில்லை.*
*Document not tendered.*

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)

ගරු ඇමතිතුමනි, ඔබතුමා ඔය කියන විධියට අපට තොරතුරු ගන්න වෙන්නේ, පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්ගෙන් සහ වෛද්‍යවරුන්ගෙන් නේ. එතුමන්ලා ලබා දෙන තොරතුරු සාවද්‍ය නම්, ඔබතුමන්ලාට පුළුවන් ඒ වෙනුවෙන් විනය ක්‍රියාමාර්ග ගන්න. හැබැයි, ඔබතුමන්ලා නාම යෝජනා දීපු නැති නිසා මෙහෙම කරනවාය කියන එක බැහැර වෙන්න ඕනෑ කාරණාවක්. ඊළඟට කිව්වා, "අරුණ" පුවත් පත ඔබතුමන්ලාට විරුද්ධව දේශපාලනය කරනවා කියලා. ඔබතුමා එහෙම කියනවා නම් ඒක හාස්‍යයට කරුණක්. මේ කාරණයේ ගැබ් වෙලා තිබෙන්නේ ඇත්ත ප්‍රවෘත්තියක්. මොකද, ඔය වෛද්‍යවරයා කියන කථාව අසත්‍යයක් වෙන්න බැහැ කියලා අපි විශ්වාස කරන්නේ මේ නිසා. එතුමා සූරියවැව ප්‍රදේශය ගැන කථා කළා; මන්දපෝෂණය මෙච්චර ප්‍රමාණයකට තිබෙනවා කියලා එහි මිනිස්සු කථා කළා. ඉතින්, මේ කරුණු කාරණා එක්ක තමයි සමාජය තුළ යම් ගොනු වීමක් තිබෙන්නේ. ගරු ඇමතිතුමනි, මෙවාට වග කිවයුතු නිලධාරින් ඉන්නවා නම්, පෞද්ගලිකත්වයට එහා ගිහිල්ලා ඔවුන්ගෙන් ඒ තොරතුරු ලබා ගෙන පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනවා නම් වඩාත් වැදගත් වෙනවා.

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய றம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)

ගරු මන්ත්‍රීතුමා, ඔය ප්‍රශ්න දෙකේ තිබෙන විද්‍යාත්මක පදනම සම්බන්ධව මම කරුණු ඉදිරිපත් කරන්නම්. එතකොට ඔබතුමාටත්, අපටත් පුළුවන් විද්‍යාත්මක පදනම තුළ යනවාද, එසේ නැත්නම් විවිධ තොරතුරු එක්ක මේ ගනුදෙනුව බේරා ගන්නවාද කියලා තීන්දු කරන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 5 -674/2022- (1), ගරු කිංස් නෙල්සන් මහතා.

**ගරු කිංස් නෙල්සන් මහතා**
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

ගරු කථානායකතුමනි, ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 6 -2645/2022- (1), ගරු ගාමිණී වලේබොඩ මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

## "කෘෂි අපනයන ගම්මාන" වැඩසටහන: නැවත ක්‍රියාත්මක කිරීම
## "விவசாய ஏற்றுமதிக் கிராமங்கள்" நிகழ்ச்சித்திட்டம்: மீளச் செயற்படுத்தல்
## "AGRICULTURE EXPORT VILLAGES" PROGRAMME: RESUSCITATION

2648/2022

**7. ගරු යූ.කේ. සුමිත් උඩුකුඹුර මහතා**
(மாண்புமிகு யூ.கே. சுமித் உடுகும்புர)
(The Hon. U.K. Sumith Udukumbura)

වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) මීට වර්ෂ කිහිපයකට පෙර "කෘෂි අපනයන ගම්මාන" නමින් වැඩසටහනක් සාර්ථකව ක්‍රියාත්මක වූ බවත්;

(ii) මේ වනවිට එම වැඩසටහන නිසි පරිදි ක්‍රියාත්මක නොවන බවත්;

එතුමා දන්නේද?

(ආ) එසේ නම්, "කෘෂි අපනයන ගම්මාන" වැඩසටහන නැවත ක්‍රියාත්මක තත්ත්වයට ගෙන ඒම සඳහා අමාත්‍යාංශය විසින් ගනු ලබන පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) சில வருடங்களுக்கு முன்னர் "விவசாய ஏற்று மதிக் கிராமங்கள்" என்ற பெயரில் நிகழ்ச்சித் திட்டமொன்று வெற்றிகரமாக நடைமுறைப் படுத்தப்பட்டது என்பதையும்;

(ii) தற்போது அந்நிகழ்ச்சித்திட்டம் உரிய முறையில் நடைமுறைப்படுத்தப்படவில்லை என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) ஆமெனில், "விவசாய ஏற்றுமதிக் கிராமங்கள்" நிகழ்ச்சித் திட்டத்தை மீண்டும் செயற்பாட்டு நிலைக்குக் கொண்டுவருவதற்காக அமைச்சினால் மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Plantation Industries:

(a) Is he aware that -

(i) a programme known as "Agriculture Export Villages" was successfully underway a few years ago; and

(ii) the said programme does not function properly at present?

(b) Will he inform this House of the measures that the Ministry would take to resuscitate the "Agriculture Export Villages" programme?

(c) If not, why?

**ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා (වැවිලි කර්මාන්ත අමාත්‍ය සහ කර්මාන්ත අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ரமேஷ் பதிரண - பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சரும் கைத்தொழில் அமைச்சரும்)
(The Hon. (Dr.) Ramesh Pathirana - Minister of Plantation Industries and Minister of Industries)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) 2021 සිට 2023 වසර දක්වා අපනයන කෘෂි කලාප 1000ක් ස්ථාපිත කිරීම අරමුණු කරගෙන අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා කජු සංස්ථාව, දිස්ත්‍රික් ලේකම් කාර්යාල සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල යන ආයතන සම්බන්ධීකරණයෙන් උක්, බඩඉරිඟු, කජු, ගම්මිරිස්, කුරුඳු, කරාබු නැටි, බුලත් ආශ්‍රිත කර්මාන්ත සහ අපනයන ප්‍රවර්ධන ඇතුළු කුඩා වැවිලි භෝග සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක කරන ලද මෙම වැඩසටහන මඟින් 2021 වර්ෂයේ අපනයන කෘෂි කලාප 261ක් සාර්ථකව ස්ථාපිත කරන ලදී.

එම විස්තර ඇමුණුම 01හි දක්වා ඇත.

| **2021** | |
|---|---|
| **කලාප වර්ගය** | **ප්‍රමාණය** |
| **අපනයන කෘෂි බෝගවලින් යුත් කලාප** | **154** |
| **මී මැසි පාලන කලාප** | **12** |
| **අඹ කලාප** | **71** |
| **අඹ + කජු** | **2** |
| **කජු** | **16** |
| **පලතුරු** | **5** |
| **අපනය කෘෂි භෝග + මී මැසි පාලන** | **1** |
| **එකතුව** | **261** |

(ii) 2022 වර්ෂය සඳහා එම වැඩසටහන, මුදල් අමාත්‍යාංශය විසින් ආරම්භ කරන ලද ජීවනෝපාය වැඩිදියුණු කිරීමේ සහ ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහනට සමගාමීව ක්‍රියාත්මක කිරීමට යෝජනා වීම හේතුවෙන් සහ අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ දැනට සිදු කරන ව්‍යාපෘති හා සමාන වීම වැළැක්වීම සඳහාත් සුළු අපනයන වැවිලි භෝග සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය හා මුදල් අමාත්‍යාංශය යන අමාත්‍යාංශ දෙකෙහිම අරමුණු එක්ව ගෙන මෙම වැඩසටහනේ නම "අපනයන කෘෂිකර්ම කලාප - ජීවනෝපාය වැඩිදියුණු කිරීම සඳහා වන දිස්ත්‍රික් පාදක කුඩා වැවිලි භෝග සංවර්ධන ව්‍යාපෘතිය" ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගන්නා ලදී.

ඒ අනුව මේ වන විට වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය සුළු අපනයන වැවිලි භෝග සංවර්ධන අංශය යටතේ මෙම වැඩසටහන ක්‍රියාත්මක වන අතර අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් කුළුබඩු ආශ්‍රිත අපනයන කෘෂි කලාප පිහිටුවීම ආරම්භ කර ඇති අතර මහ කන්නය සඳහා අපනයන කෘෂි භෝග වගාවන් ආරම්භ කිරීම සඳහා අවශ්‍ය රෝපණ ද්‍රව්‍ය සහ පුහුණු වැඩසටහන් ප්‍රතිලාභීන්හට ලබා දීම සඳහා අවශ්‍ය කටයුතු සාර්ථකව ක්‍රියාත්මක වේ. එසේම, කජු වගාව ආශ්‍රිත කෘෂි කලාප ශ්‍රී ලංකා කජු සංස්ථාව විසිනුත්, TJC අඹ වගාව සහ මී මැසි කලාප අමාත්‍යාංශය විසින් දිස්ත්‍රික් ලේකම් කාර්යාල සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහාත් ක්‍රියාත්මක කෙරේ.

ඒ අනුව, 2022 වර්ෂය සඳහා මේ වන විට පහත සඳහන් පරිදි අපනයන කෘෂි කලාප 335ක් ස්ථාපිත කිරීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කර ඇත. අපනයන කෘෂි කලාප පිළිබඳ විස්තර ඇමුණුම 02හි දක්වා ඇත.

| 2022 | | |
|---|---|---|
| අපනයන කෘෂි භෝග කලාප | 303 | මෙම සියලු කලාපවල වැඩ ආරම්භ කර ඇති අතර, ඉල්ලුම්පත්‍ර ලබා ගැනීම, ගොවි පුහුණු කිරීම් හා ඉඩම් පරීක්ෂණ අවශ්‍ය පරිදි සිදුකර ඇත. කලාප 181ක ඉඩම් සකස් කළ ගොවීන් සඳහා පැළ නිකුත් කිරීම ආරම්භ කර ඇත. මෙම වසර තුළ මෙම කලාපවල අපනයන කෘෂි භෝග පැළ ලබා දීම පමණක් සිදුවන අතර, එම පැළ යල, මහ කන්න දෙකටම ලබාදීමට සැලසුම් කර ඇත. මෙම පැළ ලබාදීමේදී ප්‍රධාන ලෙස කුරුඳු පැළ නිකුත් කරනු ලබන අතර, එය මුළු පැළ අවශ්‍යතාවෙන් සියයට 83කි. කුරුඳු බීජ පැළ නිෂ්පාදනය සඳහා බීජ ජුනි-ජූලි මාසවලදී ලැබෙන බැවින් එයින් නිෂ්පාදිත පැළ නිකුත් කිරීම සැප්තැම්බර් අග වනවිට ආරම්භ කරනු ලැබේ. |
| TJC අඹ කලාප | 6 | ත්‍රිකුණාමලය, කුරුණෑගල, මාතලේ යන දිස්ත්‍රික්කයන්හි කලාප තුනක් ස්ථාපිත කර අවසන් අතර ඉතිරි කලාප සඳහා පැළ බෙදා දීම සිදු කෙරෙමින් පවතී. |
| මී මැසි | 25 | ගම්පහ, මාතලේ, රත්නපුර දිස්ත්‍රික්කයන්හි කලාප තුනක පුහුණුවීම අවසන් කර ඇත. |
| කජු | 1 | අවශ්‍ය පැළ නිෂ්පාදනය කරමින් පවතී. |
| මුළු කලාප ගණන | 335 | |

ඊට අනුකූලව අදාළ රෝපණ ද්‍රව්‍ය/පැළ නිකුත් කිරීම අදාළ කාලගුණික තත්ත්ව, භූමිය සකස් කිරීම සහ අනෙකුත් නිර්ණායක මත මේ වනවිට සිදු වෙමින් පවතී. 2022 වර්ෂය වෙනුවෙන් මෙම වැඩසටහන සඳහා අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වෙත රුපියල් මිලියන 400ක ප්‍රතිපාදන ලබා දී ඇති අතර TJC අඹ, කජු වගාව සහ මී මැසි පාලන කලාප සඳහා මිලියන 100ක ප්‍රතිපාදන වෙන් කර ඇත.

ඇමුණුම් 01 සහ 02 **සභාගත*** කරමි.

(ආ) නැවත ක්‍රියාත්මක තත්ත්වයට ගෙන ඒමක් අවශ්‍ය නොවන අතර මෙම වසර අවසන් වන විට දැනට යෝජිතව ඇති කලාප 335 ස්ථාපිත කර අවසන් කිරීමට අවශ්‍ය සැලසුම් සකස් කොට ඇත.

(ඇ) අදාළ නොවේ.

**ගරු යූ.කේ. සුමිත් උඩුකුඹුර මහතා**
(மாண்புமிகு யூ.கே. சுமித் உடுகும்புர)
(The Hon. U.K. Sumith Udukumbura)
ගරු ඇමතිතුමනි, පිළිතුර ලබා දුන්නාට ස්තුතියි. පළමුවෙන්ම මම ඔබතුමාගෙන් දැන ගන්න කැමැතියි, වාර්ෂික අපනයන භෝගවලින් ලැබෙන ආදායම කොපමණ ද කියලා.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ரமேஷ் பதிரண)
(The Hon. (Dr.) Ramesh Pathirana)

ගිය වසරේ අපනයන කෘෂිකර්මය ආශ්‍රිත කුරුඳු, ගම්මිරිස් ඇතුළු ද්‍රව්‍ය අපනයනයෙන් ඩොලර් මිලියන 460ක මුදලක් උපයා ගෙන තිබෙනවා. අපි හිතනවා, එම ප්‍රමාණයම මේ වසරේදීත් වාර්තා කිරීමට හැකි වෙයි කියලා.

**ගරු යූ.කේ. සුමිත් උඩුකුඹුර මහතා**
(மாண்புமிகு யூ.கே. சுமித் உடுகும்புர)
(The Hon. U.K. Sumith Udukumbura)

ඩොලර් ලබා ගැනීමට අපට විශාල පිටුවහලක් වෙන්නේ අපනයන භෝග වෙළෙඳාමයි. මම මේ කාරණයත් ඔබතුමාගෙන් දැන ගන්න කැමැතියි, ගරු ඇමතිතුමනි. සාම්ප්‍රදායික භෝග අපනයනය කිරීමට වඩා, ඒ සඳහා අගය එකතු කිරීමක් කළොත් විශාල ඩොලර් ආදායමක් ලබා ගන්න අපට හැකි වෙයි. ඒ සඳහා ඔබ අමාත්‍යාංශය විසින් මොකක් හරි වැඩ පිළිවෙළක් සකස් කර තිබෙනවා ද?

**ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ரமேஷ் பதிரண)
(The Hon. (Dr.) Ramesh Pathirana)

2020 වසරට සාපේක්ෂව 2021 වසරේ අපනයන ආදායමෙහි මුදල්මය වශයෙන් සියයට 30ක වැඩි වීමක් සිදු වුණා. අපනයන කෘෂිකර්ම ක්ෂේත්‍රයේ විතරක් නොවෙයි, වැවිලි කර්මාන්ත ක්ෂේත්‍රයේ තේ හැර අනෙකුත් සෑම එකකම සියයට 25ක් වැඩි වෙලා තිබෙනවා. අගයදාමය එකතු කිරීමේ වැඩසටහන් වෙනුවෙන් ආසියානු සංවර්ධන බැංකු ණය ආධාර යටතේ කෘෂිකර්ම නවීකරණ ව්‍යාපෘතිය හරහා අපි කර්මාන්ත විශාල ප්‍රමාණයකට ආධාර ලබා දීලා තිබෙනවා. ඒ හරහා අගය එකතු කිරීමේ ක්‍රියාදාමයන් වැඩි කිරීමට විශාල පිටුබලයක් ලැබිලා තිබෙනවා. සමහර කර්මාන්ත දැනටමත් කටයුතු ආරම්භ කරලා තිබෙනවා. ඊට අමතරව, තවත් විවෘත කළ යුතු කර්මාන්ත කිහිපයකුත් මේ වන විට වැඩ අවසන් වෙමින් තිබෙනවා.

## සූර්ය විදුලිබල පද්ධති ස්ථාපනය කිරීම: මුහුණ දෙන දුෂ්කරතා
### சூரிய சக்தி மின் கட்டமைப்புகளை நிறுவுதல்: முகங்கொடுக்கும் சிரமங்கள்
### INSTALLATION OF SOLAR POWER SYSTEMS: DIFFICULTIES FACED

2658/2022

**8. ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය**
(மாண்புமிகு (திருமதி) கோகிலா குணவர்தன)
(The Hon. (Mrs.) Kokila Gunawardene)

විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) සූර්ය විදුලිබල පද්ධති ලබා ගැනීම සඳහා ජනතාව දැඩි උනන්දුවක් දක්වන බවත්;

(ii) එහෙත් පැනල් හා ඉන්වර්ටර් මිල ඉතා අධික වීම හේතුවෙන් සූර්ය විදුලිබල පද්ධති ලබා ගැනීමේ දුෂ්කරතා මතු වී ඇති බවත්;

එතුමා දන්නේද?

(ආ) (i) සූර්ය විදුලිබල පද්ධති, පැනල් සහ ඉන්වර්ටර් ඇතුළු අවශ්‍ය උපකරණ පහසු මිලට ලබාගැනීම සඳහා වැඩ පිළිවෙළක් සකස් කර තිබේද;

(ii) සූර්ය විදුලිබල පද්ධති සවි කරනු ලබන ආයතන විසින් විවිධ මිල ගණන් යටතේ ඒවා අළෙවි කරනු ලබන බව දන්නේද;

(iii) එසේ නම්, එම පද්ධති සඳහා නිශ්චිත මිලක් නියම කිරීමට කටයුතු කරන්නේද;

(iv) සවි කරන ලද එම පද්ධති සඳහා, ලංකා විදුලිබල මණ්ඩලයේ සම්බන්ධතාවය ලබා දීමේදී පවතින ප්‍රමාදය මඟහරවා ගැනීමට වැඩ පිළිවෙළක් සකස් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

மின்சக்தி மற்றும் வலுசக்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) சூரிய சக்தி மின் கட்டமைப்புகளைப் பெற்றுக் கொள்வதற்குப் பொதுமக்கள் அதிக ஆர்வம் காட்டுகின்றனர் என்பதையும்;

(ii) ஆயினும், சூரியப் படலங்கள் - பெனல் - மற்றும் மாறுதிசையாக்கிகளின் - இன்வெர்ட்டர்களின் - விலைகள் அதிகமாக இருப்பதன் காரணமாகச் சூரிய சக்தி மின் கட்டமைப்புகளைப் பெற்றுக் கொள்வதில் சிரமங்கள் ஏற்பட்டுள்ளன என்பதை யும்;

அவர் அறிவாரா?

(ஆ) (i) சூரிய சக்தி மின் கட்டமைப்புகள், சூரியப் படலங்கள் மற்றும் மாறுதிசையாக்கிகள் உட்பட தேவையான உபகரணங்களைக் கட்டுப்படியான விலைகளில் பெற்றுக்கொள்வதற்கான வேலைத் திட்ட மொன்று தயாரிக்கப் பட்டுள்ளதா என்பதையும்;

(ii) சூரிய சக்தி மின் கட்டமைப்புகளைப் பொருத்தும் நிறுவனங்களால் பல்வேறுபட்ட விலைகளில் அவை விற்பனை செய்யப்படுவதை அறிவாரா என்பதையும்;

(iii) ஆமெனில், அக்கட்டமைப்புகளுக்கு நிலையான விலையொன்றை விதிப்பதற்கு நடவடிக்கை மேற்கொள்ளப்படுமா என்பதையும்;

(iv) பொருத்தப்பட்டுள்ள சூரிய சக்தி மின் கட்ட மைப்புகளுக்கு, இலங்கை மின்சார சபையின் இணைப்பை வழங்குவதில் நிலவுகின்ற தாமதத்தைத் தவிர்ப்பதற்கான வேலைத்திட்ட மொன்று தயாரிக்கப்படுமா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Power and Energy:

(a) Is he aware that -

(i) people are very keen to obtain solar power systems;

(ii) but, owing to the very high prices of panels and inverters, they have faced difficulties in obtaining solar power systems?

(b) Will he inform this House -

(i) whether an arrangement has been made for the people to buy solar power systems and required equipment including panels and inverters at affordable prices;

[ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය]

(ii) whether he is aware that institutions that install solar power systems make the installations at different rates;

(iii) if so, whether steps would be taken to determine a fixed price for the said systems; and

(iv) whether an arrangement would be put in place to prevent the delay in Ceylon Electricity Board connections being given for the installed solar power systems?

(c) If not, why?

**ගරු කංචන විජේසේකර මහතා (විදුලිබල සහ බලශක්ති අමාත්‍යතුමා)**

(மாண்புமிகு கஞ்சன விஜேசேகர - மின்சக்தி மற்றும் வலுசக்தி அமைச்சர்)

(The Hon. Kanchana Wijesekera - Minister of Power and Energy)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) සහ (ii) - ඔව්.

(ආ) (i) මේ සඳහා ආසියානු සංවර්ධන බැංකුව ණය ආධාර උපයෝගි කර ගනිමින් ණය යෝජනා ක්‍රමයක් ඇති කර අඩු පොලියක් යටතේ ඒ සඳහා ආයෝජනය කිරීමට උනන්දුවක් දක්වන පාරිභෝගිකයන්හට ණය ලබා දීමට අවශ්‍ය කටයුතු කරනු ලැබීය. එහි දෙවන අදියර ලෙස තවදුරටත් ණය ලබා දීමේ වැඩසටහන් සැකසීමට අවශ්‍ය මූලික කටයුතු ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් සිදු කරමින් පවතී.

(ii) ඔව්.

වෙළෙඳ පොළේ පවත්නා තරගකාරී මිල ගණන් යටතේ විවිධ මාදිලියේ සූර්යබල පැනල නිෂ්පාදනය කරනු ලබන රටවල සන්නාම යටතේ විවිධ මිල ගණන්වලට අළෙවි කරනු ලබයි. එය ශ්‍රී ලංකාවට පමණක් සීමා වූ තත්ත්වයක් නොව, විවිධ වෙළෙඳ පොළ ආර්ථික තිබෙන සියලු රටවලට අදාළ වේ.

(iii) සූර්ය බල පද්ධති සඳහා සහතික කරනු ලැබූ මිලක් - benchmark එකක් - ඇති කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් අධ්‍යයනය කරමින් සිටින අතර, පවතින විදේශ සංචිත හිඟතාව හේතුවෙන් මෑත කාලයේදී මිල ගණන් උච්චාවචනය වී ඇත. එමෙන්ම සූර්ය විදුලි බල පද්ධති නිෂ්පාදනය කරනු ලබන රටවල හා ඒ නිෂ්පාදිතයන්ගේ කීර්තිනාමය පදනම් කර ගනිමින් හා එම පැනලවල ජීව කාලය පදනම් කර ගනිමින් සූර්ය පැනල හා පද්ධතින්ගේ මිල ගණන් වෙනස් වේ.

(iv) ඒ සඳහා ලංකා විදුලිබල මණ්ඩලයේ පාරිභෝගිකයන්ට මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ සූර්යබල පද්ධති සඳහා අනුමැතින් ලබා ගැනීමේ පහසුකම් සපයා ඇත. ඒ අනුව https://ceb.lk/ වෙබ් අඩවිය මඟින් ඒ සඳහා ධාරිතාව සඳහන් කරමින් සූර්ය බල පද්ධතිය ජාතික ජාලයට එකතු කිරීම පිළිබඳව පූර්ව අනුමැතියද ලබා ගැනීමට හැකියාව ඇත.

(ඇ) අදාළ නොවේ.

**ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය**

(மாண்புமிகு (திருமதி) கோகிலா குணவர்தன)

(The Hon. (Mrs.) Kokila Gunawardene)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, අපි දන්නවා අද රටේ විශාල විදුලි අර්බුදයක් තිබෙන බව. ඔබතුමා ඉතාම හොඳින් එය කළමනාකරණය කරගෙන යාම ගැන අපි සතුටු වෙනවා. සූර්ය බල පද්ධති වැඩි වශයෙන් පාවිච්චි කිරීම තුළ මේ අර්බුදය තවදුරටත් නිරවුල් කර ගන්න පුළුවන්කම තිබෙනවා කියලා අපි විශ්වාස කරනවා. විශේෂයෙන්ම මහා පරිමාණ කර්මාන්තවලට වාගේම කුඩා පරිමාණ කර්මාන්තවලටත් යම් සහනදායී ක්‍රමයකට මේවා ලබා දීමේ වැඩ පිළිවෙළක් සකස් කරන්න ඔබතුමාට පුළුවන්ද? විශේෂයෙන්ම පන්සල් ගැන දිගින් දිගටම කථා වුණා. ඒ පන්සල්වලට සූර්ය බල පද්ධති ලබා දෙන්න, අඩුම තරමින් ඒ සඳහා බදු සහනයක් හෝ ලබා දෙන්න වැඩ පිළිවෙළක් ඔබතුමා සකස් කරලා තිබෙනවාද?

**ගරු කංචන විජේසේකර මහතා**

(மாண்புமிகு கஞ்சன விஜேசேகர)

(The Hon. Kanchana Wijesekera)

ගරු කථානායකතුමනි, විදුලි මිල සංශෝධනය කිරීම පිළිබඳව සාකච්ඡා වෙන මේ මොහොතේ විශේෂයෙන්ම පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති කෙරෙහිත් වැඩියෙන් අවධානය යොමු වී තිබෙනවා.

ඒ අනුව විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය වශයෙන් අපි ලංකා විදුලිබල මණ්ඩලයටත්, ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියටත්, LECO ආයතනයටත් -මේ ආයතන තුනටම- උපදෙස් ලබා දීලා තිබෙනවා, ඔවුන්ගේ ආයතන හරහා ලබා ගන්න පුළුවන් විවිධ ණය ක්‍රම යටතේ, ආගමික සිද්ධස්ථානවලට පමණක් නොව, ව්‍යාපාරික ස්ථානවලට, ගෘහස්ථ විදුලි අවශ්‍යතා සම්පූර්ණ කිරීමට, හෝටල් සහ රජයේ ගොඩනැඟිලිවලට සූර්ය පැනල ලබා දීමට. පාරිභෝගිකයාගේ අවශ්‍යතාව සම්පූර්ණ වන ආකාරයට, පසුගිය කාලයේදී ඔවුන් විසින් ගෙවන ලද විදුලි බිලට සමාන මුදලක් ගෙවීමේ පදනම මත සූර්ය පැනල ලබා දීමේ වැඩ පිළිවෙළක් අපි මේ වනකොට ආරම්භ කරලා තිබෙනවා. ඒ සඳහා අවශ්‍ය මුදල් නිදහස් කර ගැනීමට අපි ප්‍රධාන රාජ්‍ය බැංකු දෙක සමඟ සාකච්ඡා කර තිබෙනවා.

මීට අමතරව, මම ඊයේ දිනයේදීත් සඳහන් කළ ආකාරයට ඩොලර් මිලියන සියයක ඉන්දියානු ණය ක්‍රමය යටතේ තාක්ෂණිකව අවශ්‍ය වන කාරණා අපි මේ වනවිට සම්පූර්ණ කර තිබෙනවා. සැපයුම්කරුවන් තෝරා ගැනීමේ කටයුත්ත මේ වනවිට ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලයේ මැදිහත්වීම මත සිදු සිදු කරනවා. විශේෂයෙන් ආගමික සිද්ධස්ථාන 2,000ක් මේ තුළින් ආවරණය කිරීමට අපි බලාපොරොත්තු වනවා. ඊට අමතරව, ආසියානු සංවර්ධන බැංකුව මඟින් එක කොටසක වැඩ කටයුතු අවසන් කළා. දෙවන කොටස සඳහා ඩොලර් මිලියන 250ක ණය මුදලක් ලබා දෙන්නයි කටයුතු කරමින් සිටියේ. ප්‍රතිව්‍යුහගත කිරීමේ කටයුතු සිදු වන නිසා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ සාකච්ඡා කරලා, ඒ ණය මුදලත් ලබා ගැනීමට අපි කටයුතු කරනවා.

ඊළඟට, සෞඛ්‍ය ඇමතිතුමාගේ මූලිකත්වයෙන් මේ වනවිට සියලුම රෝහල්වල වහලය මත සූර්යබල පද්ධති සවි කිරීම සඳහා වැඩ පිළිවෙළක් ආරම්භ කර තිබෙනවා. අධ්‍යාපන අමාත්‍යාංශය

යටතේ තිබෙන සියලුම පාසල් ගොඩනැඟිලිවලත් ඒ කටයුත්ත සිදු කිරීම මේ වනවිට ආරම්භ කර තිබෙනවා. නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය යටතේ, අඩු ආදායම්ලාභී පවුල් වෙසෙන නිවාස ඒකක සඳහාත් මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීමට මේ වනවිට ප්‍රවේශයක් ලබා දීලා තිබෙනවා. පළාත් සභා මට්ටමිනුත් මේ වෙනුවෙන් යම් කාර්යභාරයක් සිදු කිරීම අපි මේ වනවිට ආරම්භ කර තිබෙනවා. ඒ වාගේම, කර්මාන්ත අමාත්‍යතුමා සමඟ සාකච්ඡා කරලා, කර්මාන්තශාලාවලටත් අවශ්‍යතාව අනුව ඒ පහසුකම් සපයන්න අපි බලාපොරොත්තු වනවා. නමුත්, විදේශ විනිමය නොමැතිකම -විදේශ විනිමය අඩුපාඩුව- නිසා සූර්ය පැනල සවි කිරීම සඳහා අවශ්‍ය වන බැටරි, inverters වාගේ දේවල් ආනයනය කිරීම සම්බන්ධයෙන් අපට අභියෝගයක් තිබෙනවා, ගරු කථානායකතුමනි. නමුත්, අපි මුදල් අමාත්‍යාංශයත් සමඟ සාකච්ඡා කරලා තිබෙනවා, ඒ අවශ්‍යතා වෙනුවෙන් ප්‍රමුඛතාවක් ලබා දීලා ඒ කටයුත්ත සම්පූර්ණ කරන්න.

ආගමික සිද්ධස්ථානවල සහ අනිකුත් ස්ථානවල විදුලි බිල වැඩිවීම පිළිබඳව ගරු කෝකිලා ගුණවර්ධන මන්ත්‍රීතුමිය කියපු කාරණයට අදාළවම විපක්ෂ නායකතුමාත්, විපක්ෂයේ මන්ත්‍රීවරුත් කරුණු දැක්වූවා. ඊයේ දවසේ මම නායක ස්වාමීන් වහන්සේලා සහ අනිකුත් ආගමික පූජකතුමන්ලා මුණ ගැහුණා. සමහර වෙලාවට බොහෝ අය තුළ වැරදි අවබෝධයකුත් තිබුණා, විදුලි උත්පාදන වියදම පිළිබඳව. මොකද, විදුලි උත්පාදන වියදම පිළිබඳව අවබෝධයකින් නොවෙයි අපි පසුගිය කාලයේම කටයුතු කළේ.

මා මුණ ගැහුණු නායක ස්වාමීන් වහන්සේලාත් හිතුවේ විදුලිය ඒකකයක් උත්පාදනය කිරීම සඳහා වැය වන්නේ රුපියල් 16ක මුදලක් කියලා. නමුත්, අද වන විට විදුලි ඒකකයක් උත්පාදනය කිරීම සඳහා රුපියල් 48ත්, රුපියල් 55ත් අතර මුදලක් වැය වෙනවා. ගරු කථානායකතුමනි, ජනවාරි මාසයේ ගල් අඟුරු කිලෝග්‍රෑම් එකක මිල රුපියල් 24ක් ලෙස තිබුණත්, අද වන විට එය රුපියල් 114ක් බවට පත් වෙලා තිබෙනවා. රුපියල් 190කට තිබුණු ඩීසල් ලීටරයක මිල අද රුපියල් 430ක් දක්වා වර්ධනය වෙලා තිබෙනවා. රුපියල් 100ක් වුණු දැවි තෙල් ලීටරයක මිල අද රුපියල් 400ක් පමණ දක්වා වර්ධනය වෙලා තිබෙනවා. ඒ අනුව මේ හැම එකකම මිල හතර ගුණයකින් වර්ධනය වෙලා තිබෙනවා.

අප ගණනය කළ ආකාරයට, පසුගිය අවුරුද්දේ -2021 අවුරුද්දේ- විදුලිය ලබා දීම තුළ විදුලිබල මණ්ඩලයට පාරිභෝගිකයන්ගෙන් ලැබුණේ රුපියල් බිලියන 289ක වාගේ මුදලක්. නමුත්, සත්‍ය වශයෙන්ම වැය වෙලා තිබෙනවා, රුපියල් බිලියන 800කට ආසන්න ප්‍රමාණයක්. ඒක ලබා ගන්න තමයි ලංකා විදුලිබල මණ්ඩලය ඉල්ලීම් කළේ, විදුලි බිල වැඩි කරන්න. නමුත්, මහජන උපයෝගිතා කොමිසම රුපියල් බිලියන 500ක් ලබා ගන්න ක්‍රමවේදය තමයි ලබා දීලා තිබෙන්නේ. නමුත්, අපි බලනවා, එක පැත්තකින් උත්පාදන වියදමත් අඩු කරගෙන අපේ තිබෙන ප්‍රතිව්‍යූහගත කිරීමේ වැඩ පිළිවෙළත් කරන්න. මොකද, උන් වහන්සේලා දිගින් දිගටම කරුණු දැක්වූවා, මේ ආයතනයේ 26,000ක් වැනි සේවක පිරිසක් ඉන්නා බවත්, ඒ වෙනුවෙන් යන වියදම ගැනත්. ඒ වාගේම, උන් වහන්සේලාම ඉල්ලීමක් කළා, කාටවත් නොමිලේ විදුලිය ලබා දෙන ක්‍රමවේදය කරන්න එපා කියලා. පූජා නගර ඇතුළු, තෝරා ගත්ත විවිධ ආගමික සිද්ධස්ථානවලට විතරක් නොමිලේ විදුලිය ලබා දෙන්න එපා, සියලුදෙනාටම එක හා සමානව මේ කටයුත්ත කරන්න කියලා උන්වහන්සේලා කිව්වා. ඒ අනුව තමයි අපි මේ ක්‍රියාවලිය යෝජනා කළේ. එය ක්‍රියාත්මක වනවා. සූර්ය පැනල මඟින් විදුලිය ලබා දීමේ ක්‍රමයට අවශ්‍ය තාක්ෂණික සහාය ලබා දෙන්න අපට පුළුවන්කමක් තිබෙනවා.

**ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය**

(மாண்புமிகு (திருமதி) கோகிலா குணவர்தன)

(The Hon. (Mrs.) Kokila Gunawardene)

ගරු ඇමතිතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි.

පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති මහා පරිමාණයෙන් ක්‍රියාත්මක කිරීමේදී, එය මිලදී ගැනීමේදී ගන්න මුදල -ප්‍රාග්ධනය- ගෙවීම් කරලා ඉවර වුණාට පසුවත් ඒ මුදලටම විදුලිය මිලදී ගන්නවාද? නැත්නම් ඊට වඩා අඩු මුදලකටද මිලදී ගැනීම් කරන්නේ?

**ගරු කංචන විජේසේකර මහතා**

(மாண்புமிகு கஞ்சன விஜேசேகர)

(The Hon. Kanchana Wijesekera)

ගරු මන්ත්‍රීතුමිය, වහලය මත සවි කරන සූර්ය පැනල සඳහා විදුලිය මිලදී ගැනීම සම්බන්ධයෙන් සංශෝධනයක් සිදු කරන්න අප බලාපොරොත්තු වෙනවා. මොකද, පවතින විදේශ විනිමය අනුපාතය සහ පොලී අනුපාත අනුව වෙනස්වීමක් සිදු කළ යුතුයි. හැබැයි, මේ මොහොතේ විදේශ විනිමය අනුපාතය සහ පොලී අනුපාතය ඉහළ අගයක පවතින්නේ. ඒක අපි අවුරුදු 20ක් තිස්සේ පවත්වාගෙන යන්න බලාපොරොත්තු වෙන දෙයක් නොවෙයි. ඒ නිසා අවුරුදු 20ක් සඳහා විදුලිය මිලදී ගැනීමට ගිවිසුම්ගත වීමේදී මේ තිබෙන මිල පාදක කරගෙන අවුරුදු 20ටම ගණන් හැදුවොත්, සමහර වෙලාවට පුනර්ජනනීය බලශක්තියෙන් විදුලිය නිෂ්පාදනය කිරීමට, ඉන්ධනවලින් විදුලිය උත්පාදනය කිරීමේදී වැය වන මුදලට වඩා වැඩි මුදලක් වැය වෙයි. ඒ නිසා අපි ඒ පිළිබඳවත් අවධානය යොමු කළ යුතුයි. නමුත්, මේ තිබෙන විදේශ විනිමය අනුපාත සහ පොලී අනුපාත තේරුම් අරගෙන කෙටි කාලයකට යම් ආකාරයක සහනයක් ලබා දෙන්නත්, ඊට පසුව දීර්ඝ කාලීනව විදුලිය මිලදී ගැනීමේදී ලංකා විදුලිබල මණ්ඩලයටත් පාඩුවක් නොවන ආකාරයට ඒ කටයුත්ත කිරීමටත් තමයි අපි බලාපොරොත්තු වන්නේ.

නමුත්, වහලය මත සූර්ය පැනල සවි කිරීම බොහෝ සමාගම් වාණිජමය කටයුත්තක් කරගෙනයි තිබෙන්නේ. අපි පාරිභෝගිකයන්ට තමන්ගේ වහලය මත සූර්ය පැනල සවි කර ගන්න කියන්නේ, ඔවුන්ගේ විදුලි පරිභෝජනය කළමනාකරණය කර ගන්නයි. මම නම් කියන්නේ, net plus වෙනුවට net metering සහ net accounting කියන systems පාවිච්චි කරන්න කියලායි. මෙහිදී මුදලක් හොයා ගන්නවා වෙනුවට, තමන්ගේ විදුලි පරිභෝජනය කළමනාකරණය කර ගැනීම සඳහා වහලය මත සූර්ය පැනල සවි කිරීමට පාරිභෝගිකයන් යොමු කරන්නයි අපි බලාපොරොත්තු වෙන්නේ.

**ගරු කථානායකතුමා**

(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)

(The Hon. Speaker)

ප්‍රශ්න අංක 9 -2689/2022- (1), ගරු වාසුදේව නානායක්කාර මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

දෙවන වටය. *[බාධා කිරීමක්]*

**ගරු කේ.පී.එස්. කුමාරසිරි මහතා**

(மாண்புமிகு கே.பி.எஸ். குமாரசிறி)

(The Hon. K.P.S. Kumarasiri)

ගරු කථානායකතුමනි, ඉතාම වැදගත් කාරණාවක් කියන්න මට පොඩි වෙලාවක් ලබා දෙන්න.

මා නියෝජනය කරන අනුරාධපුරය දිස්ත්‍රික්කයේ, බටහිර අනුරාධපුරය ආසනයේ, විලච්චිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සිද්ධාර්ථ මහා විද්‍යාලයේත්, කිඹුලාවැව ගාමිණී මහා විද්‍යාලයේත්, කිඹුලාවැව ආනන්ද විද්‍යාලයේත් -පාසල් තුනක- දරුවෝ 20දෙනකුට වඩා කෑම නැතිකම නිසා ඊයේ දවසේ සිහිසුන්ව වැටී තිබෙනවා. ඒ වාගේම, ගම්පහ දිස්ත්‍රික්කයේ මිනුවන්ගොඩ

[ගරු කේ.පී.එස්. කුමාරසිරි මහතා]

අධ්‍යාපන කොට්ඨාසයේ පාසලක දරුවකු දිවා ආහාරය සඳහා කුරුම්බා ලොඳ ගෙනැවිත් තිබෙනවා. කරුණාකර මේ පිළිබඳව සොයා බලා, මේ තත්ත්වය නැති කරන්න පුළුවන් තරම් ඉක්මනට වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න කියලා මම ගරු අධ්‍යාපන ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. ගරු ඇමතිතුමනි, රුපියල් 60කින් දරුවෙකුට දිවා ආහාරය දෙන්න බැහැ. ඒ සම්බන්ධයෙන් ලොකු ප්‍රශ්නයක් තිබෙනවා. මේ ගැන සොයා බලා කඩිනමින් පියවරක් ගන්න කියලා මම ඉල්ලා සිටිනවා.

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய றம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)

ගරු කථානායකතුමනි, විලච්චිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පාසල්වල සිදුවීම් ගැන නම් මා දන්නේ නැහැ. හැබැයි, මීනුවන්ගොඩ පාසලක වුණාය කියන සිද්ධිය සම්බන්ධව එම පාසලේ විදුහල්පතිතුමිය එක්ක මා කථා කළා. මොකද, එය පත්තරේ පළ වූ ප්‍රධාන ප්‍රවෘත්තියක්. ඒ පාසලේ ඉන්නේ ගුරුවරු 15දෙනායි. බොහොම පොඩි ඉස්කෝලයක්, ඒක. එවැනි සිදුවීමක් වෙලා තිබෙනවා නම්, එම පාසලේ ගුරුවරු සහ දරුවන්ගෙන් කවුරු හෝ එය දැන සිටින්න ඕනෑ. ඒ ප්‍රදේශයේ වාර්තාකරුගෙන් ඇහුවාම "ඒක මගේ වැඩක්. ඒක ගැන අහන්න ඕනෑ නැහැ. ප්‍රශ්නයක් නැහැ" කියනවා. මේ ප්‍රවෘත්තිය පිළිබඳව දැන ගත් වහාම පාසල් සංවර්ධන සභාව කැඳවා පෝෂණ වැඩ පිළිවෙළ ගැන සාකච්ඡා කරලා, මේ සිදුවීම ගැන අහලා තිබෙනවා. ඒ පාසලේ දරුවෝ බොහොම ටිකදෙනායි ඉන්නේ. මෙවැනි සිදුවීමක් වුණාද කියලා ඒ අයගෙන් අහලා තිබෙනවා.

නමුත්, කිසිම දරුවකු ඉදිරිපත් වෙලා නැහැ. ඒ පාසලේ විදුහල්පතිතුමිය කළ ප්‍රකාශය ඇතුළත් හඬ පටය මා ළඟ තිබෙනවා. ඒ ප්‍රකාශය මේ ගරු සභාවේ අහන්න සලස්වන්න පුළුවන්. මිනිත්තු හතරක voice-cut එකක් මා ළඟ තිබෙනවා. ඒකෙදි කියනවා, "මේ ප්‍රවෘත්තිය දැකපු ගමන් අපි පාසල් සංවර්ධන සභාව කැඳෙව්වා. පාසලේ ඉන්න ගුරුවරු 15දෙනා කැඳෙව්වා. එක් එක් දරුවාගෙන් ඇහුවා, එහෙම දෙයක් අහම්බෙන්වත් සිදු වුණාද කියා හොයා බැලුවා. නමුත්, එවැනි කිසිම දෙයක් සිදු වෙලා නැහැ" කියලා.

**ගරු කේ.පී.එස්. කුමාරසිරි මහතා**
(மாண்புமிகு கே.பி.எஸ். குமாரசிறி)
(The Hon. K.P.S. Kumarasiri)

ගරු කථානායකතුමනි, මම මේ කියන්නේ මගේ ආසනයේ සිදුවීම ගැනයි. මම ඒ විදුහල්පතිවරු තුන්දෙනාටම කථා කළා. විලච්චිය සිද්ධාර්ථ මහා විද්‍යාලයට කථා කළා, කිඹුලාවැව ගාමිණී මහා විද්‍යාලයටත් කථා කළා. මගේ ආසනයේ මේ සිදුවීම වෙලා තිබෙනවා, ගරු කථානායකතුමනි. මීනුවන්ගොඩ පාසලේ සිදුවීම පුවත් පතක තිබුණු එකක්. හැබැයි, මගේ ආසනයේ සිද්ධිය සැබෑ සිද්ධියක්. අනුරාධපුර දිස්ත්‍රික්කයේ තන්තිරිමලේ, විලච්චිය කියන්නේ ඉතාම දුෂ්කර ප්‍රදේශ. එ් නිසා කරුණාකර මේ පිළිබඳව සොයා බලා මේ සඳහා වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න කියලායි මා ඉල්ලන්නේ.

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய றம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)

ගරු කථානායකතුමනි, විලච්චියේ ඒ පාසල් සම්බන්ධ කාරණය මම බැහැර කරන්නේ නැහැ. මෙන්න අහන්න, මීනුවන්ගොඩ ඒ සිද්ධිය වුණාය කියන පාසලේ විදුහල්පතිතුමිය කියන කථාව.

***(මේ අවස්ථාවේදී හඬ පටයක් ඇසෙන්න සලස්වන ලදී.)***
*(இவ்வேளையில், ஒலிப்பதிவொன்று ஒலிக்கச் செய்யப்பட்டது.)*
*At this stage, an audio recording was played.)*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු ඇමතිතුමා, ඔය කරන්නේ වැරදි දෙයක්. පාර්ලිමේන්තුවේ කථා කරන්න පුළුවන් අපේ මන්ත්‍රීවරුන්ට විතරයි.

**ගරු කේ.පී.එස්. කුමාරසිරි මහතා**
(மாண்புமிகு கே.பி.எஸ். குமாரசிறி)
(The Hon. K.P.S. Kumarasiri)

ගරු ඇමතිතුමනි, මම කියන්නේ මගේ ආසනයේ සිදුවීම ගැනයි.

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய றம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)

හරි, හරි. මම අහන්න සැලැස්වුවේ මීනුවන්ගොඩ පාසලේ විදුහල්පතිතුමිය ප්‍රකාශ කරපු දේ; ඒ හඬ පටය. ඒක විනාඩි දෙකක හඬ පටයක්.*[බාධා කිරීමක්]*

**ගරු කේ.පී.එස්. කුමාරසිරි මහතා**
(மாண்புமிகு கே.பி.எஸ். குமாரசிறி)
(The Hon. K.P.S. Kumarasiri)

ගරු කථානායකතුමනි, මම කියන්නේ විලච්චිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සිද්ධාර්ථ මහා විද්‍යාලය, කිඹුලාවැව ආනන්ද විද්‍යාලය සහ ගාමිණී විද්‍යාලය පිළිබඳවයි. මම කියන්නේ, ඒ පාසල් තුන ගැන සොයා බලන්න කියලා. මම අද උදේ මේ ගැන කථා කළා, ගරු ඇමතිතුමනි. මේක විහිළුවකට ගන්න එපා. මේක සත්‍ය කථාවක්.

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

ගරු කථානායකතුමනි, සෞඛ්‍ය අමාත්‍ය ගරු කෙහෙළිය රඹුක්වැල්ල මැතිතුමනි, මේ කාරණාව පිළිබඳව ඊයේ පුවත් පතේ පළ වුණාම මීනුවන්ගොඩ පාසලක් කියපු නිසා පෞද්ගලිකව මම ඒ ගැන සොයා බැලුවා. ඒ පාසලේ විදුහල්පතිතුමාවත්, නියෝජ්‍ය විදුහල්පතිතුමාවත් මේ සම්බන්ධව දැනුවත් නැහැ. ඊළඟට, මාධ්‍යයට සම්බන්ධ කෙනාට කථා කරලා ඇහුවා, කොහොමද මේ තොරතුරු ලබා ගත්තේ කියලා. අපි දන්නවා, රටේ ආර්ථික අර්බුදයක් තිබෙනවා, පාසල් යන දරුවන්ට යම් ප්‍රශ්නයක් තිබෙනවා කියලා. එහෙම සිදුවීමක් වෙලා තිබෙනවා නම්, ඒ පිළිබඳව සොයා බලා ඒ වෙනුවෙන් උදවු කරන්න තමයි අපි කථා කළේ.

හැබැයි, ඒ පාසලේ එහෙම දෙයක් වෙලා නැහැ. මේ රටේ පවතින තත්ත්වය තුළ මේ විධියට වැරදි මතවාද යැවීම හේතුවෙන් වෙන්නේ මිනිසුන් නැවත කුලප්පු කිරීමක්. ගරු කථානායකතුමනි, ඒ ගරු මන්ත්‍රීතුමා කියපු, අනුරාධපුර දිස්ත්‍රික්කයේ පාසල් තුනට අදාළ සිද්ධිය ගැනත් සොයා බලන්න අපට පුළුවන්. *[බාධා කිරීමක්]*

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாபா)
(The Hon. Anura Priyadharshana Yapa)

ගරු කථානායකතුමනි, ගොවිතැන් කරන ප්‍රදේශවල පොහොර ආදිය නැති නිසා ඇති වෙලා තිබෙන තත්ත්වය උඩ ආහාර මිල වැඩි වීම නිසා ජනතාවට ආහාර සපයා ගැනීමේ අපහසුකමක් තිබෙනවා. ඒ හේතුවෙන් යම් ප්‍රමාණයක මන්දපෝෂණ තත්ත්වයක් මේ රටේ ළමයින් අතර දැන් ඇති වෙලා තිබෙනවා. ඒක සෞඛ්‍ය ඇමතිතුමා පිළිගන්නේ නැද්ද? ඒක පිළිගන්න. පිළිගෙන අපි කථා කරමු, කොහොමද ඒකට

උත්තර සොයන්නේ කියලා. *[බාධා කිරීමක්]* ගරු කථානායකතුමනි, මේ ඇමතිවරුන්ට මේ විධියට උද්ධච්ච ලෙස කථා කරන්න එපා කියන්න. මොකද, ප්‍රශ්නයක් තිබෙනවා. ප්‍රශ්නය පිළිගෙන විසඳුමක් දෙන්න. ඒකට තමයි ආණ්ඩුව තිබෙන්නේ.

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷன ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමනි, මේක නිලධාරින්ගෙන්වත්, එහෙම නැත්නම් ඇමතිවරුන්ගෙන්වත් ඇසිය යුතු ප්‍රශ්නයක් නොවෙයි. මේ පාර්ලිමේන්තුවෙන් එළියට ගිහින් ඕනෑම මනුස්සයෙකුගෙන් ඇහුවොත්, 'තමන්ගේ දරුවාට කන්න දෙන්නේ මොනවාද?' කියලා, ඔහු කියාවි. ඊට වඩා හොඳ විද්‍යාත්මක දෙයක් නැහැ. මේක තේරුම් ගන්න. ප්‍රශ්නයක් තිබෙනවා කියන එක තේරුම් අරගෙන ඒකට විසඳුමක් ලබා දෙන්න. එහෙම නැතිව, 'මේ නිලධාරියා වැරැදියි. නිලධාරියා කරන්නේ දේශපාලනය' එහෙමත් නැත්නම්, 'මේ නිලධාරියාට වෙන අරමුණක් තිබෙනවා' වාගේ කථා කියන එක නොවෙයි කරන්න ඕනෑ. ගරු කථානායකතුමනි, අප මේ ප්‍රශ්නය ගැන කථා කර කර ඉන්නවා මිස, එය විසඳන වැඩ පිළිවෙළක් තවම නැහැ. මේ ප්‍රශ්නය නිසා මේ රටේ ජනතාව, මේ රටේ දූ දරුවන් ඉතාම අසරණ තත්ත්වයට පත් වෙලා ඉන්නවා. අනෙක් අතට, මෙහි බලපෑම එන්නේ අද හෙට නොවෙයි, ගරු ඇමතිතුමා. මෙහි දීර්ඝ කාලීන - long-term - බලපෑමක් එනවා. ඒ හින්දා අනෙක් හැම දෙයක්ම නතර කරලා මේ ප්‍රශ්නය විසඳන්න. තවත් කැබිනට් ඇමතිවරුන් පත් කරන්න නොවෙයි, රාජ්‍ය ඇමතිවරුන් 38දෙනෙකු පත් කරන්න නොවෙයි, ඒ ගොල්ලන්ට වාහන දෙන්න නොවෙයි කටයුතු කරන්න ඕනෑ. අන්න ඒ දේවල් නතර කරලා මේ දරුවන්ට කන්න ටික දෙන්න. තමුන්නාන්සේලා කන එක නොවෙයි කරන්න ඕනෑ. දැන් රටම කාලා තිබෙන්නේ. තවත් මොනවාද කන්න තිබෙන්නේ?

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)
මා නැවතත් බොහොම පැහැදිලිව මේ අවස්ථාවේදී කියන්නේ මෙච්චරයි. අප ඔක්කෝම පිළිගත් එක මතයක් තමයි මෙතැන ප්‍රශ්නයක් තිබෙනවා කියන එක. කවුරුවත් කිසිම මොහොතක කියලා නැහැ, මෙවැනි ප්‍රශ්නයක් නැහැ කියලා. *[බාධා කිරීම්]* හැබැයි, ප්‍රශ්නය විසඳන්න,- *[බාධා කිරීම්]* Let me speak. I am on my feet. ප්‍රශ්නය විසඳන්න වැඩ පිළිවෙළක් සකස් කරනකොට, ඒ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න හදනකොට අනවශ්‍ය විධියේ, එහෙම නැත්නම් ඊට පරිබාහිර, ඊට අදාළ නැති ප්‍රශ්නයක් ගැන කථා කරද්දී, මෙතැන කට වහගෙන ඉඳලා ඒක එහෙමම පිළිගන්න කියලා නම් අපට කියන්නේ, මේ පාර්ලිමේන්තුවේ මහජන නියෝජිතත්වයෙන් වැඩක් නැහැ නේ. මම උදාහරණයක් කියන්නම්. අද තවත් වාර්තාවක් එවා තිබෙනවා, හම්බන්තොට, මිරිජ්ජවිල, දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා විසින්.

අද එවා තිබෙන මේ වාර්තාව දිහා බලන්න. මේ වාර්තාවේ ඉතාම පැහැදිලිව, කරුණු එකින් එකට අරගෙන එකින් එක විශ්ලේෂණය කරලා, මේ සම්බන්ධයෙන් විද්‍යාත්මකව තිබෙන කරුණු ගෙනැල්ලා ඉදිරිපත් කරලා කියනවා, මේ කියන සියයට 80 පැත්ත පළාතකවත් නැහැ කියලා. ඉතින් මට මේක නොකියා ඉන්නද කියන්නේ? එහෙම නැත්නම් "ඒක හරි" කියලා පිළිගෙන ඒ අනුව කටයුතු කරන්න කියලාද කියන්නේ? එහෙම කියනවා නම්, සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් හෝ වෙනත් ඕනෑම ආයතනයකින් විද්‍යාත්මක පදනමක් මත ගන්නා කරුණු පැත්තකට වීසි කරලා පුවත් පත්වල තිබෙන ඒවායි, ගොසිප් එකේ තිබෙන ඒවායි අරගෙන අපි වාද විවාද කරමු. ඒකේ ප්‍රශ්නයක් නැහැ. හැබැයි, විද්‍යාත්මක පදනමක් තිබියදීත් ඒක පිළිගන්න තරම් ශක්තියක් නැත්නම්, මට කරන්න දෙයක් නැහැ.

**ගරු ඩලස් අලහප්පෙරුම මහතා**
(மாண்புமிகு டலஸ் அழஹப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
ගරු කථානායකතුමනි, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔව්, ගරු ඩලස් අලහප්පෙරුම මන්ත්‍රීතුමා.

**ගරු ඩලස් අලහප්පෙරුම මහතා**
(மாண்புமிகு டலஸ் அழஹப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
ගරු කථානායකතුමනි, මා මිත්‍ර ඇමතිතුමා විද්‍යාත්මක පදනමක් පිළිබඳව කියන කාරණය මම පිළිගන්නවා. මේ විද්‍යාත්මක පදනම මොකක්ද, ගරු කථානායකතුමනි? පාසල් දරුවන් ලක්ෂ 42ක් පාසල් පද්ධතිය තුළ ඉන්නවා. ඒ දරුවන් ලක්ෂ 42න් ලක්ෂ 11කට අපි දිවා ආහාරය ලබා දෙනවා. ඒක තමයි විද්‍යාත්මක පදනම. දැන් අවුරුදු දෙකකින් ඒ දිවා ආහාරය පාසල් දරුවන්ට දෙන්න බැරි වෙලා තිබෙනවා. එහෙම සිද්ධියක් මිනුවන්ගොඩ වුණේ නැහැ, අපේ මන්ත්‍රීතුමා කියන විධියට විලච්චියේ මේ වාගේ දෙයක් වුණා කියමින් විවාද කිරීමෙන් වැඩක් නැහැ නේ, ගරු කථානායකතුමනි. විද්‍යාත්මක පදනම තමයි පාසල් පද්ධතියේ දරුවන්ගෙන් හතරෙන් එකකට දිවා ආහාරය ලබා දෙන්න අප අසමත් වෙලා තිබෙනවා කියන එක. කාගේද වැරැද්ද කියන එක නොවෙයි මෙතැන තිබෙන ගැටලුව. සමහර දරුවෝ පාසල් එන්නේ නැහැ. පාසල් එන දරුවෝ ක්ලාන්ත වෙලා වැටෙනවා. විදුහල්පතිවරුන්ගේ දුග්ගැනවිල්ලක් තිබෙනවා. ඊයේ විකාශය වූ රූපවාහිනී වැඩසටහනක මම දැක්කා, Prince of Wales' College එකේ සහ තවත් විද්‍යාලයකත් විදුහල්පතිවරු ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වෙලා ඉස්කෝල ඇතුළේ "උදවු කාමරය" කියලා කාමර හදනවා. කෑම වැඩිපුර තිබෙන අම්මා කෙනෙකුගේ දරුවෙකු පාසලට එනවා නම්, ඒ දරුවාට අමතර කෑම එකක් ගේන්න කියනවා. මේක දේශපාලන ප්‍රශ්නයක් නොවෙයි. අද බත් බැංකු හදනවා. ඉතින්, විද්‍යාත්මක පදනම තමයි ලක්ෂ 11ක් දරුවන් නිරාහාරව ඉන්නවා කියන එක. ඒ දරුවන්ට අවුරුදු දෙකකින් පාසල් දිවා ආහාරය දීලා නැහැ. දිවා ආහාර වේලක් සඳහා ලබා දෙන මුදල රුපියල් 60 දක්වා වැඩි කළා. අපි ඒක පිළිගන්නවා. නමුත් රුපියල් 60කින් ඒක කරන්න බැහැ. ඒ නිසා දරුවන්ගේ කාරණාවට ප්‍රමුඛත්වය දෙන්න ඕනෑ කියන එකට විවාදයක් තියාගන්න නරකයි. ඒක අපි පිළිගන්න ඕනෑ, ගරු කථානායකතුමනි. ඒක තමයි විද්‍යාත්මක පදනම.

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)
ගරු ඩලස් අලහප්පෙරුම මැතිතුමනි, ඔබතුමාගේ ප්‍රකාශයේ ගැබ් වෙලා තිබෙන කරුණු ගැන අපට තර්කයක්, වාදයක් නැහැ. එක එක සිදුවීම් අරගෙන, ඒ සිදුවීම් generalize කරලා, ඒ සිදුවීම් තමයි සමස්තයක් හැටියට වෙන්නේ කියන එකේ තිබෙන සාවද්‍යභාවය ගැනයි මා කියන්නේ. එතකොට යම්කිසි විධියක සැකයක්, සාධාරණ සැකයක් මතු වෙනවා, එවැනි සාවද්‍ය ප්‍රකාශයකට ඒ විධියට ප්‍රමුඛත්වය ලබා දීලා සාකච්ඡාවට ලක් කරනවා නම්, එහි පසුබිමේ සැඟවුණු කරුණු ගණනාවක් තිබෙන්න පුළුවන් කියලා.

[ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා]

මේ ප්‍රශ්නය නැහැ කියලා එක මොහොතකවත් කියන්න මම සූදානම් නැහැ. පැහැදිලිව, මේ ප්‍රශ්නය තිබෙනවා. මේ ප්‍රශ්නයට විසඳුම් හොයන්න ඕනෑ. අපිට එහෙම නොකර සිටින්න බැහැ. හැබැයි, මේ කරුණු කාරණා ඉදිරිපත් කිරීම සම්බන්ධව ගැටලුවක් තිබෙනවා. ඒකයි මම ඒ කරුණු ඉදිරිපත් කළේ.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පැහැදිලි කර ගැනීමක්ද, ගරු මන්ත්‍රීතුමා?

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
ගරු කථානායකතුමනි, මම මේ කාරණය කියන්නේ ගරු සෞඛ්‍ය ඇමතිතුමාට. සෞඛ්‍ය ඇමතිතුමනි, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්තුමාට මම දවස් පහක් තිස්සේ telephone calls ගන්නවා. කවදාකවත් ප්‍රතිචාර දක්වන්නේ නැහැ. එතුමා ඉස්සර හිටියේ කලුබෝවිල. එතුමාට වැඩ වැඩි ඇති. බෙහෙත් නැති හින්දා වැඩ වැඩි ඇති. එහෙම කරන්න එපා කියන්න. අපි මහජන නියෝජිතයෝ. එතුමාට කියන්න, telephone එකට answer කරන්න කියලා. Message එකක් යැව්වත් ඒකටවත් උත්තරයක් නැහැ. කරුණාකර එතුමාට ඒක කියන්න.

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷன ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු හර්ෂණ රාජකරුණා මන්ත්‍රීතුමනි, ඔබතුමා හුඟක් කථා කළා නේ. *[බාධා කිරීමක්]* ගරු තිලක් රාජපක්ෂ මන්ත්‍රීතුමා.

**ගරු (වෛද්‍ය) තිලක් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) திலக் ராஜபக்ஷ)
(The Hon. (Dr.) Thilak Rajapakshe)
ගරු සෞඛ්‍ය ඇමතිතුමනි, මම මේ ඔබතුමා අපහසුතාවට පත් කරන්න කියනවා නොවෙයි. අප මෙතැනදී කොච්චර වාද විවාද කරගත්තත් වැඩක් වෙන්නේ නැහැ. මන්දපෝෂණය තිබෙනවා සහ ළමයින් ක්ලාන්තය හැදිලා වැටෙනවා කියන කථා දැන් කියනවා. ඒ වාගේ ලොකු ප්‍රශ්න ගොඩක් ගැන දැන් හැම දාම කථා කරනවා.

ගරු කථානායකතුමනි, මම මේ කියන්නේ අම්පාර දිස්ත්‍රික්කයේ ලාහුගල ප්‍රදේශය ගැනයි. අම්පාර කියන්නේ ගොවි ජනතාව ඉන්න ප්‍රදේශයක්. මම ගියා, ලාහුගල පැත්තේ. එහේ සිවිල් ආරක්ෂක බලකා නිලධාරින්ට නිදහසේ ව්‍යාපෘති කරන්න පුළුවන්. ඒ ගොල්ලන් හුඟක් කරන්නේ කුඹුරු ගොවිතැන. ඒකෙන් කොටසක් දෙන්න ඕනෑ, රජයට. මම පසුගිය සතියේ එහේ ගියා. ඒ ගොල්ලන් කන්නයකට දෙකකට කලින් දීපු වී කිලෝ ලක්ෂ ගණනක් එහේ ගබඩාවල දැන් විනාශ වෙනවා. ඒ සම්බන්ධයෙන් වග කියන්න කවුරුවත් නිලධාරියෙක් නැහැ. පාසල් ළමයින්ට කන්න නැහැ කියනවා නම්, ගෙනෙන හාල් ටිකේ වස විස තිබෙනවා කියලා කෘෂිකර්ම ඇමතිතුමාම කියනවා නම්, තිබෙන හොඳම හාල ලංකාවේ හාලම නම්, ඔබතුමන්ලා අවස්ථාවක් අරගෙන ඒ ගබඩාවල විනාශ වන හාල් ටික අරගෙන අඩුම ගණනේ කන්න නැති ඉස්කෝල ළමයින්ගේ පෝෂණය වෙනුවෙන් හෝ ලබා දීම සඳහා මොකක් හරි වැඩ පිළිවෙළක් සකස් කරන්න කියා මා ඉල්ලා සිටිනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දෙවන වටය.

## දේශීය බිම්මල් වර්ග: විස්තර
### உள்ளூர் காளான் வகைகள்: விபரம்
### LOCAL MUSHROOM VARIETIES: DETAILS

28/2022

**2. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු බුද්ධික පතිරණ මහතා වෙනුවට)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு புத்திக பத்திரண சார்பாக)
(The Hon. Gayantha Karunatilleka on behaalf of the Hon. Buddhika Pathirana)
කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) ශ්‍රී ලංකාවේ ස්වාභාවිකව වැවෙන මිනිස් ආහාරයට සුදුසු බිම්මල් සම්බන්ධයෙන් සමීක්ෂණයක් සිදු කර තිබේද;

(ii) එසේ නම්, එම බිම්මල් වර්ග සංඛ්‍යාව කොපමණද;

(iii) ඒවායේ නම් කවරේද;

(iv) ඒ අතරින් ඒකදේශික බිම්මල් වර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නේද?

(ආ) (i) මේ වනවිට ස්වයං රැකියාවක් ලෙස බිම්මල් වගා කරනු ලබන වගාකරුවන්ට අවශ්‍ය බීජ ආනයනය කරන්නේද;

(ii) එසේ නම්, එම රටවල් කවරේද;

(iii) ඒ සඳහා වර්ෂයකට වැය කරනු ලබන මුදල කොපමණද;

(iv) දේශීය බිම්මල් බීජ, වගාකරුවන් අතර ප්‍රචලිත කිරීමට ක්‍රියා මාර්ග ගෙන තිබේද;

(v) එසේ නම්, එම ක්‍රියා මාර්ග කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නේද?

(ඇ) (i) බිම්මල් වගාකරුවන්ට රජය සහන ලබා දීමට කටයුතු කර තිබේද;

(ii) එසේ නම්, එම සහන කවරේද;

යන්න එතුමා තවදුරටත් සඳහන් කරන්නේද?

(ඈ) නො එසේ නම්, ඒ මන්ද?

கமத்தொழில் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையில் இயற்கையாக வளரும் மனித நுகர்வுக்கு உகந்த காளான்கள் தொடர்பில் ஆய்வு மேற்கொள்ளப்பட்டுள்ளதா;

(ii) ஆமெனில், மேற்படி காளான் வகைகளின் எண்ணிக்கை யாது;

(iii) அவற்றின் பெயர்கள் யாவை;

(iv) அவற்றில் உள்ளூர் காளான் வகைகள் யாவை;

என்பதை அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) இன்றளவில் சுயதொழிலாகக் காளான் பயிர்ச் செய்கையில் ஈடுபடும் பயிர்ச்செய்கையாளர்களுக்குத் தேவையான விதைகள் இறக்குமதி செய்யப்படுகின்றனவா;

(ii) ஆமெனில், அந்நாடுகள் யாவை;

(iii) அதற்காக வருடமொன்றுக்குச் செலவிடப்படும் நிதித்தொகை யாது;

(iv) சுதேச காளான் விதைகளைப் பயிர்ச்செய்கையாளர்கள் மத்தியில் பிரபல்யப்படுத்துவதற்கான நடவடிக்கைகள் மேற்கொள்ளப்பட்டுள்ளனவா;

(v) ஆமெனில், அந்நடவடிக்கைகள் யாவை ;

என்பதையும் அவர் குறிப்பிடுவாரா?

(இ) (i) காளான் பயிர்ச்செய்கையாளர்களுக்கு அரசாங்கம் சலுகைகளை வழங்குவதற்கான நடவடிக்கைகளை மேற்கொண்டுள்ளதா;

(ii) ஆமெனில், அச்சலுகைகள் யாவை;

என்பதை அவர் மேலும் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture:

(a) Will he state -

(i) whether a survey has been conducted about edible mushrooms which grow naturally in Sri Lanka;

(ii) if so, the number of such mushroom varieties;

(iii) their names; and

(iv) the endemic mushroom varieties out of them?

(b) Will he also state -

(i) whether seeds required by farmers who cultivate mushrooms as a means of self-employment are imported by now;

(ii) if so, the countries from which they are imported;

(iii) the amount spent annually on that;

(iv) whether measures have been taken to promote local mushroom seeds among cultivators; and

(v) if so, the said measures?

(c) Will he further state -

(i) whether the Government has taken action to provide relief to mushroom cultivators; and

(ii) if so, the said relief measures?

(d) If not, why?

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ශ්‍රී ලංකාවේ ස්වාභාවිකව වැවෙන, ආහාරයට සුදුසු බිම්මල් සම්බන්ධයෙන් සම්පූර්ණ සමීක්ෂණයක් සිදු කර ඒ පිළිබඳ ප්‍රසිද්ධියට පත් කර ඇත. (2013) (Sri lankan Mushrooms, Ms. Srimathi Udugama, හිටපු බිම්මල් අංශ ප්‍රධානි, උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය, ගන්නෝරුව)

(ii) බිම්මල් 23ක් දැනට හඳුනාගෙන ඇත.

(iii) දේශීයව හඳුනාගෙන ඇති බිම්මල් වර්ග:

1. හුඹස් බිම්මල්
2. මහවැලියා
3. හීන් වැලියා (වැලි බිම්මල්)
4. ඉඳලොළු
5. කුකුල් බඩවැල්
6. පිදුරු බිම්මල්
7. වැහි බිම්මල්
8. තීන්ත බිම්මල්
9. බෙලි හතු
10. රෝස කොටන් බිම්මල්
11. ඌරු පහ
12. හම් බිම්මල්
13. ලේන පහුරු බිම්මල්
14. යල බිම්මල්
15. සිංහරාජ බිම්මල් / අතුරු හතු
16. යෝධ බිම්මල්
17. සූකිරි බිම්මල්
18. කුට්ටම් බිම්මල්
19. බැම්බු හතු
20. කංකූරා (අලිකන් හතු)
21. සුදු ජෙලි බිම්මල්
22. යෝධ පියරු බිම්මල්
23. දඹුලු බිම්මල්

(iv) දේශීයව හඳුනාගෙන ඇති අතර, ඒක දේශික බව තහවුරු කර නොමැත.

(ආ) (i) බිම්මල් බීජ ආනයනය නොකෙරේ.

(ii) අදාළ නොවේ.

(iii) අදාළ නොවේ.

(iv) ඔව්.

(v) දේශීය බිම්මල් ප්‍රචලිත කිරීමේ ක්‍රියාමාර්ග:

- බිම්මල් වගාව පිළිබඳ පුහුණු වැඩසටහන් පැවැත්වීම.
- බිම්මල් බීජ නිෂ්පාදන පුහුණු වැඩසටහන් පැවැත්වීම.
- බීජ නිපදවීම සඳහා අවශ්‍ය විද්‍යාගාර උපකරණ හා විද්‍යාගාර සැලසුම සම්බන්ධ දැනුම ලබා දීම සහ අවශ්‍ය පිරිවිතර ලබා දීම.

[ගරු ප්‍රසන්න රණතුංග මහතා]

- බිම්මල් වගාව සම්බන්ධ ගොවි මහතුන්ගේ ගැටලු සඳහා විසඳුම් ලබා දීමත් අවශ්‍ය අවස්ථාවල ක්ෂේත්‍ර නිරීක්ෂණය සිදු කිරීමත් කරනු ලැබේ.

(ඈ) (i) ඔව්.

(ii)
- ප්‍රාථමික අවධියේ වගාකරුවන්ට අවශ්‍ය අඩු වියදම් තාක්ෂණය ලබා දීම.
- ව්‍යාපාරික වගාකරුවන්ට අවශ්‍ය නිවැරැදි තාක්ෂණය ලබා දීම.
- මාධ්‍ය සැකසීමට අවශ්‍ය ද්‍රව්‍ය, පොලිතීන්, සීලර්, බැරල් ලබා දීම.
- මධ්‍ය පරිමාණ වගාකරුවන් සඳහා බිම්මල් ගෘහය සඳහා සැලසුම සහ ඇස්තමේන්තුව ලබා දීම.
- පළාත් මුදල් කොමිසම මඟින් සානුබල දීමනාව මඟින් කාලීනව යම් මුදලක් ප්‍රදානය කිරීම.
- මධ්‍ය හා මහා පරිමාණ වගාකරුවන්ට අවශ්‍ය යන්ත්‍ර සූත්‍ර 50% දායකත්වය යටතේ ලබා දීම.
- කෘෂිකර්ම උපදේශක ප්‍රධානත්වයෙන් බිම්මල් සමිති පිහිටුවා බිම්මල් ගම්මාන ඇති කිරීම.
- බිම්මල් බීජ නිෂ්පාදනය සඳහා දෙපාර්තමේන්තු තාක්ෂණ දැනුම ලබා දීම.
- අගය එකතු කළ නිෂ්පාදනය සඳහා අවශ්‍ය දැනුම ලබා දීම.

(ඇ) අදාළ නොවේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 6 -2645/2022- (1), ගරු ගාමිණී වලේබොඩ මහතා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatilleka)
ගරු කථානායකතුමනි, ගරු ගාමිණී වලේබොඩ මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)
ගරු කථානායකතුමනි, කෘෂිකර්ම ඇමතිතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 9 -2689/2022- (1), ගරු වාසුදේව නානායක්කාර මහතා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatilleka)
ගරු කථානායකතුමනි, ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)
ගරු කථානායකතුමනි, අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ ඇමතිතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ස්ථාවර නියෝග 27 (2) යටතේ ප්‍රශ්නය, ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා.

# පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

## පිළිකා ප්‍රතිකාර සඳහා ප්‍රමිතියෙන් තොර විකිරණ චිකිත්සක උපකරණ භාවිතය
### புற்றுநோய் சிகிச்சைக்கான தரமற்ற கதிர்வீச்சு சிகிச்சை உபகரணங்களின் பயன்பாடு
### USE OF SUBSTANDARD RADIATION THERAPY EQUIPMENT FOR CANCER TREATMENT

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, ගුණාත්මක සෞඛ්‍ය සේවයක් ජනතාවට ලබාදීම රජයේ වගකීමකි. කෙසේ වෙතත්, සෞඛ්‍ය අංශය සඳහා අත්‍යවශ්‍ය ඖෂධ හා උපකරණ ප්‍රමාණවත් පරිදි සැපයීමට අද වන විට ආණ්ඩුව අපොහොසත් වී තිබේ. මේ අතර පිළිකා රෝගීන්ගේ ප්‍රතිකාර සඳහා අත්‍යවශ්‍ය වන විකිරණ ප්‍රතිකාර උපකරණවල හිඟය හා නඩත්තු ගැටලු නිසා එම රෝගීන්ගේ ජීවිත විශාල සංඛ්‍යාවක් අනතුරේ වැටී ඇති බව වාර්තා වේ. එපමණක් නොව, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 19/2022 සෞඛ්‍ය ක්ෂේත්‍රය සම්බන්ධයෙන් ද අදාළ වන්නේ නම්, දැනට පවතින මානව සම්පත් කළමනාකරණය ද තවදුරටත් ගැටලු සහගත විය හැකියි. ඒ අනුව, සෞඛ්‍ය ක්ෂේත්‍රයට අදාළ ජාතික වැදගත්කමකින් යුතු මෙම ගැටලු දෙක සම්බන්ධයෙන් පහත සඳහන් ප්‍රශ්නවලට නිශ්චිත පිළිතුරු හා පැහැදිලි කිරීම් මම රජයෙන් බලාපොරොත්තු වෙනවා.

1. පිළිකා රෝගීන්ට ප්‍රතිකාර කිරීම සඳහා භාවිත කරනු ලබන Elekta Compact, Elekta Synergy Platform, Elekta Synergy විකිරණ ප්‍රතිකාර යන්ත්‍ර සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත ලබා ගැනීමට 2013 වසරේ දී විදේශීය සමාගමක් සමග ගිවිසුම්ගතව තිබුණේ ද? එසේ නම්, එම ගිවිසුම මෙම සභාවට ඉදිරිපත් කරන්නේ ද? එසේ ලබා ගත් Elekta Compact යන්ත්‍ර මඟින් දිනකට ප්‍රතිකාර කළ හැකි රෝගීන් සංඛ්‍යාව ඉතා අඩු ගණනක් බව රජය දැනුවත් ද?

2. මෙලෙස ගෙන්වනු ලැබූ Elekta Compact සහ Elekta Synergy Platform විකිරණ ප්‍රතිකාර යන්ත්‍රවල නූතන ලෝක සම්මත විකිරණ ක්‍රමෝපායන් හා අංගෝපාංග නොමැති බව දැන දැනම ප්‍රාථමික ගණයේ Elekta Compact යන්ත්‍ර හා යාවත්කාලීන නොවූ Elekta Synergy

Platform යන්ත්‍ර ස්ථාපනය කිරීමට කටයුතු කළේ මන්ද? මෙම සෑම විකිරණ ප්‍රතිකාර යන්ත්‍රයක් සමඟම සැපයිය යුතු විකිරණමිතික උපාංග කට්ටල - dosimetry equipment - ගිවිසුම්ගත පරිදි ලබා නොදී ඇති බව වාර්තා වන හෙයින් එහි සත්‍යතාව සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් සිදුකර තිබේ ද?

3. එළැඹී සිටි ගිවිසුමේ පැවති ගැටලු නිරාකරණය සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් එය නිවැරදි කිරීමට 2021 වසරේදී සැපයුම් සමාගම සමඟ එකඟතාවන්ට පැමිණ ඇති බව වාර්තා වේ. එහිදී දැනට සපයා ඇති Elekta Synergy Platform යන්ත්‍ර හතරටම නවීන අංගෝපාංග එක්කොට නොමිලේ යාවත්කාලීන කර දීමටත්, ඉදිරියේදී අති නවීන Elekta Infinity යන්ත්‍ර අඩු මුදලකට ලබා දීමටත් සමාගම එකඟ වී ඇත. එම එකඟතා අනුව මේ වන විට ක්‍රියාත්මක වී ඇත් ද?

ගරු ඇමතිතුමනි, ඒ කියන්නේ වැරදි යන්ත්‍ර ගෙන්වා රටටත්, ජනතාවටත් වංචා කරලා ආපසු ඒ වැරැද්ද නිවැරදි කර ගන්නට එම සමාගමෙන් වන්දි හැටියට අලුතින්ම ප්‍රතිසංස්කරණය කිරීමේ guarantee එකක් ලබා ගෙන තිබෙනවා. මේ වංචාව කොතරම් බැරෑරුම් ද කියනවා නම්, ලෝකයේ අති නවීනතම යන්ත්‍ර ටික නොමිලයේ ලබා දීමට ඒ ගොල්ලන්ම ඉදිරිපත් වෙලා තිබෙනවා. මේ හොරකම නිවැරදි කරන්නට මේ ගත් ක්‍රියාමාර්ග දැනට ක්‍රියාත්මකද කියන එක අපිට දැනගන්න ඕනෑ.

4. නිසි ප්‍රමිතියෙන් යුතු විකිරණ යන්ත්‍ර ස්ථාපිත කර නොතිබීම හා ප්‍රමාණවත් තරම් විකිරණ යන්ත්‍ර නොමැතිවීම නිසා වසරකට බේරා ගත හැකි පිළිකා රෝගීන් 5,000කට වැඩි ප්‍රමාණයකට සිය ජීවිතය අහිමි වන බව රජය නොදන්නේද? එසේ නම්, නව විකිරණ යන්ත්‍ර මිලදී ගැනීමට හා ඒ සඳහා අවශ්‍ය ගොඩනැගිලි කඩිනමින් ඉදිකිරීම සඳහා අවශ්‍ය පරිදි 2023 අයවැය තුළින් ප්‍රතිපාදන වෙන් කිරීමට කටයුතු කරන්නේද?

ගරු සෞඛ්‍ය අමාත්‍යතුමනි, මම ඊයේ මතු කළ ප්‍රශ්නයට තවත් එකතු කිරීමක් කරනවා.

5. සෞඛ්‍ය සේවයේ විශේෂඥ වෛද්‍යවරුන්ගේ සේවා කාලය වයස අවුරුදු 63 දක්වා දීර්ඝ කිරීමක් 2018 වසරේදී සිදු විය. නමුත් මෑතක කෙටිකාලයක් තුළ නිකුත් කළ චක්‍රලේඛ දෙකක් නිසා මෙම තත්ත්වය තවත් ව්‍යාකූල වී තිබේ. එක් අතකින් එකවර විශේෂඥ වෛද්‍යවරු සැලකිය යුතු සංඛ්‍යාවක් -ඒ කියන්නේ 300කට වැඩි සංඛ්‍යාවක්- විශ්‍රාම යෑමෙන් වෛද්‍ය කළමනාකරණය හා සේවා සැපයීම පිළිබඳ ගැටලුසහගත තත්ත්වයක් ඇති විය හැකියි. අනෙක් අතට, නිසි අධ්‍යයනයකින් තොරව සිදු කරන මෙවන් කඩිනම් සංශෝධන තරුණ වෛද්‍යවරුන් හා නව විශේෂඥ දැනුම සෞඛ්‍ය ක්ෂේත්‍රය තුළ රඳවා ගැනීම අධෛර්යවත් කරයි. බොහෝ දෙනා රට අතහැර යයි. මෙම ගැටලුකාරී තත්ත්වයන් දෙක සම්බන්ධයෙන් ආණ්ඩුව දැනුවත්ද? එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද?

මීට අමතරව, ගරු සෞඛ්‍ය අමාත්‍යතුමාගේ අවසරය මත අද රට පත් වෙලා තිබෙන තත්ත්වය පිළිබඳවත් මම ඔබතුමාට පෙන්වා දෙන්න කැමැතියි. උතුරු මැද පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව චක්‍රලේඛයක් නිකුත් කර තිබෙනවා. මේ ලේඛන දෙක මම සභාගත කරන්න බලාපොරොත්තු වෙනවා, ගරු කථානායකතුමනි. ඒ අය රෝහල්වලට චක්‍රලේඛයක් නිකුත් කර තිබෙනවා.

ගණකාධිකාරී විසින් චක්‍රලේඛයක් නිකුත් කර තිබෙනවා. එම චක්‍රලේඛයෙන් මොනවාද කියන්නේ? "නේවාසික රෝගීන් සඳහා කිරි සැපයීම නැවත දන්වන තුරු නැවැත්වීම" කියලා එහි සඳහන් වෙනවා. මෙම චක්‍රලේඛයෙන් කියන්නේ, රෝහල්වල ප්‍රතිකාර ලබන ගිලන් වුණු පුද්ගලයන්ට කිරි සපයන එක නතර කරන්න කියලායි. එහෙම කරන්නේ කොහොමද? රෝගීන්ට කිරි සපයන එක නතර කරලා රාජ්‍ය ඇමතිවරුන් 38දෙනකු පත් කරනවා. කැබිනට් ඇමතිවරුත් තව 10දෙනකු පත් කරන්න යනවා ලු. මොකක්ද මේ විහිළුව?

අනෙක් කාරණාව වශයෙන්, "මුහුදු මාළු වෙනුවට ආදේශකයක් ලෙස වැව් මාළු ලබා දීම" කියා එම චක්‍රලේඛයේ සඳහන් වෙනවා. ඒක මරු කථාව! මම අහන්න කැමැතියි, එම නීතිය පාර්ලිමේන්තුවටත් අදාළද කියලා. මුහුදු මාළු වෙනුවට වැව් මාළු දෙන්න කියන එක මේ පාර්ලිමේන්තුවට අදාළද? පාර්ලිමේන්තුවේ කැන්ටීමට අදාළද? එම කාරණය අසත්‍යයක් නොවෙයි. මේ මොන ලජ්ජා නැති වැඩක්ද? එම චක්‍රලේඛය මා **සභාගත*** කරනවා, ගරු කථානායකතුමනි.

ගරු සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් මා ඉල්ලා සිටිනවා, වහාම මේ චක්‍රලේඛ ඉවත් කරන්න කියලා. තමුන්නාන්සේලාට මාළු සපයන්න බැරි නම්, ඔය පත් කරපු රාජ්‍ය ඇමතිවරුන් ටිකක් අස් කරලා, ඒ ගොල්ලන්ට වැය වන සල්ලි ටික මාළු සපයන්න යොදවන්න. ඒ දේ කරන්න.

රෝහල් පද්ධතිය තුළ රෝගීන්ට කිරි සපයන්න එපා කියලා කියන්නේ කොහොමද, ගරු ඇමතිතුමනි? ඒක වැරැදියි. අමනාප වෙන්න එපා, සැරට කථා කළාට. අපටත් කිව්වා, ඇමති ධුර ගන්න එන්නය කියලා. අපටත් කිව්වා, අගමැති ධුරය ගන්න එන්න කියලා. *[බාධා කිරීමක්]* තමුන්නාන්සේලාගේ ඡන්ද 134කින් ජනාධිපති වෙන්න මට වුවමනාවක් නැහැ. නිකම් වැඩකට නැති කථා කියන්නේ නැතිව ඉන්න. තමුන්නාන්සේලා රට පාවා දෙන මිනිස්සු. මැතිවරණයක් පවත්වන්න, එතකොට මහ පොළොවේ යථාර්ථය තේරෙයි. ලජ්ජා නැතුව කියනවා, කිරි දෙන්න එපාය කියලා. ලජ්ජා නැතුව කියනවා, මුහුදු මාළු දෙන්න එපාය කියලා. එහෙම කිය-කියා ඇමතිවරුන් දූසිම් ගණන් පත් කරනවා. මේ ගැන වහාම ක්‍රියාමාර්ගයක් ගන්න.

ඒ විතරක් නොවෙයි. විලච්චිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පාසල් තුනක ප්‍රශ්න සම්බන්ධයෙන් අද කේ.පී.එස්. කුමාරසිරි මන්ත්‍රීතුමා කරුණු ඉදිරිපත් කළා. ඒක සියයට ලක්ෂ වාරයක් ඇත්ත; ඒක සත්‍ය කථාවක්. ඔබතුමා අමනාප වෙන්න එපා, මෙහෙම කිව්වාට. රජයේ ඇමතිවරයකු නිලධාරියකුගෙන් ප්‍රශ්නයක් අහනකොට, ඔබතුමන්ලා කියන විධියට කුලියට කතින එකයි - ස්වාධීන කොමිෂන් සභා නැති නිසා - ඒ ගොල්ලන් කරන්නේ. ප්‍රසන්න රණතුංග මැතිතුමා මේ සභාවේදී කථා කළා. අපි දන්නවා නේ, එතුමා රජයේ නිලධාරින්ට කථා කරපු විධිය. දැන් ඒවා එළියට ඇවිල්ලා තිබෙනවා නේ. ඉතින්, රජයේ නිලධාරින්ගෙන් මේ කාරණා ගැන ප්‍රශ්න කරනකොට ඒ ගොල්ලන් සත්‍යය කියයි ද? මේ කියන දේවල්වල recordings දමලා හරි යන්නේ නැහැ; live telecast කරලා හරි යන්නේ නැහැ. මේකයි ඇත්ත කථාව.

ගරු ඇමතිතුමනි, මා ඔබතුමාට කියන්න කැමැතියි, රණසිංහ ප්‍රේමදාස මැතිතුමා ක්‍රියාත්මක කළ, පාසල් දරුවන්ට දිවා ආහාරය ලබා දීමේ වැඩසටහනේ වටිනාකම දැන් තමයි රටට තේරිලා තිබෙන්නේ කියලා. එදා තේරුණේ නැහැ. දැන් රටටම ඒක තේරිලා තිබෙනවා. මා ඔබතුමාට වග කීමෙන් කියනවා, පාසල් දූ

---

** **පුස්තකාලයේ තබා ඇත.***
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

දරුවන්ගේ මන්දපෝෂණ තත්ත්වය පිළිබඳව survey එකක් කරන්න කියලා. මේ රජය හයයි, survey එකක් කරන්න. ඔබතුමා දන්නවාද, ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානය මීට මාස 12කට පෙර survey එකක් කරන්න අවසර ඉල්ලනකොට ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයා යටතේ තිබුණු ආණ්ඩුව එයට අවසර දුන්නේ නැහැ කියලා? ඒ ඇයි?

සංඛ්‍යාලේඛන එළියට එනවාට හයයි. ගරු ඇමතිතුමනි, බුද්ධිමත් පුද්ගලයකු හැටියට ඔබතුමා පාසල් මට්ටමේ දූ දරුවන් මුහුණ දෙන මේ ප්‍රශ්නයට යම්කිසි විසඳුමක් ලබා දෙන්න කියා මම ඉල්ලා සිටිනවා. මොකද, එම ප්‍රශ්නවලට විසඳුම් ලබා දෙන්න සල්ලි තිබෙනවා. එම නිසා ඒ කටයුතු ක්‍රියාත්මක කරන්න. අපිත් ඊට උදවු කරන්නම්; අපේ සහයෝගය ලබා දෙන්නම්.

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய றம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)

ගරු කථානායකතුමනි, සෞඛ්‍ය ක්ෂේත්‍රයත්, අධ්‍යාපනයත්, දරුවනුත් ගැන මේ අවස්ථාවේදී ඉතාම වැදගත්, කාලෝචිත ප්‍රශ්න ගණනාවක් ඉදිරිපත් වුණා කියා මම හිතනවා. එක මොහොතකවත් මම සූදානම් නැහැ, එහෙම ප්‍රශ්නයක් මේ රටේ නැහැයි කියලා කියන්න. හැබැයි, එහෙම කියන අතරතුර, අපේ පාසල් දරුවන්ගේ ආහාර ප්‍රශ්නය වාගේ දේවල්වලදී ඒවා දේශපාලනීකරණය කිරීමේ වැඩ පිළිවෙළ සම්බන්ධවත් මට කරුණු කාරණා කියන්න සිද්ධ වෙනවා. උදාහරණයක් ගත්තොත්, දැන් හම්බන්තොට දිස්ත්‍රික්කයේ මන්දපෝෂණය සියයට 80ක් බව ප්‍රකාශ කළ වෛද්‍යවරයා මොකක්දෝ සේනාංකයක දිස්ත්‍රික් සම්බන්ධීකරණ නිලධාරියෙක්. ඒ දේශපාලන ගැටගැසීම ගැන තමයි මම මේ කියන්න උත්සාහ කරන්නේ. මොකද, එතැනින් බැහැර වෙලා, මැද තැනක ඉඳගෙන අපට මේ ගැන කථා කරන්න පුළුවන් විය යුතුයි. පළමුවෙන්ම, ඒ සඳහා මම සියලුදෙනාට ආරාධනා කරනවා.

ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමා ස්ථාවර නියෝග 27(2) යටතේ අසන ලද ප්‍රශ්නයට අදාළ සිදුවීම වෙලා තිබෙන්නේ 2013 වර්ෂයේදී. 2015 සිට 2019 වෙනකල් ඔබතුමන්ලාගේ රජය මේ සම්බන්ධව කරුණු ඉදිරිපත් නොකර එය යටපත් කළාද කියලා මම දන්නේ නැහැ. එසේ කරුණු ඉදිරිපත් කිරීමෙන් තොරව ඉඳලා, 2013 වර්ෂයේ ඇති වූ ඒ ප්‍රශ්නය නැවත වරක් 2022 වර්ෂයේදී අපට ඉදිරිපත් කරලා එය නිවැරැදි කරන්න අවස්ථාව ලබා දීම ගැන මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ඒ අවුරුදු පහ තුළ ඒ සම්බන්ධව වචනයක්වත් කථා නොකිරීමත්, ඒ සම්බන්ධව කිසිම වග විභාගයක් නොකිරීමත් ගැන මගේ කනගාටුව මම මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා.

1. පිළිකා රෝගීන්ට අධිශක්ති විකිරණ චිකිත්සක ප්‍රතිකාර ලබා දීම සඳහා Triple Energy Linear Accelerator යන්ත්‍රයක්, Dual Energy Linear Accelerator යන්ත්‍ර 06ක් සහ Fixed-Energy Linear Accelerator යන්ත්‍ර 07ක් සපයා ගැනීම වෙනුවෙන් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ප්‍රකාරව "ඉලෙක්ටා" නමැති විදේශ සමාගම සමඟ 2013.12.03වැනි දින ගිවිසුම්ගත වී ඇත. එම ගිවිසුමේ ඡායා පිටපතක් මම ඉදිරිපත් කරන්නම්.

2. යෝජිත යන්ත්‍ර සැපයීම සම්බන්ධව පිළිකා රෝග විශේෂඥයන්ගේ නිර්දේශ ලත් ප්‍රසම්පාදන යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර සමාලෝචන කමිටුවේ - SCARC - නිර්දේශ ලබා, රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් පත් කරන ලද තාක්ෂණික ඇගැයීම් කමිටුවේ නිර්දේශ හා අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටු අනුමැතියත් ලබා, අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව ගිවිසුමට එළඹීමට කටයුතු කර ඇති අතර, එම යන්ත්‍ර මඟින් ප්‍රතිකාර ලබා දීමේ කටයුතු පිළිබඳව එම අදාළ කමිටුව මඟින් සලකා බලා ඇත. ඒ අනුව, 2013 වර්ෂයේදී තාක්ෂණය අතින් ඉහළ තත්ත්වයක පැවැති මෙම යන්ත්‍ර එම ගිවිසුම ප්‍රකාරව සපයා ගැනීමට කටයුතු කර ඇත.

ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමා ඇහුවා, ඒ හොරකම් කරපු අය සම්බන්ධයෙන් ගන්නා ක්‍රියාමාර්ගය කුමක්ද කියලා. මම බොහොම පැහැදිලිව කියන්න ඕනෑ, විශේෂඥ වෛද්‍යවරුන්ගෙන් සැදුම් ලත් කමිටුවකින් සිදු කරන ප්‍රසම්පාදන වැඩ පිළිවෙළක් මේ වෙනුවෙන් තිබෙන බව. ඒ සම්බන්ධව කරුණු ඉදිරිපත් කරලා ඔබතුමා කියපු ඒ හොරකම් කරපු අය සම්බන්ධවත් ඔවුන්ගෙන් වාර්තාවක් අරගෙන මම මේ සභාවට දැනුම් දෙන්නම්. මොකද, මේ රටේ oncologistsලාගෙන් සමන්විත කණ්ඩායමකින් තමයි පළමුවෙන් ම මේ සම්බන්ධව ඉල්ලීමක් ඇවිල්ලා තිබෙන්නේ. මෙතැනදී මම බොහොම පැහැදිලිව කිව යුතු දෙයක් තිබෙනවා. විශේෂඥ සහාය ලබා ගන්න ඕනෑය කියා ඔබතුමන්ලා නිතරම කියන ප්‍රසම්පාදන කමිටුව මෙහිදී පළමුවෙන් කළ යුත්තක් තිබෙනවා. අමාත්‍යාංශයට මෙන්න මෙවැනි භාණ්ඩයක් අවශ්‍යයි කියලා විශේෂඥ වෛද්‍යවරුන්ගෙන් සැදුම් ලත් කමිටුවකින් තමයි නිර්දේශය ලබා දී තිබෙන්නේ. අන්න එතැනදී සැලකිලිමත් වෙන්න ඕනෑ.

ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමාත් දන්නා පරිදි, technological landscape කියන එක දිනපතා වාගේ වෙනස් වනවා. එම නිසා 2013දී මතු වූ එම ප්‍රශ්නය 2015, 2016, 2017, 2018 වර්ෂවලදී ඇහුවා නම්, යාවත්කාලීනයි කියා මම හිතනවා. හැබැයි, 2020 වර්ෂය වෙනකොට නියත වශයෙන්ම මෙය අලුත් කළ යුතුයි. එසේ නැත්නම් අපි කියනවා, compatible දේවල්, එහෙම නැත්නම් ඒ හා සමාන්තරව තිබෙන අනෙකුත් දේවල් ගත යුතුයි කියලා.

මම නැවත යොමු වෙනවා, ඔබතුමා අසන ලද ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

තවද, මෙම දිනය දක්වා මෙම සෑම විකිරණ ප්‍රතිකාර යන්ත්‍රයක් සමඟම සැපයිය යුතු විකිරණමිතික උපාංග කට්ටල - dosimetry equipment - ගිවිසුම්ගත පරිදි ලබා නොදී ඇති බවට පැමිණිල්ලක් ලැබී ඇත. ඔබතුමාගේ විමසීමට අනුව, යන්ත්‍ර භාවිතයට ගනු ලබන අදාළ පාර්ශ්ව වෙතින් ඒ පිළිබඳව විමසා සුදුසු පියවරක් ගැනීමට මේ වෙනකොට අපි කටයුතු කර තිබෙනවා. නමුත්, පසුගිය අවුරුදු 8-10 පුරාම ඒ සම්බන්ධයෙන් කිසිම කටයුත්තක් වෙලා නැහැ.

3. කාලීන අවශ්‍යතාව සලකා බලා තාක්ෂණික උත්ශ්‍රේණිගත කිරීමේ කටයුතු සිදුවෙමින් පවතින අතර, ප්‍රමාණවත් ප්‍රතිපාදන ලැබීම මත නව සැපයීම් සිදු කිරීමට කටයුතු කරනු ලැබේ.

4. පිළිකා රෝග සත්කාර සේවාව සඳහා ඉහළ ගුණාත්මකභාවයකින් යුතු අධිතාක්ෂණ විකිරණ චිකිත්සක නවීන උපකරණ තිබීමේ අවශ්‍යතාව හඳුනා ගැනීම මත මෙම අදාළ යන්ත්‍ර සැපයීමේ කටයුතු සිදු වෙමින් පවතිනවා.

විකිරණ කාන්දු වීම වැළැක්වීමට අදාළ lead doors නොතිබීම මත මෙම යන්ත්‍ර භාවිත කිරීමට කාල ප්‍රමාදයක් සිදුවී ඇති අතර, ඒ හේතුවෙන් Cobalt Therapy කියන මෙම විකිරණ ප්‍රතිකාරය ලබා දීම සම්බන්ධයෙන් යම් ප්‍රමාදයක් සිදු වුවත්, පැරණි තාක්ෂණය සහිත යන්ත්‍ර මඟින් බොහෝදුරට ප්‍රතිකාර කටයුතු සිදු කරගෙන

යැම නිසා රෝගීන් 5,000කගේ පමණ ජීවිත අහිමි වන බවට කර ඇති ප්‍රකාශය පිළිගත නොහැක. එමෙන්ම 2019 වර්ෂයේ සිට lead doors සවිකර මෙම යන්ත්‍ර නිසි භාවිතයට ගෙන ඇත. මේකේ කියන්නේ, 2013 ඉඳලා 2018, 2019 වෙනකල්ම lead doorsවලට කිසිම දෙයක් වෙලා නැහැ කියලායි. අපි ඒක තේරුම් අරගෙන ඒ lead doors ගෙනැල්ලා මේ වෙනකොට ඒවා භාවිත කරන්න පටන් අරගෙන තිබෙනවා. මේ වන විට වසර 9ක් පමණ ගතවී ඇති බැවින්, ඊට අදාළ ඉහළ තාක්ෂණයකින් යුතු යන්ත්‍ර වෙළෙඳ පොළ තුළ පවතින බව සත්‍යයක්.

ඉහත කී ව්‍යාපෘතියේ කටයුතු ඉදිරියට කරගෙන යැමට නීතිපතිතුමාගේ උපදෙස් ලැබී ඇති අතර, සැපයුම්කාර ආයතනය සමඟ එකඟතාවකට පැමිණීම සහ යාවත්කාලීන කිරීමට අදාළ කටයුතු මේ වන විට සිදු කරමින් පවතිනවා.

5. ඔබතුමා මේ කාරණය ඊයේ අතුරු ප්‍රශ්නයක් හැටියටත් ඇහුවා. ඔබතුමා අසන ලද මෙම ප්‍රශ්නයට සවිස්තරාත්මක පිළිතුරක් දෙන්න ඕනෑ. මොකද, මේ වෙනකොට සෞඛ්‍ය ක්ෂේත්‍රයේ නියුතු විවිධ පුද්ගලයන් මේ සම්බන්ධයෙන් විවිධ මත පළ කර තිබෙනවා. මම ඊයේ කිව්වා වාගේ, මේ ප්‍රශ්නයේ පැති 2ක් තිබෙනවා. ඒ පැති දෙක ගැනම අපි සාකච්ඡා කළත්, තවම අවසන් තීන්දුවක් අරගෙන නැහැ. ඒ පැති දෙක ගැනම හොඳට සිතා බලා, රටේ ජනතාව සෞඛ්‍ය ක්ෂේත්‍රයෙන් බලාපොරොත්තු වන සේවාවන් අඩාළ නොවන ආකාරයට යම් කිසි අවසන් තීන්දුවක් ගත යුතුයි කියන මතයේ අපි පැහැදිලිව ඉන්නවා.

ඒ ප්‍රශ්නයට මට දෙන්න පුළුවන් පිළිතුර මෙයයි. රාජ්‍ය සේවකයන්ගේ විශ්‍රාම වයස -2022 වර්ෂය වනතුරු- අය වැය යෝජනාවක් මඟින් අවුරුදු 60 ලෙස සැලකීම මත වෛද්‍ය ක්ෂේත්‍රයේ විශේෂඥ වෛද්‍යවරුන්ගේ විශ්‍රාම වයස අවුරුදු 60ක් බවට පත්වී ඇත.

ශ්‍රී ලංකාවේ රෝහල් පද්ධතිය තුළ දැනට විශේෂඥ වෛද්‍ය නිලධාරින් 2,278දෙනෙක් පමණ සේවයේ යෙදී සිටින අතර, අනිවාර්ය විශ්‍රාම වයස අවුරුදු 60ක් වීම මත, පහත පරිදි විශේෂඥ වෛද්‍ය නිලධාරින් හා පරිපාලනය වෛද්‍ය නිලධාරින් විශ්‍රාම යැමට නියමිතය. ඒ අනුව, විශේෂඥ වෛද්‍ය නිලධාරින් 222ක් හා පරිපාලන වෛද්‍ය නිලධාරින් 27දෙනෙක් වනවා. ඒ අනුව විශ්‍රාම යැමට නියමිත වෛද්‍යවරුන්ගේ එකතුව 249දෙනෙක් වන අතර, මේ අවුරුද්ද අවසානයේ ඔවුන් විශ්‍රාම ගැන්වීමට සිදු වෙනවා. ප්‍රතිශතයක් වශයෙන් සියලු විශේෂඥ වෛද්‍ය නිලධාරින්ගේ සංඛ්‍යාවෙන් සියයට 9ක් පමණ විශ්‍රාම යැමට නියමිත බැවින්, ඒ ඒ රෝහල්වල හා ආයතනවල පුරප්පාඩු වන විෂය ක්ෂේත්‍රය, අභ්‍යන්තර විෂය මාරු ක්‍රමයක් යටතේ තුලනය කිරීමට හැකියාව පවතින බවත් මා සඳහන් කරන්න ඕනෑ.

මීට අමතරව වසර පහක විදේශ නිවාඩු ලබා දීමේ ක්‍රමය යටතේ තවත් වෛද්‍යවරුන් සියයට තුනක් පමණ විදේශගත විය හැකි අතර, එම සංඛ්‍යාව ද සාමාන්‍යයෙන් වෛද්‍ය තනතුරු ආවරණය කරන ක්‍රමය යටතේ සපුරාලීමට කටයුතු කර ඇත. විදේශ පුහුණුව සඳහා රජය වසරකට විශාල මුදලක් වැය කරන අතර, එම පුහුණුව ලබන නිලධාරින් අනිවාර්ය සේවා කාලයකට යටත් වේ. එබැවින්, විශ්‍රාම යන වයස අවුරුදු 60 දක්වා වෙනස් වීම මත, තරුණ වෛද්‍යවරුන්ට ප්‍රියතම ස්ථාන ලබා ගැනීමට එය හේතුවක් වන බැවින් ද, දේශීයව නිසි කුසලතා සහතික වෛද්‍යවරුන් සඳහා උසස්වීම් අවස්ථා ලැබෙන බැවින් ද ක්ෂේත්‍රයට ධනාත්මකව බලපාන බවක් ප්‍රකාශ කරයි.

මේ තමයි, විශ්‍රාම යන අයගේ පාඩුව සම්බන්ධව කියැවෙන අනෙක් පැත්ත.

තවද, මෙම විශ්‍රාම වයස වෙනස් වීම රට හැර යැමට බල නොපාන බවත් රටේ සෞඛ්‍ය සේවය තවදුරටත් ශක්තිමත්වීමට ඉවහල් වනු ඇතැයි යන්න ඔවුන්ගේ නිර්දේශයයි. අනිවාර්ය සේවා කාලයකට යටත්ව නිලධාරින් අනුමැතියකින් තොරව රට හැර යැම පිළිබඳ විශේෂ ප්‍රවණතාවක් වෛද්‍ය අංශය තුළ පැන නැඟී නොමැති නමුත්, එවැනි තත්ත්වයක් ඇති වුවහොත් අනුගමනය කරනු ලබන සාමාන්‍ය නෛතික ක්‍රම අනුව එය යම් කිසි පාලනයකට ගත හැක. ඒ වාගේම ඔබතුමාගේ දැන ගැනීම පිණිසයි මම මේ කියන්නේ. මොකද, ඊයේ ඔබතුමා කරපු ප්‍රකාශය නිසා මම ටිකක් සවිස්තරව මේ සම්බන්ධයෙන් හොයලා බැලුවා. 2016දී මේ රටේ විශේෂඥ වෛද්‍යවරුන් ඉඳලා තිබෙන්නේ 1,660දෙනායි. මේ වෙනකොට ඒ ප්‍රමාණය 2,278කට වර්ධනය වෙලා තිබෙනවා. ඒ intake එක වැඩි වුණු නිසා. සියයට 30කින් පමණ ඒ කාල පරාසය තුළත් විශේෂඥ වෛද්‍යවරුන්ගේ වැඩිවීමක් තිබෙනවා.

මේ නීතිය බලපෑවොත් retire වෙන consultantsලා ගණන 249යි. ගරු විපක්ෂ නායකතුමාටත්, අනෙකුත් අයගේත් ප්‍රයෝජනය පිණිස මම මේ ගැන පොඩි විග්‍රහයක් කරන්න කැමතියි. General medicineවල නිරත 261දෙනෙක් දැනට ඉන්නවා. එයින් 29දෙනෙක් retire වෙනවා. Paediatriciansලා 169දෙනාගෙන් 28දෙනෙක් retire වෙනවා. General surgeonsලා 168දෙනාගෙන් 26දෙනෙක් retire වෙනවා. Obstetricians and gynaecologistsලා 144දෙනාගෙන් 21දෙනෙක් retire වෙනවා. Anaesthetistsලා ගැන ඔබතුමන්ලා කථා කළා. Anaesthetistsලා 155දෙනාගෙන් 19දෙනෙක් retire වෙනවා. Ophthalmologistsලා ගත්තොත්, 49දෙනාගෙන් 18දෙනෙක් retire වෙනවා. Community medicineවල නිරත 93දෙනාගෙන් 9දෙනෙක් retire වෙනවා. Cardiologistsලා හැටදෙදෙනාගෙන් 9 දෙනෙක් retire වෙනවා. Transfusion medicineවල නිරත 24දෙනාගෙන් 8දෙනෙක් retire වෙනවා. Radiologistsලා 73දෙනාගෙන් 7දෙනෙක් retire වෙනවා. Dermatologistsලා 135දෙනාගෙන් 7 දෙනෙක් retire වෙනවා. ENT surgeonsලා 46දෙනාගෙන් 6දෙනෙක් retire වෙනවා. Respiratory medicineවල නිරත 37දෙනාගෙන් 5දෙනෙක් retire වෙනවා. Psychiatristsලා 63දෙනාගෙන් 5දෙනෙක් retire වෙනවා. Judicial medical officersලා 45දෙනෙකුගෙන් 5දෙනෙක් retire වෙනවා. Histologistsලා 63දෙනාගෙන් 5දෙනෙක් retire වෙනවා. Cardiothoracic surgeonsලා 18දෙනෙකුගෙන් 5දෙනෙක් retire වෙනවා.

මේ විධියට අනෙක් විස්තර ටිකත් මට කියන්න පුළුවන්. ඔබතුමන්ලාගේ දැන ගැනීම පිණිස මම මේ ලේඛනය **සභාගත*** කරනවා.

මේ ප්‍රශ්නය සම්බන්ධව අපි ස්ථිර තීන්දුවක් අරගෙන නැහැ. එය තවමත් සාකච්ඡා මට්ටමේ තිබෙනවා. පාර්ශ්ව ගණනාවක් මේ සම්බන්ධව අපත් සමඟ සාකච්ඡා කරනවා. උදාහරණයක් ගත්තොත්, specialistsලා 1,600 සිට 2,200 දක්වා වැඩි වෙලා තිබෙනවා, මේ කාලය තුළ. ඒ වාගේම subspecialistsලා 40දෙනෙක් පමණ දැන් වැඩි වෙලා තිබෙනවා. ඉස්සර subspecialistsලා කියලා කවුරුවත් හිටියේ නැහැ. ඉස්සර ඔක්කෝම හතක් අටක් වාගෙයි හිටියේ. දැන් 40දෙනෙක් විතර ඉන්නවා. උදාහරණයක් ගත්තොත්, පිටස්තර තිබෙන - peripheral - ඉස්පිරිතාලෙකට අවශ්‍ය දෙන්නයි නම්, අපි හතර දෙනෙක් එතැනට යොදවා තිබෙනවා. මොකද, end posts තිබෙන අය එතැනට ගේන්න විධියක් නැති නිසා. ඒ අය තරුණ, අලුත් තාක්ෂණය සමඟ කටයුතු කරන, අත්දැකීම් තිබෙන අය. අපි

---

** ලියවිල්ල ඉදිරිපත් නොකරන ලදී.*
*ஆவணம் சமர்ப்பிக்கப்படவில்லை.*
*Document not tendered.*

[ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා]

සාමාන්‍ය භාෂාවෙන් කියනවා, you can never overtake the experience කියලා. තුලනයක් තුළ මේ සම්බන්ධව තීන්දුවක් ගන්න ඕනෑ. හැබැයි, ජාතික ප්‍රතිපත්තියක් සකස් වෙලා තිබෙන මොහොතක, එක අංශයක ලක්ෂ 15ක් ඉන්නවාය කියලා අපි දැනට උපකල්පනය කරනකොට, 260කගේ ප්‍රශ්නයක් ගැන අපි කථා කළ යුත්තේ කුමක් නිසාද? ඒ, ඔවුන්ගේ සේවාව අත්‍යවශ්‍ය නිසාමයි. අපේ තවත් යෝජනාවක් හැටියට තිබෙනවා, අත්‍යවශ්‍ය ස්ථානවලට යම්කිසි විධියක වැඩි කිරීමක් කරන්න. ඒ සඳහා සේවා දීර්ඝ කිරීමට වැඩ පිළිවෙළක් ගේන්නත් පුළුවන්. මෙහි එක පැත්තක් ගැන පමණයි ඔබතුමා කථා කළේ. මම ඒකයි මේ පැති දෙක ගැනම අවබෝධයක් ලබා ගන්නට මේ කරුණු ඉදිරිපත් කළේ. මේ කරුණු දෙකම අපි සැලකිල්ලට ගත යුතුයි. අපේ රටේ විශේෂඥ වෛද්‍යවරු කියන්නේ, අත්දැකීම් බහුල කණ්ඩායමක්; ඉතා ප්‍රබල සේවයක් සහ වැදගත් සේවයක් කරන කණ්ඩායමක්. ඒ වාගේම, ලෝකයත් එක්ක, අලුත් තාක්ෂණයත් එක්ක හැප්පෙන, අලුත් තාක්ෂණයත් එක්ක කටයුතු කරන තවත් විශාල තරුණ කණ්ඩායමක් මේ තනතුරු අපේක්ෂාවෙන් ඉන්නවා. ඉතින්, මේ කරුණු දෙක තුලනය කරලා රටට සුදුසුම දේ අපි කළ යුතුයි. පෞද්ගලික අවශ්‍යතාවලට වඩා, රටට අවශ්‍ය කුමක්ද කියන එක තක්සේරු කරලා ගත යුතු තීරණයක් හැටියටයි මම මේක දකින්නේ. මේ සම්බන්ධයෙන් තවමත් අවසාන තීන්දුවක් ගෙන නොමැති බව මම පැහැදිලිව කියන්න ඕනෑ.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
On a quick point of Order, -

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய றம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)
I am sorry, I have one more matter to state.

ගරු විපක්ෂ නායකතුමනි, මම ඔබතුමාට සහතික වෙනවා, එවැනි චක්‍රලේඛයක් තිබෙනවා නම් ඒ සම්බන්ධව සොයා බලා ඊළඟ පැය ඇතුළත ඔබතුමාට අනිවාර්යයෙන්ම තොරතුරු ඉදිරිපත් කරන්නම් කියලා. එවැනි චක්‍රලේඛයක් තිබෙනවා නම්, මට ඒකේ copy එකකුත් ලැබෙන්න සලස්වන්න. මමත් හොයා ගන්නම්. ඒ සිද්ධිය උතුරුමැද පළාතට අදාළ එකක් ද කියලා මම හොයලා බලන්නම්. ඒ වාගේම මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා එවැනි චක්‍රලේඛයක් ගැන තොරතුරු ඉදිරිපත් කළාට.

ඔබතුමන්ලා විලච්චිය ප්‍රදේශයේ පාසල් 3ක් සම්බන්ධයෙනුත් කථා කළා. මම විලච්චිය ගැන නොවෙයි කථා කළේ. ඒක ගැන මම වාද කළේ නැහැ. මම කථා කළේ මීනුවන්ගොඩ තත්ත්වය ගැන. මට හැකියාවක් ලැබුණා, ඔවුන් -පාසල් සංවර්ධන සමිතියේ නිලධාරින්- සමඟ සාකච්ඡා කරන්න. ඒ සම්බන්ධවයි මම ප්‍රකාශ කළේ. විලච්චිය ගැන නොවෙයි මම ප්‍රකාශ කළේ. විලච්චිය ප්‍රදේශයේ ඇති වුණ සිද්ධිය ගැන හොයලා බලන්න වෙනවා. ඒක කියන අතරතුර, මේ ප්‍රශ්නය රටේ තිබෙනවාය කියන එකත් අනිවාර්යයෙන්ම මම පිළිගන්නවා. මම ඒ ගැන අඩියක්වත් පස්සට ගන්නේ නැහැ. අපි ඔක්කෝම එකතුවෙලා ඒකට විසඳුමක් සෙවිය යුතුයි කියන තැන තමයි මම ඉන්නේ. ස්තුතියි.

**ගරු වීරසුමන වීරසිංහ මහතා**
(மாண்புமிகு வீரசுமன வீரசிங்ஹ)
(The Hon. Weerasumana Weerasinghe)
ගරු කථානායකතුමනි, කෙටි පැහැදිලි කිරීමකට මටත් අවස්ථාව දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කියන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු වීරසුමන වීරසිංහ මහතා**
(மாண்புமிகு வீரசுமன வீரசிங்ஹ)
(The Hon. Weerasumana Weerasinghe)
ගරු කථානායකතුමනි, මන්දපෝෂණය ගැන අදත්, ඊයේත් - අවස්ථා ගණනාවක- ගොඩක් කාරණා කථා කළා. එය රෝහිණී කුමාරි කවිරත්න මන්ත්‍රීතුමිය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරපු යෝජනාවක්. ඒ සම්බන්ධයෙන් දවසක පූර්ණ විවාදයක් පැවැත්වුණා. ඒ වෙලාවේත්, පිළිතුරු කථාව විධියට "මේ ප්‍රශ්නය පරණ එකක්" කියා වහලා දැම්මා මිසක්, ඒකට අවශ්‍ය කිසිම දෙයක් කළේ නැහැ. ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්නය මේ රටේ දරුවන්ගේ ප්‍රශ්නයක්. එදා විවාදයේදීත් මේ පිළිබඳ සාධනීය කාරණා රැසක් පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරුන්ගෙන් ඉදිරිපත් වුණා. ගරු අමාත්‍යතුමාගේ අවධානයටත් මම ඒවා යොමු කරනවා. එහිදී වතුකරයේ ජීවත් වෙන දරුවන්ගේ ප්‍රශ්න, නාගරික වතුකරයේ ජීවත් වන දරුවන්ගේ ප්‍රශ්න, ධීවර ප්‍රජාවගේ ප්‍රශ්න ආදි වශයෙන් දරුවන්ට තිබෙන ප්‍රශ්න ගැන කාරණා ගණනාවක් ඉදිරිපත් වුණා. ඒක නිසා ගරු කථානායකතුමනි මේ ප්‍රශ්නය යට ගසන්නේ නැතිව, පාර්ලිමේන්තුවේ විශේෂ කාරක සභාවක් හරහා එයට සාමූහික උත්තරයක් ලබා දෙන්න ඔබතුමා කටයුතු කරන්න කියලා මම ඉල්ලා සිටිනවා. ඒකට අපිත් උදව් කරන්නම්. කවුරුත් මැදිහත් වෙලා ඒක කරමු. මෙතැන කාගේද, කොළ ද, නිල් ද, රතු ද කියලා ප්‍රශ්නයක් නැහැ. මේක මේ රටේ දරුවන්ගේ -අනාගත පරම්පරාවේ- ප්‍රශ්නයක්. මන්දපෝෂණය කියන කාරණාව මතු වෙන්නේ, තවත් පරම්පරාවකට. මන්දපෝෂණ තත්ත්වය දරුවන්ගේ අධ්‍යාපන මට්ටම, දැනුම මට්ටම, මොළය වර්ධනය ආදි මේ හැමදේටම බලපානවා.

ඊළඟ පරම්පරාවේ ප්‍රශ්නයක් වෙනුවෙන් මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් 225දෙනාටම වග කියන්න වෙනවා. ගරු කථානායකතුමනි, ඒක නිසා මම ඔබතුමාගෙන් ඉල්ලනවා, මේ කාරණය සම්බන්ධයෙන් පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් හෝ වෙනත් සුදුසු කාරක සභාවක් පත් කරලා කාගේත් අදහස්, යෝජනා අරගෙන යම් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න කියලා. ඒ ඉදිරිපත් වෙච්ච යෝජනාව, ඒ මතු වෙච්ච කාරණා සම්බන්ධයෙන් අමාත්‍යාංශ නිලධාරින් කථා කළා ද, ඒවා ගැන සොයා බැලුවා ද, ඒවාට ඇහුම්කන් දුන්නා ද, පසුවිපරමක් කළා ද කියලා මම දන්නේ නැහැ. මම සෞඛ්‍ය ඇමතිතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලනවා, ඒ කාරණාව සම්බන්ධව පාර්ලිමේන්තුවේ සාමූහිකව වැඩ කරන්න පුළුවන් ආයතනයක්, ව්‍යුහයක්, එහෙම නැත්නම් Select Committee එකක් පත් කරලා එයට මැදිහත් වෙන්න කියලා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
Sir, I just want a couple of minutes to raise an important matter.

ගරු කථානායකතුමනි, අපි දැන් මේ එක ප්‍රශ්නයක් දිහා විතරයි නේ බලන්නේ. විලච්චියේ පාසලක දරුවෝ ක්ලාන්ත

වෙලා. මීනුවන්ගොඩ පාසලක දරුවෝ ක්ලාන්ත වෙලා. ඒ, එක ප්‍රශ්නයක්. හැබැයි, මෙන්න මේ ප්‍රශ්නය ඊට වඩා පුළුල් ප්‍රශ්නයක්; බැරෑරුම් ප්‍රශ්නයක්. ඒ නිසා කරුණාකර මට විනාඩියක් දෙන්න. මේ බැරෑරුම් ප්‍රශ්නය විසඳන්න අර ඉස්කෝලේට, මේ ඉස්කෝලේට විසඳුම් දීලා බැහැ. ඒ සඳහා සමස්ත විසඳුමක් ඕනෑ.

මම අද ප්‍රධාන පුවත් පත් දෙකක headlines කියවන්නම්. "Daily FT" පුවත් පතේ කියලා තිබෙනවා, "SL not out of the woods yet and there is no second chance:...." කියලා. කවුද මේ කියන්නේ? CBSL Chief, Dr. Nandalal Weerasinghe. දෙවැනි chance එකක් නැති ලු. මෙවර හරියට කළේ නැත්නම් ඉවරටම ඉවරයි කියලායි කියන්නේ. ඒක කියන්නේ මහ බැංකු අධිපතිවරයා; පාර්ලිමේන්තුවේ සියලු දෙනා ගරු කරන පුද්ගලයෙක්. අද "Daily Mirror" පුවත් පතේ තිබෙනවා, "On Friday, we are making the announcement and making a public presentation inviting all external creditors and we present our programme" කියා මහ බැංකු අධිපතිවරයා පැවසූ බව. ඒ කියන්නේ එතුමා කියනවා, IMF Agreement එක සහ අපේ ඉදිරි වැඩ පිළිවෙළ ගැන හෙට public presentation එකක් කරනවා කියලා. Public presentation එකක් කිව්වාට, ඒක සියලු පුද්ගලයන් සඳහා කරන එකක් නොවෙයි. ඒක කරන්නේ ණයහිමියන්ට. ගරු කථානායකතුමනි, ඔබතුමා උදේ කියපු කථාව අපට දැන් news alert එකක් විධියට ඇවිල්ලා තිබෙනවා: "President informs Speaker that the IMF Staff-level Agreement is not finalized, and Cabinet and Opposition will be briefed on the Agreement after the creditors' report is added and approved by the IMF Board". ඒ කියන්නේ, ජනාධිපතිතුමා ඔබතුමාට කිව්වා ලු - මේක හරිද, නැද්ද කියන්න මම දන්නේ නැහැ. මේ ඔබතුමා කියපු කථාව - අපට එය පෙන්වන්නේ Agreement එක finalize වුණාට පස්සේ කියලා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
No, that is wrong.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
ඒක වැරදිද? එහෙම නම් මේ කට්ටියට කියන්න, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
That is wrong. What he told me was, once all the discussions are over, finalities are reached and before going to the IMF, he will brief the Cabinet and the relevant Ministers .

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
එහෙම නම් ඒක හොඳයි. මේ විධියේ වැරදි alert ගහන කොට බලන්න එපා යැ, මොනවාද ගහන්නේ කියලා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
They would have taken it mistakenly.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
මම වැදගත්ම කථාව කියන්නම්. ගරු කථානායකතුමනි, 2021 ජූලි මාසයේ 8වැනි දා ගැසට් එකක් නිකුත් කරලා කිව්වා, මුදල් අමාත්‍යාංශයේ අනුමැතිය, කැබිනට් මණ්ඩලයේ අනුමැතිය දුන්නා කියලා, ලංකාවේ පුද්ගලයන්ට ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කර ද්විතියික වෙළෙඳ පොළෙන් ලබා ගන්න. මම දන්නේ නැහැ, එවකට මහ බැංකු අධිපති විධියට නිවාඩ් කබ්රාල් ද, වෙන කවුරුවත්ද හිටියේ කියලා. පිට රටවලින් ඩොලර් ණයට අරගෙන ඒ ඩොලර්වලින් සියයට 50ක් මේ ISBsවලත්, ඉතුරු සියයට 50 ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවලත් ඩොලර්වලින් ආයෝජනය කරන්න පුළුවන් කියලා එහිදී කිව්වා. ඒ කියන්නේ මොකක්ද? මේ රටේ ණයහිමියෝ ඉන්නවා. ඒ, සමහර පවුල්වල කට්ටිය වෙන්න පුළුවන්; සමහර බැංකුවල කට්ටිය වෙන්න පුළුවන්. ඩොලර් බිලියන ගණනක් ගැන මම මේ කථා කරන්නේ, ගරු කථානායකතුමනි. ප්‍රධාන බැංකුවලට පමණක් ඩොලර් බිලියන එකහමාරකට වඩා ගෙවන්න තිබෙනවා. මහා ලොකුවට කථා කරන ආණ්ඩුව කිව්වා, "පිට රට ගිහිල්ලා ඩොලර්වලින් ණය ගන්න. ඒ ඩොලර් ගෙනැල්ලා ද්විතියික වෙළඳ පොළෙන් ISBs ගන්න" කියලා. දැන් ISBs ගෙවන්න බැහැ. ISBs ගෙවන්න බැරි නිසා ණයහිමියන්ට සාකච්ඡාවකට කථා කරලා තිබෙනවා. හැබැයි, මේ පාර්ලිමේන්තුව දන්නේ නැහැ, මොකක් ගැනද කථා කරන්නේ කියලා. හැබැයි, ණයහිමියන්ට හෙට කියනවා, මේක තමයි plan එක කියලා. මේ ණයහිමියන් අතරේ ජාත්‍යන්තර ණයහිමියන් ඉන්නවා; දේශීය ණයහිමියන් ඉන්නවා; පවුල්වල කට්ටිය ඉන්නවා. ඒක තමයි අපි කලින්ම ඇහුවේ, මේ ණය කාටද ගෙවන්න තිබෙන්නේ කියලා. මේ ණය ගෙවන්න තිබෙන පුද්ගලයන් ගැන අපට කිසිම දැනුමක් නැහැ. එතකොට ඒක සාධාරණ ද, ගරු කථානායකතුමනි? ශ්‍රී ලාංකිකයෝ සමහර දෙනෙකුට හෙට ඒ සියලු වැඩ පිළිවෙළ ඉදිරිපත් කරනවා. හැබැයි, ඒ වැඩ පිළිවෙළ ගැන අපි දන්නේ නැහැ; ඔබතුමා දන්නේත් නැහැ; මගේ ඉස්සරහින් ඉන්න අගමැතිතුමාගේ කැබිනට් මණ්ඩලය දන්නේත් නැහැ.

හැබැයි, මහ බැංකුවේ අධිපතිතුමා කියනවා එක chance එකයි තිබෙන්නේ, මේ chance එක miss වුණොත් රට වැටිලා, විනාශ වෙලා, සුන්නද්දූලි වෙලා යනවා කියලා. මීනුවන්ගොඩයි, විලච්චියේයි ඉස්කෝලවල විතරක් නොව කොළඹ ඉස්කෝලවලත්, -රාජකීය විද්‍යාලයේ පවා- දරුවෝ ක්ලාන්ත වෙලා වැටෙනවා. මෙතැන ලොකු පරස්පරයක් තිබෙනවා. මෙතැනදී සංවේදී කාරණා කියන්න එපා කියලා අපි කියන්නේ නැහැ. නමුත් ගරු කථානායකතුමනි, මම දැඩිව විශ්වාස කරනවා මේ කරන වැඩකටයුතු සම්බන්ධයෙන් අපි දැනුවත් විය යුතුයි, සාකච්ඡා කළ යුතුයි කියලා. අපට පුළුවන් තරම් සහයෝගය අපි දෙනවා. අපට මේ රට වට්ටන්න කිසිම අවශ්‍යතාවක් නැහැ. අපේ සහයෝගය නැතිව මේ කටයුතු කරන්න බැහැ. අපේ සහයෝගය ලබා දෙන්න නම්, අඩු වශයෙන් යම්කිසි road map එකක්, වැඩ පිළිවෙළක්, මාර්ගෝපදේශයක් පිළිබඳව අපි හෙටට කලින් කථා කරමු.

**ගරු අශෝක් අබේසිංහ මහතා**
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)
ගරු කථානායකතුමනි, මට පොඩි පැහැදිලි කිරීමක් කරන්න තිබෙනවා. ගරු සෞඛ්‍ය ඇමතිතුමනි, වෛද්‍යවරුන්ගේ විශ්‍රාම වයස පිළිබඳව කථා කරනකොට අවධානයට යොමු නොවුණු කාරණයක් තිබෙනවා. ලංකාවේ ලියාපදිංචි වෛද්‍යවරු කියලා කොට්ඨාසයක් ඉන්නවා. ඒ සේවය දැන් ක්ෂය වී ගෙන යනවා. දැනට ඒ අය 653දෙනෙක් ඉන්නවා. මේ අය තමයි අතිදුෂ්කර රෝහල්වල කටයුතු කරන්නේ. වයස අවුරුදු 60න් විශ්‍රාම

[ගරු අශෝක් අබේසිංහ මහතා]

යවනකොට මේ අයගෙන් 350දෙනෙකු විශ්‍රාම යනවා; වයඹ පළාතේ ඉන්න 70දෙනාගෙන් 40දෙනෙක් විශ්‍රාම යනවා. එතකොට මේ දුෂ්කර කාලයේ අතිදුෂ්කර රෝහල්වල වැඩ සම්පූර්ණයෙන් ඇන හිටිනවා. විශ්‍රාම වයස පිළිබඳව සාකච්ඡා කරද්දී ඒ ලියාපදිංචි වෛද්‍යවරු පිළිබඳවත් යම්කිසි අවධානයක් යොමු කරන්න. ඒ අය පිළිබඳව තවම කවුරුත් කථා කළේ නැහැ. ඒ නිසා ඒ අය ගැනත් අවධානය යොමු කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய றம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)
ගරු කථානායකතුමනි, ඒ සම්බන්ධව මගේ අවධානය යොමු කරන්නම්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
වරප්‍රසාද ප්‍රශ්නය, ගරු ජී.එල්. පීරිස් මැතිතුමා.

## වරප්‍රසාද: පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ කථා කිරීමේ නිදහස
## சிறப்புரிமை: பாராளுமன்ற உறுப்பினர்களின் பேச்சுச் சுதந்திரம்
## PRIVILEGE: FREEDOM OF SPEECH OF MEMBERS OF PARLIAMENT

**ගරු (මහාචාර්ය) ජී.එල්. පීරිස් මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ.எல். பீரிஸ்)
(The Hon. (Prof.) G.L. Peiris)
ගරු කථානායකතුමනි, ඔබතුමාගේ අවසරය සහිතව මම මේ ගරු සභාවට වරප්‍රසාද ප්‍රශ්නයක් ඉදිරිපත් කරනවා.

ගරු කථානායකතුමනි, මන්ත්‍රීවරුන් නිශ්ශබ්ද කිරීමෙන් කිසිම ප්‍රශ්නයක් විසඳන්න බැහැ. පසුගිය පැය දෙක තුළ අපි දැක්කා විශේෂයෙන්ම ළමා මන්දපෝෂණය ගැන කෙතරම් බැරෑරුම් ප්‍රශ්න මේ රටේ තිබෙනවාද කියලා. මන්ත්‍රීවරයාගේ ප්‍රමුඛ වගකීම හා යුතුකම තමයි, ජනතාව වෙනුවෙන් ජනතාවගේ දුක් ගැනවිලි, ප්‍රශ්න, ගැටලු අවංකව මේ ගරු සභාවට ඉදිරිපත් කිරීම. එසේ කිරීම සඳහා භාෂණයේ අයිතිය තිබීම මූලික වෙනවා. මේ ගරු සභාවට පැමිණ ඔබතුමා අමතමින් රටේ තත්ත්වය ඉදිරිපත් කිරීමේ අයිතිය තමයි පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදයේ හරය, ගරු කථානායකතුමනි. ඒත් අද ඇති වෙලා තිබෙන තත්ත්වය මොකක්ද? චේතනාන්විතව සහ සැලසුම් සහගතව මේ ගරු සභාවේ මන්ත්‍රීවරු 13දෙනෙකුට කථා කිරීමේ අයිතිය අද සම්පූර්ණයෙන් අහිමි කරලා තිබෙනවා. ඒක තමයි අගෝස්තු 31වන දා සිට තත්ත්වය. ඒ කියන්නේ දවස් 22ක් ඒ තත්ත්වය දිගින් දිගටම පැවතුණා.

ගරු කථානායකතුමනි, සාමාන්‍ය සම්ප්‍රදාය තමයි මන්ත්‍රීවරයෙකුට කථා කරන්න අවශ්‍ය නම්, ඔහුට නිශ්චිත කාලයක් වෙන් කරනවා, ඒ අනුව මන්ත්‍රීවරයාට දැනුම් දෙනවා අහවල් වෙලාවට කථා කිරීමට පුළුවන් කියලා. හැබැයි, මේ මන්ත්‍රීවරු 13දෙනා සම්බන්ධයෙන් සම්පූර්ණයෙන් වෙනස් ප්‍රතිපත්තියක් අනුගමනය කර තිබෙනවා. වෙන කිසිම මන්ත්‍රීවරයෙකුට බලනොපාන සුවිශේෂ නීතියක් හෝ සම්ප්‍රදායක් මේ මන්ත්‍රීවරු 13දෙනා සම්බන්ධයෙන් ක්‍රියාත්මක වෙනවා. ගරු කථානායකතුමනි, මේකේ ප්‍රතිඵලය කුමක්ද? රජයේ ආදායම් මාර්ග වර්ධනය කිරීම සඳහා උචිත ක්‍රමවේද පිළිබඳව ඊයේ මේ සභාවේ බොහොම කාලෝචිත, වටිනා විවාදයක් පැවැත්වුණා. අද අපේ රට මුහුණ දෙන ගැටලු ගැන සිතන විට ඊට වඩා වැදගත් විවාදයක් තවත් නැහැ. මේ මන්ත්‍රීවරු 13දෙනා අතර ආර්ථිකය පිළිබඳ අත්දැකීම් තිබෙන, විශේෂ දැනුමක් තිබෙන, අධ්‍යාපන පසුබිමක් තිබෙන මහාචාර්යවරු, ආචාර්යවරු, නීතිඥයින්, වෛද්‍යවරුන් ඉන්නවා. ඒ අය එම විවාදයට සහභාගි වෙන්න ඉතාම කැමැත්තෙන් සිටියා. මේ කිසිම ප්‍රශ්නයක් නැහැ, ගරු කථානායකතුමනි, අගය එකතු කිරීම - value addition - පිළිබඳ ඒ විවාදයට මේ මන්ත්‍රීවරුන්ට සම්බන්ධ වෙන්න ඉඩ දුන්නා නම්.

හරයක් තිබෙන, වටිනාකමක් තිබෙන විවාද තමයි අද ජනතාව පාර්ලිමේන්තුවෙන් බලාපොරොත්තු වන්නේ. දේශපාලනඥයන් සහ දේශපාලන සංස්කෘතිය පිළිබඳ ජනතා විශ්වාසය විශාල වශයෙන් පිරිහිලා තිබෙන්නේ ඒ ගුණාත්මකභාවය අඩු නිසායි. ඒ ගුණාත්මකභාවය සපයා දීමට මෙවන් පිරිසක් ඉතා කැමැත්තෙන් ඉදිරිපත් වන අවස්ථාවේදී ඒක චේතනාන්විතව වළක්වනවා. ඔවුන්ට කථා කරන්න ඉඩ දෙන්නේ නැහැ.

ගරු කථානායකතුමනි, අද දිනයේ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග සංශෝධනය කිරීම පිළිබඳ විවාදයක් පැවැත්වෙනවා. COPE හා COPA කියන කාරක සභා දෙක සම්බන්ධයෙන් වන සංශෝධනත් එයට ඇතුළත් වෙනවා. රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව සහ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව කියන්නේ අතිශයින් වැදගත් කාරක සභා දෙකක්. ඒ කාරක සභාවක සභාපති හැටියට කටයුතු කළ මහාචාර්ය චරිත හේරත් මැතිතුමා අතින් අගනා සේවයක් සිදු වුණා කියලා මුළු රටම පිළිගන්නවා. එතුමා ඉතා කැමැත්තෙන් හිටියා ඒ කාරක සභාව තුළ කටයුතු කළ කාලය ගැන එතුමාගේ පෞද්ගලික අත්දැකීම් ආශ්‍රිතව අදහස් මාලාවක් මේ ගරු සභාවට ඉදිරිපත් කිරීමට. ඒකටත් අවසර නැහැ. ගරු කථානායකතුමනි, මේක මූලික වශයෙන් මේ ගරු සභාවේ මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාදවලට සෘජුව බලපාන ප්‍රශ්නයක්. එපමණක් නොවෙයි, ජනතාවගේ පරමාධිපත්‍යය, සර්වජන ඡන්ද බලය හා පාර්ලිමේන්තු ක්‍රමයේ අඩිතාලම දෙදරන විධියේ තත්ත්වයක් තමයි මේ නිසා උද්ගත වෙලා තිබෙන්නේ.

අද මේ ගරු සභාවේ මතු වෙච්ච ප්‍රශ්නය ගත්තොත්, ලෝකයේ ඕනෑම පාර්ලිමේන්තුවක මේ විධියේ ප්‍රශ්න මතු වෙනවා නම් ඒ ගැන සාකච්ඡා කරනවා. ළමයින්ට කන්න නැත්නම්, ක්ලාන්තය හැදිලා වැටෙනවා නම් එවැනි ගැටලු සම්බන්ධයෙන් අදහස් ප්‍රකාශ කිරීමට අපි සියලුදෙනාටම නිදහස තිබිය යුතුයි. දැන් ඒක තමයි වළක්වලා තිබෙන්නේ. ගරු කථානායකතුමනි, මෙහි බැරෑරුම් ස්වභාවය අපි ඉදිරිපත් කරනවා ජාත්‍යන්තරයට. ඒ මන්ත්‍රීවරු 13දෙනාගේ අත්සන් සහිතව Martin Chungong, Secretary-General of the Inter-Parliamentary Union වෙත අපි ලිපියක් යවා තිබෙනවා. එතුමාගේ කාර්ය භාරයට කෙළින්ම සම්බන්ධ වන ප්‍රශ්නයක් තමයි මේ තත්ත්වය. Martin Chungong කියන්නේ, අන්තර් පාර්ලිමේන්තු සංගමයේ මහලේකම්තුමා. ඒ වාගේම, පොදු රාජ්‍ය මණ්ඩලීය පාර්ලිමේන්තු සංගමයේ ස්ටීවන් ට්විග් මහ ලේකම්තුමාගේ කාර්ය භාරයටත් මේ තත්ත්වය කෙළින්ම සම්බන්ධ වෙනවා.

ගරු කථානායකතුමනි, ඔබතුමා මීට සති දෙක තුනකට ඉස්සෙල්ලා සහභාගි වුණා, කැනඩාවේ හැලිෆැක්ස් නගරයේ පැවැති Commonwealth Parliamentary Association එකේ සමුළුවකට. එතැන කථා කළේ පාර්ලිමේන්තු සම්ප්‍රදාය, පාර්ලිමේන්තු ඉතිහාසය ගැන. ඒ සියල්ලක්ම බින්දුවට බස්සන වැඩ පිළිවෙළක් තමයි මේ ක්‍රියාත්මක වන්නේ. මෙය අහම්බයක් නොවෙයි, ගරු කථානායකතුමනි. ඉතා චේතනාන්විතව, ද්වේශසහගතව මන්ත්‍රීවරු 13දෙනෙකු ඉලක්ක කරමින් මේ වැඩ

පිළිවෙළ ගෙන යනවා. Commonwealth Parliamentary Association එකේත්, Inter-Parliamentary Union එකේත් මහලේකම්වරුන්ට අපි පූර්ණ වශයෙන් දැනුවත් කර තිබෙනවා, මේ බේදවාචකය ගැන. මෙය පුද්ගලයන්ගේ බේදවාචකයක් නොවෙයි, රටේ ප්‍රජාතන්ත්‍රවාදය සම්බන්ධයෙන් වන බේදවාචකයක්. ඒ වාගේම, දකුණු ආසියානු කලාපීය සහයෝගිතා සංවිධානයේ Secretary-General ශ්‍රී ලාංකිකයෙක්. ඒ තමයි ඇසළ වීරකෝන් මැතිතුමා. එතුමාටත් අපි මේ ලිපිය යොමු කර තිබෙනවා.

ගරු කථානායකතුමනි, මේ අවස්ථාවේදී ඔබතුමාට මේ ගැන දන්වන එක මගේ යුතුකමක්. ගරු කථානායකතුමා හැටියට ඔබතුමා උපරිම උත්සාහ දැරුවා, මේ ප්‍රශ්නයට සාධාරණ විසඳුමක් ලබාදීමට. ඒ සම්බන්ධයෙන් අපේ කෘතඥතාව ඔබතුමාට පිරිනැමීමට අපි කැමැතියි. හැබැයි, ඔබතුමා ගත් සියලු උත්සාහයන් ව්‍යර්ථ වුණා, වෙනත් බලවේග නිසා. තවදුරටත් මේ තත්ත්වය පිළිගැනීමට අපිට කිසිසේත් පුළුවන්කමක් නැහැ, ගරු කථානායකතුමනි. ඒක මේ රටේ ජනතාවට කරන අවැඩක්; අසාධාරණයක්. එම නිසා තවත් ප්‍රමාදයක් නැතුව ඊළඟ පාර්ලිමේන්තු සතියේදී මේ ප්‍රශ්නය නිරාකරණය කර, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ මූලික වරප්‍රසාදය වන භාෂණ අයිතිය ලබා දෙන්න කියලා මේ මන්ත්‍රීවරු 13දෙනා වෙනුවෙන් මා ඔබතුමාගෙන් ඉතා ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

ගරු කථානායකතුමනි, අපිට භාෂණයේ අයිතිය නැත්නම්; මේ ගරු සභාවට ඇවිල්ලා කථා කරන්න අයිතියක් නැත්නම් පාර්ලිමේන්තු වරප්‍රසාද කියන සංකල්පයේ කිසිම අර්ථයක් නැහැ. ඒක හිස් සංකල්පයක් වෙනවා. ගරු කථානායකතුමනි, මෙය බැරෑරුම් ප්‍රශ්නයක්. ඒ නිසා ඉක්මනින් මේ ගැටලුව නිරාකරණය කර දෙන්න කියලා පාර්ලිමේන්තු මන්ත්‍රීවරු 13දෙනකු වෙනුවෙන් මා ඔබතුමාගෙන් ඉතා ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, මා පළමුවෙන්ම ඔබතුමාට ස්තුතිවන්ත වනවා, මේ ප්‍රශ්නය මතු කරපු අවස්ථාවේ ඔබතුමා ඉතා හොඳින්, සාවධානව ඊට සවන් දීම ගැන. විශේෂයෙන්ම එම පාර්ලිමේන්තු මන්ත්‍රීවරු 13දෙනාට මේ සභා ගර්භයේ කථාවක් පවත්වන්න අවස්ථාව නොලැබෙන්නේ, ජනාධිපතිවරයා තෝරා පත් කර ගත් ඒ වැඩ පිළිවෙළේදී ඊට ප්‍රතිවිරුද්ධව කටයුතු කරපු නිසා ද කියලා මම දැන ගන්න කැමැතියි. ඒ වාගේම, ඒ මන්ත්‍රීවරු 13දෙනාගේ කණ්ඩායමට ආණ්ඩුව මෙච්චර බය ද? ඇයි, බය? ඒ අයට භාෂණයේ නිදහසක් නැද්ද? කථා කරන්න අයිතියක් නැද්ද? මේ බය තිබෙන්නේ ඒ 13දෙනාගේ කණ්ඩායමේ නීතිඥවරු, මහාචාර්යවරු, වෛද්‍යවරු, කථිකාචාර්යවරු වැනි ඇත්තටම මේ ජන සමාජය නියෝජනය කරන වියත් පුද්ගලයන් කොට්ඨාසයක් සිටින නිසා ද? ඒක ද, එතුමන්ලාට කථා කරන්න දෙන්නේ නැත්තේ?

ගරු කථානායකතුමනි, දැන් ජිනීවාවල ලොකුවට මානව අයිතිවාසිකම් ගැන කථා කරනවා. මේ රටේ අරගළයේ කණ්ඩායම්, තවත් සිවිල් සංවිධාන, ලසන්ත වික්‍රමතුංග මහත්මයා වෙනුවෙන් ඒ ගිය කණ්ඩායම -එතුමාගේ මරණය ගැන අදටත් පැහැදිලි විභාගයක් නැහැ- වැනි කණ්ඩායම් ගිහිල්ලා මානව සහ සිවිල් අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම ගැන පමණක් නොවෙයි, ආර්ථික අයිතිවාසිකම් අහිමි කිරීම ගැනත්, ආර්ථික සාපරාධී ක්‍රියා - economic crimes - ගැනත් ජිනීවාවල කථා වන කොට, දැන් මේ හදන්නේ මේ උත්තරීතර යැයි කියන පාර්ලිමේන්තුව තුළත් මහජන නියෝජිතයන්ට කථා කරන්න අවස්ථාවක් නැහැයි කියන කාරණය ජිනීවාවල ඉදිරිපත් කරන තත්ත්වයට ගෙන එන්නද?

ගරු කථානායකතුමනි, IPU එකේ ප්‍රධානියා ආවා. අපි වචනයක්වත් කියන්න ගියේ නැහැ. අපි කථා කරන්න ගියේවත් නැහැ. ඒ මොකද? අපි හිතුවා, ඔබතුමාගෙන් මේකට විසඳුමක් ලැබෙයි කියලා. මොකද, රට ඇතුළේ ගනුදෙනු පිටතින් විසඳා ගන්න අපි අකැමැතියි. අපට එහෙම වුවමනාවක් නැහැ. හැබැයි, ගරු කථානායකතුමනි, මන්ත්‍රීවරු 225දෙනාගෙන් මන්ත්‍රීවරු 13දෙනකුට මේ සභා ගර්භයේ කථා කරන්න අවස්ථාව නැතිවීම තුළ, මේ දෙන සංඥාව මොකක්ද? ආණ්ඩුව කියන්නේ, ඒවා පිටතට ගිහින් විසඳා ගන්න කියලා ද? ජිනීවා ගිහිල්ලා විසඳා ගන්න, IPU එකට ගිහිල්ලා විසඳා ගන්න, Commonwealth Parliamentary Association එකට ගිහිල්ලා විසඳා ගන්න කියලා ද? ඒක ද මේ දෙන පණිවුඩය? මේ 13දෙනාට ඇයි මෙච්චර බය? ගරු කථානායකතුමනි, මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. ඔබතුමා යම් යම් අවස්ථාවල ඔබතුමාගේ අභිමතය පරිදි අපේ මහජන නියෝජිතයන්ට කථා කරන්න අවස්ථාව දීලා තිබෙනවා. ආණ්ඩු පාර්ශ්වයෙන් මේ යුතුකම ඉෂ්ට කරන්නේ නැත්නම්, ආණ්ඩු පාර්ශ්වයේ මන්ත්‍රීවරු කොටසකට එක විධියකටත් තවත් මන්ත්‍රීවරු කොටසකට වෙනස් විධියකටත් සලකනවා නම්; discriminate කරනවා නම්, ඔබතුමා අභිමතය උපයෝගි කරගෙන මේ ප්‍රශ්නය විසඳන්න කියලා මම බොහොම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. *[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු ඩිලාන් පෙරේරා මන්ත්‍රීතුමා.

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)

ගරු කථානායකතුමනි, මා නැඟී සිටියේ මේ ප්‍රශ්නය විසඳීම සඳහා ඔබතුමාට උපකාරයක් කරන්නයි. ඒ නිසා මට පොඩි වෙලාවක් දෙන්න.

ගරු කථානායකතුමනි, මෙවැනිම තත්ත්වයක් උදා වුණා, 2015 යහ පාලන ආණ්ඩු සමයේ. 2015 මැතිවරණයට අපි සියලුදෙනාම තරග කළේ, එක්සත් ජනතා නිදහස් සන්ධානයෙන්. ඊට පස්සේ, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මධ්‍යම කාරක සභාවේ තීන්දුවක් අනුව කොටසක් එක්සත් ජනතා නිදහස් සන්ධානයෙන් ඉවත්වෙලා යහ පාලන ආණ්ඩුවට එකතු වුණා; එකාබද්ධ ආණ්ඩුවක් පිහිටුවීමට. දැනට මේ පැත්තේ ඉන්න මන්ත්‍රීතුමන්ලාගෙන් එදා ඒකට විරුද්ධ වුණේ, ඩලස් අලහප්පෙරුම මැතිතුමා විතරයි.

ඔබතුමාත්, වර්තමාන අගමැතිතුමාත් ඇතුළුව අද ආණ්ඩු පක්ෂයේ ඉන්න බොහෝදෙනෙක් - මන්ත්‍රීවරු 55දෙනෙක් - එදා ඒකට විරුද්ධ වෙලා කිව්වා, "නැහැ, අපි ආණ්ඩුවට යන්නේ නැහැ" කියලා, ගරු කථානායකතුමනි.

**ගරු වීරසුමන වීරසිංහ මහතා**
(மாண்புமிகு வீரசுமன வீரசிங்ஹ)
(The Hon. Weerasumana Weerasinghe)

ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාත් ඇතුළුව.

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)

එදා ඔබතුමන්ලා ඇවිත් විරුද්ධ පක්ෂයේ ඉඳගත්තා. එතකොට මම හිටියේ ආණ්ඩු පක්ෂයේ. ගරු කථානායකතුමනි, එදා මේ විධියටම ඒ මන්ත්‍රීවරුන් 55දෙනාට පාර්ලිමේන්තුවේ කථා කිරීම සම්බන්ධයෙන් ප්‍රශ්නයක් මතු වුණා. එවිට, හිටපු කථානායකතුමා ඒ ගැන සලකා බලා තීන්දුවක් දුන්නා. එක්සත් ජනතා නිදහස් සන්ධානයේ මහලේකම්තුමා කථානායකතුමාට ලිපියක් ලියා තිබුණා, සන්ධානය ආණ්ඩුවේ කියලා. අපි තරග කළේ බුලත්

[ගරු ඩිලාන් පෙරේරා මහතා]

කොළය ලකුණින් නිසා ඒ තීන්දුවේ තිබුණේ, එක්සත් ජනතා නිදහස් සන්ධානයට ලැබෙන වෙලාවෙන් විරුද්ධ පක්ෂයේ හිටපු ඒ 55දෙනාට කාලය ලබා දෙන්න කියලායි. ඒ නිසා මේ ප්‍රශ්නය විසඳන්න වැඩි දුර යන්න ඕනෑ නැහැ. ඔබතුමා එදා විපක්ෂයේ 55දෙනාගේ කණ්ඩායමේ සිටියදී ඔබතුමාට කථා කිරීමේ නිදහස නැති කරන කොට ඔබතුමාගේ පපුවට පිහියෙන් ඇන්නා වාගෙයි නේ දැනුණේ. ඒක ඔබතුමා හොඳටම දන්නවා නේ. එදා ඒ 55දෙනා වෙනුවෙන් නායකත්වය දුන්නේ වර්තමාන අගමැතිතුමායි. එතුමා තමයි ඒ 55දෙනාගෙන් යුත් පාර්ලිමේන්තු කණ්ඩායමේ නායකයා. ඔබතුමාත් එක්ක දිනේෂ් ගුණවර්ධන අගමැතිතුමා ඇතුළු කණ්ඩායම මේ සබා ගැබ මැදට ඇවිල්ලා ඉඳගත්තා, කථා කිරීමේ අයිතිය ඉල්ලලා. එදා ඔබතුමාට වෙච්ච දේ අද ඔබතුමා මූලාසනයේ ඉන්නකොට අපට සිදු වෙමින් තිබෙනවා. එදා දිනේෂ් ගුණවර්ධන මැතිතුමාට වෙච්ච දේ අද එතුමා අගමැතිතුමා වෙලා ඉන්න කොට ඒ පැත්තේ ඉඳගෙන අපට කරනවා. මේක කොච්චර අසාධාරණයක්ද? මෙවැනි අසාධාරණයකට පිළිතුරක් හොයන්න අප මෙච්චර වාද වෙනවා නම්, පාර්ලිමේන්තුවේ කථා කරන අයිතිය සම්බන්ධයෙන් මෙච්චර වාද වෙනවා නම්, කන්න නැතිව ක්ලාන්තය දමන ළමයින් ගැන මොන කථාද? පොහොර නැතිව දුක් විඳින ගොවියා ගැන මොන කථාද? පාර්ලිමේන්තුවේ 13දෙනෙකුට කථා කරන්න දෙන්නේ නැහැ. ඇයි ඒ? පාර්ලිමේන්තුවේදී ජනාධිපතිවරයා තෝරන්න ඡන්දය පවත්වපු අවස්ථාවේ අපි උදවු කළේ ඩලස් අලහප්පෙරුම මැතිතුමාට. ඒ හැර වෙනත් කිසිම හේතුවක් නැහැ. අපි මිනී මරලා ද, හොරකම් කරලාද, පගාව ගහලාද, උසාවියෙන් දඬුවම් විඳලාද? නැහැ. ගරු කථානායකතුමනි, එදා ඒකාබද්ධ විපක්ෂයේ හිටපු කාලයේ ඔබතුමාත් අප වාගේම මේ විධියටම මේ දුක වින්දා. ඒ නිසා වෙන්න ඕනෑ, සාමාන්‍ය පාර්ලිමේන්තු සම්ප්‍රදායට පිටින්, අපට කථා කරන්න අවස්ථාවක් ලබා දෙන්න ඔබතුමා උත්සාහ කරන්නේ. ඒ ගැන අපි ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
ඔබතුමා පොඩ්ඩක් ඉන්න.

ගරු අගමැතිතුමනි, එදා ඔබතුමා ඒකාබද්ධ විපක්ෂය කණ්ඩායමට නායකත්වය දීලා ඒ ලබාගත් විසඳුම ම අප සම්බන්ධයෙනුත් කරුණාකර ක්‍රියාත්මක කරන්න කියා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. මේක මහා අපරාධයක්. ගරු කථානායකතුමනි, මේ අපරාධය හරහා අවසානයේ පහර වදින්නේ ඔබතුමාට -මහින්ද යාපා අබේවර්ධන කථානායකතුමාට- පමණක් නොවෙයි, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවටම සහ ප්‍රජාතානත්ත්‍රවාදී ක්‍රමයට.

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)
ගරු කථානායකතුමනි, ගරු ජී.එල්. පීරිස් හිටපු ඇමතිතුමා ඉදිරිපත් කළ කාරණාව පිළිබඳව ආණ්ඩු පක්ෂය හැටියට අපේ අදහස් ඉදිරිපත් කරන්න ඕනෑ. මම පැහැදිලිව පිළිගන්නවා, පාර්ලිමේන්තුවේ සිටින මන්ත්‍රීවරුන් සියලුදෙනාට කථා කිරීමේ අයිතිය තිබෙන බව. මේ පාර්ලිමේන්තුවේ තිබෙන්නේ වෙස්ට්මිනිස්ටර් සම්ප්‍රදායයක්. මේ පාර්ලිමේන්තුවේ ඉන්නේ ආණ්ඩු පක්ෂය හා විපක්ෂය කියා කොටස් දෙක. එතකොට මෙතැන මැද ස්වාධීන කොටසක් කියන්න කණ්ඩායමක් ඉතිරි වන්නේ නැහැ. එක්කෝ, ආණ්ඩුවේ වෙන්න ඕනෑ; එහෙම නැත්නම් විපක්ෂයේ වෙන්න ඕනෑ. ඒ දෙපැත්තටම නැති අය ඉන්නවා නම්, මැදට ආසන ටිකක් දමා ඒ අය ස්වාධීනයි කියන්න ඕනෑ. එහෙම වුණොත් සිදු වන්නේ, මේ වෙස්ට්මිනිස්ටර් ක්‍රමය නැති කරලා ඔළු තුනේ සම්ප්‍රදායය ක්‍රියාත්මක කරන්නයි. මම අද උදේ වාසුදේව නානායක්කාර හිටපු ඇමතිතුමාටත් කථා කරලා මේ ගැන විස්තර හෙව්වා. ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා මැතිතුමා, මීට කාලෙකට ඉස්සර ස්වාධීන වන අයට කිව්වා මට මතකයි, "ඔළු තුනේ බූරුවෝ" කියලා. මම නම් එහෙම කියන්නේ නැහැ. මම අද වාසුදේව හිටපු ඇමතිතුමාගෙන් ඇහුවා ස්වාධීන වන අයට ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා මැතිතුමා කියපු කථාව. එතකොට එතුමා කිව්වා, "ඔළු තුනේ බූරුවෝ" කියලා ඒ කාලයේ ඒ අයට කියපු බව. අපි එහෙම කියන්න කැමැති නැහැ. අපිත් පිළිගන්නවා එතුමන්ලාට කථා කිරීමේ අයිතිය තිබෙනවා කියලා.

2015 වර්ෂයේදී ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් අප පාර්ලිමේන්තුවට තේරී පත් වුණාම, අපේ පක්ෂය තීන්දුවක් ගත්තා, 'අපි විපක්ෂයේ වාඩි වෙනවා' කියලා. ඒ අනුව අපට වෙලාවක් ලබා දුන්නා.

මේ පාර්ලිමේන්තු සම්ප්‍රදායය අනුව අපිත් අපත් එක්ක එකතු වෙච්ච සමහර දේශපාලන පක්ෂවලට ඒ අවස්ථාවම දීලා තිබෙනවා. ගරු කථානායකතුමනි, පසුගිය කාලයේ ලැබුණු අත් දැකීම තමයි, මෙතැන විවාදයක් යනකොට ආණ්ඩු පක්ෂය නියෝජනය කරන මන්ත්‍රීවරුන්ට මුළු කාලයෙන් සියයට 30ක් විතර ලැබීම. ස්වාධීන වෙච්ච සහ විපක්ෂයේ කණ්ඩායම් මුළු කාලයෙන් සියයට 70ක් පමණ කථා කරනවා. පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේදී ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකවරයා හැටියට මම යෝජනා කළා, අපට ලැබෙන සියයට 60 කාලයෙන් යම් කොටසක් පරිත්‍යාග කරන්න අප සූදානම් කියලා. ගරු කථානායකතුමනි, ඔබතුමා එය හොඳාකාරව දන්නවා. අපට මන්ත්‍රීවරු 140 ගණනක් හිටියා. දැන් ඒ ගණන නැහැ. දැන් අපට ඉන්නේ මන්ත්‍රීවරු 128දෙනෙක් විතර. පාර්ලිමේන්තුවේදී ජනාධිපතිවරයා තෝරා පත් කරගැනීමේ ඡන්ද විමසූ අවස්ථාවේ මන්ත්‍රීවරු 134දෙනෙක් රනිල් වික්‍රමසිංහ මැතිතුමාට ඡන්දය දුන්නා. මන්ත්‍රීවරුන් 113දෙනෙකු හිටියත් ඒ අයට සියයට 50ක කාලයක් දෙන්න ඕනෑ. "සියයට 55ක් හෝ ඒ හා සමාන යම් කාලයක් අපට දෙන්න, අපි ඉතිරි කාලය විපක්ෂයට දෙන්නම් කියලා" අපි ප්‍රකාශ කළා. අද විපක්ෂ නායකතුමා මෙතැන මොන විධියේ කථාවක් කළත්, ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා ඒ ගැන දන්නවා. එතුමා එදා ප්‍රසිද්ධියේ කිව්වා, අපිට කාලය දෙන්න බැහැ කියලා. ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමනි, අපිට කාලය දෙන්න බැහැ කියලා ඔබතුමා එදා කිව්වා. ඉතින් අප කියන්නේ, අපේ වෙලාවෙනුත් දෙන්නම්, ඔබතුමන්ලාගේ වෙලාවෙනුත් කොටසක් දෙන්න කියලා. අපේ පක්ෂයෙන් තීන්දුවක් අරගෙන එතුමන්ලා ගියා නම්, අපි එකඟයි. ඒ නිසා තමයි විමල් වීරවංශ මන්ත්‍රීතුමාට, වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමාට අප අපේ පැත්තෙන් කාලය දෙන්නේ. හැබැයි, ස්වාධීන වෙලා විපක්ෂයේ වාඩි වුණාම ඒ අය එක පැත්තක් තෝරාගන්න ඕනෑ. ඔළු තුනේ අය වෙලා ඉන්න බැහැ. ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමා කිව්වා, "ඒ කණ්ඩායමේ හැදියාව බලලා, ක්‍රියා කලාපය බලලා අපි තීන්දුවක් ගන්නම්; මේ කාලයේ ඒ ගොල්ලන් probation" කියලා. අපි නොවෙයි, එහෙම කිව්වේ. *[බාධා කිරීම්]* අපට නම් එතුමන්ලාගේ හැදියාව හොඳයි. එතුමන්ලා විපක්ෂයේ වාඩි වුණා කියලා අපේ තරහක් නැහැ. ඒ නිසා අපට වෙන් කරන කාලයෙනුත් කොටසක් දෙන්නම්, ඔබතුමන්ලාත් ඔබතුමන්ලාගේ කාලයෙන් කොටසක් දීලා එතුමන්ලාට ඒ අවස්ථාව දෙන්න කියන යෝජනාව මම කරනවා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, මගේ නම සඳහන් වෙච්ච නිසා මම පැහැදිලි කිරීමක් කරන්න ඕනෑ.

Probation කථාවක් මා කිව්වේ ඩලස් අලහප්පෙරුම මන්ත්‍රීතුමාගේ කණ්ඩායමට නොවෙයි. තව කණ්ඩායමක් ඉන්නවා, විපක්ෂය පැත්තේ වාඩි වුණාට ආණ්ඩුවත් එක්ක එකතු වෙලා ඡන්දය දෙන. ඒ කණ්ඩායම විපක්ෂය පැත්තේ වාඩි වුණාට ආණ්ඩුවත් එක්කයි ඡන්දය දෙන්නේ. ඒක වෙනම කථාවක්. නමුත්, පාර්ලිමේන්තු සම්ප්‍රදායයක් තිබෙනවා නේ, ගරු කථානායකතුමා? There is a parliamentary tradition. පාර්ලිමේන්තු සම්ප්‍රදායය තමයි පාර්ලිමේන්තුවට තේරිච්ච කණ්ඩායමට හිමි වෙලාවෙන් කාලය ලබා දීම. ඒක තමයි සම්ප්‍රදායය. වැඩිදුර ගිහින් මේ ගැන මහා තර්කයක් ඇති කරගන්න ඕනෑ නැහැ. විපක්ෂයේ වාඩි වෙච්ච මේ මන්ත්‍රීවරුන් තේරී පත් වෙලා ආවේ ඔය පැත්තෙන්; ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ කණ්ඩායමෙන්. ඉතින් වෙලාව දෙන්න ඕනෑ, ඔය පැත්තෙන්. ඒක තමයි බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුව වුණත් අනුගමනය කරන්නේ. මේ පැත්තේ වාඩි වුණා කියලා "මගෙන් කැල්ලයි, එහෙන් කැල්ලයි" කියමින් කාලය අඩු වැඩි කරන්න බැහැ. Time is given by the party from which they were elected. මම probation කථාව කිව්වේ ජී.එල්. පීරිස් මැතිතුමාගේ කණ්ඩායමට නොවෙයි. සමහර කණ්ඩායම් ඉන්නවා, මේ පැත්තේ වාඩි වුණාට ඔය පැත්තට ඡන්දය දෙන. ඒ අය ගැනයි මම කිව්වේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මේක දැන් තමුන්නාන්සේලාට විසඳාගන්න පුළුවන් නේ.

**ගරු චන්දිම වීරක්කොඩි මහතා**
(மாண்புமிகு சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු චන්දිම වීරක්කොඩි මන්ත්‍රීතුමා.

**ගරු චන්දිම වීරක්කොඩි මහතා**
(மாண்புமிகு சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody)
පාර්ලිමේන්තු සම්ප්‍රදායය ගැන ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා කියන්නේ මොකක්ද කියලා මම දන්නේ නැහැ. අපේ මව් පාර්ලිමේන්තුව බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුව. ඒ වාගේම අපේ පාර්ලිමේන්තුවේ පැරණි සම්ප්‍රදායයන් තිබෙනවා. පසුගිය යහ පාලන ආණ්ඩුව කාලයේ පමණක් නොවෙයි, ඊට කලින් ආණ්ඩුවේ ජනතා විමුක්ති පෙරමුණ අපත් එක්ක එකට ඡන්දය ඉල්ලලා ඇවිත් වෙන් වෙලා ගියාම ඒ අයටත් කථා කරන්න අයිතිය දුන්නා. එහෙම සම්ප්‍රදායයක් තිබෙනවා. නමුත් අද වෙලා තිබෙන්නේ ආණ්ඩු පක්ෂයේ කියලා කණ්ඩායමක් තීන්දු කරගෙන ඒ තීන්දු කරගත් කට්ටියට විතරක් කථා කරන්න අවස්ථාව දීලා අනෙක් කට්ටියට කථා කරන්න අවස්ථාව දෙන්නේ නැති එකයි. ගරු කථානායකතුමනි, ඔබතුමා පැහැදිලිවම දන්නවා, අපට වුණත් දුන්නොත් දෙන්නේ විනාඩි 5ක් බව.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒකත් ලොකු කාලයක්.

**ගරු චන්දිම වීරක්කොඩි මහතා**
(மாண்புமிகு சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody)
ගරු කථානායකතුමනි, අපට ඡන්දය දීපු මිනිසුන්ගේ අයිතිය ආරක්ෂා කර දෙන්න.

බූරු කථාවකුත් කිව්වා. "බූරුවෝ" කවුද කියන එක, "බූරුවා" කවුද කියන එක එළියේ මේක අහගෙන ඉන්න ජනතාව හොඳින්ම දන්නවා කියන එක ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා දැනගත්තොත් හොඳයි.

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)
අනේ, සමාවන්න! ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා වැරැදියට තේරුම් ගන්න එපා. මම කාටවත් බූරුවා කිව්වේ නැහැ. මම කිව්වේ ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා මැතිතුමා කියපු එකක්. ඔබතුමාට බැහැ, එතුමාට "බූරුවා" කියන්න. මොකද, එතුමන්ලා මේ පාර්ලිමේන්තු ක්‍රමය තුළ විශාල කාර්යභාරයක් කරපු අය. මම මේ කථා කරන්නේ,- *[බාධා කිරීමක්]*

**ගරු චන්දිම වීරක්කොඩි මහතා**
(மாண்புமிகு சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody)
*තමුන්නාන්සේ කිව්වා නේ,- [බාධා කිරීමක්]*

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)
*ඉතින්, ඉන්න කෝ. [බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කරුණාකර ඔබතුමා ඔය වාදයට යන්නේ නැතුව ඉන්න.

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)
ගරු කථානායකතුමනි, අපේ පැත්තෙන් යම් කාලයක් ලබා දෙන්න අපි සූදානම්. එතුමන්ලා ස්වාධීන වෙලා විපක්ෂයේ වාඩි වුණා. ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් එකසිය තිස් ගණනක් ඉන්නවා. ඒ අයත් කථා කරන්න අවස්ථාව ඉල්ලනවා. ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක හැටියට මම කාලය කළමනාකරණය කරගන්න ඕනෑ. ඒ නිසා තමයි මම කිව්වේ, අපේ පාර්ශ්වයේ වෙලාවෙන් යම් කොටසක් දෙන්නම්, ඔබතුමන්ලාත් යම් වෙලාවක් දෙන්න කියලා. මොකද, විපක්ෂයෙන් ආණ්ඩුව පැත්තට ආපු අයට කථා කරන්න අපි අවස්ථාව දෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳම විසඳුම ඒකයි.

**ගරු (ආචාර්ය) නාලක ගොඩහේවා මහතා**
(மாண்புமிகு (கலாநிதி) நாலக்க கொடஹேவா)
(The Hon. (Dr.) Nalaka Godahewa)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඉක්මනට කියන්න, point of Order එක මොකක්ද කියලා.

**ගරු (ආචාර්ය) නාලක ගොඩහේවා මහතා**
(மாண்புமிகு (கலாநிதி) நாலக்க கொடஹேவா)
(The Hon. (Dr.) Nalaka Godahewa)
මම ඉක්මනින් කියනවා, ගරු කථානායකතුමනි.

අපි අන්තිමට ස්ථාවර නියෝග අනුව නේ ඔක්කොම බලන්නේ. අපේ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා කියපු කථාව සියයට සියයක් නිවැරදි නැහැ. මොකද, පාර්ලිමේන්තුවේ කථා කරන්න කවුරු හෝ මන්ත්‍රීවරයෙකුට අවස්ථාව ලබා දීමේ අයිතිය තිබෙන්නේ තමුන්නාන්සේට, ගරු කථානායකතුමනි. ස්ථාවර නියෝග 91 (ච)හි පැහැදිලිව මෙසේ සඳහන් වෙනවා:

> "මෙම ස්ථාවර නියෝගයේ විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, කථානායකවරයා විසින් මන්ත්‍රීවරයන් අතර සාධාරණ සහ යුක්ති සහගත ආකාරයකට කාලය වෙන් කිරීම සඳහා වගකියනු ලැබිය යුත්තේ ය. කථා කිරීම සඳහා කැඳවනු ලැබිය යුත්තේ කවරෙකුද යන්න තීරණය කරනු ලැබීමේ දී, ආණ්ඩු පාර්ශ්වයේ සහ විරුද්ධ පාර්ශ්වයේ සංවිධායකවරයන් විසින් එසේ කථා කිරීම සඳහා කථානායකවරයා විසින් කැඳවනු ලැබිය යුතු මන්ත්‍රීවරයන්ගේ ලැයිස්තුවක් ලබා දීම මඟින් කථානායකවරයාට සහාය වනු ලැබිය හැකි ය."

ඒක නිසා, මෙහෙම අයිතියක් නැහැ. අපි පසුගිය කාලයේ සම්ප්‍රදායක් හදාගෙන තිබෙනවා. අපි ඉස්කෝලේ යන කාලයේ - පුංචි කාලයේ- බලාගෙන හිටියා, පාර්ලිමේන්තු මන්ත්‍රීවරු කථා කරන හැටි. හුඟක් අයට සිහිනයක් තිබුණා, පාර්ලිමේන්තුවේ කථා කරන්න. පාර්ලිමේන්තුවේ කථාව සීමා කරන්නේ නැහැ, ගරු කථානායකතුමනි. ඒක පවා පසු කාලීනව සම්ප්‍රදායක් වුණා. මොකද, හුඟක් අය කථා කරන්න ඕනෑ කියන නිසා තමයි වෙලාව වෙන් කරගෙන තිබෙන්නේ. එහෙම නැතිව, ආණ්ඩු පක්ෂයට මෙච්චර වෙලාව අයිතියි, විපක්ෂයට මෙච්චර වෙලාව අයිතියි කියලා කියන්න කාටවත් බැහැ. ඒක ඔබතුමාගේ කැමැත්ත අනුවයි කරන්නේ. අපට කාලය ලබා දෙන්න පසුගිය දවස්වල ඔබතුමා උත්සාහ කළ බව අපි දන්නවා. අපි ඒ පිළිබඳව ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා. අපි කියන්නේ එකම එක දෙයයි. ඒකට ක්‍රමවේදයක් හදාගන්න කියන එකයි අපි කියන්නේ. අපට අපේ කථාව දෙන්නේ කොයි වෙලාවටද කියලා අසමින් හැම තිස්සේම ඔතැනට ඇවිත් ඔබතුමාට හෝ ඒ අවස්ථාවේ මූලාසනයේ සිටින කෙනාට බැගෑපත් වෙන්න බැහැ. අපට කථා කරන්න වෙලාව දෙනවා නම්, ඒ දෙන්නේ කොයි වෙලාවද කියලා සඳහන් කරලා උදෙන්ම කථික ලැයිස්තුවට නම දමන්න. එච්චරයි අපි ඉල්ලන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒකට මට සියලුදෙනාගේම සහයෝගය දෙන්න.

**ගරු ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා**
(மாண்புமிகு பிரேம்நாத் சி. தொலவத்த)
(The Hon. Premnath C. Dolawatte)
ගරු කථානායකතුමනි, මේ ගෙවෙන්නේ සාහිත්‍ය මාසයයි. අපි දන්නවා, කොළඹ ජාත්‍යන්තර පොත් ප්‍රදර්ශනය දශක දෙකකට වැඩි කාලයක් තිස්සේ දිගටම පවත්වනවා කියලා. මේ වනවිට අපේ දරුවන් ලක්ෂ සංඛ්‍යාත ගණනක් මේ සඳහා සහභාගි වෙලා තිබෙනවා. හැබැයි, දැන් තිබෙන ආර්ථික අර්බුදයත් එක්ක මෙන්න මේ මගේ අතේ තිබෙන පිටු 80ක පොත මේ අවුරුද්දේ print කළාම රුපියල් 700ක් වෙනවා. හැබැයි, ගිය අවුරුද්දේ print කළ ඊට වඩා වැඩි පිටු ගණනක් තිබෙන මෙන්න මේ ලොකු පොත රුපියල් 900යි. ගරු කථානායකතුමනි, මෙතැන තිබෙන ප්‍රශ්නය මේකයි. පොත් ගන්න එන අය පරණ පොත් ටික මිල දී ගත්තාට පස්සේ අලුතින් print කරන පොත් ගන්න මිනිසුන්ට හැකියාවක් නැහැ. පාසල් පෙළ පොත්, ලියන පොත්වලටත් අනාගතයේ මේ දෙය සිද්ධ වෙනවා. ඒ නිසා, අඩුම තරමින් මේ පොත් ප්‍රකාශකයන්ටවත් යම් සහනදායී ක්‍රමයකට කඩදාසි ටික ගෙනෙන්න ක්‍රමවේදයක් හදලා දෙන්න කියලායි මම ඉල්ලා සිටින්නේ. එහෙම නැති වුණොත්, දරුවන් මේ වනවිට කන්න නැතිව මන්දපෝෂණයෙන් සිටිනවා වාගේ දැනුම ලබා ගැනීම අතිනුත් විශාල වශයෙන් අර්බුදයකට මුහුණ දෙන්න වෙනවා. අපට ලියන්න, කියවන්න පොත් ටික නැති වෙනවා. සමහර අය, "සාහිත්‍ය කන්නද?" කියලා මේක සිනහවට ලක් කරයි. හැබැයි, අපිට කියවන්න පොතක් නැති වෙනවා. සාහිත්‍යයට මරු පහරක් එල්ල වෙනවා. මේ අයට පොතක් ලියන්න, පොතක් print කරන්න, පොතක් ප්‍රකාශයට පත් කරන්න යම් සහනදායී ක්‍රමවේදයක් හදන්න. අපේ වෙළෙඳ ඇමතිතුමා මේ අවස්ථාවේ ගරු සභාවේ ඉන්නවා. මම මේ සම්බන්ධයෙන් එතුමාගේ අවධානය යොමු කරවනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩ කටයුතු.

## ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා (සංශෝධන) පනත් කෙටුම්පත
## இலங்கைத் தொலைக்காட்சிக் கூட்டுத்தாபனம் (திருத்தம்) சட்டமூலம்
## SRI LANKA RUPAVAHINI CORPORATION (AMENDMENT) BILL

***දෙවන වර කියවීමේ නියෝගය කියවන ලදී.***
*இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*Order for Second Reading read.*

[පූ.භා. 11.49]

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)
ගරු කථානායකතුමනි, ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන්, "පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

එසේම අද දින න්‍යාය පත්‍රයේ දිනට නියමිත කටයුතුවලට අදාළ විෂය අංක 2 දරන යෝජනාව ද මා ඉදිරිපත් කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatilleka)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමනි, දැනටම වෙලාව දොළහට දහයයි. දැන් තමයි සභාවේ ප්‍රධාන කටයුතු ආරම්භ වෙන්නේ. ඒ නිසා

දිවා ආහාර විවේකය සඳහා වෙන් කර ඇති පැය භාගයක කාලය විවාදයට ලබා දෙන්න කියලා අපි ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මීළඟට, ගරු ශාන්ත බණ්ඩාර රාජ්‍ය ඇමතිතුමා.

Order, please! මේ අවස්ථාවේ ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු අජිත් රාජපක්ෂ මහතා] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத் தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு அஜித் ராஜபக்ஷ] தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. SPEAKER *left the Chair, and* DEPUTY SPEAKER [THE HON. AJITH RAJAPAKSE] *took the Chair.*

[පූ.භා. 11.51]

**ගරු ශාන්ත බණ්ඩාර මහතා (ජනමාධ්‍ය රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சாந்த பண்டார - வெகுசன ஊடக இராஜாங்க அமைச்சர்)
(The Hon. Shantha Bandara - State Minister of Mass Media)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 1982 අංක 6 දරන ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා පනත සංශෝධනය කිරීම තමයි අද සිදු කරන්නේ. ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය වෙනස් කිරීම සඳහා තමයි මෙම සංශෝධනය ඉදිරිපත් කරන්නේ. 2019 මාර්තු 8 වැනිදා පාර්ලිමේන්තුවේ පැවැත්වුණු පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ දී නිර්දේශයක් ලබා දුන්නා. දැනට රූපවාහිනී සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂවරුන් හත්දෙනෙකු සිටිනවා. ඒ වාගේම භාණ්ඩාගාරය නියෝජනය කරමින් එක් නිලධාරි මහත්මයෙකුත්, අමාත්‍යාංශයේ ලේකම්තුමා නියෝජනය කරමින් තවත් නිලධාරි මහත්මයෙකුත්, අධ්‍යක්ෂ මණ්ඩලයේ නිරීක්ෂකයන් හැටියට කටයුතු කරනවා. නමුත් දිගින් දිගටම මතු වුණු කාරණා සැලකිල්ලට අරගෙන කෝප් එක නිර්දේශයක් ලබා දුන්නා, භාණ්ඩාගාරය වෙනුවෙන් සහභාගි වන නියෝජිතයා, අධ්‍යක්ෂ මණ්ඩලයේ නිත්‍ය, සක්‍රිය සාමාජිකයකු බවට පත් කර ගන්න කියලා. හත්දෙනෙකුගෙන් සමන්විත අධ්‍යක්ෂ මණ්ඩලයට භාණ්ඩාගාරය වෙනුවෙන් සහභාගි වන නිලධාරියා සක්‍රිය අධ්‍යක්ෂවරයකු කර ගත්තාම සංඛ්‍යාව අටක් බවට පත් වෙනවා. අට කියන්නේ, ඉරට්ටේ සංඛ්‍යාවක්. එතකොට, යම් තීරණයක් ගැනීමේදී එය ප්‍රායෝගිකව බාධාවක් වන නිසා, අමාත්‍යාංශයේ ලේකම්තුමා හෝ එම සහභාගි වන නියෝජිතයා අධ්‍යක්ෂවරයකු බවට පත් කරලා, අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන් සංඛ්‍යාව නවයක් බවට පත් කිරීම තමයි විශේෂයෙන්ම මේ සංශෝධනය තුළින් බලාපොරොත්තු වන්නේ. භාණ්ඩාගාරය නියෝජනය කරන නිලධාරි මහත්මයාත්, අමාත්‍යාංශයේ ලේකම්තුමා හෝ එම නියෝජිත මහත්මයාත්, අධ්‍යාපන අමාත්‍යාංශය වෙනුවෙන් සහභාගි වන නිලධාරි මහත්මයාත්, ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ සභාපතිතුමාත්, ජාතික චිත්‍රපට සංස්ථාවේ සභාපතිතුමාත්, විෂය භාර අමාත්‍යවරයා විසින් පත් කරන අධ්‍යක්ෂවරුන් හතරදෙනාත් ඇතුළුව සාමාජිකයන් නවදෙනෙකුගෙන් සමන්විත අධ්‍යක්ෂ මණ්ඩලයක් හරහා මින් ඉදිරියට සංස්ථාවේ තීන්දු තීරණ ගැනීම සඳහා තමයි මේ සංශෝධනය සිදු කර තිබෙන්නේ.

අපේ රටේ ජාතික නාළිකාව ලෙස, දැයේ නාළිකාව ලෙස ජාතික රූපවාහිනිය මේ රටේ මාධ්‍ය ක්ෂේත්‍රය වෙනුවෙන් විශාල මෙහෙවරක් ඉටු කරන බව අපි දන්නවා. රූපවාහිනී සංස්ථාව පාඩු ලබන ආයතනයක් හැටියට තමයි දැනට අපි හඳුනාගෙන තිබෙන්නේ. එසේ පාඩු ලැබීමට හේතු ගණනාවක් තිබෙනවා. පසුගිය කාලය තුළ වූ සිදුවීම්, ගනු ලැබූ තීරණ, කළමනාකාරිත්වයේ ඇති වී තිබෙන දුර්වලතා, ඒ වාගේම පෞද්ගලික අංශයේ රූපවාහිනී නාළිකා විශාල ප්‍රමාණයක් බිහි වීමත් සමඟ ඇති වූ තරගකාරිත්වය ඇතුළු කාරණා කිහිපයක් පදනම් කරගෙන රූපවාහිනී සංස්ථාව මේ වනකොට පාඩු ලබන ආයතනයක් බවට පත් වෙලා තිබෙනවා. හැබැයි, අපට තිබෙන සම්පත් දිහා බලනකොට, 1982දී ජපන් රජයේ ආධාරයක් - සහයෝගයක්- හැටියට ආරම්භ වුණු රූපවාහිනී සංස්ථාව රට වෙනුවෙන්, මේ දැය වෙනුවෙන් විශාල කාර්ය භාරයක් ඉටු කරලා තිබෙන බව පෙනෙනවා. එක පැත්තකින්, ජාතික රූපවාහිනියට යම් ජාතික මෙහෙවරක් ඉටු කිරීමේ වග කීම පැවරී තිබෙනවා. අනෙක් පැත්තෙන්, ජාතික මෙහෙවරක් ඉටු කරන ගමන්, ජාතික වගකීමකුත් ඉටු කරන්න ඔවුන්ට සිදු වෙලා තිබෙනවා. ඒ නිසා ගුණාත්මකභාවයත් ආරක්ෂා කරගෙන, ජාතික වග කීමත් ආරක්ෂා කරගෙන, ඉදිරි කාලයේදී අනෙකුත් රූපවාහිනී නාළිකා එක්ක තරගකාරිත්වයටත් මුහුණ දෙමින්, නිර්මාණශීලී වැඩ පිළිවෙළක් ඔස්සේ නැවත වරක් අපේ රටේ ප්‍රමුඛ පෙළේ රූපවාහිනී නාළිකාවක් බවට ජාතික රූපවාහිනිය පත් කිරීම සඳහා ගරු ඇමතිතුමාත්, මමත්, අමාත්‍යාංශයේ ලේකම්තුමාත්, ඒ වාගේම රූපවාහිනී සංස්ථාවේ සභාපතිතුමා ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලයත්, එම කාර්ය මණ්ඩලයත් එකට අත්වැල් බැඳගෙන, සාමූහික මෙහෙයුමක් ක්‍රියාත්මක කරනවාය කියන කාරණය අපි මේ වෙලාවේදී ගෞරවයෙන් යුතුව මතක් කර සිටිනවා.

අපේ මාධ්‍ය ක්ෂේත්‍රය තුළ අද ජාතික මට්ටමේ මාධ්‍යවේදීන්ට, ඒ වාගේම ප්‍රාදේශීය මාධ්‍යවේදීන්ට ගැටලු රාශියක් තිබෙනවා. ඔවුන් විවිධ දුෂ්කරතා මධ්‍යයේ, විවිධ බාධක මධ්‍යයේ ප්‍රවෘත්ති වාර්තාකරණය, සන්නිවේදනය වෙනුවෙන් මහඟු කාර්ය භාරයක් ඉටු කරනවා.

එම නිසා ජාතික මට්ටමේ ඉන්න මාධ්‍යවේදීන් සමඟත්, ඒ වාගේම ඉතාම දුෂ්කර ප්‍රදේශවල සිටින ප්‍රාදේශීය මාධ්‍යවේදීන් හැටියට කටයුතු කරන රජයේ වාගේම පෞද්ගලික අංශයේ සියලුම මාධ්‍යවේදීන් සමඟත් සාකච්ඡා කරමින් ඔවුන්ගේ සුබසාධනය සහ ඔවුන්ගේ පහසුකම් වැඩිදියුණු කිරීම සඳහාත් අවශ්‍ය වැඩ පිළිවෙළක් නිර්මාණය කරන්න අපි ඉදිරි කාලයේදී විශේෂයෙන්ම බලාපොරොත්තු වෙනවා.

විශේෂයෙන්ම අපේ රටේ සිටින අයට විශ්වවිද්‍යාලවලින්, විවිධ පාඨමාලා තුළින්, ඒ වාගේම වර්තමානයේ පාසල් අධ්‍යාපනය තුළින් උසස් පෙළ හදාරද්දී විෂයයක් ලෙස ජන සන්නිවේදනය හදාරන්න අද අවස්ථාව ඇති කරලා තිබෙනවා. ඒ හරහා විවිධාකාරයෙන් දැනුම ලබා ගත් මාධ්‍යවේදීන් විශාල ප්‍රමාණයක් ඉන්නවා. ඒ වාගේම, වරලත් මට්ටමට මාධ්‍යවේදියෙකු නිර්මාණය කිරීම සඳහාත් අපි වැඩ පිළිවෙළක් නිර්මාණය කළ යුතුයි. ඒ වෙනුවෙන් පසුගිය දිනක ගරු බන්දුල ගුණවර්ධන ඇමතිතුමා

[ගරු ශාන්ත බණ්ඩාර මහතා]

ජනමාධ්‍ය අමාත්‍යවරයා හැටියට ඉදිරිපත් කළ කැබිනට් පත්‍රිකාවට ගරු ජනාධිපතිතුමා, අගමැතිතුමා ප්‍රධාන කැබිනට් මණ්ඩලයේ පූර්ණ අනුමැතිය ලැබිලා තිබෙනවා. ඒ අනුව වරලත් මාධ්‍යවේදී ආයතනයක් විශේෂයෙන්ම ඉදිරි කාලය තුළදී අප රට තුළ බිහි වෙනවා. ඒ තුළින් වසර හතරක පාඨමාලාවක් හදාරන කෙනෙකුට පුළුවන්කම ලැබෙනවා, ගුණාත්මක සහ වෘත්තීය මට්ටමින් ඉතා ඉහළ වරලත් මාධ්‍යවේදියකු බවට පත් වෙන්න. ඒ අනුව, මේ වරලත් මාධ්‍යවේදීන්ගේ ආයතනය පිහිටුවීම මාධ්‍ය ක්ෂේත්‍රයේ හැරවුම් ලක්ෂ්‍යයක් ලෙස අපට හඳුන්වන්න පුළුවන්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එක පැත්තකින් විධායකයත්, අනෙක් පැත්තෙන් ව්‍යවස්ථාදායකයත්, ඒ වාගේම අධිකරණයත් අපේ රටේ තිබෙනවා. ඒ වාගේම, "මාධ්‍ය" කියන්නේත් ඒ හා සමානවම විශාල වගකීමක් පැවරෙන අංශයක්. ඒ නිසා මේ ප්‍රධාන කුලුනු තුනට එකතු වෙන තවත් ප්‍රධාන කුලුනක් හැටියට තමයි අපි මාධ්‍ය දකින්නේ. ඒ තරම් පරිවර්තනයක්, වෙනසක් ඇති කරන්න පුළුවන්, මාධ්‍ය ක්ෂේත්‍රයට.

විශේෂයෙන්ම මේ වෙලාවේ අපේ රට බරපතළ ආර්ථික අර්බුදයකයි තිබෙන්නේ කියලා අපි දන්නවා. මේ අර්බුදයේදී රට පාලනය කරන්නේ කුමන පක්ෂය ද, කුමන නායකත්වය ද කියා සිතා බලනවාට වඩා, අප සියලුදෙනාම මේ අර්බුදයට මුහුණ දීලා මේ රට ආර්ථික වශයෙන් ශක්තිමත් කිරීමේ වගකීම අපට තිබෙනවා. මේ රටේ පැවැති බෙදුම්වාදී එල්ටීටීඊ ත්‍රස්තවාදය පරාජයට පත් කරන්න ගෙන ගිය වැඩ පිළිවෙළේදී ඒ සාමූහික අරමුණට යෑම සඳහා පෞද්ගලික සහ රාජ්‍ය මාධ්‍ය ඇතුළු අපේ රටේ සමස්ත මාධ්‍ය අතිවිශාල කැපකිරීමක්, සහයෝගයක් ලබා දුන් ආකාරය අපට මතකයි. ඒ වාගේම මාධ්‍ය ක්ෂේත්‍රයේ, විශේෂයෙන්ම රාජ්‍ය මාධ්‍ය සහ පෞද්ගලික මාධ්‍ය, ඒ අතර විද්‍යුත් හා මුද්‍රිත, ඒ වාගේම අතථ්‍ය සන්නිවේදන ක්‍රමවල නියැළෙන සියලුදෙනාගේම සහයෝගය අවශ්‍ය වෙලාවක් තමයි, මේ අවස්ථාව. මොකද, මේ වෙලාවේ අපේ රට ගැඹුරු ආර්ථික අර්බුදයකයි සිටින්නේ. මේ ආර්ථික අර්බුදයෙන් අපේ රට ගොඩ ගැනීමට මාධ්‍ය තුළින් කළ යුතු කාර්ය භාරයක් තිබෙනවා. අපේ රටේ ජනතාව තුළ ධනාත්මක සිතුවිලි ඇති කරමින්, ඒ වාගේම අපේ රට වැටිලා තිබෙන තැනින් ගොඩ ගැනීමට අවශ්‍ය ආත්ම ශක්තිය වර්ධනය කරන්න සන්නිවේදනයට විශාල කාර්ය භාරයක් කළ හැකියි කියා මා විශ්වාස කරනවා. එම නිසා විශේෂයෙන්ම මම ජනමාධ්‍ය රාජ්‍ය අමාත්‍යවරයා හැටියට මාධ්‍ය ක්ෂේත්‍රයේ නියැළෙන සියලුදෙනාට ඒ සඳහා ගෞරවයෙන් ආරාධනා කරනවා. රාජ්‍ය හා පෞද්ගලික මාධ්‍ය සහ සමාජ වෙබ් අඩවි ඇතුළු සියලු මාධ්‍ය තුළ ඔවුනොවුන්ගේ අදහස් නිදහසේ පළ කරනවා වාගේම ඔවුන් ඒ නිවැරැදි තොරතුරු සමාජගත කරනවා වාගේම දේශපාලනඥයන්ගේ වේවා, රාජ්‍ය නිලධාරින්ගේ වේවා, වෙනත් ඕනෑම අංශයක් විවේචනය කරන්න මාධ්‍යයට ඕනෑ තරම් ඉඩකඩ තිබෙනවා වාගේම, ඒ දේවල් කරනවා වාගේම අපේ රට වැටී තිබෙන මේ ආර්ථික අර්බුදයෙන් ගොඩගැනීම සඳහාත් මාධ්‍ය විසින් දේශපාලනඥයන්ගේත්, රාජ්‍ය නිලධාරින්ගේත්, පෞද්ගලික අංශයේත්, රටේ පුරවැසියන්ගේත් ආකල්පමය වෙනසක් අනිවාර්යයෙන්ම ඇති කළ යුතුව තිබෙනවා. ඒ සඳහා මාධ්‍ය ක්ෂේත්‍රයේ නියැළෙන සියලුදෙනාට මම ගෞරවයෙන් ආරාධනා කරනවා, ඒ අභියෝගය ජයග්‍රහණය කරන්න ජාතික වශයෙන් සහ අන්තර්ජාතික වශයෙන් කරන්න ඕනෑ යුතුකම් කොටස ඉටු කරන්න එකතු වන්න කියලා.

අවසාන වශයෙන් මම තව එක කාරණයක් මතක් කරන්න කැමැතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඉතා සංවේදී කාරණාවක් පිළිබඳව අද මේ පාර්ලිමේන්තුව තුළදී දිගින් දිගටම ආණ්ඩු පක්ෂයේත්, විපක්ෂයේත් ගරු මන්ත්‍රීවරු අදහස් පළ කළා. ඒක ඉතාම සංවේදී කාරණයක්. අප සියලුදෙනාටම දැනෙන, අපේ රටට දැනෙන, මේ පාර්ලිමේන්තුවේ ඉන්න අපේ සියලු මන්ත්‍රීවරුන්ට වගකීම පැවරෙන කාරණයක් පිළිබඳව තමයි එලෙස දිගින් දිගටම අද කථා වුණේ. ඒක තමයි, මන්දපෝෂණය කියන කාරණය. ඒ වෙනුවෙන් විශේෂයෙන්ම ආණ්ඩු පක්ෂය පැත්තෙන් අපි කාරණාවක් මතු කරන්න ඕනෑ. එම කාරණය ඉතාම සංවේදී වාගේම ඒකේ වගකීම අනිවාර්යයෙන්ම ආණ්ඩුව ප්‍රමුඛ වශයෙන් භාර ගත යුතුව තිබෙනවා. ඒ වෙනුවෙන් මේ වන විට නිශ්චිත වැඩ පිළිවෙළක් සූදානම් කර තිබෙනවා. ගරු ජනාධිපතිතුමා සභාපතිත්වය දරන, ගරු අග්‍රාමාත්‍යතුමාගේ ද මූලිකත්වයෙන් ඒ වෙනුවෙන් ජාතික වශයෙන් ආර්ථික පුනර්ජීවන වැඩ පිළිවෙළක් අපි නිර්මාණය කර තිබෙනවා.

ඊයේ මම අලව්ව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සිටින සියලු රාජ්‍ය නිලධාරින් සමඟ සාකච්ඡා කළා, මේ වැඩ පිළිවෙළ ගමට ගෙන යෑම සම්බන්ධව. ලංකාවේ තිබෙන ග්‍රාම නිලධාරි වසම් 14,022 තුළම ආර්ථික පුනර්ජීවන කමිටු නිර්මාණය කර මන්දපෝෂණයට ලක්වීමේ -ගොදුරුවීමේ- අවදානම අබියස සිටින පවුල් මොනවාද කියා හඳුනා ගැනීමට අපි යම් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළ යුතුයි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු ශාන්ත බණ්ඩාර මහතා**
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)

මගේ කථාව ඉක්මනින් අවසන් කරන්නම්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

කෙනෙක් මන්දපෝෂණයට ලක් වුණාට පසු ප්‍රතිකර්ම කරනවාට වඩා, මන්දපෝෂණ තත්ත්වයක් ඇති නොවීමට වගබලා ගැනීම තමයි අප සියලුදෙනාගේ කාර්ය භාරය විය යුත්තේ. ඒ නිසා ග්‍රාමීය ආර්ථික පුනර්ජීවන කමිටු හදලා අපි එම කටයුත්ත ආරම්භ කළ යුතුයි. මේ කටයුත්තේදී පක්ෂ භේදයක් නැහැ. ඒ ප්‍රදේශයේ සිටින පළාත් පාලන නියෝජිතයෝ -කුමන පක්ෂයේ අය වුණත්- දෙදෙනකු අනිවාර්යයෙන්ම එම කමිටුවට සම්බන්ධ වෙනවා. ඒ වාගේම රාජ්‍ය නිලධාරින්, ගමේ ප්‍රභූවරු, ගමේ පන්සලේ හාමුදුරුවෝ, අනෙකුත් ආගමික නායකයින්, විදුහල්පතිවරුන්, විශ්‍රාම ගිය නිලධාරින් කියන සියලුදෙනා එකතු වෙලා කුමන පවුලටද ලැබිය යුතු ආහාර ප්‍රමාණය නොලැබෙන්නේ, කුමන පවුලටද සහනාධාර ලැබිය යුත්තේ, කුමන පවුලද මන්දපෝෂණය අබියස සිටින්නේ කියන කාරණා පිළිබඳව ග්‍රාම නිලධාරි වසම් මට්ටමින් විමර්ශනයක් කරලා, සහනාධාර ලැබීමට සුදුසු අය තෝරාගෙන ඒ අයට ඒ අවශ්‍ය සහයෝගය ලබා දෙන්න කටයුතු කළ යුතුයි. මේ වනකොටත් ලෝක බැංකුව සහ ආසියානු සංවර්ධන බැංකුව අපට ඒ වෙනුවෙන් විශාල මුදලක් ලබා දෙන්න තීරණය කර තිබෙනවා, ඔවුන් දැනට මුදල් ලබා දීලාත් තිබෙනවා. ඒ මුදලත් උපයෝගි කරගෙන මන්දපෝෂණයට ලක්වීමට ආසන්න තත්ත්වයේ පසුවන පවුල් අපේ රටේ සිටිනවා නම්, ඔවුන් ඒ තත්ත්වයට පත්වීම වැළැක්වීමට අවශ්‍ය වැඩ පිළිවෙළ ගරු ජනාධිපතිතුමාගේත්, ගරු අගමැතිතුමාගේත් සහයෝගය ඇතිව ආරම්භ කරන්න අපේ රජය මේ වනකොට කටයුතු කරමින් සිටිනවා. මේ වන විට අපි බිම් මට්ටමින් ඒ මූලික කටයුතු සිදු කරමින් සිටිනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

අවසාන වශයෙන්, ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා (සංශෝධන) පනත් කෙටුම්පතට ඔබතුමන්ලාගේ සහයෝගය ලබා දෙන්න කියා ඉල්ලා සිටිමින්, මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු අශෝක් අබේසිංහ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 14ක කාලයක් තිබෙනවා.

[අ.භා. 12.02]

**ගරු අශෝක් අබේසිංහ මහතා**
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දින ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා (සංශෝධන) පනත් කෙටුම්පත සහ සිවිල් ගුවන් සේවා පනත යටතේ ගෙන එන නියෝග පිළිබඳව සාකච්ඡා කරනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ වන විට සභාවේ කාලය විශාල ලෙස ගත වී තිබෙනවා. දැන් ජනමාධ්‍ය රාජ්‍ය ඇමතිවරයා කිව්වා, රූපවාහිනී සංස්ථාව පාඩු ලබනවා කියලා. අද මේ පනත් කෙටුම්පතින් කියන්නේ රූපවාහිනී සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය තව වැඩි කරන්න කියන එකයි. සංස්ථාව පාඩු ලබද්දි අධ්‍යක්ෂ මණ්ඩලය තවත් වැඩි කරනවා. දැනටත් රූපවාහිනී සංස්ථාවේ සේවකයෝ 850දෙනෙක් පමණ ඉන්නවා.

රූපවාහිනී සංස්ථාව මෙසේ පාඩු ලැබීමට හේතු කිහිපයක් බලපා තිබෙනවා. ලොතරැයි මණ්ඩලයේ දිනුම් ඇදීම් පටිගත කිරීම සහ විකාශය කිරීම සිදු කළේ රූපවාහිනී සංස්ථාවෙන්. නමුත්, ඒ කටයුත්ත එකවරම රූපවාහිනී සංස්ථාවෙන් අයින් කරලා ස්වාධීන රූපවාහිනී සේවයට ලබා දුන්නා. ඊට පසු එතැනිනුත් ඒ පටිගත කිරීම් කටයුතු ඉවත් කරලා දැන් එය පෞද්ගලික අංශයට දීලා තිබෙනවා. ඉතින්, මේ සංස්ථා පාඩු ලබන එක අහන්න දෙයක් නොවෙයි නේ. ආදායම් ලැබෙන ඒවා වෙනත් පුද්ගලයන්ට, පෞද්ගලික ආයතනවලට දුන්නාම මේ ආයතන පාඩු ලබනවා. ඒක තමයි රූපවාහිනී සංස්ථාවටත් වෙලා තිබෙන්නේ. ඒ වාගේම ස්වාධීන රූපවාහිනී සේවයේත් දහසක් පමණ සේවය කරනවා. සාමාන්‍යයෙන් එහි වියදම රුපියල් මිලියන 150ක් විතර වනවා. හැබැයි, හම්බ වෙන්නේ රුපියල් මිලියන 60යි. 2019 වර්ෂයේ සිට මේ ආයතනයේ ප්‍රධාන පාලන අධිකාරියේ සිටි සභාපතිවරු 4දෙනෙක් මාරු වෙලා තිබෙනවා. මේ ආයතන පාඩු ලබන්න මේ හේතු විශාල ලෙස බලපෑවා.

මේ වන විට මෙරට මාධ්‍යවේදීන්, මාධ්‍ය ආයතන, ඒ වාගේම සිවිල් ක්‍රියාකාරීන්, සමාජ ක්‍රියාකාරීන් මර්දනය කිරීම විශාල වශයෙන් සිදුවෙනවා. මේ කරුණ දැන් ජාත්‍යන්තර අවධානයටත් ලක් වෙලා තිබෙනවා. මේ දවස්වල එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සලයේ 51වැනි සැසි වාරය පැවැත්වෙනවා. මේ මාධ්‍යවේදීන්ගේ, මාධ්‍ය ආයතනවල සහ සිවිල් ක්‍රියාකාරීන්ගේ මර්දනය පිළිබඳ ප්‍රශ්නය එතැන දක්වා ගිහින් තිබෙනවා. මේක මේ රටේ තිබෙන විශාල ප්‍රශ්නයක්. අපි දැක්කා, ජූලි 09වැනි දා වුණු සිද්ධිය මාධ්‍යවේදීන් විකාශය කළා කියා ඔවුන් අත්අඩංගුවට අරගෙන ඔවුන්ගෙන් ප්‍රකාශ ලබා ගත් ආකාරය. අපි දැක්කා, වර්තමාන ජනාධිපතිවරයාගේ -හිටපු අගමැතිතුමාගේ- නිවසට පහර දුන්නා කියා එම්ටීවී ආයතනයේ පාලන අධිකාරිය ප්‍රකාශ ලබා ගැනීම සඳහා කැඳවා තිබුණු ආකාරය. මාධ්‍යවේදීන් මර්දනය කිරීම ගැන මේ රජයට කිසිම ප්‍රශ්නයක් නැහැ. මේ එම්ටීවී ආයතනය මේ වන විට ලෝක විකාශකයින්ගේ සංගමයේ සාමාජිකයෙක්. එම්ටීවී ආයතනය කියන්නේ ආසියා පැසිෆික් විකාශන සංගමයේ සාමාජිකයෙක්. ආසියා පැසිෆික් විකාශන සංගමය ලෝක විකාශකයින්ගේ සංගමයේ සාමාජිකයෙක්. එවැනි ආයතනවල සේවය කරන අයත් ගෙන්වා ප්‍රශ්න කිරීම, මානව හිමිකම් පිළිබඳ සංවිධානවල අවධානයට විශේෂයෙන්ම යොමු වෙලා තිබෙනවා.

හිරු ටීවී නාළිකාවේ සේවය කරන මාධ්‍යවේදී චමුදිත සමරවික්‍රම මහත්මයාගේ නිවසට පසුගිය දවසක ප්‍රහාරයක් එල්ල වුණා. අද ඒ ගැන කථාවක්වත් නැහැ. චමුදිතගේ නිවසට පහර දීපු එක ගැන හෙවිල්ලක්-බැලිල්ලක් නැහැ. ඒ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු ක්‍රියාත්මක වෙන්නේත් නැහැ. ඒ වාගේම ඔහු ඊයේත් සීඅයිඩී එකටත් කැඳවා තිබුණා. ඊළඟට, සියත ටීවී නාළිකාවේ සේවය කරන මාධ්‍යවේදී ලාල් හේමන්ත මාවලගේ "ටෙලි වැකිය" තුළින් මේ රජය විවේචනයට ලක් කළ නිසා, ඔහු මර්දනය කරන්න වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කර තිබුණා. ශිෂ්ට සම්පන්න සමාජයක මෙවැනි දේවල් සිදු නොවිය යුතුයි. ඒ නිසා තමයි එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සලයේ 51වැනි සැසි වාරය තුළ මේ පිළිබඳව කථා කරන්නේ. අපි මෙය තරයේ හෙළා දකිනවා.

අද, සිවිල් ගුවන් සේවා පනත යටතේ ගෙනෙන නියෝග ගැනත් සාකච්ඡා වෙනවා. ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ ලේකම් සාගර කාරියවසම් මන්ත්‍රීතුමා ඊයේ පෙරේදා කියනවා, IMF එකට ගිය නිසා තමයි මේ රටේ මේ ප්‍රශ්න ඇතිවෙලා තිබෙන්නේ කියලා. හැබැයි, විදුලිබල සහ බලශක්ති ඇමතිවරයා පාර්ලිමේන්තුවේදී කිව්වා, IMF එකේ ණය මුදල් ලැබුණාම විදුලි බිල අඩු කරන්න පුළුවන් කියලා. මෙවැනි පරස්පර විරෝධී කථා කියනවා.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදල කියනවා, පාඩු ලබන ආයතන ප්‍රතිව්‍යුහගත කරන්න කියලා. පාඩු ලබන ආයතන වශයෙන් ආයතන 39ක් හඳුනාගෙන තිබෙනවා. හැබැයි, ඒ ආයතන 39 තුළ ලාභ ලබන ආයතනත් තිබෙනවා. ශ්‍රීලන්කන් ගුවන් සේවය ගත්තොත්, එය විශාල වශයෙන් පාඩු ලබනවා. මේ වන විට රුපියල් කෝටි 40,000ක් විතර පාඩුවෙලා තිබෙනවා. 2008දී ලාභ ලැබූ මේ ආයතනය දේශපාලන හේතු මත රජයට පවරා ගත්තා. ඊට පස්සේ එදා සිට පාඩු ලබනවා. වර්ෂයකට රුපියල් කෝටි 5,000ක් විතර පාඩු ලබනවා. ඒ නිසා ශ්‍රීලන්කන් ගුවන් සේවය ප්‍රතිව්‍යුහගත කළාට කිසි ප්‍රශ්නයක් නැහැ. මේ වන විට මේ ආයතනයේ එක සේවකයකු වෙනුවෙන් වන පාඩුව මාසයකට රුපියල් 400,000ක් පමණ වෙනවා. 2014 වනකොට වසරකට පාඩුව රුපියල් 4,900,000ක් කියලා COPE වාර්තාවේ සඳහන්වෙලා තිබෙනවා. එතැන සේවකයෝ හාරදහස් ගණනක් ඉන්නවා. ගුවන් යානා තිබෙන්නේ 21යි. එක ගුවන් යානයකට 300කට වඩා වැඩි සේවකයන් පිරිසක් ඉන්නවා. ඉතින්, මේ ආයතනය ප්‍රතිව්‍යුහගත කරන්න ඕනෑ. නමුත් ඒ ආයතනයේ පාලිත සමාගමක් වන SriLankan Catering ආයතනය ලාභ ලබනවා. පසුගිය 2018-2019 වසරේ එම ආයතනය රුපියල් බිලියන 5.6ක් -රුපියල් මිලියන 5,600ක්, රුපියල් කෝටි 560ක්- ලාභ ලැබුවා. එම ආයතනයට ජාත්‍යන්තර සම්මාන ලැබුණා, ආහාර පාන අංශයෙන් වැඩිම විදේශ විනිමය ප්‍රමාණයක් ලංකාවට ගෙනාවේ SriLankan Catering ආයතනය කියලා. දැන් ඒ SriLankan Catering ආයතනය ප්‍රතිව්‍යුහගත කරනවාය කියලා සියයට 49ක් පෞද්ගලික අංශයට දෙන්න යනවා. ඒ විතරක් නොවෙයි. ගුවන් තොටුපොළේ ground handling අංශය ගැන බලන්න. ඒකත් ලාභ ලබන අංශයක්. දැන් ඒකත් පෞද්ගලික අංශයට දෙන්න යනවා. ගුවන් සේවා ඇමතිවරයා මේ වෙලාවේ සභාවේ නැහැ. එතුමා මගේ හිතවතා. මා ඒ අමාත්‍යාංශයේ හිටපු රාජ්‍ය ඇමතිවරයා. මේ අවස්ථාවේදී ආයතනවලට සේවකයන් බඳවා ගන්න එපා කියලා චක්‍රලේඛ නිකුත් කරලා තිබියදීත්, ඊයේ පෙරේදා පුහුණු වීම් සඳහාය කියලා SriLankan Catering ආයතනයට 75දෙනෙකු විතර කැඳවා සම්මුඛ පරීක්ෂණ පැවැත්වුවා.

[ගරු අශෝක් අබේසිංහ මහතා]

අපට ආරංචි විධියට බදුල්ල දිස්ත්‍රික්කයෙන් තමයි ඔවුන් කැඳවා තිබෙන්නේ. ඌව පළාත් ක්‍රීඩා අමාත්‍යාංශයේ බස් එකකින් ඒ අය ඔවුන්ගේ දෙමව්පියන් සමඟ ගෙනාවා කියනවා. ඔවුන්ට කෑමත් දීලා තිබෙනවා. ඒ ආයතනයට බඳවා ගන්න තමයි මේ සම්මුඛ පරීක්ෂණය පවත්වා තිබෙන්නේ. මෙහෙම සේවකයන් බඳවා ගෙන ඒකත් පාඩු ලබන තත්ත්වයට පත් කරලා, විකුණනන්න කටයුතු කරනවාද දන්නේ නැහැ. මේ රටේ ජීවත් වන්න බැරි වාතාවරණයක් ඇතිවෙලා තිබෙන තත්ත්වය තුළ මෙවැනි දේවල් පිළිබඳව දැනුවත් කරන්න ඕනෑ.

ලංකාවේ ජාත්‍යන්තර ගුවන් තොටුපොළ 4ක් තිබෙනවා. ඒ තමයි, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ, මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපොළ, යාපනය -පලාලි- ජාත්‍යන්තර ගුවන් තොටුපොළ සහ ලංකාවේ පැරණිම ගුවන් තොටුපොළ වන රත්මලාන ජාත්‍යන්තර ගුවන් තොටුපොළ. රුපියල් මිලියන 220ක් -රුපියල් කෝටි 22ක්- වියදම් කරලා රත්මලාන ගුවන් තොටුපොළ ජාත්‍යන්තර ගුවන් තොටුපොළක් බවට පත් කළා. ජාත්‍යන්තර ගුවන් තොටුපොළක් බවට පත් කරලා ජනවාරි මාසයේ එය විවෘත කළා. කාගේ වුවමනාවටද ඒක කළේ? 2022 ජනවාරි මාසයේදී තමයි ඒක කළේ. මේ රට බංකොලොත් වෙලා තිබුණේ. අප්‍රේල් මාසයේ රටේ ණය ගෙවන්න බැහැ කියලා බංකොලොත්බව ප්‍රකාශ කළා. 2022දී රුපියල් කෝටි 22ක් වියදම් කරලා රත්මලාන ගුවන් තොටුපොළ ජාත්‍යන්තර ගුවන් තොටුපොළක් බවට පත් කරනවා. දැන් කියනවා, ගුවන් යානා පැමිණෙන්නේ නැහැයි කියලා. මාලදිවයිනේ ගුවන් යානාවක් තමයි ජාත්‍යන්තරව ඒකට පැමිණෙන්න තීන්දු කරලා තිබුණේ. දැන් ඒ ගුවන් යානා එන්නේත් නැහැයි කියලා ජාත්‍යන්තර ගුවන් තොටුපොළක් වශයෙන් තිබුණු තත්ත්වය දැන් නැති කරලා තිබෙනවා. මේ තත්ත්වය තුළ මේ රටේ මුදල් නාස්ති කිරීම විශාල ප්‍රශ්නයක් බවට පත්වෙලා තිබෙනවා. මේ මුදල් නාස්ති කිරීම හැම තැනකම සිද්ධ වන දෙයක්. මේ මුදල් නාස්ති කිරීම පළාත් වශයෙනුත් වෙනවා. ඊයේ පෙරේදා කුරුණෑගල මහ නගර සභාව විසින් මධ්‍යම වෙළෙඳ පොළ ඉදිකිරීමේ ටෙන්ඩර්වල අක්‍රමිකතාවක් ඇතිවෙලා තිබෙනවා. ඒක අනුමත කර ගන්න මහ නගර සභාවේ නාගරික මන්ත්‍රීවරුන්ට රුපියල් ලක්ෂ 5 සිට රුපිල් ලක්ෂ 25 දක්වා අල්ලස් දෙන්න තීන්දු කරලා තිබෙනවා. ජාතික වශයෙනුත්, පළාත් වශයෙනුත් අල්ලස් දීම වාගේම දූෂණ හා වංචාත් සිදු වෙනවා.

ජාත්‍යන්තරය කියනවා, මේ රටේ ආර්ථික අපරාධකරුවන් ඉන්නවා කියලා. ඒකට හේතුව, දූෂණය, වංචාව, අධික ලෙස ණය ගැනීම සහ රසායනික පොහොර තහනම. ඊයේ පෙරේදා පුවත් පතක තිබුණා, "හම්බන්තොට සූරියවැව දරුවන් 80කට මන්දපෝෂණය" කියලා. හම්බන්තොට සූරියවැව කියන්නේ, මේ රටේ ජනාධිපතිවරයකු හිටපු, අගමැතිවරයකු හිටපු, කැබිනට් ඇමතිවරු හිටපු රාජපක්ෂ පවුලේ ස්ථානය. දැන් එහේ සියයට 80කට මන්දපෝෂණය ලු. මෙන්න මේ පින්තූරයේ තිබෙන හම්බන්තොට දිස්ත්‍රික්කයේ නිවාසවල හැටි බලන්න, ගරු නියයෝජ්‍ය කථානායකතුමනි. ඒ නිවාසවලට වැසිකිළියක් නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හම්බන්තොට කියන්නේ, ඔබතුමාත් නියෝජනය කරන දිස්ත්‍රික්කය. හිටපු ජනාධිපතිවරු නියෝජනය කරපු දිස්ත්‍රික්කයක් මෙවැනි තත්ත්වයකට පත් වීම පිළිබඳව ලජ්ජා වෙන්න ඕනෑ.

වර්තමාන රජය අපකීර්තියට පත්වන එකෙන් ගැලවෙන්නද කොහේද අපේ ආර්ථික විශේෂඥ මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමා ආර්ථිකය ගැන විශාල දේශනයක් කරනවා අපි දැක්කා. මේ රටේ ආදායම එන්න-එන්න අඩුවෙලා තිබෙනවා, ආදායම එකතු කර ගන්නේ නැති තත්ත්වයක් තිබෙනවා, මේ මේ අය ආදායම් බදු ගෙවලා නැහැයි කියලා එතුමා කියනවා. පසුගිය අතුරු අය වැයෙන් කිව්වා නේ, වයස අවුරුදු 18න් ඉහළ හැම කෙනකුටම ආදායම් බදු ලිපි ගොනු විවෘත කරන්න කියලා.

පාර්ලිමේන්තුවේ ඉන්න මන්ත්‍රීවරු ඔක්කෝටම ආදායම් බදු ලිපි ගොනු විවෘත කරන්න පුළුවන්. බදු ලිපි ගොනු තිබෙන අය බදු ගෙවනවා. සෑම කෙනෙක්ම වාගේ ගෙවනවා. මම හිතන හැටියට පාර්ලිමේන්තුවේ බහුතරයක් ආදායම් බදු ගෙවනවා. දැන් ඒ ගොල්ලන්ට ඒවා අමතක වෙලා තිබෙනවා. මේ රටේ ජනතාවට මේ ආණ්ඩුව එපා වෙන්න, එපා වෙන්න ඔවුන්ගේ අනුකම්පාව ගන්නද කියලා මම දන්නේ නැහැ, මෙතැනට ඇවිල්ලා කථා කරනවා ආදායම් එකතු කරන්න ඕනෑ කියලා. එතුමන්ලාට මේවා අමතක වෙලා තිබෙනවා. 1994 ඉඳලා මේ රට කවුද පාලනය කළේ? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 1994 ඉඳලා බැලුවාම දැන් අවුරුදු 28ක් ගත වෙලා තිබෙනවා. ඒ අවුරුදු 28න් අවුරුදු 21ක් මේ රට පාලනය කළේ එතුමන්ලා. ඒ විධියට කථා කරන අය කැබිනට් ඇමතිවරු වෙලාත් හිටියා. එහෙම නම්, එතකොට ආදායම් එකතු කර ගන්න එපා යැ. ආදායම් එකතු කර ගන්න ක්‍රම ගැන දැන් තමයි කථා කරන්නේ. දැන් තමයි එතුමන්ලාට අනුකම්පා හිතිලා තිබෙන්නේ. දැන් මේ මන්ත්‍රීතුමන්ලා හැම කෙනෙක්ම වාගේ වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කරනවා. මේ මන්ත්‍රීවරුන්ගේ වත්කම් බැරකම් ප්‍රකාශ ප්‍රසිද්ධ කරන්න ඕනෑ. සමහර විට වෙන වෙන නම්වලින් වත්කම් අරගෙන ඇති. හැබැයි තිබෙන ඒවා ප්‍රසිද්ධ කරන්න ඕනෑ. එහෙම කළේ නැත්නම් රටේ ජනතාව හිතන්නේ මොනවා ද? පාර්ලිමේන්තුවට ඇවිල්ලා කෑ ගහනවා මෙන්න මෙච්චර බදු මුදලක් එකතු වෙලා නැහැ කියලා. කවුද ඒවා එකතු කෙරුවේ නැත්තේ? බදු එකතු කෙරුවේ නැති නිසා නේ මේ ප්‍රශ්නය ඇතිවෙලා තිබෙන්නේ. ඒ නිසා මේ ආදායම් එකතු නොකිරීම පිළිබඳව මේ රජය වග කියන්න ඕනෑ. මොකද, එතුමන්ලාට ඒක මතක නැහැ. කවුද ආදායම් බදු අඩු කෙරුවේ? රුපියල් බිලියන 600ක් -රුපියල් කෝටි 60,000ක්- අඩු වුණා, මේ නිසා. 2018 වසරේ ලංකාවේ වැඩිම රාජ්‍ය ආදායම තියෙද්දී එතුමන්ලා බලයට ඇවිල්ලා, රුපියල් කෝටි 60,000කින් ආදායම අඩු කර ගත්තා. එහෙම ආදායම අඩු කරලා, දැන් ඇවිල්ලා කෑ ගහනවා ආදායම් එකතු කර ගන්න කියලා. ඉතින් මේ කථාව හරි පරස්පරයි. ජනතාව නොමඟ යැවීමක් නේ මේ කරන්නේ. ඒ වාගේ දේවල් කරන්න එපා කියලා අපි කියනවා.

ඊයේ පෙරේදා ඉඳලා ත්‍රිපෝෂ ගැන ප්‍රශ්නයක් මතු වෙලා තිබෙනවා. ත්‍රිපෝෂවල ඇෆ්ලටොක්සින් අධිමාත්‍රාවක් තිබෙනවා කියනවා. ඒවා අක්මාවේ පිළිකාවලට බලපානවා. කළුතර ප්‍රදේශයේ බෙදපු ත්‍රිපෝෂවල ඇෆ්ලටොක්සින් අඩංගු වෙලා තිබුණා කියනවා. ඒ වාගේම, කෘෂිකර්ම ඇමතිවරයා කියනවා පිට රටින් ගෙනාපු හාල්වල විස රසායන තිබෙනවා කියලා. එතුමාගෙන් ඒ ගැන අහපුවාම, ඒ හාල් පරීක්ෂා කරලා එහෙම නැහැ කියලා කියනවා වෙනුවට, දැන් කියන්නේ මොකක් ද? ලංකාවේ හාල් හොඳයි ලු. ලංකාවේ හාල් හොඳ බව කවුරුත් දන්නවා. මේ හාල් පිට රට තිබෙනවා. පිට රට අයත් මේවා කන බව දන්නවා. ඇයි, එහෙම නම් මේ හාල් ගැන පරීක්ෂා කරන්නේ නැත්තේ? මේ තොරතුරු පුවත් පත්වල ගියාම ජනතාව ඒවා බලනවා. දැන් මේ ගැන වෙළෙඳ ඇමතිවරයාත් කෘෂිකර්ම ඇමතිවරයාත් අතර ප්‍රශ්නයක් ඇති වෙනවා. ඒ ගොල්ලෝ එතැන වාද විවාද කරනවා. හැබැයි, මේ හාල් පරීක්ෂා කරන්නේ නැහැ. මේ ආණ්ඩුවෙන් ම තමයි විස පොල් තෙල් ගෙනාවේ. විස පොල් තෙල් ගෙනැල්ලා රටේ ජනතාවට කැව්වා. දැන් ඒ ගැන කථාවක්වත් නැහැ. මේ රටේ කෘෂිකර්ම ඇමතිවරයා කියනවා, පිට රටින් ගෙනෙන හාල් විසයි, ඒවා කන්න හොඳ නැහැ, ඒවා සතුන්ට දෙන්න ඕනෑ කියලා. සතුන්ටත් විස වෙනවා නේ. එහෙම නම් සතුන්ට දීලා හරියනවා ද? මනුෂ්‍යයන්ට දෙන්න හොඳ

නැත්නම් සතුන්ටත් ඒක විසයි. එහෙම නම් ඇයි ඒවා ගෙනාවේ? ලංකාවේ කෘෂිකර්ම ඇමතිවරයෙක් ඉන්නේ පිට රටින් හාල් ගෙන්වන්නද? එහෙම නොවෙයි නේ. ඒ නිසා මේ ගැන පරීක්ෂා කරන්න. ඒවා හරියට පරීක්ෂා කරලා ඒවායේ විස නැහැ, මෙන්න මෙහෙම තත්ත්වයක් තිබෙනවා කියලා පෙන්වන්න. එහෙම පෙන්වන්නේ නැතිව ලංකාවේ හාල් හොඳයි කිව්වාට මේ ප්‍රශ්නය විසඳෙන්නේ නැහැ. ඒ වාගේමයි ත්‍රිපෝෂ. කුඩා දරුවන්ට, ගැබිනි මවුවරුන්ට මේ ත්‍රිපෝෂ ලබා දෙනවා. පාසල් දරුවන්ටත් දෙනවා. එතකොට ඒ ගොල්ලන්ට වන හානියට කවුද වග කියන්නේ? මේක විශාල ප්‍රශ්නයක්.

මේ ආණ්ඩුව ආපු දවසේ ඉඳලා හොරකම් කිරීම නේ කෙරුවේ. සීනි බදු වංචාවෙන් රුපියල් කෝටි 1,600ක් පමණ පාඩු වුණා කිව්වා. මම දැක්කා අද පුවත් පත්වල තිබෙනවා, ඒ මුදල රුපියල් කෝටි 4,500ක් කියලා. ඒක පොඩි ගණනක් නොවෙයි. ඒවා ගැන සොයන්න කිසි කෙනෙක් නැහැ. ඇයි? පසුගිය රජය කාලයේ -වර්තමාන ජනාධිපතිතුමාගේ ආණ්ඩුව තිබුණු කාලයේ- එතුමාට කිව්වේ මොකක්ද? මහ බැංකු වංචාව කරපු මහ බැංකු හොරා කියලායි කිව්වේ. අන්න, මහ බැංකු වංචාව කළ කෙනා පිට රටට ඇරියා; ඔහු ගෙන්වන්න කිව්වා. දැන් එතුමාට ඡන්දය දීලා, එතුමා ජනාධිපති කරලා තිබෙනවා. දැන් එතුමා මේක අල්ලයිද? ජනාධිපතිතුමා මේ වංචාව හෙළි කරන්න වැඩ පිළිවෙළක් සකස් කරයිද?

ඒ කාලයේ විශේෂයෙන් පාස්කු ප්‍රහාරය ගැන කථා කළා. දැන් පාස්කු ප්‍රහාරය ගැන වචනයක්වත් කථා කරන්නේ නැහැ. දැන් පාස්කු ප්‍රහාරය ගැන හොයයිද? ඒ ගැන කිසි දෙයක් හෙවිල්ලක් නැතිව, මේ වංචා ගැන සොයන්නේ නැතිව, තව තවත් වංචා කිරීම් සිද්ධ වෙනවා. මේ වැටී තිබෙන ආර්ථික අගාධයෙනුත් හොරකම් කරනවා. ඊයේ, පෙරේදා ගෑස් ගෙනෙද්දී ඩොලර් 96ට ගන්න තිබුණු එක ඩොලර් 129ට අරගෙන තිබෙනවා. ඒ ගැන COPE එකේ හිටපු සභාපතිවරයා පාර්ලිමේන්තු විවාදයේදී පැහැදිලි කරනවා කිව්වා. CP එකට අමතරව තිබෙන ගණන ඩොලර් 96ට තිබෙන්නේ. මේ තිබෙන ආර්ථික අර්බුදයෙනුත් ගසා කන තත්ත්වයක් තිබෙනවා. මේක විශාල ප්‍රශ්නයක්. මාධ්‍යකරුවන් විසින් මේවා හෙළි කරද්දී, මාධ්‍යකරුවන් අත්අඩංගුවට අරගෙන ඒ ගොල්ලන් භය කරනවා. තවම ඉතිරි වෙලා තිබෙන්නේ "දෙරණ" සහ "ස්වර්ණවාහිනී" විතරයි. "හිරු" නාළිකාවේ මාධ්‍යවේදියා අරගෙන ගියා; "සියත" නාළිකාවේ මාධ්‍යවේදීන් අරගෙන ගියා; "සිරස" නාළිකාවේ මාධ්‍යවේදීන් අරගෙන ගියා. දැන් ආණ්ඩුවට ඉතිරි වෙලා තිබෙනවා, දෙරණයි ස්වර්ණවාහිනියයි විතරක්. ඒ නාළිකා දෙකත් භය කරන්නද කොහේද, අනෙක් අය අරගෙන ගිහිල්ලා මේවා ප්‍රකාශ කරන්න එපා, මේ වාගේ පුවත් විකාශනය කරන්න එපා කියනවා. ඉතින්, මේක විශාල ප්‍රශ්නයක් බවට පත් වෙලා තිබෙනවා.

අපි ආණ්ඩුවට කියනවා, කරුණාකර මේ රටේ ජනතාව ජීවත් කරවීම සඳහා වැඩ පිළිවෙළක් සකස් කරන්න කියලා. මේ දවස්වල අපේ රට ලෝක දර්ශකවල ඉදිරි ස්ථානවලට එනවා. බොහෝ දත්තවලින් අපි පහෙන් ඉහළ ඉන්නේ. මන්දපෝෂණයෙන් අපි ඉන්නේ ලෝකයේ පස්වැනි ස්ථානයේ. උද්ධමනයෙන් අපි ඉන්නේ ලෝකයේ හතරවැනි, පස්වැනි ස්ථානයේ. අද වන විට අලුත්ම තත්ත්වය මොකක්ද? රුපියල අවපාතවීම. තමන්ගේ රටේ මුදල් ඒකකය අවප්‍රමාණයවීම අතින් අපේ රට ලෝකයේ තුන්වැනි ස්ථානයට පත් වෙලා තිබෙනවා.

ඩොලරයට සාපේක්ෂව තමන්ගේ රටේ මුදල් ඒකකය අවප්‍රමාණය වීම අතින් අපි දැන් ලෝකයේ 3වැනි ස්ථානයට ඉන්නේ. පළමුවැනි ස්ථානයේ ඉන්නේ සිම්බාබ්වේ රාජ්‍යය. ඔවුන්ගේ මුදල් ඒකකය ඩොලරයට සාපේක්ෂව සියයට 73කින් අවප්‍රමාණය වෙලා තිබෙනවා. ඊළඟට ඉන්නේ කියුබාව. ඔවුන්ගේ මුදල් ඒකකය සියයට 54කින් අවප්‍රමාණය වෙලා තිබෙනවා. අපේ රුපියල සියයට 48කින් අවප්‍රමාණය වෙලා තිබෙනවා. ඒ වාගේ දර්ශකවලින් නම් අපි ඉදිරියට එනවා; එක, දෙක, තුන, හතර, පහ වාගේ ස්ථානවලට පත් වෙනවා. අපි අද මන්දපෝෂණයෙන්, උද්ධමනයෙන් ඉදිරියට ඇවිල්ලා තිබෙනවා. මේ වෙනකොට අපේ රටේ උද්ධමනය සියයට 70 දක්වා ඉහළ ගිහිල්ලා තිබෙනවා. අධිඋද්ධමනයක් ඇති වුණොත් මිලදී ගැනීමේ හැකියාව -ක්‍රය ශක්තිය- අඩු වෙනවා වාගේම, බඩු මිල වැඩිවීමේ වේගය ඉහළ යනවා. උද්ධමනය මේ විධියට වැඩි වුණොත් අධි උද්ධමනයක් ඇති වෙනවා. ආර්ථික විශේෂඥ ගරු ආචාර්ය බන්දුල ගුණවර්ධන ඇමතිතුමා මේ වෙලාවේ ගරු සභාවේ ඉන්නවා. අධිඋද්ධමන තත්ත්වයක් ආවොත් මේ රටට මොකද වෙන්නේ? මහ බැංකුවේ අධිපතිවරයා දැන් කියනවා, "මේක තමයි අවසාන අවස්ථාව" කියලා. හැබැයි, 2023 වෙනකල් උද්ධමනය වැඩි වෙයි, 2023න් පස්සේ උද්ධමනය අඩු වෙයි ලු. 2023ට තව මාස කීයක් තිබෙනවාද? ගරු බන්දුල ගුණවර්ධන ඇමතිතුමනි, මේ විධියට ගිහිල්ලා අධි උද්ධමන තත්ත්වයක් ඇති වුණොත් මේ රටේ ජනතාවට ජීවත් වෙන්න පුළුවන්ද? අධිඋද්ධමන තත්ත්වයක් තිබෙන රටවලට සිද්ධ වුණු දේ අපි දැක්කා නේ. අපි දැක්කා, සිම්බාබ්වේ ජනතාව විල්බැරෝ එකෙන් තමයි සල්ලි අරගෙන ගියේ. දැන් අපේ රටේත් ඒ තත්ත්වය ඇති වෙමින් තිබෙනවා. දැන් එහෙම වේගන එනවා. රටේ ජනතාවට ජීවත් වෙන්න බැහැ. රුපියල් 50ට තිබුණු පාන් රාත්තල දැන් රුපියල් 200ට ගන්නවා. බේකරි හිමියෝ මට කිව්වා, දැන් තිරිඟු පිටි කිලෝ ග්‍රෑම් පනහේ බෑග් එකක් රුපියල් 20,000යි කියලා. එතකොට, පාන් රාත්තලක් රුපියල් 300ට තමයි දෙන්න වෙන්නේ. ලංකාවේ ජනතාව දවසකට පාන් රාත්තල් තිස්පන්ලක්ෂයක් කනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු මන්ත්‍රීතුමනි, ගරු හරිනි අමරසූරිය මන්ත්‍රීතුමියගේ කාලයෙන් ඔබතුමාට තව අමතර විනාඩි 5ක කාලයක් ලැබෙනවා.

**ගරු අශෝක් අබේසිංහ මහතා**
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)

බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

එහෙම තත්ත්වයක් තුළ අධිඋද්ධමන තත්ත්වයකට ආවොත්, මේ රට විශාල ප්‍රශ්නයකට මුහුණ පානවා. මේ වෙනකොට උද්ධමන තත්ත්වය ඒ විධියට ඉදිරියට, ඉදිරියට යනවා. සෑම භාණ්ඩයකම මිල අධික වෙලා තිබෙනවා. සෑම භාණ්ඩයකම මිල අධික වීම තුළ මේ රටේ ජනතාවට ජීවත් වෙන්න බැරි තත්ත්වයක් ඇතිවෙලා තිබෙනවා. මේකට වග කියන්නේ කවුද?

ඊයේ මහ බැංකු අධිපතිවරයා කියනවා, ණය ප්‍රතිව්‍යුහගත කිරීම පිළිබඳව 23 වැනිදා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල එක්ක සාකච්ඡා කරනවා කියලා. ණය ප්‍රතිව්‍යුහගත කළේ නැත්නම් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ලැබෙන දේ ලැබෙන්නේ නැහැ. ඒ ඩොලර් බිලියන 2.9න් අපට බඩු ගන්න ලැබෙන්නේ නැහැනේ. ඒ ඩොලර් බිලියන 2.9 අපේ සංචිතවලට දමන්න ඕනෑ. ඒක මාස 48ක් තුළ ඩොලර් මිලියන 350 ගණනේ මාස හයෙන් හයට තමයි හම්බ වෙන්නේ.

අද වෙද්දී ඉන්දියාව තමයි අපට වැඩියෙන්ම ණය දීපු රට බවට පත්වෙලා තිබෙන්නේ. එතකොට, ඉන්දියාව අපිත් එක්ක සාකච්ඡා කළත් චීනය කියනවා, "අපි ණය ප්‍රතිව්‍යුහගත කරන්න කැමති නැහැ. ණය ගෙවන්න අපි තවත් ණයක් දෙන්නම්" කියලා. ණය ගෙවන්න ණයක් දෙන්නම් කියලා කථා කරද්දී අපි කොහොමද

[ගරු අශෝක් අබේසිංහ මහතා]

ණය ප්‍රතිව්‍යුගත කිරීමක් ගැන කථා කරන්නේ? මෙහෙම කොච්චර කථා කළත් මේ ප්‍රශ්නය විසඳෙන්නේ නැහැ. දැනට ලංකා බැංකුවයි, මහජන බැංකුවයි ඇමෙරිකානු ඩොලර් බිලියන 1.5ක - ඩොලර් මිලියන 1,500ක- බැඳුම්කර අරන් තිබෙනවා. ගරු හර්ෂ ද සිල්වා මැතිතුමා කිව්වා වාගේ, ඩොලර්වලින් ණය අරන්, ඒවා බැඳුම්කරවල ආයෝජනය කරලා දැන් ඒවා ප්‍රතිව්‍යුහගත කරන්න, ණය කපා හරින්න, නැත්නම් කල් දමන්න කියලා කිව්වාම ඒ මිනිස්සු ඒකට කැමති වෙයිද? කැමති වුණේ නැත්නම් අපට මොකද වෙන්නේ? ඒක අවසාන අවස්ථාව වුණොත් මේ රටට මොකද වෙන්නේ? මේවා මේ රටේ මේ ආණ්ඩුව ගත් ඔළමොට්ටළ ක්‍රියාකාරකම් නිසා වෙච්ච දේවල්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද වෙද්දී අපේ රටේ ණය බර රුපියල් ට්‍රිලියන 23ක් වෙනවා. රුපියල් ට්‍රිලියන 23ක් කියන්නේ, රුපියල් කෝටි විසිතුන්ලක්ෂයක්. දැන් ඒක පුද්ගල ණය ප්‍රමාණය රුපියල් 1,150,000යි. මහින්ද රාජපක්ෂ මහත්මයා 2005දී බලයට එද්දී ඒක පුද්ගල ණය ප්‍රමාණය රුපියල් 95,000යි; සමස්ත ණය ප්‍රමාණය රුපියල් කෝටි 223,000යි. දැන් ණය ප්‍රමාණය කෝටි විසිතුන් ලක්ෂයයි. 2020 වසරේ අපේ රටේ සමස්ත ණය ප්‍රමාණය රුපියල් කෝටි පහළොස් ලක්ෂයයි. පසුගිය අවුරුදු දෙකහමාර තුළ රුපියල් කෝටි අටලක්ෂයක් අරන් තිබෙනවා. ඒ කියන්නේ මේ කාලය තුළ -මේ අවුරුදු දෙකහමාර තුළ- තමයි සමස්ත ණය ප්‍රමාණයෙන් සියයට 50කට වැඩියෙන් අරන් තිබෙන්නේ. ඒ කියන්නේ, රුපියල අවප්‍රමාණය වීමත් එක්ක ණය ප්‍රමාණය වැඩි වීමක් සිද්ධ වුණා. රජය කියනවා, අද වෙද්දී විදේශ ණය විධියට තිබෙන්නේ ඩොලර් බිලියන 55යි කියලා. හැබැයි, රොයිටර් කියනවා මම දැක්කා, ඇමෙරිකානු ඩොලර් බිලියන 85යි, 100යි අතර විදේශ ණය තිබෙනවා කියලා. කවුද ඇත්ත කියන්නේ? ණය හංගන්නේ මොකද? අපි ණය හංගන හැටි දැක්කා. දැනට නොරොච්චෝලේ සඳහා ගත් ණය හංගලා තිබෙනවා. එතකොට, හම්බන්තොට වරාය වෙනුවෙන් ගත් ණය හංගලා තිබෙනවා. මේවා ණය පොත්වල නැහැ. ණය පොත් නැත්නම් ඒවාට මොකද වුණේ? මේ තත්ත්වය තුළ එක් පුද්ගලයෙක් රුපියල් 1,150,000ක ණයකාරයෙක් බවට පත් කළා.

රටේ ජනතාවට අද ජීවත් වෙන්න බැරි තත්ත්වයක් ඇති කරලා තිබෙනවා. මේ ගැන කථා කරද්දී මාධ්‍යවේදීන් අත්අඩංගුවට ගන්නවා, මාධ්‍ය මර්දනයක් සිද්ධ වෙනවා. ඒ පිළිබඳව මානව හිමිකම් සංවිධානවලදීත් කථා කළා. හෙට අනිද්දා වෙනකොට ජිනීවා මානව හිමිකම් කවුන්සලයේ ඡන්දය පවත්වනවා. අපි ඒකෙන් පැරදුණොත් මොකද වෙන්නේ? අපි තවත් අන්තයට යනවා. ඒ නිසා කරුණාකර රජය ඇත්ත කියන්න, මේවා පිළිගන්න. මේ රටේ මන්දපෝෂණය තිබෙනවා කියලා පිළිගන්න. ඒ සඳහා යම් වැඩ පිළිවෙළක් සකස් කරන්න. බෙහෙත් හිඟයක් තිබෙනවා කියලා පිළිගන්න. රෝගීන්ට අවශ්‍ය බෙහෙත් ටික අඩු ගණනේ ගුවන් මඟින් හෝ ගෙනැල්ලා ලබා දෙන්න. ඒ සඳහා ක්‍රමවත් වැඩ පිළිවෙළක් හදන්න. එහෙම නැතිව, ඇමතිවරු සංඛ්‍යාව වැඩි කරලා හරියන්නේ නැහැ නේ. ඇමති මණ්ඩලය 38 දෙනෙකුගෙන් වැඩි කරලා තිබෙනවා. ඒ අය වෙනුවෙන් අවුරුද්දකට රුපියල් බිලියන 2ක් ඕනෑ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. වී ටික ගන්න ඕනෑ වෙන්නේත් බිලියන 2යි. වී ටික ගන්න ඒ බිලියන 2 දෙන්නේත් නැහැ. ලංකාවේ එක කන්නයක අස්වැන්නෙන් සියයට 5යි වී අලෙවි මණ්ඩලය ගන්නේ. ඉතිරි සියයට 95ම පෞද්ගලික අංශය ගන්නේ. ඒ සියයට 5 ගන්නත් කෝටි 200යි -ඩොලර් බිලියන 2යි- ඕනෑ වෙන්නේ. ලංකා බැංකුව දැන් ඒ මුදල දෙන්නේත් නැතුව ඉන්නවා. දැන් ඒ මුදල ගන්නත් බැරි තත්ත්වයක් තිබෙන්නේ. ඉතින්, මේ තත්ත්වයත් එක්ක සමස්ත දේම, සියලුම ආයතන අද කඩා වැටිලා තිබෙන්නේ.

අද අපි ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව ගැන කථා කරනවා. රූපවාහිනී සංස්ථාව පාඩු ලබන්නේ මොකද? ජාතික ලොතරැයි මණ්ඩලයේ ලොතරැයි දිනුම් ඇදීමේ කටයුතුවලින් ජාතික රූපවාහිනිය ඉවත් කරපු නිසායි. මේ රජය ආවාට පස්සේ මේ හැම ආයතනයකම ප්‍රශ්න ඇති කරලා තිබෙනවා. හැබැයි, පසුගිය රජයට ඇඟිල්ල දිගු කරමින් නොයෙක් දේවල් කියනවා. පසුගිය ආණ්ඩුවේ හිටපු අගමැතිතුමා තමයි වර්තමාන ජනාධිපතිතුමා ලෙස කටයුතු කරන්නේ. ඒ නිසා එතුමාට පුළුවන් මේ ගැන කථා කරන්න. මොකද, දෙපැත්තේම හිටපු අගමැති කෙනෙක්, ජනාධිපති කෙනෙක් නේ ඉන්නේ. ඒ නිසා කරුණාකර මේ ප්‍රශ්නය විසඳලා රටේ ජනතාවට ජීවත් වෙන්න පුළුවන් පරිසරය සකස් කරන්න. එහෙම වටුණොත් අපට අනිවාර්යයෙන්ම රට ඉදිරියට ගෙන යන්න පුළුවන් වෙයි. ඒ වාගේම දූෂිතයන්ට දඬුවම් කරන්න වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න. සමගි ජන බලවේග ආණ්ඩුවක් යටතේ, සජිත් ප්‍රේමදාස මැතිතුමාගේ නායකත්වය යටතේ, සරත් ෆොන්සේකා මැතිතුමා සමඟ එකතු වී මේ දූෂිතයන්ට දඬුවම් කිරීම අනිවාර්යයෙන්ම කරලා, මේ රටෙන් හොරකම් කරපු මුදල් මේ රටට නැවත අරගෙන දෙන්න අපි කටයුතු කරනවා කියන කාරණය මතක් කරමින් මම නිහඬ වෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**

(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)

(The Hon. Deputy Speaker)

ගරු බන්දුල ගුණවර්ධන ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 20ක කාලයක් තිබෙනවා.

[අ.භා. 12.21]

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා (ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன - போக்குவரத்து மற்றும் நெடுஞ்சாலைகள் அமைச்சரும் வெகுசன ஊடக அமைச்சரும்)

(The Hon. (Dr.) Bandula Gunawardana - Minister of Transport and Highways and Minister of Mass Media)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කුරුණෑගල දිස්ත්‍රික්කයේ අපේ ගරු අශෝක් අබේසිංහ මැතිතුමා ඉතා හැඟීම්බරව අදහස් ප්‍රකාශ කළා. මේක අපි කවුරුත් දන්නා, පිළිගන්නා තත්ත්වයක්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නිදහසින් පසුව අපේ රටේ ඉතිහාසයේ මෙවැනි තත්ත්වයක් කවදාවත් ඇතිවෙලා නැහැ. මේ තත්ත්වය නිසා ලංකා ඉතිහාසයේ ආර්ථිකය ආපස්සට ගිහිපු අවස්ථා තිබෙනවා. 2001දී ආර්ථික වර්ධනය ඍණ 1.4යි. ඊට පස්සේ කොවිඩ් 19 වසංගතය නිසා 2020 දී ආර්ථික වර්ධනය 3.6ක් වුණා. මේ වර්ෂයේ ඇස්තමේන්තු කරලා තිබෙනවා, මේ රටේ ආර්ථික වර්ධන වේගය සියයට 6ත්, 8ත් අතර ප්‍රමාණයකින් පස්සට යයි කියලා. ඒ කියන්නේ සමස්ත නිෂ්පාදන ක්‍රියාවලියේ පසුබෑමක් දිගින් දිගටම බරපතළ ලෙස ඇති වෙලා තිබෙනවා. මේ තත්ත්වය තුළ ණය අර්බුදය ගැනත් ඔබතුමා සඳහන් කළා, ගරු මන්ත්‍රීතුමනි. අපි අවංක වෙන්න ඕනෑ. මේ රටේ නිදහස ලැබුණු දවසේ ඉඳන් දිගටම සිදු වුණු රාජ්‍ය මූල්‍ය කළමනාකරණයේ ගැටලුවක් නිසායි මෙය සිදු වෙලා තිබෙන්නේ. අපි හැමදාම රජයේ ආදායමට වඩා වැඩියෙන් වියදම් කරලා තිබෙනවා. එතකොට අය වැයේ ඇතිවන පරතරය පියවා ගැනීම සඳහා කාගේ ආණ්ඩුව තිබුණත්, දේශීය හා විදේශීය වශයෙන් විශාල ණය ප්‍රමාණයක් අරගෙන තිබෙනවා. ගත්ත ණය වාරික, පොලිය ගෙවන්න බැරි වෙනකොට, අපිට ආදායම් ප්‍රමාණවත් නැතිවෙනකොට, දැරිය නොහැකි මට්ටමක වියදම් දරනකොට හැමදාම අපි දීර්ඝකාලීනව කියලා තිබෙනවා, ලංකා ආණ්ඩුවට එදිනෙදා කටයුතු කරගෙන යාමට ප්‍රමාණවත් ආදායමක් ලැබෙන්නේ නැහැ කියලා. රජයක් එදිනෙදා පවත්වාගෙන යන්න

ප්‍රමාණවත් ආදායමක් ලැබෙන්නේ නැතිව, හැම ආණ්ඩුවක් යටතේ ම වර්තන ගිණුමේ හිඟයක් ඇති කරගෙන තමයි ඇවිල්ලා තිබෙන්නේ. ප්‍රාග්ධන වියදම් සියල්ල දරලා තිබෙන්නේ ණයටයි.

යුද්ධය නිම වුණාට පස්සේ, අවුරුදු තිහක් තිස්සේ විනාශ කර තිබුණ උතුර-නැඟෙනහිර ප්‍රදේශවල සංවර්ධනය වෙනුවෙන් "උතුරු වසන්තය" හා "නැඟෙනහිර නවෝදය" කියන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා අසීමිත ලෙස ණය අරගෙන තිබෙනවා. ඒ වාගේම, මං මාවත්, විදුලිය, ජලබස්නා ජලාපවහන ක්‍රම හදලා තිබෙනවා. අවුරුදු තිහක් තිස්සේ ඒ සියල්ල නැති වෙලායි තිබුණේ. ඒ ණය ගෙවා ගන්න බැරි තත්ත්වය ඇති වෙන්න ප්‍රධාන වශයෙන් හේතු වුණේ අපි සාමාන්‍යයෙන් සම්ප්‍රදායිකව ණය ලැබෙනවාට වඩා Sovereign Bonds issue කරලා ජාත්‍යන්තර වෙළෙඳ පොළට ගිහිල්ලා ගිනි පොලියට ණය ගත්ත එක. ඒ ණය ගන්න වුණේ 2007 යුද්ධය තිබෙන කාලයේදියි. මහින්ද රාජපක්ෂ මහත්මයාගේ මුළු ආණ්ඩු කාලයටම Sovereign Bond issuesවලින් තමයි ඒ ණය ප්‍රමාණය අරගෙන තිබෙන්නේ. ඒ, ප්‍රමාණය ඇමෙරිකන් ඩොලර් බිලියන 6.5යි. ඔබතුමන්ලා කොච්චර අකමැති වුණත් පිළිගන්න වෙනවා, නිදහසින් පස්සේ ලංකා ඉතිහාසයේ වැඩිම ස්වෛරීත්ව බැඳුම්කර නිකුත් කර තිබෙන්නේ යහ පාලන රජය පැවැති අවුරුදු 5 තුළදීයි කියන කාරණය. ඒ අරගෙන තිබෙන බැඳුම්කර ප්‍රමාණය ඇමරිකානු ඩොලර් බිලියන 12.5කට වැඩියි. එවැනි ප්‍රමාණයක් ණය ගත්ත ආණ්ඩුවක් ලංකා ඉතිහාසයේ නැහැ. ඒ අරගෙන තිබෙන ණය කල් පිරෙන්නේ 2029 අවුරුද්දේදී. කවුරු ආණ්ඩුව ගත්තත් 2029 වෙනකන් මේ තත්ත්වයට අපිත්, තමුන්නාන්සේලාත් මුහුණ දෙන්න ඕනෑ. අපේ රට ඇතුළේ තිබෙන මේ ප්‍රශ්නය විසඳා ගන්න ආචාර්යවරුන්ට, මහාචාර්යවරුන්ට, ආර්ථික විද්‍යා විද්වතුන්ට, ශ්‍රී ලංකා මහ බැංකුවට හෝ වෙනත් අයට සරල විසඳුමක් නැහැ. ඒ නිසා තමයි අපි ජාත්‍යන්තරව කැඳවලා ප්‍රංශයේ Lazard සමාගමට කියලා තියෙන්නේ, "මේ අර්බුදය විසඳන්න වැඩ පිළිවෙළක් සකස් කරලා දෙන්න" කියලා. මෙහි තිබෙන නීති ගැටලු විසඳාගන්න අපි ජාත්‍යන්තරයට කියලා Clifford Chance කියන සමාගම අරගෙන තිබෙනවා. මොකද අපේ මට්ටම, අපේ දැනුම, අපේ මොළයේ තිබෙන ප්‍රමාණය අනුව, මේ ගැටලුව; මේ ජාතික ව්‍යසනය විසඳන්න බැහැ. ඒ නිසා මේ ගරු සභාව ඇතුළත අපි බැණ ගැනීම වෙනුවට, මෙවැනි ජාතික ව්‍යසනයකදී මුහුණ දෙන්නේ කෙසේ ද කියන එක පිළිබඳව ප්‍රබුද්ධ සාකච්ඡාවක් ඇති වීම තමයි විය යුත්තේ. එතැනදී ව්‍යවස්ථාදායකය, විධායකය, අධිකරණය වාගේම ජනමාධ්‍ය ආයතනවලටත් විශාල වගකීමක් තිබෙනවා, තමුන්ගේ මාතෘ භූමිය පිළිබඳව.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පසු ගිය සතියේ රුසියාවේ ටාටාර්ස්ටාන් රාජ්‍යයේ "කසාන්" ජාත්‍යන්තර සිනමා උළෙලට ලංකාව නියෝජනය කරමින් සහභාගි වුණා. එහිදී විවිධ රටවල සිටින චිත්‍රපට නිෂ්පාදකවරු, අධ්‍යක්ෂවරු, විශ්වවිද්‍යාලවල සිටින විෂයානුබද්ධ ආචාර්ය, මහාචාර්යවරු විශාල පිරිසක් මට මුණ ගැසුණා. ඒ අවස්ථාවේ ඔවුන් ප්‍රශ්න ගණනාවක් ඇහුවා. "ඔබේ රටට බයෙන් හා සැකෙන් තොරව පැමිණෙන්න පුළුවන්ද, රටේ පාරවල් වහලා තිබෙනවා නේද, හැම වෙලාවේම රට ඇතුළේ ප්‍රචණ්ඩත්වයක් තිබෙනවා නේද, ගුවන් තොටුපොළෙන් එනකොට වෙනත් අය -බලය නැති අය- විසින් පාස්පෝර්ට් එක පරීක්ෂා කරනවාද, ගුවන් තොටුපොළට එන පාර වහනවාද, පාරවල් වහලා, දිනපතාම මිනී මැරීම් සිද්ධ වෙනවාද, අපරාධ සිද්ධ වෙනවාද, බය නැතිව ගමන් කරන්න පුළුවන්ද?" කියලා ඔවුන් ඇහුවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ විධියට ලංකාව සම්බන්ධයෙන් ඇති වෙලා තිබෙන්නේ ඉතාම නරක ප්‍රතිරූපයක්. අපි කැමැති වුණත්, අකැමැති වුණත් එවැනි ප්‍රතිරූපයක් ඇති වෙලා තිබෙනවා. රටක කවුරු ආණ්ඩු කළත්, ඒ රටට ජාත්‍යන්තර වශයෙන් හොඳ ප්‍රතිරූපයක් තිබිය යුතු වෙනවා. ඒ ප්‍රතිරූපය නැති වෙන විධියට මාධ්‍ය වාර්තාකරණයක් තිබෙනවා නම්, රටක් වශයෙන් ඉතාම නරක තත්ත්වයකට තමයි අපට මුහුණ දෙන්න සිද්ධ වෙන්නේ. ඒ නිසා රාජ්‍ය, පෞද්ගලික සහ සමාජ මාධ්‍යවල සිටින රටට ආදරය කරන සියලුම පුරවැසියන්ට මම කියන්නේ, රටක මූලික ප්‍රතිරූපය කෙලෙසන ආකාරයට ප්‍රවෘත්ති පළ කිරීමෙන් වළකින්න ඔබට හැකියාවක් තිබෙනවා නම්, ඒක ඇත්තටම මෙලොව වශයෙන් කීර්තියක්, පරලොව වශයෙන් පින්කමක් අත්කර ගත හැකි දෙයක් කියලා. මොකද, රටක් වැටුණාට පසුව කවුරු ආණ්ඩු ගත්තත් ඒක එක දවසකදී වෙනස් කරන්න පුළුවන්කමක් නැහැ.

ඔබතුමන්ලා දන්නවා, ජාත්‍යන්තර මාධ්‍ය ගෙන ගිය විවිධ ප්‍රචාරණ නිසා ජිනීවාවල පැවැත්වෙන එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සලයෙන් ශ්‍රී ලංකාවට මානව හිමිකම් කඩ කිරීම් පිළිබඳව චෝදනා නඟන බව; අපේ රණ විරුවන්ට චෝදනා නඟන බව. ඒ චෝදනා අසත්‍යයි, මානුෂික මෙහෙයුමක් තමයි වුණේ කියා අපි කොතරම් කීවත්, ජාත්‍යන්තර මාධ්‍ය ඒ අයගේ මතය අරගෙන ගියා. ඒ නිසා මාධ්‍යවල එවැනි මතවාද පැළ කිරීම තුළින් ඇති වෙන අහිතකර ප්‍රතිඵල පිළිබඳව අපට සාකච්ඡා කරන්න වෙනවා.

පසු ගිය අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේදී පක්ෂ, විපක්ෂ සියලු මන්ත්‍රීවරු පෙන්වා දුන්නා, අපේ රටේ මාධ්‍ය වාර්තාකරණයේදී පුවත් පත්වල පළවන ප්‍රවෘත්ති ගැන සඳහන් කිරීමේදී "පුවත් පත් පුවත්" කියලා පුවත් පතේ නැති දේවල් වැඩි වශයෙන් කීම තුළ, තමන්ගේ මතයක් ප්‍රකාශ කිරීම තුළ, පුවත් පත්වලට අගතියක් සිදු වෙනවා කියලා. මොකද, පුවත් පතේ සඳහන් දේ ගැන විග්‍රහ කිරීමේදී පුවත් පත කියපු දෙය නොවෙයි ඉදිරිපත් වෙන්නේ. ඒ පළ වන අදහස වෙනස් එකක්; පෞද්ගලික මතයක්. එදා අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේදී ඉල්ලා සිටියා පුවත් පත් පාලක මණ්ඩලයෙන් මේ පිළිබඳව අවධානය යොමු කරන ලෙස. පුවත් පතේ තිබෙන දේ කොතරම් පුන පුනා ප්‍රකාශ කළත් ප්‍රශ්නයක් නැහැ. හැබැයි, පුවත් පතේ සඳහන් නොවන පෞද්ගලික මතයක් එතැනදී ප්‍රකාශ කරන්න පුළුවන්ද කියන කාරණාව ගැනත් එතැනදී ප්‍රශ්නයක් මතු වුණා. ඒ නිසා මාධ්‍ය ආයතන සියල්ලෙන්ම මා ඉල්ලා සිටිනවා, අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේදී ආණ්ඩු පක්ෂ, ප්‍රතිපක්ෂ සියලු මන්ත්‍රීතුමන්ලා පළ කරපු එම අදහස් පිළිබඳව ඔබගේ බුද්ධිමය අවධානය යොමු කරන්න කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ආයතන බොහොම අමාරුවෙන් තමයි පවත්වා ගෙන යන්නේ. කැමැති වුණත්, අකැමැති වුණත් මම මේ විෂයය භාර ගැනීමෙන් පසුව කිසිම කෙනෙකුට මේ හරහා රැකියාවක් දීලා නැහැ. නමුත්, මීට පෙර හැමදාමත් විවිධ දේශපාලන හේතූන් මත ඒ ආයතනවලට පත්වීම් ලබාදීම තුළ රාජ්‍ය අංශයේ සෑම මාධ්‍ය ආයතනයකම දැන් අතිරික්ත ශ්‍රම බලකායක් ඉන්නවා. අද සෑම ආයතනයකම තිබෙන ප්‍රධාන ප්‍රශ්නය තමයි, ඒ ආයතනය උපදවන ආදායමෙන් වැටුප් හා විශ්‍රාම වැටුප් සඳහා විශාල වියදමක් දරන්න සිදු වීම. ඒ අය ජීවත් කරවීම සඳහා ඒවා ගෙවිය යුතුමයි. හැබැයි, ඒක කරන්නේ කෙසේද කියන එක මුළු රටේම තිබෙන ප්‍රශ්නවලින් එකක්.

2021 වර්ෂයේදී රජයේ මුළු බදු ආදායම රුපියල් බිලියන 1,268යි. වක්‍ර බදු, සෘජු බදු හා බදු නොවන ආදායම්වලින් සොයා ගෙන තිබෙන්නේ රුපියල් බිලියන 1,268යි. රාජ්‍ය සේවකයන්ගේ වැටුප් සහ විශ්‍රාම වැටුප් සඳහා පමණක් වියදම් වෙනවා, රුපියල් බිලියන 1,115ක්. රුපියල් බිලියන 1,268ක් බදු විධියට අරගෙන රුපියල් බිලියන 1,115ක් වැටුප් හා විශ්‍රාම වැටුප් වශයෙන් ගෙව්වාට පස්සේ ඒ ඉතුරු වෙන මුදලින් කොහොමද රටක් ගෙන යන්නේ? කවුරු බලයට ආවත්, කාගේ ආණ්ඩුවක් තිබුණත් මේ ප්‍රශ්නය ගැන කල්පනා කරන්න ඕනෑ. ලැබෙන ආදායමෙන් වැටුප්

[ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා]

සහ විශ්‍රාම වැටුප් ගෙවන්න සියයට 86ක් යනවා නම් කොහොමද රටක් ඉදිරියට ගෙන යන්නේ? එතකොට ලංකාව බදු අය කරන්නේ වැටුප් හා විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා පමණ ද? එහෙම රටක් ලෝකයේ වෙන කොහේවත් තිබෙනවා ද? මගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට ලංකාවේ විතරයි රජයේ මුළු බදු ආදායමෙන් සියයට 86ක් රාජ්‍ය සේවා වැටුප් සහ විශ්‍රාම වැටුප් සඳහා වැය වෙන්නේ. ඒ නිසා වැටුප් ගෙවන දවසට හැම ආයතනයකටම ප්‍රශ්නයක් තිබෙනවා. අපේ රූපවාහිනී සංස්ථාවේ ආදායම වැටුප් ගෙවන්න ප්‍රමාණවත් නැති වෙනකොට කොහොමද වැටුප් ගෙවන්නේ? විශ්‍රාම වැටුප් ගෙවන්නේ?

රජයේ දෙපාර්තමේන්තුත් එහෙමයි. දුම්රිය දෙපාර්තමේන්තුවේ ගිය අවුරුද්දේ ආදායම රුපියල් බිලියන 2.6යි. අතිකාල දීමනා සඳහා අවශ්‍ය වන මුදල රුපියල් බිලියන 2.3යි. වැටුප් සඳහා වැය වන මුදල රුපියල් බිලියන 7යි. බිලියන 7ක් වැටුප් විධියට ගෙවන්න වනවා නම්, බිලියන 2.3ක් අතිකාල දීමනා වශයෙන් ගෙවන්න වනවා නම්, බිලියන 2.6ක ආදායමින් කොහොමද දුම්රිය දෙපාර්තමේන්තුව පවත්වාගෙන යන්නේ? ඒ නිසා මම දුම්රිය ගාස්තු වැඩි කළා. ඒ අවස්ථාවේදී දුම්රිය ස්ථානාධිපතිවරු - station mastersලා - ජනතාවට පීඩනයක් කියලා ප්‍රවේශපත්‍ර - tickets - නිකුත් කිරීම නතර කළා. මම ඔවුන්ට පැහැදිලි කරලා දුන්නා, වැඩි වෙලා තිබෙන ඉන්ධන බිලවත්, මේ වැඩි කරපු ගාස්තුවෙන් පියවා ගන්න බැහැ කියලා. මසකට මිලියන 600ක් පමණ ලබපු ආදායම දැන් මිලියන 1,300 දක්වා ඉහළ නංවා තිබෙනවා. ඒ මුදල වැඩි කළා කියලා අපේ වැඩිවෙච්ච විදුලි බිලවත් ඒකෙන් පියවා ගන්න බැහැ. ඒක නිසා රාජ්‍ය ආයතනයක් වුණත්, පෞද්ගලික ආයතනයක් වුණත්, නිවසක් වුණත් ආදායමට සරිලන ලෙස වියදම් කළේ නැත්නම්, වියදම් පියවා ගන්න බැරි තත්ත්වයක් තිබෙනවා නම් මේ වාගේ ඛේදවාචකයකට මුහුණ දෙන්න සිදු වෙනවා. සියලු මාධ්‍ය ආයතනවලටත් වගකීමක් තිබෙනවා, අපේ රට පත්වෙලා තිබෙන තත්ත්වය පිළිබඳ තම තමන්ගේ හැඟීම් අනුව නොවෙයි, තම නැණ පමණින් නොවෙයි, ආර්ථික විද්‍යාත්මක වශයෙන් හිතලා මේ ප්‍රශ්නයෙන් ගොඩ ඒම සඳහා කටයුතු කරන්න. ඒ සඳහා අවශ්‍ය දායකත්වය ලබා දෙන්න කියලා අපි මාධ්‍ය ආයතනවලින් ඉල්ලා සිටිනවා. මේ ඇතිවන තත්ත්වයන් පිළිබඳව විෂයානුබද්ධ විද්වතුන් සහ ශාස්ත්‍රීය අවබෝධයක් තිබෙන අය සමඟ නිරන්තරයෙන් පැවැත්වෙන සාකච්ඡා, සම්මන්ත්‍රණ, වැඩමුළු යනාදියට මාධ්‍ය මඟින් වැඩි අවස්ථාවක් ලබා දුන්නොත් අපේ රටේ ජනතාව වඩා හොඳ දිශානතියකට ගමන් කරවන්න පුළුවන්කම තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජපානයේ හිරෝෂිමාවට බෝම්බ දාලා මුළු රටම සම්පූර්ණයෙන්ම විනාශ වුණු අවස්ථාවේදී ජපන් ජාතික විද්වතුන්, උගතුන්, මාධ්‍යවේදීන් සියලු දෙනා එකතුවෙලා පළමුවෙන් ජපානයට පුරුදු කළේ ආදරය කරන්නයි. ජපන් රටට ආදරය කරන්න, තමන් හැදූ වැඩූ දෙමව්පියන්ට ආදරේ කරන්න, ඒ රටේ ඉන්න අනෙක් සෑම පුරවැසියකුටම ආදරේ කරන්න, ගහ කොළ, සතා සිවුපාවන්ට ආදරය කරන්න පුරුදු කළා. මේ සභාවේ ඉන්නවා, ජපානය පිළිබඳව අත්දැකීම් තිබෙන බොහෝ දෙනෙක්. ජපානයේ අය නන්නාඳුනනා ඕනෑම කෙනෙක් දැක්කොත් ඔළුව පහත් කරලා bow කිරීමක් කරනවා. ජපානයේ පාසල් ශිෂ්‍යයෙක් පාර හරහා ඇඳලා තිබෙන ඉරි මතින් පාර පැනලා ගියොත්, ඒ ඉරට bow කරලා යන තත්ත්වයක් තිබෙනවා. වැඩ වර්ජනයක් කරනවා නම්, වැඩ වරන කොට ඔක්කෝම යන්ත්‍ර සූත්‍රවල ග්‍රීස් ගාලා ඒවා මලකඩ කන්නේ නැති විධියට කටයුතු කරලා තමයි වැඩ වර්ජනයක් කරන්නේ. රට ඇතුළේ විශාල කාර්මික දියුණුවක් තිබුණත් හරිත උද්‍යානයක් වශයෙන් ගහකොළ ටික ආරක්ෂා කරනවා. වර්ණ යොදන කොට ඇස් කඩාගෙන යන වර්ණ යොදන්නේ නැහැ, බොහොම නිවිච්ච වර්ණ තමයි යොදන්නේ. ජපන් ජාතිකයෝ හරිම බයයි, රණ්ඩු වෙනවා දකින්න. ඒ රටේ කිසිම මිනිහෙක් පාරේ රණ්ඩුවක් වෙනවා දකින්න නැහැ. අපි වෛරයෙන් මුසපත් වෙලා තිබෙනවා. පාර්ලිමේන්තුව ඇතුළේ වාද-විවාදවලින් පවා අපට එවැනි මනුස්සකමක් පිරුණු උතුම් මට්ටමකට ගෙන යන්න බැරි තත්ත්වයක් නිර්මාණය වුණාම ඊට පහළ මට්ටමේ ඊට වඩා නරක තත්ත්වයක් නිර්මාණය වෙනවා.

ඒ නිසා අලුතින් හිතන්න. අප කැමැති වුණත්, අකැමැති වුණත් බොහෝ දේවල් සම්බන්ධයෙන්, එනම් රාජ්‍ය සේවක වැටුප් ගෙවන්නේ කොහොමද, විශ්‍රාම වැටුප් ගෙවන්නේ කොහොමද, ගත්තු රාජ්‍ය ණයවල පොලී ගෙවන්නේ කොහොමද, මේ ටික කළාට පස්සේ ප්‍රාථමික ගිණුමේ අතිරික්තයක් ඇති කරගන්නේ කොහොමද කියන කාරණා සම්බන්ධයෙන් අපි සියලුදෙනා එකතු වෙලා සර්වපාක්ෂික එකඟතාවක් ඇති කරගත යුතු වෙනවා. ප්‍රාථමික ගිණුමේ අතිරික්තයක් ඇති කරගත්තේ නැත්නම්, ණය ප්‍රතිව්‍යුහගත කළේ නැත්නම් අපට ණය දෙන්නේ නැහැ. අප ණයවර ලිපියක් නිකුත් කළාම ලෝකයේ පවතින system එක අනුව ඒ ණයවර ලිපිය පිළිගන්නේ නැති වුණොත් අපට ඉන්ධන ගෙන්වන්න බැරි වනවා; ගෑස් ගෙන්වන්න බැරි වනවා; බෙහෙත් ගෙන්වන්න බැරි වනවා. භාණ්ඩ ආනයනය කරන්න නම් අපි ණයවර ලිපියක් - Letter of Credit කියන එක - නිකුත් කරන්න ඕනෑ. ඒක තමයි ජාත්‍යන්තර ක්‍රමවේදය. ඒ සඳහා තමයි ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සහයෝගය ලබාගන්නේ. ඒ මිස, ඒ ලැබෙන මුදලින් සියලු ප්‍රශ්න විසඳන්න නොවෙයි. මේ system එක තුළ නැවත වතාවක් අපේ රට පිළිබඳ අලුත් විශ්වසනීයභාවයක් ඇති කරගන්න ඕනෑ, අපේ රට ආර්ථික වශයෙන් ශක්තිමත්ව පවත්වාගෙන යන්න නම්. අපට හිතෙන දේවල් කියන්න පුළුවන්. නමුත්, අප හිතන දේවල් අනුව ලෝකයෙන් කිසි දෙයක් කරගන්න අපට හැකියාව ලැබෙන්නේ නැහැ. යම් රටක් ලෝකයේ සම්මත මූල්‍ය ක්‍රමවේද පාවිච්චි කරන්නේ නැත්නම් ඒ රටට ජාත්‍යන්තරය සමඟ ගනු දෙනු කරන්න බැහැ. අපි තේ, රබර්, පොල් සහ අනෙක් භාණ්ඩ අපනයනය කරන්න ඕනෑ; අපනයන ආදායම් ලබාගන්න ඕනෑ; පාරිභෝජන භාණ්ඩ, අන්තර් භාණ්ඩ, ආයෝජන භාණ්ඩ ආනයනය කරන්න ඕනෑ. ඒ සඳහා විදේශ විනිමය ලැබෙන්න ඕනෑ. විදේශ විනිමය අනුපාත තීරණය වෙනවා. එහෙම තීරණය වන විදේශ විනිමය අනුපාත අතින් අල්ලා වෙනස් කරන්න බැහැ. මේවා සංකීර්ණ තාක්ෂණික කරුණු. ඒ නිසා මේ කරුණු කෙරෙහි අවධානය යොමු කරලා, මේවා පිළිබඳත් ජනතාව දැනුවත් කිරීම සඳහා ජාතික මෙහෙවරක කොටස්කරුවන් ලෙස සියලු මාධ්‍ය ආයතනවලට එකතු වෙන්න කියා මා ඉල්ලා සිටිනවා.

ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා (සංශෝධන) පනත් කෙටුම්පත මඟින් අලුත් බරක් එකතු වන්නේ නැහැ. දැනට නිරීක්ෂණ මට්ටමේ සිටින මුදල් අමාත්‍යාංශයේ නියෝජිතයා රූපවාහිනී සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කිරීම ආදිය සඳහා පමණයි, මේ සංශෝධන පනත් කෙටුම්පත ඉදිරිපත් කරන්නේ. වඩා හොඳින් මූල්‍ය කළමනාකරණය සිදු කිරීමට උදව්වක් ලෙස තමයි එය කරන්නේ. පත් කරන පුද්ගලයා කවුද කියන එක නොවෙයි, රජයේ රැකියාවේ නියුතු, මුදල් අමාත්‍යාංශයේ නිලධාරියෙකු එහි අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කිරීමයි මේ කරන්නේ. ඒ සඳහා ඔබතුමන්ලාගේ සහාය පතමින් මගේ වචන කීපය මෙයින් සමාප්ත කරනවා.

**ගරු ගාමිණී වලේබොඩ මහතා**
(மாண்புமிகு காமினி வலேபொட)
(The Hon. Gamini Waleboda)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට ගරු ඇමතිතුමාගෙන් කාරණා දෙකක් නිරාකරණය කරගැනීමට අවශ්‍යයි.

ගරු ඇමතිතුමනි, දැන් ඔබතුමා ප්‍රකාශ කළා, රජයේ සේවකයන්ට පඩි ගෙවීම සම්බන්ධයෙන් මුදල් පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා, ඒ සම්බන්ධයෙන් ගැටලුවකට මුහුණ දී තිබෙනවා කියලා. අද අපි මේ ගෙවමින් ඉන්නේ මේ මාසයේ 22 වැනි දා. මේ මාසයේ 25 වැනි දා වනකොට රජයේ සේවකයන්ට වැටුප් ගෙවීමට නියමිතයි. ගරු ඇමතිතුමනි, ඔබතුමා මේ ලබා දෙන්නේ රාජ්‍ය සේවකයන්ට මේ මාසයේ වැටුප හම්බ වෙන්නේ නැහැ කියන පණිවුඩයද කියා දැනගන්න අවශ්‍යයි. එය පළමුවන කාරණය.

ඊළඟට, ඔබතුමාගේ කරුණු පැහැදිලි කිරීමේදී කියැවුණා, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ තිබෙන එකඟතාව අනුව මුදල් අච්චු ගහන්න බැහැ කියලා. හැබැයි, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ තිබෙන එකඟතාව හෙළිදරව් කරන්න කියලා මේ ගරු සභාවේදී අප ඉල්ලා සිටියාම, තමුන්නාන්සේලා කිව්වා, "එහෙම එකඟතාවක් නැහැ. හෙළිදරව් කරන්න දෙයක් නැහැ" කියලා. දැන් ඔබතුමාගේ කථාවේදී ප්‍රකාශ කළා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ එකඟ වෙලා තිබෙන විධියට මුදල් අච්චු ගහන්න විධියක් නැහැ, ඒ නිසා රජයේ සේවකයන්ට පඩි ගෙවන්න විධියක් නැහැ කියලා. ඒ ඉදිරිපත් කළේ පරස්පර විරෝධි ප්‍රකාශයක්. කරුණාකර රාජ්‍ය සේවකයන්ට පඩි ගෙවන විධිය පිළිබඳ නිශ්චිතව සඳහන් කරන්න.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardana)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ප්‍රථම වතාවට පාර්ලිමේන්තුව නියෝජනය කරන විද්වතෙක්. අපි ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ 16 වතාවක් සාකච්ඡා කර තිබෙනවා; ණය අරගෙන තිබෙනවා. පසුගිය රජයත් ඇමෙරිකානු ඩොලර් බිලියන 1.5ක ණය ගත්තා. ඒ සාකච්ඡා පවත්වාගෙන ගිය කිසි වෙලාවක, -මමත් 1989 ඉඳන් මේ පාර්ලිමේන්තුවේ ඉන්නවා- ඒ කිසිම දවසක ඒ සාකච්ඡා පිළිබඳව පාර්ලිමේන්තුවට කියලා නැහැ. එහෙම හෙළිදරව් කිරීමේ සම්ප්‍රදායයක් නැහැ. පාර්ලිමේන්තුවේ ඒ සමහර දේවල් ගැන, හෙළිදරව් නොකරපු ගිවිසුම් ඇතුළත් කරලා මම වෙනම පොතක් ලියා තිබෙනවා. ඊට පසුව, මෑත ඉතිහාසයේ "ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ශ්‍රී ලංකාවට විලංගු" කියා සඳහන් කරමින් මම ලංකාවේ සිතියම සහිතව පොතක් ලියා තිබෙනවා. *[බාධා කිරීමක්]* ලංකාවේ ආණ්ඩුව කවදාවත් පඩි නොගෙවා ඉන්නේ නැහැ. මොකද, පඩි නොගෙවා ඉන්නේ නැත්තේ? එහෙම පඩි නොගෙවා ඉන්න බැහැ. පඩි ගෙවීම සඳහා මුදල් හොයා ගන්නේ වෙනත් ගෙවීම් අඩු කරලා. මම මහාමාර්ග විෂය භාර ඇමතිවරයා ලෙස වගකීමට බැඳෙනවා, කොන්ත්‍රාත් වැඩ කරලා අවසන් කොන්ත්‍රාත්කරුවන්ට මුදල් ගෙවන්න. ඒවා ගෙවන්නේ නැත්තේ ඇයි? ඒ මුදල් කපලා තමයි රජයේ සේවකයන්ට වැටුප් ගෙවන්නේ, ප්‍රාග්ධන වියදම් කපලා තමයි රජයේ සේවකයන්ට වැටුප් ගෙවන්නේ. එහෙම කරලා තමයි මේ මූල්‍ය කළමනාකරණය සිදු කරන්නේ. ඒකයි මේ තිබෙන අර්බුදය. මෙය තේරුම් ගන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු එම්.ඒ. සුමන්තිරන් මැතිතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[12.41 p.m.]

**ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා**
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)

Thank you, Hon. Deputy Speaker, for the opportunity to speak a few words at today's Debate.

The Hon. Minister of Ports, Shipping and Aviation was here a moment ago. I want to raise one matter with him with regard to the Palaly Airport. That is an international airport. It was opened and there were flights from Madras. Then, due to COVID, all flights were suspended. It has not resumed operations yet and even when it resumes, the cost of the airfare is prohibitive. The reason for that is, the airport taxes are so high that people will not be able to afford it. The Hon. Minister is now coming back into the House. I have spoken to the Hon. Minister about this matter. The taxes at the Mattala Airport have been waived and we have been asking that the taxes at the Palaly Airport also be waived because unlike the Mattala Airport, the Palaly Airport, when you resume operations, will have a steady traffic and that will be good for our economy. Therefore, I am requesting the Hon. Minister again to please waive the airport tax for Palaly Airport so that there will be a steady stream of traffic.

Sir, as we deal with these issues today, in the North and the East, there are other issues that people are facing, particularly with regard to the lands. Yesterday, in Kurunthur Malai, there was a demonstration with regard to new constructions that were being undertaken by the Department of Archaeology. Two of our members were arrested saying that they had disrupted the officials from functioning. The Department of Archaeology is entrusted with the responsibility of preserving archaeological monuments. We know that there are archaeological monuments. Those must be preserved, but they do not have the authority to build anew. There are court orders restraining them from building new structures and yet, when people demonstrate against an illegal activity by the Department of Archaeology, they are being arrested. So, I want to raise that issue here.

குருந்தூர்மலையிலே தொல்லியல் திணைக்களம் சட்ட விரோதமாகக் கட்டடங்கள் கட்டுவதை எதிர்த்து ஆர்ப்பாட்டத்தில் கலந்துகொண்டிருந்த எங்களுடைய கட்சி உறுப்பினர்கள் நேற்றையதினம் கைது செய்யப்பட்டிருக்கிறார்கள். தொல்லியல் திணைக்களம் இப்படியாக எங்களுடைய மக்களின் நிலங்களை மிக மோசமான முறையிலே அபகரிக்கின்ற திட்டங்கள் சம்பந்தமாகப் பல தடவை இந்தப் பாராளுமன்றத்திலும் வெளியிலும் பேசியிருக்கின்றோம். 600 ஏக்கருக்கும் மேற்பட்ட வயல் காணிகளை அபகரிக்கின்ற இந்த முயற்சி தடுக்கப்படவேண்டுமென்று அவர்கள் செய்த ஆர்ப்பாட்டத்திற்குப் பிரதிபலனாக அவர்கள் கைதுசெய்யப் படுகிறார்கள். இது உடனடியாக நிறுத்தப்படவேண்டும். ஜனாதிபதி அவர்களோடு தமிழ்த் தேசியக் கூட்டமைப்பினராகிய நாங்கள் நடாத்திய சந்திப்பிலே இதுகுறித்துச் சொன்னோம். பணிப்பாளர் நாயகத்திற்கு உடனடியாகத் தான் அறிவிப்பதாக அவர் உறுதியளித்திருந்தார். ஆனாலும் இந்தத் திணைக்களம் மிகமோசமான இனவாதப் போக்குடன் தமிழ் மக்களுக்கு எதிராகத் தொடர்ச்சியாகச் செயற்பட்டுக் கொண்டிருக்கின்றது. இது உடனடியாக நிறுத்தப்பட வேண்டும்.

இதேபோல, கிழக்கிலே திருக்கோணேஸ்வரம் ஆலயத்தை அபகரிக்க இப்போது ஒரு திட்டம் முன்வைக்கப் பட்டிருக்கின்றது. திருக்கோணேஸ்வரம் இலங்கையிலே இருக்கின்ற ஐந்து ஈஸ்வரங்களிலே ஒன்று. இது மிகப் பழைமை வாய்ந்தது. இந்த நாட்டுக்கு விஜயன் வருவதற்கு முன்னதாகவே ஐந்து ஈஸ்வரங்கள் இலங்கையிலே இருந்ததாக சேர் போல் பீரிஸ் எழுதியிருக்கின்றார்.

[ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා]

Sir Paul Pieris, renowned historian, has written that long before the advent of Prince Vijaya to this Island, there existed five *Iswarams* and one of those is Thirukoneswaram. Tirugnana Sambandar had sung about this Temple in the Seventh Century BC. So, it is ancient. This was destroyed by the Portuguese in 1624, but it was rebuilt in 1959. This is now designated as an archaeological site, but using the fact that it is an archaeological site - it is indeed an archaeological site - there are efforts to bring in people from other districts, particularly from the Ratnapura District. There was one politician who took people from the Ratnapura District, settled them - traders in that area - around the archaeological site and now, there are 58 shops that have been set up and efforts are being made to grant lands from that archaeological site to those 58 shop owners, who are actually aliens in that area. They have been brought and settled there to change the demography. This must immediately be stopped.

So, these are the issues that our people are facing today, particularly the issue of land being grabbed by the Department of Archaeology, the Mahaweli Authority, the Department of Forest and the Department of Wildlife Conservation. Also, various other special laws are used to take away the lands on which Tamil people have lived for centuries. Now, that is something which must immediately be stopped.

Your Government is now facing a challenge at the UN Human Rights Council. The Hon. Minister of Justice, Prison Affairs and Constitutional Reforms is here and that is good because I want to refer to some matters that concern him as well. In September, 2015, the Sri Lankan Government co-sponsored a Resolution called HRC 30/1. Co-sponsoring means, you agree and sign on to that Resolution, which then means that it is your Resolution also. In that Resolution - Hon. Minister, you were the Minister of Justice even at that time - there was a clause to which Sri Lanka agreed: Operative Paragraph 6 of the Resolution, in which it was agreed that Commonwealth and other foreign judges, defence lawyers, authorized prosecutors and investigators would participate in a process. So, it states "Commonwealth and other foreign judges". Originally, that draft, as you know, Hon. Minister, stated “foreign judges”. It was at the request of the Sri Lankan Government that the word “Commonwealth” was also added to say “Commonwealth and other foreign judges.” That is Sri Lanka’s own Resolution. But, now, your Minister of Foreign Affairs goes to Geneva - you were seated behind him - and says that participations like this, external mechanisms, are unconstitutional. How can that be unconstitutional, Hon. (Dr.) Wijeyadasa Rajapakshe, when, in December, 2012, you yourself, as an MP, brought in a Private Members’ Bill called "Removal of Judges of the Superior Courts (Special Provisions) Act"? In that, you yourself had suggested that that inquiry be conducted, against the Superior Court Judges, by judges who have held office in the highest court of any Commonwealth country other than Sri Lanka. So, even according to you, according to your own belief, consistently between 2012 and 2015, foreign judges participating in processes or inquiries in Sri Lanka was not unconstitutional. You would not have presented a Bill that was unconstitutional, surely! You are a constitutional lawyer. So, it was your own Private Members’ Bill. Then, as the official position of the Government of Sri Lanka, while you were the Minister of Justice and the incumbent President was the Prime Minister, he wanted the word “Commonwealth” added in that Resolution and so it was added and it was resolved.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා**
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
I will conclude, Sir.

You cannot resile from whatever you had agreed to. I can understand it when the Government changed and Gotabaya Rajapaksa became President, where statements were made saying, “We are withdrawing from the Resolution”. But, can you withdraw from that Resolution? How can you withdraw from the Resolution that you yourself agreed to? So, the Resolution now before the Council will be put to vote because you are opposing it, you are opposing the very words that you had agreed to previously, and that is not good for the country.

Thank you. - [Interruption.]

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ අමාත්‍යතුමා.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා (අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ - நீதி, சிறைச்சாலைகள் அலுவல்கள் மற்றும் அரசியலமைப்பு மறுசீரமைப்பு அமைச்சர்)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe - Minister of Justice, Prison Affairs and Constitutional Reforms)
බොහොම ස්තුතියි. Sir, I will not take more than two minutes.

The Hon. Sumanthiran mentioned my name, about the Resolution adopted in Geneva in 2015 and one of the Private Members’ Bills I had submitted with regard to the removal of judges. I am thankful to the Hon. Member for raising it. I presented that Bill taking into consideration the Latimer House concept, according to which the independence of the Judiciary is very vital for the sustenance of democracy and the rule of law, and we all are concerned about the independence of the Judiciary. Therefore, at that time, I made an attempt and I think my learned Friend would appreciate the effort I made on that issue.

Similarly, we concede that there was a Resolution which was co-sponsored by Sri Lanka. But, in the meantime, the Hon. Member knows, there were a lot of turbulences in the political landscape of our country; there was change of regimes and from time to time, some different decisions had been taken. But, I think my good Friend, the Hon. Sumanthiran, believes me, that as you have some interest to resolve this issue, similarly, I too have an interest to resolve it. You are genuinely saying that; I am also genuinely saying that. At the moment, we have taken a lot of meaningful steps to resolve the issue. We concede that there is a lot more to do. In the next few weeks' time, I hope to have a cordial discussion with the Hon. Members from the North and the East on this issue, decide the way forward and reconcile for a peaceful nation. I think my good Friend will help us.

Thank you very much.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු නිමල් සිරිපාල ද සිල්වා අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 20ක කාලයක් තිබෙනවා.

[අ.භා. 12.54]

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමා)**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா - துறைமுகங்கள், கப்பற்றுறை மற்றும் விமான சேவைகள் அமைச்சர்)
(The Hon. Nimal Siripala de Silva - Minister of Ports, Shipping and Aviation)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දින විවාදය සඳහා ඉදිරිපත් කර තිබෙන එක් විෂයයක් වන සිවිල් ගුවන් සේවා පනත යටතේ ගෙන එන නියෝග පිළිබඳව පැහැදිලි කිරීමට මම බලාපොරොත්තු වනවා. ඇත්ත වශයෙන්ම සිවිල් ගුවන් සේවා කටයුතුවලදී ජාත්‍යන්තර වශයෙන් අපි නියාමනය කරන්නේ ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානයයි. ඒ කියන්නේ, ICAO එකයි. මේ සංවිධානය මඟින් මුළු ලෝකයේම රටවල ගුවන් සේවා පිළිබඳව -රටින් පිටතට යන ගුවන් ගමන් පිළිබඳව වාගේම රට ඇතුළත සිදුවන ගුවන් ගමන්- තාක්ෂණික වශයෙන් ඉතා ගැඹුරින් අධ්‍යයනය කරලා, යම් යම් නිර්ණායක ඉදිරිපත් කරනවා. මේ නිර්ණායක ක්‍රියාත්මක කිරීමට "චිකාගෝ සම්මුතිය" ලෙස හඳුන්වන ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සම්මුතියට අපි අත්සන් කරලා තිබෙනවා. එම සම්මුතියට අපි අත්සන් කළේ නැත්නම් වෙනත් රටවල ගුවන් යානාවලට අපේ රටට ඒමට පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ. ඇත්ත වශයෙන්ම මේ ICAO එක මඟින් කරනු ලබන්නේ සිවිල් ගුවන් සේවාවන්හි නිරුපද්‍රිතතාව සම්බන්ධයෙන් වන කාර්යයන්. ඒ කියන්නේ, කොච්චර දුරට සුරක්ෂිත ලෙස ගුවන් මගීන්ගේ ගමනාගමනය නියාමනය කළ හැකිද කියන කාරණයයි. එහිදී ගුවන් යානාවල පැවැත්ම, ගුවන් යානා නියමුවන්ට සහ අනිකුත් කාර්ය මණ්ඩලවලට තිබිය යුතු යම් යම් අධ්‍යාපන මට්ටම් වාගේම තාක්ෂණික වශයෙන් ඔවුන්ගේ දැනුම් මට්ටම් අනිවාර්යයෙන්ම තිබෙන්න ඕනෑ. ඒ සඳහා බලපත්‍ර නිකුත් කිරීමේ කාර්ය පටිපාටියක්, licensing procedure එකක් තිබෙනවා.

ICAO එක ලෝකයේ තිබෙන නව ප්‍රවණතා අනුව වාගේම ලබන ලද නව අත්දැකීම් අනුව විටින් විට මේ නීති රීති හා නියෝග මාලා වෙනස් කරනවා. ඒ අනුව අපේ නියෝග හා නීති රීති මාලා ද වෙනස් විය යුතුයි. විශේෂයෙන්ම ගුවන් නියමුවන්, ගුවන් ගමන් පාලකවරු, ගුවන් යානා නඩත්තු ඉංජිනේරුවන් ආදී අයගේ කාර්යයන් නියමිත ප්‍රමිතියට ඉටු කර ගැනීමට හැකි වන පරිදි නිරුපද්‍රිතතාව සම්බන්ධයෙන් එලෙස සකස් කරන ලද ප්‍රමිති ක්‍රියාවලි හා ක්‍රියා පටිපාටීන්ගෙන් යුතුව ඒකාකාරී පද්ධතියක් ස්ථාපනය කිරීම සඳහා වූ නීති රීති මාලාව තමයි අපි මේ Regulations යටතේ ඉදිරිපත් කරන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජාත්‍යන්තර ප්‍රමිතීන්ට සහ පරිචයන්ට අනුගත වීම පිළිබඳවත් මම කියන්න කැමැතියි. 2018 ජූලි මස 03 දිනැති අංක 2078/22 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ අංකයක යම් සුළු වැරැදීමක් තිබෙනවා. එයත් නිවැරැදි කිරීම මේ සංශෝධනය මඟින් ඉටු කරනවා.

මීට පෙර මම මේ විෂය භාරව කටයුතු කරද්දි මගේ නියෝජ්‍ය අමාත්‍යවරයා වශයෙන් හිටපු අශෝක් අබේසිංහ මැතිතුමා මේ ගුවන් සේවා ක්ෂේත්‍රය පිළිබඳව ප්‍රශ්න කීපයක් ඇහුවා. ඒ ප්‍රශ්නවලට පිළිතුරු දීම මගේ යුතුකමක් වනවා. විශේෂයෙන්ම එතුමා කිව්වා, ශ්‍රීලන්කන් ගුවන් සේවයට අයත් ශ්‍රීලන්කන් කේටරින් සමාගමට සේවකයන් බඳවා ගන්නවා කියලා. මම හිතන විධියට ඒ පිළිබඳව ප්‍රවෘත්තියක් එක්තරා නාළිකාවකත් පළ වුණා. නමුත්, ඒ ප්‍රවෘත්තිය සත්‍යතාවෙන් තොරයි. අපි කළේ සේවකයන් බඳවා ගැනීමක් නොවෙයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශාල මගී නෞකාවල catering අංශයේ අරක්කැමියන්, වේටර්වරු වැනි විදේශ විනිමය හොයන්න පුළුවන් රැකියා විශාල ප්‍රමාණයක් තිබෙන බව මා විසින් පවත්වන ලද ප්‍රගති සමාලෝචන රැස්වීමකදී එම නිලධාරින් මට කියා සිටියා. නමුත්, ඒ සඳහා අවශ්‍ය පුහුණුව ලත් තරුණ තරුණියන් ලංකාවේ නැහැ. ඒ අයට අවශ්‍යයි, ඉහළ මට්ටමේ පුහුණුවක්. මේ නිසා මම SriLankan Catering එකට කිව්වා, ආරම්භයක් වශයෙන් මෙවැනි තරුණ තරුණියන් පනස්දෙනෙකු පුහුණු කරලා දෙන්න කියලා. තමන් මේකට බොහොම කැමැති බවත්, මේ නිසා ඔවුන්ගේ වියදම අඩු වන බවත්, අලුතෙන් සේවකයෝ බඳවා ගන්න ඕනෑ නැති බවත්, එම නිසා පනස්දෙනෙකු අරගෙන ඔවුන්ගේ kitchen එකට දාලා අන්තර්ජාතික මට්ටමින් අවුරුද්දක පුහුණු කාල සීමාවක් ලබා දෙන බවත්, රැකියා දෙන්නේ නැති බවත් ඒ අය කිව්වා. අපි කිව්වා, රැකියා අවශ්‍ය නැහැ කියලා. අපි කළේ පුහුණු කිරීමක්. අපි තරුණ තරුණියන් පුහුණු කළේ මේ රටට අවශ්‍ය විදේශ විනිමය ගෙන ඒම සඳහා මගී නෞකාවන්හි සේවය සඳහා ඔවුන් යවන්නයි. මොකක්ද, ඒකේ තිබෙන වැරැද්ද? ඒ මිසක්, අපි කිසිසේත්ම බඳවා ගැනීම් කරන්නේ නැහැ. මොකද, බඳවා ගැනීම් කිරීම මේ වෙලාවේ කිසිසේත් සුදුසු නැහැ. මම හිතන විධියට එතුමාට ලැබිලා තිබෙන්නේ වැරැදි තොරතුරක්. අපි එහෙම බඳවා ගැනීමක් කරන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ශ්‍රීලන්කන් ගුවන් සේවය ප්‍රතිව්‍යුහගත කිරීම පිළිබඳව මම කැබිනට් සන්දේශයක් ඉදිරිපත් කර තිබෙනවා. හුඟක් අය දන්නේ නැහැ, ශ්‍රීලන්කන් ගුවන් සේවය සතුව තමයි ශ්‍රීලන්කන් කේටරින් සමාගම තිබෙන්නේ කියන එක. ශ්‍රීලන්කන් ගුවන් සේවයට Airport and Aviation Services (Sri Lanka) (Private) Limited එකෙන් බලය දීලා තිබෙනවා, ground handling කරන්න. මේ ආයතන දෙකෙන් අපි ලාභයක් ලබනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නමුත් සමස්තයක් වශයෙන් ගත්තාම ශ්‍රීලන්කන් ගුවන් සේවය දැනට ලබා තිබෙන අලාභය ඇමෙරිකානු ඩොලර් බිලියන 1.2ක්. ශ්‍රීලන්කන් ගුවන් සේවය මහජන බැංකුවට, ලංකා බැංකුවට දැවැන්ත මුදල් ප්‍රමාණයක් ණයයි. ඒ වාගේම Ceylon Petroleum Corporation - CPC - එකට ඇමෙරිකානු ඩොලර් මිලියන 384ක් ණයයි. ඉතින් ශ්‍රීලන්කන් ගුවන් සේවය පවත්වාගෙන යෑම සඳහා හැම අවුරුද්දකම පාහේ රජයෙන් ඇමෙරිකානු ඩොලර් මිලියන 150ක්

[ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා]

විතර දෙනවා. නමුත්, දැන් අපට එහෙම දෙන්න පුළුවන්කමක් නැහැ. මේ විධියට ගියොත් තව අවුරුදු 10ක් යනකොට තවත් ඩොලර් බිලියන 1.2ක් හෝ 1.5ක් ගෙවන්න වනවා. ඒ නිසා එතැන යම්කිසි අවශ්‍යතාවක් තිබෙනවා. මේ තත්ත්වයට පත් වෙලා තිබෙන්නේ ශ්‍රීලන්කන් ගුවන් සේවය පමණක් නොවෙයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ඉන්දියාවේ අපට වඩා ශක්තිමත් ආර්ථිකයක් තිබෙනවා. ඉන්දියාවෙන් අපටත් ඇමෙරිකානු ඩොලර් මිලියන 4ක් දුන්නා. ඒ රටේත් Air India එක අයිති වෙලා තිබුණේ රජයට. නමුත්, එම ගුවන් සේවයත් මේ විධියටම ප්‍රතිව්‍යුහගත කරලා ටාටා සමාගමට ලබා දුන්නා. මොකද, ඔවුන්ටත් වෙන විකල්පයක් නැහැ. ඒ විතරක් නොවෙයි, මලයාසියාවත් මේක කළා, ස්විට්සර්ලන්තයත් කළා. ලෝකයේ රටවල් ගණනාවක්ම මේ කාර්යය කළා. මොකද, රාජ්‍ය අංශයේ තබාගෙන මෙවැනි ව්‍යාපාර කිරීමේ අපහසුතාව නිසා. ඒ නිසා විශේෂයෙන්ම මම මේ කාරණය කියන්න ඕනෑ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ශ්‍රීලන්කන් ගුවන් සේවයේ 6,000ක් පමණ වූ සේවක පිරිසක් ඉන්නවා. "SriLankan Airlines" කියලා නම ගහගෙන ගියාට මේ එකදු ගුවන් යානාවක්වත් අපට දැන් අයිති නැහැ. ඒවා ඔක්කෝම කුලියට ගත්ත ටැක්සි වාගේයි. ගුවන් යානා 23ම අරගෙන තිබෙන්නේ lease පදනම මත. ඒවාට අපි lease rental එක ගෙවන්න ඕනෑ. දැන් ඒකටත් ඇමෙරිකානු ඩොලර් මිලියන 80ක් අපි ණයයි. ඒ මුදලත් ගෙවලා නැහැ. තව ටික කාලයක් ගියාම ආයෝජකයකු හොයාගෙන ශ්‍රීලන්කන් ගුවන් සේවය ප්‍රතිව්‍යුහගත කරලා මුදල් හොයාගන්න කටයුතු කළේ නැත්නම් වෙන්නේ මේ 6,000ටම රැකී රක්ෂා නැති වෙන එකයි.

මේ සමාගම ප්‍රතිව්‍යුහගත කරන්න එපා කියලා අද අපේ කකුලෙන් අදින අයට අපි යමක් කියන්න ඕනෑ. සමස්ත ලංකාවේම සිටින අය -වැඩි ප්‍රමාණයක් වෘත්තීය සමිති- අද මේ තත්ත්වය තේරුම් ගෙන මේ ප්‍රතිව්‍යුහගත කිරීම කාලීන අවශ්‍යතාවක් බව පිළිගෙන තිබෙනවා. අපි ඒ දේ කරන්නේ කැමැත්තෙන් නොවෙයි. අපට මේ හැරෙන්න වෙනත් විකල්පයක් නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේ ක්‍රියාවලිය කළොත් අපට සේවකයන් 6,000කගේ රැකියා බේරා ගන්න පුළුවන් වෙයි. ඒ වාගේම "ශ්‍රීලන්කන්" නාමය සහිතව ගුවන් සේවාවක් පවත්වාගෙන යන්නත් පුළුවන් වෙයි. අපට මේ ගුවන් සමාගමේ කොටස් සියයට සියයක්ම විකුණන්න පුළුවන්කමක් නැහැ. මොකද, ඒකට නීතිමය බාධාවක් තිබෙනවා. අපේ ගුවන් යානා පිට රටවල ගුවන් තොටුපොළවල ගොඩබෑම සඳහා අවසර ලබා දීලා තිබෙන්නේ ඒක ශ්‍රී ලංකාවට ලබා දෙන slot එකක්, එහෙම නැත්නම් අයිතියක් හැටියටයි. ඒ නිසා ශ්‍රී ලංකාවට ඒ සමාගමේ වැඩි කොටස් සංඛ්‍යාවක් අයිතිව තිබුණේ නැත්නම්, ඒ අවස්ථාව නැතිව යනවා. ඒක අපි හැමෝම දන්නා කාරණයක්. ඒ නිසා තමයි අපි සියයට 49ක කොටස් විකිණීම සඳහා පෞද්ගලික අංශයේ හොඳ ගුවන් යානා සමාගම්වලට ආරාධනා කර තිබෙන්නේ. මෙහිදී සියයට 51ක කොටස් අපි තියාගන්න ඕනෑ. හැබැයි, අපි සියයට 49ක කොටස් දුන්නා කියලා කවුරුවත් ඒක ගන්න නිකම්ම එන්නේ නැහැ. අපි පරිපාලනය - mangement - ඔවුන්ට භාර දෙන්න ඕනෑ. ඒ සඳහා දේශපාලන ඇඟිලි ගැසීම්වලින් තොරව, වෙනත් බලපෑම්වලින් තොරව ආයෝජන ගෙනැල්ලා මේ ගුවන් සේවා ආයතනය ශක්තිමත් කිරීමට අපි කටයුතු කරන්න ඕනෑ. මෙහිදී එවැනි කොන්දේසි මාලාවක් අපි පනවා තිබෙනවා.

විශේෂයෙන්ම මේ ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියේදී අපි බලාපොරොත්තු වෙන්නේ සේවක අයිතිය සුරක්ෂිත කිරීමයි. අපේ පළමු පරමාර්ථය එයයි. නැත්නම් තව ටික කාලයක් යනකොට මේ ගුවන් සේවය කඩා වැටුණාම, මේ සේවකයන්ට යන එන මං නැති වෙනවා. එතකොට අපේ ගුවන් යානා ටික බිමට බස්සන්න වෙනවා. Lease rental එක ගෙව්වෙ නැත්නම්, අපි ළඟ තිබෙන ගුවන් යානා ටික ඒ අය ආපහු ගනීවි. වර්තමානයේ පවතින ආර්ථික අර්බුදය අතරතුර මෙම ගුවන් සේවය පවත්වාගෙන යෑමට රජයෙන් කොහොමද හැම අවුරුද්දකම ඩොලර් මිලියන 150ක්, 200ක් දෙන්නේ? ඒ නිසා බොර දියේ මාළු බාන්නේ නැතිව, අපි කවුරුත් මේ තත්ත්වය තේරුම් ගන්න ඕනෑ. ශක්තිමත් ආර්ථික තිබෙන ඉන්දියාව, ඉන්දුනීසියාව හා මලයාසියාව වැනි අපේ කලාපයේ රටවල රාජ්‍ය අංශයටත් තම ගුවන් සේවා පවත්වා ගෙන යෑම අසීරු වුණා නම්, අපි ගැන මොනවාද කියන්න තිබෙන්නේ? විශේෂයෙන්ම ඒ කාරණයත් පැහැදිලි කිරීමට අවස්ථාවක් ලැබීම ගැන මම ඉතා සතුටු වෙනවා.

සුමන්තිරන් මන්ත්‍රීතුමා පලාලි ගුවන් තොටුපොළ ගැන කථා කළා. පලාලි ගුවන් තොටුපොළ සඳහා අපි විශාල මුදල් ප්‍රමාණයක් වියදම් කළා. මාත් ගිහිල්ලා එදා පලාලි ගුවන් තොටුපොළ විවෘත කළා. පලාලි ගුවන් තොටුපොළේ සේවය සඳහා යාපනය දිස්ත්‍රික්කයේ පදිංචි තරුණයන්ම අපි තෝරා ගත්තා. ඒකට එක් කෙනෙක්වත් මෙහෙන් යැව්වේ නැහැ. ගුවන් සමාගම් කීපයක් කිව්වා; පොරොන්දු වුණා, "ගුවන් තොටුපොළ ඉක්මනට විවෘත කරන්න, අපි planes අරගෙන එනවා" කියලා. නමුත්, මෙතෙක් කවුරුත් planes ගෙනාවේ නැහැ. හෙට-අනිද්දාට planes ටිකක් එනවා කියලා කියනවා. ඒක නිසා මම සුමන්තිරන් මන්ත්‍රීතුමාගෙන් ඉල්ලා සිටිනවා, ඉස්සර වෙලා planes ගෙන්වන්න කියලා. මොකද, ගුවන් යානා ගෙන්වන්න අවශ්‍ය පසුබිම අපි දැන් හදලා තිබෙනවා.

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
Hon. Member, you can speak after me.

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)
Sir, please give me one minute.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
කියන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)
கௌரவ அமைச்சர் அவர்களே, பலாலி விமான நிலையத்திற்கு விமானங்களைக் கொண்டுவருவதற்கு இந்தியா முயற்சிகளை மேற்கொண்டிருக்கிறது. இந்தியாவினுடைய airlines நிறுவனம் இவ்விமான நிலையத்துக்கு விமானங்களைக் கொண்டுவருவதற்கு எப்பொழுதும் தயாராக இருக்கின்றது. ஆகையால், யாரும் இங்கு விமானங்களைக் கொண்டு வரவில்லை என்று தயவுசெய்து சொல்லவேண்டாம்.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
හොඳයි, ගරු මන්ත්‍රීතුමා. හෙට ගෙනෙන්න කියන්න කෝ.

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)
நான் சொல்வதைக் கொஞ்சம் கேளுங்கள்! *[இடையீடு]* தயவுசெய்து, ஒரு நிமிடம் தாருங்கள்! நீங்கள் எவ்வாறு இரத்மலானை மற்றும் மத்தள விமான நிலையங்களுக்கு வருகின்ற பயணிகளுக்கான taxஐ இல்லாமற் செய்திருக் கிறீர்களோ, அதேமாதிரி பலாலி விமான நிலையத்திற்கு வருகின்ற பயணிகளிடமிருந்து அறவிடுகின்ற taxஐயும் இல்லாமற் செய்ய வேண்டும். அவ்வாறு செய்தால்தானே விமானங்களின் வருகையானது ஓரளவுக்கு நடைமுறைச் சாத்தியமாகும். அதை நீங்கள் 2 வருடங்களுக்குச் செய்தால், குறித்த நிறுவனத்தினுடைய விமானங்களின் வருகையானது உடனடியாகச் சாத்தியமாகும். அதை நீங்கள் இப்பொழுதே செய்யுங்கள்! இந்தியாவினுடைய airlines நிறுவனம் விமானங்களை அனுப்புவதற்குத் தயாராக இருக்கின்றன. ஆகவே, தயவுசெய்து பிழையான கருத்துக்களை விதைக்க வேண்டாம் என்று நான் இந்த நேரத்தில் பகிரங்கமாக உங்களைக் கேட்டுக்கொள்கிறேன்.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, Indian airlinesවලට අපි මුලින්ම කථා කළා. ඒ අය කිව්වා, ඉක්මනට ගුවන් තොටුපොළ හදන්න අපි ගුවන් යානා ගේනවා කියලා. ගේනවා කියපු නිසා ගුවන් යානා එනකල් අපි බලාගෙන හිටියා; පණිවුඩ කිහිපයක් යැව්වා. නමුත්, ඒ අය ගුවන් යානා ගෙනාවේ නැහැ. එහෙම ප්‍රශ්නයක් තිබෙනවා නම් අපිත් එක්ක කථා කරන්න ඕනෑ. එහෙම ඉල්ලීමක් ඉන්දියන් ගුවන් සේවය අපෙන් කරලාත් නැහැ. අපිත් එක්ක කථා කරලා ඉස්සෙල්ලා ගුවන් යානා කිහිපයක් ගෙනැල්ලා පෙන්වන්න, සත්‍ය වශයෙන්ම ඒ ගොල්ලන් මේකට committed කියලා. ඊට පස්සේ අපිත් එක්ක සාකච්ඡා කරන්න. අපට ලබා දෙන්න පුළුවන් යම් concession එකක් තිබෙනවා නම්, ඒක ලබා දෙන්න අපි සූදානම්. අපි විශාල මුදලක් ඒ ගුවන් තොටුපොළ වෙනුවෙන් වියදම් කර තිබෙනවා; staff අරගෙන තිබෙනවා. දැන් මාස දෙකක් තිස්සේ ඒ අයට පඩි ගෙවා ගෙන ඉන්නවා. ඒ නිසා මන්ත්‍රීතුමන්ලාගෙන් මම ඉල්ලා සිටිනවා, ඉන්දියන් ගුවන් සේවාවට ප්‍රශ්නයක් තිබෙනවා නම්, අපිත් එක්ක කථා කරන්න කියන්න කියලා. අඩු ගානේ එක plane එකක් හරි ගෙනැල්ලා පෙන්වන්න කෝ. අපි අපේ පැත්තෙන් කරන්න පුළුවන් ඔක්කෝම දේවල් කරලා තිබෙන්නේ. නමුත්, ඒ පැත්තෙන් අවශ්‍ය දේ ඉටු වෙලා නැහැ. ඒකට හේතුව මොකක්ද කියලා අපි දන්නේ නැහැ. ඒ බවත් මම ප්‍රකාශ කරන්න ඕනෑ.

විශේෂයෙන්ම රත්මලාන ගුවන් තොටුපොළේ කර තිබෙන නාස්තියක් පිළිබඳව කථා කළා. ඒක මම පිළිගන්නවා. හැබැයි, ඒක මගේ කාලයේ වෙච්ච දෙයක් නොවෙයි. මම ඇමති ධුරය භාර ගැනීමට ප්‍රථම තමයි ඒ කටයුත්ත වෙලා තිබෙන්නේ. මම හිතන විධියට නිවැරදි තක්සේරුවක් නැතිකමින් එතැනට විශාල මුදලක් වියදම් කරලා තිබෙනවා, Maldivian planes මෙහාට එනවා කියලා. නමුත්, ඒ ගුවන්යානා ආවේ නැහැ. ඒකට ඒ අය නොයෙකුත් හේතු සාධක දෙනවා. ඒ නිසා විශේෂයෙන්ම මම රත්මලාන ගුවන් තොටුපොළ පිළිබඳව විශේෂ පරීක්ෂණයක් කළා. පරීක්ෂණයක් කරලා මේ තත්ත්වයෙන් ගොඩ එන්න පුළුවන් ක්‍රමයක් දැනට සොයාගෙන යනවා. ඒකට කරලා තිබෙන වියදමට සරිලන return එකක් අපට නැහැ. මත්තල ගුවන් තොටුපොළත් එහෙමයි. මත්තල ගුවන් තොටුපොළෙන් මාසයකට රුපියල් මිලියන 100ක් පාඩුයි. රුපියල් මිලියන 100ක් පාඩුයි, මත්තල ගුවන් තොටුපොළින්.

අපට කොවිඩ් ප්‍රශ්නය බලපෑ එක ඇත්ත. දැන් ගුවන් සංසරණයත් අඩුයි. ඒත් එක්කම, අපේ රටේ තිබෙන විවිධ විරෝධතාවලට පින් සිද්ධ වෙන්න සංචාරකයෝ එන එක නතර වුණා. අපේ රටේ පවතින තත්ත්වය අනුව, සංචාරකයන්ගේ පැමිණීම අඩු නිසා ගුවන් ගමන් අඩු වුණා. නමුත්, අපි බලමු, දැන් රට ස්ථාවර කරගෙන යනකොට මේ තත්ත්වය වැඩි දියුණු කරගැනීමට පුළුවන් වෙයි. මත්තල ගුවන් තොටුපොළ මොන ආකාරයෙන්ද දියුණු කරගන්න පුළුවන් වන්නේ කියන කාරණය පිළිබඳවත් අපි බලමු. මත්තල ගුවන් තොටුපොළට අවශ්‍ය පසුබිම සකස් කරලා අපට ලබා දෙන්න යම් ආයෝජකයෙක් එනවා නම් අපි කැමැතියි. ඒ පිළිබඳව අපි ඉතාම ගැඹුරින් කල්පනා කරනවා. මම විශේෂයෙන්ම කියන්න කැමැතියි, කටුනායක ගුවන් තොටුපොළේ අපි කිසිම concession එකක් දෙන්නේ නැහැ; ගාස්තුවල කිසිම අඩු කිරීමක් කරන්නේ නැහැ. ඒ ගාස්තු ගෙවන්න ඕනෑ, ඩොලර්වලින්. සමහර අය කියනවා, ඩොලර්වලින් ගෙවන්න බැහැ, රුපියල්වලින් ගෙවන්න දෙන්න කියලා. අපට එක එක airportsවලට එක එක නීති දමන්නත් අමාරුයි. නමුත්, පලාලි ගුවන් තොටුපොළට ගුවන් යානා ගෙන එනවා නම්, යානා ගෙනැල්ලා අපට පෙන්නුවොත්, අපි ලෑස්තියි ඒ සඳහා යම් සහනයක් සලසා දෙන්න.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු ගයන්ත කරුණාතිලක මැතිතුමා. ඔබතුමාට විනාඩි 19ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.13]

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatilleka)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා (සංශෝධන) පනත් කෙටුම්පත ගැන වචන ස්වල්පයක් ප්‍රකාශ කරන්න මම බලාපොරොත්තු වෙනවා.

එක පැත්තකින්, මම ඉතාම කනගාටු වෙනවා, මිනිසුන්ට මේ තරම් බරක් පටවලා තිබෙන වෙලාවක විදුලි බිල, ජල බිල වැඩි කිරීම ගැන. අද ජනතාවට තුන්වේල ගැටගහ ගන්න විධියක් නැහැ. ඒ වාගේම දරුවෝ ක්ලාන්ත වෙලා ඇදගෙන වැටෙනවා; පන්සල්වල විදුලි බිල ගෙවා ගන්න බැරි ප්‍රශ්න තිබෙනවා. මේ ඔක්කෝම තිබෙද්දී, මහ බරපතළ කැබිනට් මණ්ඩලයකුයි, රාජ්‍ය ඇමතිවරුයි පත් කරලා තිබෙනවා.

අද ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා (සංශෝධන) පනත් කෙටුම්පත සහ සිවිල් ගුවන් සේවා පනත යටතේ වූ නියෝග ගැන අපි කථා කරනවා. ජනමාධ්‍ය කියන විෂයයට කැබිනට් ඇමති කෙනෙක් ඉන්නවා. ඒ සඳහා තව රාජ්‍ය ඇමතිවරයෙකුත් ඊයේ පෙරේදා පත් කළා. හැබැයි, මේ විවාදය පවත්වන මේ සුළු වෙලාව තුළවත් කථාව අහන්න ඒ කිසිවෙක් සභාව තුළ නැහැ. මම ඒ ගැන අතිශයින්ම කනගාටු වෙනවා. මේ ක්‍රමය කවදාවත් අනුමත කරපු කෙනෙක් නොවෙයි, වර්තමාන ජනාධිපතිතුමා. මට මතකයි, අපි ඇමතිවරු හැටියට හිටපු කාලයේ එතුමා අපට උපදෙස් දුන්නේ

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

සභාවේ රැඳිලා ඉන්න ඕනෑ කියලායි. අපි ඒ කාලයේ ඇමතිකම් කරනකොට අපේ අමාත්‍යාංශයේ විෂයය ගැන කථා කරනවා නම්, මිනිත්තුවකටවත් එළියට යන්නේ නැහැ. ඒ නිසා ඒ ගැන මගේ කනගාටුව මම ප්‍රකාශ කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ශ්‍රී ලංකාවේ ටෙලිවිෂන් ක්ෂේත්‍රය ගැන කථා කරනකොට මම විශේෂයෙන් මේ වෙලාවේ සිහිපත් කරනවා, ශ්‍රී ලංකා ටෙලිවිෂන් ක්ෂේත්‍රයේ පුරෝගාමියා වන TNL නාළිකාවේ වර්තමාන සභාපති ශාන් වික්‍රමසිංහ මැතිතුමාව. එතුමාට ගෞරවයක් හැටියට මා එතුමාව මේ මොහොතේ සිහිපත් කරනවා. එතුමාට පුළුවන් වුණා, 1978දී ITN නාළිකාව ආරම්භ කරන්න. ඒක ලංකාවේ පළමුවැනි නාළිකාව. 1979දී එවකට ජේ.ආර්. ජයවර්ධන රජය ITN එක රජයට පවරා ගත්තා. ඉන් පසු 1982 වසරේදී ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා පනත් කෙටුම්පත සම්මත කරමින් ජපන් රජයේ ත්‍යාගයක් ලෙස රූපවාහිනී සංස්ථාව ස්ථාපිත කළා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද අපි මේ කථා කරන ජාතික රූපවාහිනිය ආරම්භ කරලා අද වෙනකොට අවුරුදු 40ක් වෙනවා; දශක හතරක් පිරෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වසර 40ක් කියන්නේ සෑහෙන සැලකිය යුතු කාලයක්. ජාතික රූපවාහිනී සංස්ථාව ආරම්භ කළ 1982 සිට 2022 දක්වා වූ මේ කාලය අතර ලෝකයේ විශාල පරිවර්තන සිද්ධ වෙලා තිබෙනවා. අපේ රට තුළත් මේ කාල සීමාව තුළ විශාල විපර්යාස සිදුවෙලා තිබෙනවා. 1982 අංක 6 දරන ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා පනත අද වන විට කොතරම් දුරට වලංගුද කියලා අපට ප්‍රශ්නයකුත් මතු වෙනවා. ඒක අදට කොච්චර ගැළපෙනවාද? එදා රූපවාහිනී සංස්ථාව ස්ථාපනය කරන විට අපේ රටේ ඊට සමගාමීව තිබුණේ ITN නාළිකාව විතරයි. ඒකත් ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තවත් රාජ්‍ය මාධ්‍ය නාළිකාවක් ලෙස තමයි ඒ වෙනකොටත් පැවතුණේ. අපට මතකයි, 1990 දශකයේ මුලදී පෞද්ගලික අංශයටත් විකාශන මාධ්‍ය කර්මාන්තය ව්‍යාප්ත කළ බව. ඒ වෙලාවේ රූපවාහිනී සංස්ථා පනතට ඉතාම සුළු සංශෝධන කිහිපයක් එකතු කරලයි ඒ දේ කළේ. ගුවන් විදුලි බලපත්‍ර ලබා දුන්නෙත් එහෙමයි. නමුත් ගරු නියෝජ්‍ය කථානායකතුමනි එදා එය සිදුවිය යුතුව තිබුණේ එහෙම නොවෙයි. හරි නම්, ඒ සඳහා වෙනම නීති ප්‍රතිපාදන සකස් කරලා, නියාමන ක්‍රමවේදයක් සකස් කරලා තමයි පෞද්ගලික අංශයට සංඛ්‍යාත බෙදා දීමට තිබුණේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අදටත් මේ වැරැද්ද තවම නිවැරදි වෙලා නැහැ. යහ පාලන ආණ්ඩුවේ මුල් කාලයේ මම ජනමාධ්‍ය ඇමති හැටියට කටයුතු කළා. මේ සඳහා සුදුසු නීතිමය කටයුතු සකස් කරන්න අපි කමිටු කිහිපයක් පත් කරලා, ඒ කටයුතු කිරීම ආරම්භ කළත් ආණ්ඩු වෙනස්වීමත් එක්ක එහි අවසානයක් දකින්න අපට බැරි වුණා. නමුත් අපේ යහ පාලන ආණ්ඩුව නවත්වපු තැනින් ඒ කටයුතු යළි ආරම්භ කර තිබීම ගැන අපි සන්තෝෂ වෙනවා. ඒ ගැන හිටපු අමාත්‍ය ඩලස් අලහප්පෙරුම මැතිතුමාටත්, වර්තමාන ජනමාධ්‍ය ඇමති බන්දුල ගුණවර්ධන මැතිතුමාටත් අපේ ප්‍රශංසාව පුද කරනවා. ඇත්ත වශයෙන්ම ඒක තමයි විය යුත්තේ. ආණ්ඩු මාරු වෙනකොට, ඇමතිවරු මාරුවෙනකොට ජාතික ප්‍රතිපත්ති වෙනස් වෙන නිසා තමයි අද අපි රටක් විධියට මේ තරම් අගාධයකට වැටිලා තිබෙන්නේ. ඒක මෙතැනදී සිදු නොවීම ගැන මම සතුටු වෙනවා. ඒ කටයුතු ඉදිරියට ගෙන යන එක අත්‍යවශ්‍යම කරුණක් වෙනවා.

ගරු නියෝජ්‍ය ගරු කථානායකතුමනි, රූපවාහිනි සංස්ථා පනත අද රටේ තිබෙන වත්මන් අභියෝගවලට සරිලන විධියට සංශෝධනය විය යුතුයි කියලා මම තරයේ විශ්වාස කරනවා. මොකද, අද වනවිට අපේ රට පවතින්නේ 1982 වසරේ තිබුණු තත්ත්වයේ නොවෙයි. ඊට වඩා හාත් පසින්ම වෙනස්කම් අපේ රට තුළ දකින්න තිබෙනවා. අද වෙද්දි පෞද්ගලික ටෙලිවිෂන් නාළිකා 14ක් පමණ තිබෙනවා. මේ වනවිට ප්‍රධාන නාළිකා හැම එකක්ම වාගේ සමාජ මාධ්‍යයටත් අවතීර්ණ වෙලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, උතුර, නැඟෙනහිර සහ සමහර කඳුකර ප්‍රදේශවල වෙසෙන ද්‍රවිඩ ජනතාව වැඩිපුරම බලන්න හුරු වෙලා තිබෙන්නේ ඉන්දියානු නාළිකා. ඉන්දියානු ඩෙකෝඩර් යන්ත්‍ර හොර පාරෙන් ලංකාවට එනවා. මේවාට උණ්ඩියල් ක්‍රමයෙන් ගෙවීම් කරලා ඉන්දියානු නාළිකා නරඹන්න ඒ පළාත්වල ජනතාව පුරුදු වෙලා ඉන්නවා. මේ හේතුව නිසා විශාල මුදල් ප්‍රමාණයක් රටින් එළියටත් යනවා. අපට ඒවාට කිසිම නීතිමය පියවරක් ගන්න බැරි වෙලා තිබෙනවා. මේ ප්‍රවණතාව ශ්‍රී ලංකාවේ ටෙලිවිෂන් කර්මාන්තයට ඉතා දැඩි ලෙස බලපානවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේ අවස්ථාවේ ඇමතිතුමා මේ ගරු සභාවේ නැහැ. ඒ නිසා ඉල්ලීමක් කරන්න කෙනෙකුත් නැහැ. කොහොම හරි දැන ගත්තොත් කියලා හිතාගෙනයි මම මේ කාරණා කියන්නේ. ශ්‍රී ලංකා විද්‍යුත් විකාශකයින්ගේ සංසදය සමඟ සාකච්ඡා කරලා ඉතා ඉක්මනින් මේ පිළිබඳවත් පියවරක් ගන්නා ලෙස අපි රජයට යෝජනා කරනවා. මේ යෝජනාව කරන්න ඇමතිවරයෙක් නැති නිසා පොදුවේ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා හරහාවත් අපි ඒ යෝජනාව ඉදිරිපත් කරනවා.

තවත් එක කාරණයක් විතරක් මම සඳහන් කරන්න කැමතියි. ඒ තමයි අවුරුදු ගණනක් තිස්සේ ඇදි ඇදී තිබුණු ශ්‍රී ලංකා ටෙලිවිෂන් කර්මාන්තය ඩිජිටල්කරණය කිරීමේ ව්‍යාපෘතිය කඩිනම් කරන්න කියන එක. මේක කඩිනම් නොකළොත් ඉදිරි වසර තුන හතර ඇතුළත අපේ ටෙලිවිෂන් කර්මාන්තය කඩා වැටෙන එක මොන විධියකින්වත් වළක්වන්න බැරි වෙයි. ඊට හේතුව ලංකාවේ තාක්ෂණය තවම දුවන්නේ analog ක්‍රමයට වීමයි. නමුත් ගෝලීය තාක්ෂණය digital වෙලා ඉවරයි. අපේ කලාපයේ බොහෝ රටවල් මේ වෙනකොට ඒ පරිවර්තනයෙන් බොහොම ඉදිරියට ගිහින් තිබෙනවා. අපේ අල්ලපු රට වන ඉන්දියාව ගත්තත්, පාකිස්තානය දිහා බැලුවත් අද ඒ පරිවර්තනයෙන් හුඟක් ඉදිරියට ගිහින් තිබෙනවා. අපේ තාක්ෂණය ඒ පරිවර්තනයට භාජන නොකළොත්, අවශ්‍ය කරන උපකරණ හා මෙවලම්වලට අමතර කොටස්වත් ඉදිරියේදී සොයා ගන්න බැරි වේවි. එහෙම වුණොත් බරපතළ ප්‍රශ්නයක් ඇති වෙනවා. ඒ නිසා විකාශන මාධ්‍ය ඩිජිටල්කරණය කිරීමේ වැඩ පිළිවෙළේ වර්තමාන ප්‍රගතිය ගැන දැනගන්න අපි ආසයි. අපේ කැබිනට් ඇමතිතුමෙකුත් සහ රාජ්‍ය ඇමතිතුමෙකුත් ඉන්නවා. මේ කරුණ අහන්න විධියක් නැති වීම ගැන මම යළි යළිත් කනගාටු වෙනවා.

අපට මතකයි, 80 දශකයේ මුල් කාලයේ තමයි රූපවාහිනිය ආරම්භ කළේ. ඒ කාලයේ අපේ ගම්වල මුළු ගමටම එක ගෙදරක වාගේ තමයි රූපවාහිනි යන්ත්‍රයක් තිබුණේ. එහෙම තමයි මේක පටන් ගත්තේ. අද වෙනකොට ගම් නගර කියලා නැහැ, ලොකු පොඩි කියලා නැහැ, කුඩා පැල්පතේ පවා රූපවාහිනි යන්ත්‍ර තිබෙනවා. දසලක්ෂ සංඛ්‍යාත ප්‍රමාණයකින් රූපවාහිනි යන්ත්‍ර දකින්න ලැබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ප්‍රමාණාත්මකව බැලුවාම රූපවාහිනි යන්ත්‍ර වැඩි වෙලා තිබෙනවා; නාළිකා ප්‍රමාණය වැඩි වෙලා තිබෙනවා; තාක්ෂණය පැත්තෙන් බොහෝ දුරට ඉදිරියට ගිහින් තිබෙනවා. නමුත් සමහර වැඩසටහන්වල ගුණාත්මකභාවය පැත්තෙන් බලද්දී, එදා තිබුණාට වඩා අද පසුබෑමක් තිබෙනවා කියලා තමයි රටේ මතය තිබෙන්නේ. රූපවාහිනිය ආරම්භ කරපු කාලයේ විකාශනය වූ ටෙලිනාට්‍ය ගැන කල්පනා කරලා බැලුවොත්, මොන තරම් වටිනා ටෙලිනාට්‍ය ද ඒ කාලයේ අපි බැලුවේ කියලා හිතෙනවා. ලොකු පණිවිඩයක් දෙන, හරවත් ටෙලිනාට්‍ය බැලුවා; රසවත් ටෙලිනාට්‍ය

බැලුවා. මට මතකයි, අපි පාසල් යන කාලයේ "යශෝරාවය", "දූ දරුවෝ", "ළාබිරු දහසක්", "චරිත තුනක්", "අසල්වැසියෝ" වැනි බොහොම වටිනා, quality එකක් තිබුණු ටෙලිනාට්‍ය තමයි බැලුවේ.

අද වාගේ බාල පණිවුඩ දෙන ටෙලි නාට්‍ය නොවෙයි ඒ කාලයේ තිබුණේ. "විනෝද සමය" වාගේ වැඩසටහන් මට මතක් වෙනවා. ඇනස්ලි, බර්ටි, සැමුවෙල් ඉදිරිපත් කළ "විනෝද සමය" වාගේ වැඩසටහන්වල කොයි තරම් අර්ථවත්භාවයක් තිබුණාද? හාස්‍යයත් එක්ක ජනතාවට ලොකු පණිවුඩයක් දුන් වැඩසටහනක් හැටියටයි ඒ කාලයේ අපි ඒ වැඩසටහන දැක්කේ. අද quantity එක වැඩි වුණත් quality එක අඩු වෙලා තිබෙනවා. මේ ගැන ඇමතිතුමාගේත්, රජයේත් -අප කාගේත්- අවධානය යොමු කළොත් වටිනවා කියා මා හිතනවා. මීට වඩා කාලය ගන්න මා බලාපොරොත්තු වෙන්නේ නැහැ. තවත් කිව යුතු කරුණු ටිකක් තිබුණත් ඇමතිවරු නැතුව ඒවා කියලා වැඩක් නැහැ.

රූපවාහිනිය පැත්තෙන් බලනකොට අද මේ විදුලිය කැපිල්ලත් ලොකු ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. මිනිසුන්ට සුපුරුදු වැඩසටහන් බලන්න විදුලිය කැපිල්ල ලොකු බාධකයක් වෙලා තිබෙනවා. ඒ වාගේම, දැන් රූපවාහිනිය නරඹනකොට විදුලි බිලත් හැමෝටම මතක් වෙනවා. මේවා පිළිබඳව අපි අවධානය යොමු කළ යුතු වෙනවා. විශේෂයෙන්ම විදුලි බිල පිළිබඳ ප්‍රශ්නය අද බරපතළ ප්‍රශ්නයක් බවට පත් වෙලා තිබෙනවා. අපි උදේත් මතක් කළ පරිදි, ත්‍රෛනිකායික මහා නායක හිමිවරුත් රජයෙන් විශේෂ ඉල්ලීමක් කරලා තිබෙනවා, ඒ ගැන යළිත් කල්පනා කරන්න කියලා. සම්බුද්ධ ශාසනයේ ආරක්ෂාව ගැන කථා කළත්, අද වනකොට පන්සල්වල ලයිට් බිල ගෙවීම ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. මේ ආණ්ඩුව අද පන්සල් අඳුරේ තබන තත්ත්වයකට මේ රට පත් කරලා තිබෙනවා. මේවා ගැනත් කල්පනා කරන්න ඕනෑ. මේ විදුලිය බිල වැඩිවීම පන්සල් -විහාරස්ථාන- ඇතුළු ආගමික ස්ථානවලටත් බලපානවා. රටේ ජනතාවටත් බලපානවා. මේවා පිළිබඳව දැඩි ලෙස අවධානය යොමු කර, පුළුවන් හැම සහනයක්ම ලබා දීමට රජයට වගකීමක්, යුතුකමක් තිබෙනවාය කියන කාරණයත් මතක් කරමින්, ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා (සංශෝධන) පනත් කෙටුම්පත ගැන අදහස් ස්වල්පයක් ඉදිරිපත් කරන්න කාලය ලබා දීම ගැන ඔබතුමාටත් ස්තුතිවන්ත වෙමින්, මගේ වචන ස්වල්පය අවසන් කරනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු කනක හේරත් රාජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 13ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.26]

**ගරු කනක හේරත් මහතා (තාක්ෂණ රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு கனக ஹேரத் - தொழில்நுட்ப இராஜாங்க அமைச்சர்)
(The Hon. Kanaka Herath - State Minister of Technology)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සිවිල් ගුවන් සේවා පනත යටතේ ගෙනෙන නියෝග ද අද දවසේ විවාදයට ගැනෙනවා. විශේෂයෙන් සිවිල් ගුවන් සේවා අධිකාරියේ සේවය කළ පුද්ගලයකු හැටියටත්, ඒ වාගේම බලපත්‍රලාභියකු හැටියටත් ඒ පිළිබඳව වචන ස්වල්පයක් කථා කරන්න අවස්ථාව ලැබීම ගැන මා සතුටුවෙනවා. මෙහිදී, 2018 අංක 01 දරන සිවිල් ගුවන් සේවා (සේවක පිරිස් සහ පුහුණු කිරීමේ ආයතන සඳහා බලපත්‍ර නිකුත් කිරීමේ) නියෝග තමයි අද පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙන්නේ.

1955 ANR - Air Navigation Regulations - එහෙම නැත්නම් ගුවන් සංතරණ රෙගුලාසිවලට අනුව තමයි මෙතෙක් කාලයක් ගුවන් සේවාවේ කටයුතු විශේෂයෙන් බලපත්‍ර ලබා දීමේ කටයුතු කරලා තිබෙන්නේ. ජාත්‍යන්තර වශයෙන් ඒක කාලයෙන් කාලයට වෙනස් වුණත්, මෙතෙක් කාලයක් -අවුරුදු 60ක්, 70ක් පමණ- ඒක මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා නීත්‍යනුකූල කරන්න හැකියාවක් ලැබී තිබුණේ නැහැ. ඒ නිසා මේ අවස්ථාව ඉතා වැදගත් අවස්ථාවක් හැටියට මා දකිනවා. විශේෂයෙන් ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානයේ පිරිස් බලපත්‍රය කියන්නේ එහි ඇමුණුම 1ට - Annex 1ට - වැදගත් වන කාරණාවක්. ඒක ඉතාම වැදගත් දෙයක්. මා හිතන විධියට 2018 අන්තර්ජාතික සිවිල් ගුවන් සේවා සංවිධානය විගණනයකදී මේ පිළිබඳව හඳුන්වා දීලා, මේකේ අඩු පාඩු ටික කියලා දුන්නාට පසුව තමයි මෙය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා තිබෙන්නේ. ලබන සතිය වනකොට අන්තර්ජාතික සිවිල් ගුවන් සේවා සංවිධානයේ රැස්වීමක් පැවැත්වෙනවා. වාර්ෂිකව පවත්වන ඒ රැස්වීමේදී මේ පිළිබඳව කරුණු දක්වන්න අපට හැකියාවක් ලැබෙනවා, මේ නියෝග පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම තුළින්. ඒ කාරණය අපේ අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කරාවි කියන බලාපොරොත්තුව තිබෙනවා. ඒ පිළිබඳව මා ඊට වඩා කථා කරන්න යන්නේ නැහැ.

මේ රටේ වාගේම අද ලෝකයේම ගුවන් සේවා විශාල අභියෝගයකට මුහුණ දීලා තිබෙනවා.

2019දී එල්ල වුණු පාස්කු ප්‍රහාරයත් සමඟ අපේ රටේ සංචාරක කර්මාන්තය වාගේම ගුවන් සේවයත් කඩා වැටුණා. පසුගිය වර්ෂ තුනේදී ඇති වුණු කොවිඩ් වසංගත තත්ත්වය නිසා මුළු ලෝකයේම ගුවන් සේවා විශාල වශයෙන් පාඩු ලබා තිබෙනවා. මඟීන්ගේ ප්‍රමාණය සියයට 50කින්, 60කින් -මිලියන 2,707කින්- පමණ අඩු වෙලා තිබෙනවා. ඇමෙරිකානු ඩොලර් බිලියන 372ක් පාඩු වෙලා තිබෙනවා. 2019ට සාපේක්ෂව 2020දී තමයි ඒ වාගේ පාඩුවක් ලබා තිබෙන්නේ. 2021 වෙනකොට මඟී ප්‍රමාණයේ අඩු වීම සියයට 40ක් -මිලියන 2,200ක්- පමණ වෙලා තිබෙනවා. පාඩුව ඇමෙරිකානු ඩොලර් බිලියන 324ක් වෙලා තිබෙනවා. මේ වර්ෂය තුළදී මඟී ප්‍රමාණයේ අඩු වීම තිබෙන්නේ සියයට 22ක්, 24ක් වශයෙන්. පාඩුවත් ඩොලර් බිලියන 176 දක්වා අඩු වෙලා තිබෙනවා. ඒක වැදගත් කාරණයක්.

ජාත්‍යන්තර ගුවන් සේවා කඩා වැටෙන්න කොවිඩ් වසංගතය බලපෑවා වාගේම අනෙක් පැත්තෙන් ඛනිජ තෙල් මිල වැඩිවීමත් බලපා තිබෙනවා. ඒ හේතුව නිසාත් බොහෝ ගුවන් සේවා අද වනවිට පාඩු ලබන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ලංකාවට එය වෙන රටවලටත් වඩා වැඩියෙන් බලපා තිබෙනවා. මොකද, මේ තිබෙන ආර්ථික අර්බුදයත් සමඟ අපට ඒක විශාල වශයෙන් බලපානවා. අද වෙනකොට අනෙක් රටවල ජාත්‍යන්තර ගුවන් සේවාව යම් තාක් දුරට ගොඩ නැඟී තිබෙනවා වාගේම, අභ්‍යන්තර ගුවන් සේවාවත් සාමාන්‍ය අතට පත් වෙමින් පවතිනවා. නමුත්, ලංකාවේ අද තිබෙන තත්ත්වය ඊට හාත්පසින්ම වෙනස්. අපේ අභ්‍යන්තර ගුවන් සේවාව මුළුමනින්ම නැති වෙලායි තිබෙන්නේ. අපේ රටේ ගුවන් නියමුවන් හැටියට පුහුණුව ලබන ශිෂ්‍ය-ශිෂ්‍යාවන්ට පවා අද දොරවල් වැහිලා තිබෙනවා. ඉස්සර අපේ රටේ තමයි මාලදිවයින, ඉන්දියාව වැනි රටවල ගුවන් නියමුවන් පුහුණු කළේ. අද වෙනකොට අපිට මේ රටේ ඒ පුහුණුවීම් කරන්න බැරි නිසා, අපේ රටේ අය පුහුණුවීම් ලබා ගන්න වෙනත් රටවලට යනවා. ඒක හැම පැත්තෙන්ම බලපාන කාරණාවක්. ඒ නිසා අපේ ගුවන් සේවාව ශක්තිමත් කරන්න නම්, අපේ තිබෙන අඩුපාඩු ටික මඟ හරවා ගෙන කටයුතු කළ යුතුයි. ඒ වාගේම, අභ්‍යන්තර ගුවන් සේවාව ශක්තිමත් කළ යුතුයි. එහෙම නැතුව ජාත්‍යන්තරය ගැන පමණක් හිතා කටයුතු කළාට අපේ රටේ ගුවන් සේවාව දියුණු වෙන්නේ නැහැ.

[ගරු කනක හේරත් මහතා]

පසුගිය දවස්වල අපට ණය ගෙවා ගැනීමට අපහසුකම් තිබුණු නිසා බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළේ දෙවන අදියරේ කටයුතු නතර වෙලායි තිබෙන්නේ. ඒක අපේ රටට විශාල පාඩුවක්. ඒක ජයිකා ආයතනයෙන් ලබා දුන් ණය ආධාරයක් මඟින් ක්‍රියාත්මක වුණේ. ගුවන් තොටුපොළ හා ගුවන් සේවා සමාගමට හැකියාව තිබෙනවා, මේ ණයත් ගෙවා ගෙන මේ සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කරන්න. ලබන සතියේදී අතිගරු ජනාධිපතිතුමා සිදු කරන ජපාන සංචාරයෙන් පසුව මේ වැඩසටහන නැවතත් ආරම්භ කරයි කියන බලාපොරොත්තුව අපට තිබෙනවා.

ගරු අමාත්‍යතුමා මේ වෙලාවේ ගරු සභාවේ හිටියා නම් හොඳයි. අපි ශ්‍රී ලන්කන් ගුවන් සමාගම ගැන කථා කළා. පසුගිය දවස්වල ගරු අමාත්‍යතුමා සමඟ පැවැති මාධ්‍ය සාකච්ඡාවකින් පසුව බොහෝ දෙනෙකු ප්‍රශ්න කළා, මේ ගුවන් සමාගම තුළ තිබෙන ලාභ ලබන ආයතන දෙක වන SriLankan Catering Limited සහ SriLankan Cargo Ground Handling පමණක් විකුණනවා කියන කාරණය සම්බන්ධයෙන්. ඒක ලොකු වැරැද්දක්. මොකද, ඇමතිතුමා සඳහන් කර තිබෙන ආකාරයට අද වනවිට අපිට ඇමෙරිකානු ඩොලර් බිලියන 1.5ක් පමණ ණය ගෙවන්න තිබෙනවා. ඒ සියල්ල අභ්‍යන්තර සහ ජාත්‍යන්තර වශයෙන් ගෙවන්න තිබෙන ණය. ගරු අමාත්‍යතුමා සඳහන් කළා, ගුවන් සේවාව ප්‍රතිව්‍යුහගත කරනවා කියලා. මේ තත්ත්වය අනුව ඒක අත්‍යවශ්‍ය කාරණාවක්. නමුත්, Sri Lankan Catering Limited එක හෝ Sri Lankan Cargo Ground Handling වෙනම විකුණනවා නම්, අඩුම තරමේ බිලියන 1.5ක මුදලක් අතට ලබා ගත්තොත් පමණයි, අපේ ගුවන් සේවාව, එහෙම නැත්නම් ශ්‍රී ලන්කන් ගුවන් සමාගම ඉදිරියට පවත්වා ගෙන යන්න හැකියාවක් ලැබෙන්නේ.

එහෙම නැතිව, අප ලාභ ලබන හොඳම ආයතන දෙක විකුණා දැම්මාට පස්සේ, බංකොලොත් වෙච්ච සමාගමක් තියාගෙන ඉන්න තමයි ඉන්තිමේදී අපට සිදු වන්නේ. එහෙම නොකර, ගරු අමාත්‍යතුමා සඳහන් කරපු ආකාරයට ඒ මුළු සමාගමේම කොටස් යම් සමාගමකට ලබා දෙන්න පුළුවන් නම්, ඒක ඉතාම වැදගත් යෝජනාවක්. මොකද, වසර කිහිපයකට පෙර මේ ගුවන් සේවා සමාගමට ගුවන් යානා 28ක් පමණ තිබුණා. නමුත්, දැන් තිබෙන්නේ ගුවන් යානා 24ක් පමණයි. අප වෙත ගුවන් යානා බදු දුන් සමාගම් ලබන වර්ෂය වනකොට ගුවන් යානා 5ක් රැගෙන යන්න කටයුතු කරනවා. ඉන් පසුව 2025 වර්ෂය වනකොට තවත් ගුවන් යානා 7ක් ගෙන යනවා. එතකොට අපට තිබෙන යානා ඇණිය නැතිව යනවා. ඒ හරහා එක පැත්තකින් අපේ ගුවන් සමාගමට ගමනාන්ත නැතිව යනවා. ඒ පමණක් නොවෙයි, අනාගතයේදීවත් ඒ ගමනාන්ත හරියාකාරව ලබාගන්න අපට හැකියාවක් ලැබෙන්නේ නැහැ. අපි උදාහරණයක් ගනිමු. අපි ඉස්සර ලන්ඩන් නගරයට දිනපතා ගුවන් ගමන් දෙකක් පමණ ක්‍රියාත්මක කළා. අද වනකොට එය ගුවන් ගමන් එකකට අඩු වෙලා තිබෙනවා. මේ වාගේ නොයෙකුත් ගැටලු තිබෙනවා. අනෙක් පැත්තෙන්, අපට තිබෙන ඩොලර් ප්‍රශ්නය නිසා අපේ ගුවන් යානාවල නඩත්තුව අද නතර වෙලා තිබෙනවා. ඒ සඳහා විශාල මුදලක් ගෙවන්න සිදු වෙලා තිබෙනවා. ඩොලර් නැති නිසා ඊට අදාළ ගනුදෙනුව නතර වෙලා තිබෙනවා. මේ ගුවන් සමාගම තවදුරටත් මේ තත්ත්වයෙන් තිබීම අපට බලාගෙන ඉන්න බැහැ. මෙය ඉතාම කඩිනමින් ප්‍රතිව්‍යුහගත කරන්න කියා ගරු අමාත්‍යතුමාගෙන් විශේෂයෙන් ඉල්ලා සිටිමින්, මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ස්තුතිවන්ත වෙමින් මම නවතිනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු උද්දික ප්‍රේමරත්න මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.36]

**ගරු උද්දික ප්‍රේමරත්න මහතා**
(மாண்புமிகு உத்திக பிரேமரத்ன)
(The Hon. Uddika Premarathne)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි.

ඇත්තටම මෙවැනි වෙලාවක ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා පනත සංශෝධනය කිරීමේ වැදගත්කම මොකක්ද? මේකෙන් සංස්ථාවට සිදු වන අභිවෘද්ධිය මොකක්ද? කැබිනට් අමාත්‍ය ගරු බන්දුල ගුණවර්ධන මැතිතුමා ප්‍රකාශ කළා, "රූපවාහිනී සංස්ථාව පාඩු ලබන ආයතනයක්. ඒ ආයතනයේ වැඩ කරන අයට පඩි ගෙවන්නවත් සල්ලි නැහැ" කියලා. අමාත්‍යවරයා එහෙම කථා කරන කොට නාලිකාවක් ලාභ ලබන්නේ කොහොමද? නාලිකාවක් විතරක් නොවෙයි, ඕනෑම ආයතනයක ප්‍රධානියෙකු තම ආයතනය පාඩු ලබනවා කියලා කියනකොට, කොහොමද ඒක ලාභ ලබන්නේ? "මේ ආයතනය පාඩු ලබනවා. සේවකයන්ට පඩි ගෙවන්න විධියක් නැහැ" කියලා අමාත්‍යවරයාම කියනකොට, ඒකම තමයි හේතුව රූපවාහිනී සංස්ථාව පාඩු ලබන්න. අමාත්‍යවරයාට සැලසුමක් තිබෙන්න ඕනෑ, ජාතික රූපවාහිනිය ලාභ ලබන තැනට ගෙන එන්නේ කොහොමද, ජාතික රූපවාහිනියේ සේවක ප්‍රජාවට පඩි ගෙවන්න වැඩ කටයුතු කරන්නේ කොහොමද කියන කාරණා සම්බන්ධයෙන්. එතුමාට එවැනි අදහසක් තිබෙන බව නම් මම දැක්කේ නැහැ. හැබැයි, එතුමා මෙතැනදී අපට ජපානය පිළිබඳව පන්තියක් පැවැත්වූවා. පන්තියක් පවත්වලා, ආදරය කරුණාව ගැන සහ ජපානයේ නායකයන් කොහොමද වැඩ කරලා තිබෙන්නේ කියන එක ගැන අපට පැහැදිලි කළා. ජපානයේ නායකයන් වැඩ කරලා තිබෙන විධිය මම සියැසින් දැක තිබෙනවා. ජපානයේ නායකයන් සහ බන්දුල ගුණවර්ධන වාගේ ජ්‍යෙෂ්ඨ අමාත්‍යවරුන් අතර අහසට පොළොව වාගේ ලොකු පරතරයක් තිබෙනවා. ඒ නිසා තමයි ජපානය අද එතැන තිබෙන්නේත්, අප අද මෙතැන ඉන්නේත්.

ගරු ඇමතිතුමනි, ඔබතුමා අදටත් අමාත්‍යාංශ තුනක් තියාගෙන ඉන්න ජ්‍යෙෂ්ඨ කැබිනට් අමාත්‍යවරයෙක්. ප්‍රවාහන අමාත්‍යාංශය, ජනමාධ්‍ය අමාත්‍යාංශය සහ මහාමාර්ග අමාත්‍යාංශය තිබෙන්නේ ඔබතුමා යටතේ. "අමාත්‍යාංශ" කියන්නේ මොනවාද? රටක තනි අමාත්‍යවරයෙකුට handle කරන්න පුළුවන්ද, අමාත්‍යාංශ තුනක්? මේ රටේ මිනිසුන්ගේ අභිවෘද්ධිය සහ අනාගතය තීරණය කරන ක්‍රියාවලිය තමයි ඒ අමාත්‍යාංශ මඟින් කෙරෙන්නේ. විවිධ විෂයයන්ට අදාළව කැබිනට් අමාත්‍යවරුන් පත් වුණා කියලා කැබිනට් අමාත්‍යවරුන්ට ඒවා අයිති නැහැ. ඒවා අයිති මේ රටේ ජනතාවට. මේ රටේ ජනතාවගේ අනාගතය වෙනුවෙන් තමයි කැබිනට් අමාත්‍යවරයෙකු පත් කරන්නේ. ඒක තමන්ගේ දෙයක් නොවෙයි. ඒක තමන් සතු ධනය නොවෙයි. මේ තණ්හාධික බව අපේ නායකයන් වෙතින් තුරන් කරන්න ඕනෑ. එසේ තණ්හාව තිබෙන නායකයන් මේ පාර්ලිමේන්තුවට ඒම මෙතැනින් එහාට වළකින්න ඕනෑ. මිනිසුන්ගේ ඡන්දයෙන් තමයි මන්ත්‍රීවරුන් පත් වන්නේ. ඇයි, මිනිසුන් ඡන්දය දෙන්නේ? ඇයි, බන්දුල ගුණවර්ධන වාගේ ජ්‍යෙෂ්ඨ අමාත්‍යවරු හැම අවස්ථාවේම පාර්ලිමේන්තුවට තේරී පත් වී එන්නේ? අපේ රටේ දේශපාලනඥයා තමයි රස්සා බෙදන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ලෝකයේ කොහේවත් එවැනි theory එකක් නැහැ. තමන්ට සුදුසුකම් තිබෙනවා නම්, රට තුළ තමන්ට රැකියාවක් හිමි විය යුතුයි. අද මිනිස්සු බොහෝ සෙයින් අපේ රට අත් හැරලා පිට රට යනවා. ඒ යන්නේ, තමන්ගේ සුදුසුකම්වලට තමන්ගේ රටේ රැකියාවක් නැති වුණාට පිට රට ගිහින් තමන්ට ගොඩ නැඟෙන්න පුළුවන් කියලා තමන්ගේ රටට වඩා පිට රටවල් පිළිබඳ විශ්වාසයක් තිබෙන නිසායි; බන්දුල ගුණවර්ධන අමාත්‍යතුමා කියපු විධියටම, ලෝකයේ නායකයන් ජපානයේ නායකයන් වාගේ වැඩ කරපු නිසායි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රූපවාහිනී නාළිකා අන්තර්ගතයන් - contents - තමයි විකුණන්නේ. අන්තර්ගතයන්හි තිබෙන වටිනාකම, නැවුම් බව, ආකර්ෂණීය බව හා නිර්මාණශීලී බව තමයි විකුණන්නේ. එහෙම නැතිව, රජයේ නාළිකාවක් පෞද්ගලික නාළිකා එක්ක තරග කරන ගොඩට වැටෙන්නේ නැහැ. පෞද්ගලික රූපවාහිනී නාළිකා ලාභ ලබන්නේත්, රජයේ රූපවාහිනී නාළිකා හැම දාම පාඩු ලබන්නේත් ඇයි? මේ ගරු සභාවේ හිටපු ජොෂ්ඨ මැති ඇමතිවරු සියලුදෙනා පාහේ කියන්නේ ජාතික රූපවාහිනී නාළිකාව පාඩු ලබනවා කියලායි. එහෙම කියන්නේ, ඒක හරියට අපි කරපු වැරැද්දක් වාගෙයි; ඒකට උත්තර සොයන්න ඕනෑ අපි වාගෙයි. තමන්ට ලැබිච්ච වගකීම අනෙක් අයට පැවරීම නොවෙයි නායකයාගේ වගකීම වන්නේ.

බන්දුල ගුණවර්ධන ඇමතිතුමා නිෂ්පාදනය කරපු "The Newspaper" චිත්‍රපටය පසුගිය දවස්වල ලෝකයේ සම්මාන උළෙලවල් 8කදී විතර සම්මාන ලැබුවා. ඒ චිත්‍රපටයේ පිටපත් රචකයන් දෙපළ, ඒ වාගේම චිත්‍රපටයේ අධ්‍යක්ෂවරුන් දෙපළ කුමාර තිරිමාදූර හා සරත් කොතලාවලයි. මේ මෑතකදී රුසියානු සම්මාන උළෙලකදී ඔවුන් දෙදෙනාට "හොඳම නළුවා සම්මානය" ලැබුණා. නමුත් ඒ "හොඳම නළුවා සම්මානය" ලබාගන්න ගියේත් බන්දුල ගුණවර්ධන අමාත්‍යතුමායි. සම්මාන උළෙළ සංවිධානය කරපු සංවිධායකවරු බලාගෙන ඉන්නවා, "හොඳම නළුවා සම්මානය" හිමි නළුවන් දෙදෙනා වේදිකාවට එනකල්. නමුත්, සම්මානය ගන්න ගියේ බන්දුල ගුණවර්ධන ඇමතිතුමා. සමහර විට ඒ ගොල්ලන් හිතන්න ඇති, මේ එන්නේ ඒ නළුවන් දෙදෙනාගේ තාත්තා වෙන්න ඇති කියලා. ඒ ගොල්ලෝ එහෙම හිතන්න ඇති. එහෙම වෙන්න හේතුව මොකක්ද?

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
එතුමාත් හොඳ නළුවෙක් තමයි.

**ගරු උද්දික ප්‍රේමරත්න මහතා**
(மாண்புமிகு உத்திக பிரேமரத்ன)
(The Hon. Uddika Premarathne)
එතුමාට ගුවන් ටිකට් එකක් අරගෙන යන්න පුළුවන්. හැබැයි, කුමාර තිරිමාදූර හෝ සරත් කොතලාවල හෝ එක්කරගෙන යන්න එතුමාට කිසිම වුවමනාවක් නැහැ; අවශ්‍යතාවක් නැහැ. ඇයි, ඒ?

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

"සොර දෙටුවෙක් කස තැළුම් කකා
දං ගෙඩියට ගෙන යන ගමනේ
වධක බෙරේ දැක සොරා ගන්ට එය
කදිමයි ලොබ සිතුවා ලු"

ඒක තමයි,
***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*
ගැන පැහැදිලි කරන්න තිබෙන ඉතාම නිර්මාණශීලී උදාහරණය.

ටෙලි නාට්‍ය කලාව තුළ, ටෙලි නාට්‍යයක එක කොටසකට නාළිකාවකින් ගෙවන මුදල රුපියල් ලක්ෂ දෙකකට වඩා අඩුයි. නමුත්, ඒ මුදලට වඩා දහපහළොස් ගුණයක ලාභයක් නාළිකාව සොයනවා. රුපියල් ලක්ෂ දෙකකට වඩා අඩු මුදලකින් තමයි ටෙලි නාට්‍යයේ වැඩ කරන නළු නිළියන්, තාක්ෂණික ශිල්පීන් ඇතුළු ඔක්කොම ජීවත් වන්නේ. බන්දුල ගුණවර්ධන ඇමතිතුමා ආර්ථික විශේෂඥයෙක්. ගරු ඇමතිතුමනි, ඒ මුදල ඉහළ දමන්න ඔබතුමාට පුළුවන් නම්, ටෙලි නාට්‍යයේ එක කොටසක පිරිවැය රුපියල් ලක්ෂ 5ක් දක්වා වැඩි කර නිෂ්පාදකවරයාට ලබා දෙන්න පුළුවන් නම්, ඔබතුමා ලබාගත් කැබිනට් අමාත්‍ය ධුරයෙන් එම ක්ෂේත්‍රයට වැඩක් කළා වෙනවා. එහෙම නැතිව මේ සභාවේ අපට පන්ති පැවැත්වූවාට කිසිම ප්‍රතිඵලයක් ලැබෙන්නේ නැහැ. අවශ්‍ය නම් අපේ සහයෝගය ලබා දෙන්නම්, නාළිකාවල තිබෙන ගැටලු සාකච්ඡා කරන්න.

ලෝකයේ සම්මාන ලබන මට්ටමේ නිර්මාණශීලී නිර්මාණකරුවන් ඉන්න අපේ රටේ සිනමා කර්මාන්තයට රජය විසින්, ආණ්ඩුව විසින් මොනවාද කරලා තිබෙන්නේ? මේ වන කල් කිසිම දෙයක් කරලා නැහැ. සිනමා කර්මාන්තය OTT platforms වාගේ දේවල් හරහා ඩිජිටල්කරණය වෙලා තිබෙන යුගයක අපේ සිනමා කර්මාන්තය ජාත්‍යන්තරයට ගෙන යන්න අපට තිබෙන ප්‍රශ්න, ගැටලු සාකච්ඡා කිරීමේ අවශ්‍යතාව වෙනුවෙන් විශේෂ කාරක සභාවක් ලබා දෙන මෙන් මා ගරු නියෝජ්‍ය කථානායකතුමාගෙන් ඉල්ලා සිටිනවා.

1971 - 1979 කාලයේ ලෝක ජනගහනයෙන් මිලියන 74.4ක ප්‍රේක්ෂක ප්‍රජාවක් හිටපු අපේ සිනමා කර්මාන්තය අද වන කොට තිබෙන තැන පිළිබඳව කිසි කෙනකුට අවබෝධයක් නැහැ. ඒ කියන්නේ ලංකාවේ ජනගහනයට වඩා තුන්ගුණයක ප්‍රේක්ෂක පිරිසක් හිටපු කර්මාන්තයක් අද වන කොට කිසි කෙනකුගේ ඇස ගැටෙන්නේ නැහැ. මීට කලින් හිටපු සංස්කෘතික අමාත්‍යවරයාගෙන් මා ඇහුවා, "අපේ සිනමා කර්මාන්තයට මොකක්ද කරන්න පුළුවන්?" කියලා. එතුමා මගෙන් ඇහුවේ, "කාටද උද්දික ඔය කර්මාන්තය තිබෙන්නේ?" කියලායි. මා කිව්වා, "සංස්කෘතික අමාත්‍යාංශය යටතේ ඔබතුමාටයි තිබෙන්නේ" කියලා. එතුමාට මතකවත් නැහැ, තමන් යටතේ තමයි ඒ අමාත්‍යාංශය තිබෙන්නේ කියලා. එතැනින් එහාට මේ කර්මාන්තය පිළිබඳ කවර කථාද?

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
නම කියන්න.

**ගරු උද්දික ප්‍රේමරත්න මහතා**
(மாண்புமிகு உத்திக பிரேமரத்ன)
(The Hon. Uddika Premarathne)
නම කියන්න අවශ්‍ය නැහැ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

**ගරු උද්දික ප්‍රේමරත්න මහතා**
(மாண்புமிகு உத்திக பிரேமரத்ன)
(The Hon. Uddika Premarathne)
නම කියන්න අවශ්‍ය නැහැ. නම කියන්නේ නැහැ, ප්‍රතිරූපවලට හානි කරන්න මා කැමැති නැති නිසාත්, ප්‍රතිරූපවලට හානි නොකළ යුතුය කියා කලාකරුවා හිතන නිසාත්. බන්දුල ගුණවර්ධන අමාත්‍යතුමා එම චිත්‍රපටයේ නිෂ්පාදකවරයා විධියට වැඩ කරන කොට පාඨලී චම්පික පාර්ලිමේන්තු මන්ත්‍රීවරයාත්, හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාත් ඒ චිත්‍රපටයට බෙහෙවින් උදවු කරලා තිබෙනවා.

ඒ උදවු කිරීම හරහා රුපියල් ලක්ෂ 40ක මුදලක් කුමාර තිරිමාදූර විසින් නැවත
***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

[ගරු උද්දික ප්‍රේමරත්න මහතා]

ගෙනිහින් දීලා තිබෙනවා. අඩු ගණනේ ඒ රුපියල් ලක්ෂ හතළිහෙන්වත් ටිකට් දෙකක් අරගෙන දීලා, ජීවිතයේ කවදාවත් අමතක නොවන අවස්ථාවක් වන රුසියානු සම්මාන උළෙලකදී ලැබෙන හොඳම නළුවාට හිමි සම්මානය ඔවුන්ගේ අත් දෙකින් ලබා ගැනීමේ අවස්ථාව ඔවුන්ට හිමි කර දෙන්න තිබුණා. ඒකටවත් එතුමා සතුටු වුණේ නැහැ. අනෙකාගේ සතුට දිහා බලලා සතුටු වෙන්න බැරි නායකයෝ නිසා තමයි අද මේ රට මේ තත්ත්වයට පත් වෙලා තිබෙන්නේ. ඒ නිසා, ජනතාවගේ සතුට දැකලා සතුටු වෙන්න බැරි එවැනි වූ නායකයන්ව නැවතත් මේ පාර්ලිමේන්තුවට ගෙන්වන්න ඡන්දය ප්‍රකාශ කරන්න එපා කියා මා ජනතාවගෙන් ඉල්ලීමක් කරනවා. කුමාර තිරිමාදූර සහ සරත් කොතලාවල Airport එකට ගිහිල්ලා තමයි බන්දුල ගුණවර්ධන මහත්මයාව පිළිගත්තේ. නමුත් වෙන්න ඕනෑ, ඒකේ අනෙක් පැත්තයි. කුමාර තිරිමාදූර සහ සරත් කොතලාවල Airport එකට ආවාට පසු බන්දුල ගුණවර්ධන අමාත්‍යතුමා ගිහිල්ලා ඒ ගොල්ලන්ව පිළිගන්න ඕනෑ. ලස්සන පින්තූරයක් තිබුණා පත්තරේ දමලා. ඒ පින්තූරයේ, Airport එකේදී බන්දුල ගුණවර්ධන අමාත්‍යතුමා සම්මානය අතේ තබාගෙන ඉන්නවා, සරත් කොතලාවල සහ කුමාර තිරිමාදූර සම්මානය දිහා බලාගෙන ඉන්නවා. ලංකාවට ඇවිල්ලාවත් ඒ අයට සම්මානය දෙන්න එතුමාට හදිසියක් නැහැ.

බොහොම ස්තුතියි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවන වර කියවන ලදී.***

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் இரண்டாம் முறையாக மதிப்பிடப்பட்டது.*
*Question put, and agreed to.*
*Bill accordingly read a Second time.*

***මතු පළවන යෝජනාව සභා සම්මත විය.:***
***"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය." - [ගරු ප්‍රසන්න රණතුංග මහතා]***

*தீர்மானிக்கப்பட்டது.*
*"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப்படுமாக." - [மாண்புமிகு பிரசன்ன ரணதுங்க]*
*Resolved:*
*"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. Prasanna Ranatunga.]*

***කාරක සභාවෙහිදී සලකා බලන ලදී.***
***[ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.]***
*குழுவில் ஆராயப்பட்டது.*
*[மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]*
*Considered in Committee.*
[THE HON. DEPUTY SPEAKER *in the Chair.]*

***1 සිට 4 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***

*1ஆம் வாசகத்திலிருந்து 4ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clauses 1 to 4 ordered to stand part of the Bill.*

***ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
***පනත් කෙටුම්පත, සංශෝධන රහිතව වාර්තා කරන ලදී.***

*சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*சட்டமூலம் திருத்தமின்றி அறிக்கை செய்யப்பட்டது.*

*Enacting Clause and Title ordered to stand part of the Bill.*
*Bill reported without Amendments.*

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන්, "පනත් කෙටුම්පත දැන් තුන්වන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව තුන්වන වර කියවා සම්මත කරන ලදී.***
*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் மூன்றாம் முறையாக மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.*
*Question put, and agreed to.*
*Bill accordingly read the Third time, and passed.*

## සිවිල් ගුවන් සේවා පනත: නියෝග
## சிவில் விமான சேவைகள் சட்டம்: ஒழுங்குவிதிகள்
## CIVIL AVIATION ACT: REGULATIONS

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනතේ 66 සහ 69 වගන්ති සමඟ කියවිය යුතු, 117 වගන්තිය යටතේ ප්‍රවාහන සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 ජූලි 03 දිනැති අංක 2078/22 දරන අති විශේෂ ගැසට් පත්‍රය සහ එම ගැසට් පත්‍රයේ මුද්‍රණ දෝෂ නිවැරදි කරමින් 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනතේ 66 සහ 69 වගන්ති සමඟ කියවිය යුතු, 117 වගන්තිය යටතේ වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2022 ජූනි 06 දිනැති අංක 2283/05 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2022.06.21 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග සංශෝධනය කිරීම
## பாராளுமன்ற நிலையியற் கட்டளைகளைத் திருத்துதல்
## AMENDMENTS TO THE STANDING ORDERS OF THE PARLIAMENT

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු සභානායකතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවල අංක 8, 9, 19, 50, 52, 54, 55, 57, 58, 68, 70, 72, 111, 112, 119, 120, 121 සහ 122 දරන ස්ථාවර නියෝග සංශෝධනය කිරීම සම්බන්ධයෙන් 2022 සැප්තැම්බර් 07 දින පාර්ලිමේන්තුවට පිළිගන්වන ලද ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාවේ වාර්තාවේ සඳහන් මතු දැක්වෙන තත් කාරක සභා නිර්දේශ පිළිගත යුතු ය:-

දැනට පවත්නා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8 ඉවත් කර ඒ වෙනුවට මතු සඳහන් නව ස්ථාවර නියෝගය ආදේශ කිරීමට:-

8. (1) පාර්ලිමේන්තුව විසින් අන්‍යාකාරයෙන් තීරණය කරනු ලබන්නේ නම් මිස, එක් එක් මාසයේ පළමුව යෙදෙන ඉරිදාට පසුව එළැඹෙන සතියෙන් ආරම්භ කරමින් ඒ ඒ සතියේ අඟහරුවාදා, බදාදා, බ්‍රහස්පතින්දා සහ සිකුරාදා දිනවල දී එක් එක් මාසයේ පළමුවැනි සහ තුන්වැනි සති දෙකේ දී පාර්ලිමේන්තුව රැස්වනු ලැබිය යුත්තේ ය.

(2) පාර්ලිමේන්තුවේ රැස්වීම පූ. භා. 9.30 ට ආරම්භ කරනු ලැබිය යුත්තේ ය:

එසේ වුව ද, ජනාධිපතිවරයා විසින් කැඳවනු ලබන රැස්වීමක්, ඒ සඳහා ජනාධිපතිවරයා විසින් කරනු ලබන දැනුම් දීමෙන් නියම කර ඇති වේලාවට ආරම්භ කරනු ලැබිය යුත්තේ ය.

පාර්ලිමේන්තුව විසින් අන්‍යාකාරයෙන් තීරණය කරනු ලබන්නේ නම් මිස, පාර්ලිමේන්තු රැස්වීම් දිනවල, අ.භා. 12.30 ට සලකා බැලීමට භාජනය වෙමින් පවතින යම් කටයුත්තක් පිළිබඳව වැඩකටයුතු ප්‍රශ්නය නොවිමසා අත්හිටවනු ලැබ, අ.භා. 1.00 ට නැවත ආරම්භ කරනු ලැබිය යුත්තේ ය.

කථානායකවරයා විසින්, අ.භා. 5.30ට ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබනු ලැබිය යුත්තේ ය.

(5) අ.භා. 4.30 ට එම අවස්ථාවේ දී සැලකිල්ලට භාජනය වෙමින් පවතින යම් කටයුත්තක් පිළිබඳ වැඩකටයුතු අත්හිටවනු ලැබිය යුතු අතර, එවිට පාර්ලිමේන්තුව කාරක සභා අවස්ථාවේ පසු වේ නම් මූලාසනාරූඪ මන්ත්‍රීවරයා විසින් මූලාසනයෙන් ඉවත්ව පාර්ලිමේන්තුවට වාර්තා කරනු ලැබිය යුත්තේ ය. තව ද, පාර්ලිමේන්තුව හෝ විවාදය හෝ කල් තබනු ලැබිය යුතු බවට හෝ කාරක සභා අවස්ථාවේ දී මූලාසනාරූඪ මන්ත්‍රීවරයා වෙත ප්‍රගතිය වාර්තා කරනු ලැබිය යුතු බවට හෝ ආසනයෙන් ඉවත් වනු ලැබිය යුතු බවට හෝ යෝජනාවක් ඉදිරිපත් කරනු ලැබ ඇත්නම්, එවැනි සෑම පමා කිරීමේ යෝජනාවක් ම ප්‍රශ්නය නොවිමසා අවලංගු විය යුත්තේ ය:

එසේ වුව ද, වැඩකටයුතු අත්හිටවනු ලැබූ විට 46 වැනි ස්ථාවර නියෝගය ප්‍රකාරව විවාදය අවසන් කිරීමේ යෝජනාවක් ඉදිරිපත් කරනු ලැබිය හැකි අතර, එවැනි යෝජනාවක් ඉදිරිපත් කරනු ලැබුවහොත්, හෝ ඒ වනවිට එම ස්ථාවර නියෝගය ප්‍රකාරව වැඩකටයුතු කරමින් පවතී නම්, ඉන් මතු වන ප්‍රශ්නය එම ස්ථාවර නියෝගයේ විධිවිධාන සලසා ඇති ආකාරයට ඉදිරිපත් කරනු ලැබ ඇති වැඩිමනත් වූ යෝජනාවක් වෙතොත් ඒ පිළිබඳ තීරණය කරනු ලබන තෙක් කථානායකවරයා හෝ මූලාසනාරූඪ මන්ත්‍රීවරයා හෝ මූලාසනයෙන් ඉවත් වනු නොලැබිය යුත්තේ ය.

අ.භා 4.30 ට සැලකිල්ලට භාජනය වෙමින් පවතින වැඩකටයුතු සම්බන්ධයෙන් ක්‍රියා කර අවසන් කරනු ලැබීමෙන් අනතුරුව කවර හෝ මන්ත්‍රීවරයකු විරුද්ධ වන, කිසි ම වැඩකටයුත්තක් සලකා බැලීම සඳහා ගනු නොලැබිය යුත්තේ ය.

(7) මෙම ස්ථාවර නියෝගයෙහි (4) සහ (5) ඡේදවල විධිවිධානයන්හි කුමක් සඳහන්ව තිබුණ ද, එවකට සිදුකරමින් පවතින පාර්ලිමේන්තුවේ වැඩකටයුතු සමාප්ත කිරීමේ කාර්යය සඳහා අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයකු විසින් දැනුම් දීමකින් තොරව කරනු ලබන යෝජනාවක් මත සභාවේ පැමිණ සිටින මන්ත්‍රීවරයන් බහුතරයකගේ එකඟත්වය පළ කරනු ලැබ ඇත්නම්, පාර්ලිමේන්තුව විසින් රැස්වීම් පවත්වනු ලබන කාල වේලාවන් දීර්ඝ කිරීම කරනු ලැබිය හැකි ය.

2. දැනට පවත්නා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 9 ඉවත් කර ඒ වෙනුවට මතු සඳහන් නව ස්ථාවර නියෝගය ආදේශ කිරීමට:-

9. ප්‍රධාන කටයුතු ආරම්භයේ දී, අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයකු විසින් සංශෝධනයක් හෝ විවාදයක් නොමැතිව නිශ්චිතව සඳහන් කරනු ලබන යම් වැඩකටයුත්තක් පිළිබඳ කටයුතු යම් නිශ්චිත දිනයක රැස්වීමේදී 8 වැනි ස්ථාවර නියෝගයේ විධිවිධානවලින් නිදහස් විය යුතු බවට යෝජනාවක් කරනු ලැබිය හැකි අතර, එවැනි යෝජනාවකට එකඟත්වය ලැබ ඇත්නම්, එසේ නිශ්චිතව සඳහන් කරන ලද වැඩකටයුත්ත, අත්හිටවීමට නියම කර ඇති වේලාවේ දී සාකච්ඡාවට භාජනය වෙමින් පවතී නම් එය අත්හිටවීම කරනු නොලැබිය යුතු අතර, ඒ සම්බන්ධයෙන් විරෝධතාවක් ඇති වුව ද කවර වේලාවක දී හෝ එය සලකා බැලීමට ගනු ලැබිය හැකි ය:

එසේ වුව ද, 8 වැනි ස්ථාවර නියෝගය ක්‍රියාත්මක වීමෙන් නිදහස් කරන ලද වැඩකටයුතු සම්බන්ධයෙන් ක්‍රියා කිරීම අ.භා. 4.30 න් පසු අවසන් වූ විට, නිදහස් කරන ලද වැඩකටයුතුවල අවසන් විෂයය නිම කරනු ලැබූ වහා ම, කථානායකවරයා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබනු ලැබිය යුත්තේ ය.

3. **දැනට පවත්නා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 19 ඉවත් කර ඒ වෙනුවට මතු සඳහන් නව ස්ථාවර නියෝගය ආදේශ කිරීමට:-**

19. (1) ප්‍රශ්න අවසාන වූ විට මන්ත්‍රීවරයකු ස්වකීය ස්ථානයේ නැඟී සිට හදිසි පොදු වැදගත්කමක් ඇති නිශ්චිත කාරණයක් සාකච්ඡා කිරීම සඳහා කාරණය කුමක්දැයි සඳහන් කරමින් පාර්ලිමේන්තුව කල් තැබීම සඳහා වූ යෝජනාවක් ඉදිරිපත් කිරීමට අවසර ඉල්ලා ඇතොත් මිස, ප්‍රධාන කටයුතු ආරම්භ කරන තෙක් (අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයකු විසින් හැර) පාර්ලිමේන්තුව කල් තැබීමේ යෝජනාවක් ඉදිරිපත් කරනු නොලැබිය යුත්තේ ය.

(2) (අ) එවැනි ඕනෑම යෝජනාවක් ඉදිරිපත් කරනු ලැබීමට අදහස් කර ඇති දිනයේ රැස්වීම් පටන් ගැනීමට පෙර ඒ යෝජනාව පිළිබඳව කථානායකවරයාට ලිඛිතව දැනුම් දී, කථානායකවරයාගේ එකඟත්වය ලබා ඇත්නම් ; සහ

(ආ) මන්ත්‍රීවරයා පාර්ලිමේන්තුවේ අවසරය ලබාගෙන ඇත්නම්; හෝ

(ඇ) පාර්ලිමේන්තුවේ අවසරය ලබා නොදෙන ලදුව, විසි දෙනෙකුට නොඅඩු මන්ත්‍රීවරයන් සංඛ්‍යාවක් ස්වකීය ස්ථානවල සිට ඒ මන්ත්‍රීවරයාගේ ඉල්ලීමට අනුග්‍රහ දැක්වීමට නැඟී සිටිත් නම්;

මිස (1) වැනි ඡේදය යටතේ එවැනි යෝජනාවක් මන්ත්‍රීවරයකු විසින් ඉදිරිපත් කරනු නොලැබිය යුත්තේ ය:

එසේ වුව ද, කථානායකවරයා, ස්වකීය එකඟත්වය දීම ප්‍රතික්ෂේප කළහොත් හෝ සාකච්ඡා කිරීමට යෝජනා කර තිබෙන කාරණය රීති විරෝධී යැයි කථානායකවරයා විසින් අදහස් කරන්නේ නම්, යෝජනාව හෝ කථානායකවරයා විසින් අනුමත කරනු ලැබූ ඉන් කොටසක් හෝ පිළිබඳ දැනුම් දීම කියවීමට ප්‍රශ්නය මතුකරන මන්ත්‍රීවරයාට ඉඩ දෙනු ලැබිය හැකි ය. ඉක්බිතිවම, ස්වකීය එකඟත්වය දීම ප්‍රතික්ෂේප කිරීමට හෝ එම යෝජනාව රීති විරෝධී වෙතැයි තීරණය කිරීමට හෝ හේතු වූ කාරණා කථානායකවරයා විසින් ප්‍රකාශ කරනු ලැබිය යුත්තේ ය.

(3) යෝජනාවට එසේ අනුග්‍රහය ලැබේ නම් නැතහොත් පාර්ලිමේන්තුව විසින් අවසර දෙනු ලබන්නේ නම්, එම යෝජනාව පිළිබඳව අ.භා. 3.30 ට පාර්ලිමේන්තුව විසින් ක්‍රියා කරනු ලැබිය යුත්තේ ය.

(4) කවර හෝ එක් දිනකදී එවැනි යෝජනා එකකට වැඩි ගණනක් සඳහා අවසර ඉල්ලනු නොලැබිය යුත්තේ ය.

(5) ආණ්ඩුවේ වැඩකටයුතු මුඛ්‍යස්ථානය ගන්නා දිනවල දී මේ නියෝගයෙහි විධිවිධාන යටතේ ඉදිරිපත් කරනු ලබන යෝජනාවක් හැර, පාර්ලිමේන්තුව කල් තැබීමේ යෝජනාවක් අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයකු විසින් ඉදිරිපත් කරනු ලැබුවහොත් මිස, ඒ දිනට නියමිත වැඩකටයුතු අතරතුරෙහි දී අ.භා. 4.30 ට පෙර එවැනි යෝජනාවක් ඉදිරිපත් කරනු නොලැබිය යුත්තේ ය.

4. දැනට පවත්නා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 50 ඉවත් කර ඒ වෙනුවට මතු සඳහන් නව ස්ථාවර නියෝගය ආදේශ කිරීමට:-

50 (1) යම් අමාත්‍යවරයකු විසින්, දැනුම් දීමෙන් අනතුරුව පනත් කෙටුම්පතක් හඳුන්වා දීම සඳහා පාර්ලිමේන්තුවේ නියෝගයක් නොමැතිව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 78 වැනි ව්‍යවස්ථාවේ විධිවිධානයන්ට යටත්ව පනත් කෙටුම්පතක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය. ප්‍රධාන කටයුතු ආරම්භයේ දී පනත් කෙටුම්පතක් එසේ ඉදිරිපත් කරනු ලැබූ විට මහ ලේකම්වරයා විසින් පනත් කෙටුම්පතේ නාමය කියවනු ලැබිය යුතු අතර, එවිට, පනත් කෙටුම්පත පළමුවැනි වර කියවන ලදුව එය මුද්‍රණය කරනු ලැබිය යුතු බවට නියෝග කරන ලද සේ සලකා එය ඉදිරිපත් කරන ලද දිනයේ සිට සතියක් ඇතුළත නොවන දිනයක් එහි දෙවැනි වර කියවීම සඳහා නියම කිරීම ද කරනු ලැබිය යුත්තේ ය:

එසේ වුව ද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 122 ව්‍යවස්ථාවේ සඳහන් හදිසි පනත් කෙටුම්පතක් අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයා හෝ නියෝජ්‍ය අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන දිනයක එහි දෙවැනි වර කියවීම සඳහා නියම කරනු ලැබිය යුත්තේ ය.

(2) එවැනි සෑම පනත් කෙටුම්පතක්ම පළමුවැනි වර කියවීම නිම වූ වහාම යෝජනාවක් නොමැතිව අදාළ ආංශික

[ගරු ප්‍රසන්න රණතුංග මහතා]

අධීක්ෂණ කාරක සභාවට යොමු කරනු ලැබිය යුත්තේ ය. කාරක සභාව විසින් පනත් කෙටුම්පතට සංශෝධන යෝජනා කරනු ලැබිය හැකිය. කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ආපසු වාර්තා කරන තෙක් හෝ පාර්ලිමේන්තුව විසින් එසේ වාර්තා කිරීමට ලබා දී ඇති කාලය ඉකුත් වන තෙක් පාර්ලිමේන්තුව විසින් ඒ පිළිබඳව කිසිදු පියවරක් ගනු නොලැබිය යුත්තේ ය.

(3) අමාත්‍ය මණ්ඩලයේ අදහස අනුව ජාතික ආරක්ෂාව තහවුරු කිරීම සඳහා හෝ ආපදා කළමනාකරණයට අදාළ යම් කාරණයක කාර්යය සඳහා වහා අවශ්‍ය වන්නා වූ ද, ඒ බවට අමාත්‍ය මණ්ඩලයේ ලේකම්වරයාගේ අත්සන ඇති සටහනක් දරන්නා වූ ද, පනත් කෙටුම්පතකට අදාළව ජනාධිපතිවරයා විසින් අග්‍රවිනිශ්චයකාරවරයා අමතා යවන ලද යොමු කිරීමක පිටපතක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 122 (1) ව්‍යවස්ථාව ප්‍රකාරව කථානායකවරයා වෙත ලැබී ඇති අවස්ථාවක, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 122(1)(ඇ) ව්‍යවස්ථාව මඟින් විධිවිධාන සලසා ඇති පරිදි කථානායකවරයාට ශ්‍රේෂ්ඨාධිකරණය වෙතින් එහි තීරණය ලැබෙන තුරු එකී පනත් කෙටුම්පත න්‍යාය පත්‍රයට ඇතුළත් නොකළ යුත්තේ ය.

5. දැනට පවත්නා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 52 ඉවත් කර ඒ වෙනුවට මතු සඳහන් නව ස්ථාවර නියෝගය ආදේශ කිරීමට:-

52. (1) පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමට අදහස් කරනු ලබන යම් පෞද්ගලික මන්ත්‍රීවරයකු විසින් එම පනත් කෙටුම්පතේ අරමුණ සහ එහි මුඛ්‍යාංගයන් සඳහන් කරමින් එය ඉදිරිපත් කිරීමට පාර්ලිමේන්තුවේ අවසරය ඉල්ලා සිටිනු ලැබිය යුත්තේ ය.

(2) එවැනි සෑම ඉල්ලීමක් ම යෝජනාවක් ආකාරයෙන් ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, එම ඉල්ලීම කරනු ලබන මන්ත්‍රීවරයා විසින්, යෝජිත පනත් කෙටුම්පතේ සිංහල හා දෙමළ භාෂා පිටපත් ඉංග්‍රීසි අනුවාදයක් ද සිය යෝජනාවේ පිටපතක් ද සමඟ මහ ලේකම්වරයාට භාර දෙනු ලැබිය යුත්තේ ය.

(3) පනත් කෙටුම්පත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනනුකූල ද යන්නත්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහතුන්වැනි සංශෝධනයට අදාළව යම් බාධාවක් තිබේ ද යන්නත්, පිළිබඳව නීතිපතිවරයාගේ මතය විමසා පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා විසින් එම පනත් කෙටුම්පත නීතිපතිවරයා වෙත යොමු කරනු ලැබිය යුත්තේ ය. නීතිපතිවරයා විසින් සිය නිරීක්ෂණ සති හයක කාලසීමාවක් ඇතුළත දී පාර්ලිමේන්තුවට දැනුම් දෙනු ලැබිය යුත්තේ ය.

(4) නීතිපතිවරයාගේ මතය ලැබීමෙන් අනතුරුව මහ ලේකම්වරයා විසින් එම පනත් කෙටුම්පත එහි ඉංග්‍රීසි අනුවාදය ද සමඟ සිංහල සහ දෙමළ භාෂාවලින් ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමට සලස්වනු ලැබිය යුත්තේ ය.

(5) පනත් කෙටුම්පත ගැසට් පත්‍රයේ පළ වූ දින සිට දින හතක කාලයක් ඉකුත් වීමෙන් අනතුරුව කවර හෝ වේලාවක ඉහත (2) වැනි ඡේදයේ දක්වා ඇති යෝජනාව පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයෙහි ඇතුළත් කරනු ලැබිය යුත්තේය.

(6) ප්‍රශ්නය සභාභිමුඛ කරනු ලැබ සභාව විසින් සම්මත කරනු ලැබීමෙන් අවසරය දෙන ලදුව හෝ සභාව විසින් අවසරය ලබා නොදුන් අවස්ථාවක දී, එහෙත් මන්ත්‍රීවරයාට සභාය පළ කිරීමට විස්සකට නොඅඩු මන්ත්‍රීවරයන් සංඛ්‍යාවක් සිය අසුන්වලින් නැඟී සිටින අවස්ථාවක දී, පනත් කෙටුම්පත පළමුවැනි වර කියවන ලද සේ සලකා මුද්‍රණය කිරීමට නියෝග කරනු ලැබූ පසු සාකච්ඡාවකින් තොරව එය අදාළ වන විෂයය හා කාර්යය භාර අමාත්‍යවරයාට හෝ නියෝජ්‍ය අමාත්‍යවරයාට හෝ එවැනි අමාත්‍යවරයකු හෝ නියෝජ්‍ය අමාත්‍යවරයකු හෝ නොමැති නම් කථානායකවරයා විසින් නම් කරනු ලබන අමාත්‍යවරයකු හෝ නියෝජ්‍ය අමාත්‍යවරයකු හෝ වෙත එය යොමු කරනු ලැබිය යුත්තේ ය. පනත් කෙටුම්පත යොමු කරනු ලැබූ අමාත්‍යවරයා හෝ නියෝජ්‍ය අමාත්‍යවරයා හෝ ඒ පිළිබඳව පාර්ලිමේන්තුවට වාර්තා කරනු ලබන තෙක් පනත් කෙටුම්පත සම්බන්ධයෙන් කිසිදු ඉදිරි පියවරක් ගනු නොලැබිය යුත්තේ ය.

(7) ඉහත (6) වැනි ඡේදයේ දක්වා ඇති වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබීමෙන් අනතුරුව හෝ පනත් කෙටුම්පත අමාත්‍යවරයාට හෝ නියෝජ්‍ය අමාත්‍යවරයාට හෝ යොමු කරන ලද දින සිට එම අමාත්‍යවරයා හෝ නියෝජ්‍ය අමාත්‍යවරයා විසින් වාර්තාවක් ඉදිරිපත් නොකර මාස හයක් ඉකුත් වීමෙන් අනතුරුව එම පනත් කෙටුම්පත භාර මන්ත්‍රීවරයා රිසි දිනයක එය දෙවැනි වර කියවීම සඳහා පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයෙහි ඇතුළත් කරනු ලැබිය යුත්තේ ය.

**6. දැනට පවත්නා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 54 ඉවත් කර ඒ වෙනුවට මතු සඳහන් නව ස්ථාවර නියෝගය ආදේශ කිරීමට:-**

54. පෞද්ගලික අයිතිවාසිකම් හෝ බැඳියාවන් කෙරෙහි යම් පනත් කෙටුම්පතක් මඟින් විශේෂ බලපෑමක් ඇති වන යම් අවස්ථාවක දී, එසේ බලපෑමට ලක්වන යම් පාර්ශ්වයක් විසින් එම පනත් කෙටුම්පත පවරනු ලැබ ඇති යෝග්‍ය ආංශික අධීක්ෂණ කාරක සභාවකට හෝ ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවට පෙත්සම් ඉදිරිපත් කරනු ලැබුවහොත්, එවිට එම අයට ඒ කාරක සභා ඉදිරියෙහි පෞද්ගලිකව හෝ නීතිඥයකු මාර්ගයෙන් පෙනී සිට කරුණු ඉදිරිපත් කරනු ලැබීමට හැකි ය.

**7. දැනට පවත්නා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 55 ඉවත් කර ඒ වෙනුවට මතු සඳහන් නව ස්ථාවර නියෝගය ආදේශ කිරීමට:-**

55. (1) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 122 ව්‍යවස්ථාව යටතේ පනත් කෙටුම්පතක් හැර, වෙනත් පනත් කෙටුම්පතක් එය ඉදිරිපත් කරන ලද දිනයේ සිට සතියකට කලින් නොවන යම් දිනයක දෙවැනි වර කියවීම සඳහා නියම කරනු ලැබිය යුත්තේ ය.

(2) යම් පනත් කෙටුම්පතක් හෝ එහි යම් විධිවිධානයක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනනුකූල වන්නේ ද යන්න නිශ්චය කිරීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121 වැනි ව්‍යවස්ථාව යටතේ ශ්‍රේෂ්ඨාධිකරණයේ අධිකරණ බලය ක්‍රියාත්මක කරනු ලැබ, එහි පිටපතක් කථානායකවරයාට භාර දෙනු ලැබ ඇති අවස්ථාවක දී :-

(අ) එම යොමු කරනු ලැබීම හෝ පෙත්සමක් ඉදිරිපත් කරනු ලැබීම එසේ යොමු කරනු ලැබීම හෝ පෙත්සම ඉදිරිපත් කරනු ලැබීමෙන් අනතුරුව පැවැත්වෙන ප්‍රථම පාර්ලිමේන්තු රැස්වීම් දිනයේ දී කථානායකවරයා විසින් ඒ සම්බන්ධව පාර්ලිමේන්තුවට දැන්වීමක් කරනු ලැබිය යුත්තේ ය;

(ආ) එම පනත් කෙටුම්පත පිළිබඳ තීරණය ශ්‍රේෂ්ඨාධිකරණය විසින් කථානායකවරයාට දන්වනු ලබන තෙක් හෝ එම යොමු කරනු ලැබීම හෝ පෙත්සම ඉදිරිපත් කරනු ලැබීම කළ දිනයේ සිට සති තුනක කාලයක් ඉකුත් වන තෙක් හෝ යන මේ දෙකෙන් පළමුව එළැඹෙන අවස්ථාව තෙක් එවැනි පනත් කෙටුම්පතක් සම්බන්ධයෙන් කිසිදු පියවරක් ගනු නොලැබිය යුත්තේ ය;

(ඇ) ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය ලැබීමෙන් අනතුරුව, කථානායකවරයා විසින් එකී තීරණය පාර්ලිමේන්තුවට නිවේදනය කරනු ලැබිය යුතු අතර, එම නිවේදනය සම්බන්ධයෙන් කිසිදු විවාදයකට අවසර දෙනු නොලැබිය යුත්තේ ය.

**8. දැනට පවත්නා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 57 ඉවත් කර ඒ වෙනුවට මතු සඳහන් නව ස්ථාවර නියෝගය ආදේශ කිරීමට:-**

57. අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයකු, අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයකු නොවන අමාත්‍යවරයකු හෝ නියෝජ්‍ය අමාත්‍යවරයකු විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනාවකින් අනතුරුව පනත් කෙටුම්පතක් දෙවැනි වර කියවා ඇති අවස්ථාවක දී, එම පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට යොමු කරනු ලැබිය යුත්තේ ය:

එසේ වුව ද, අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයකු, අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයකු නොවන අමාත්‍යවරයකු හෝ නියෝජ්‍ය අමාත්‍යවරයකු විසින් යෝජනාවක් ඉදිරිපත් කරනු ලැබීමේ දී පාර්ලිමේන්තුව විසින් එසේ තීරණය කරනු ලැබුවහොත් වාර්ෂික හෝ පරිපූරක විසර්ජන පනත් කෙටුම්පතක් හැර, වෙනත් යම් පනත් කෙටුම්පතක් කථානායකවරයා විසින් නම් කරනු ලබන විශේෂ කාරක සභාවකට හෝ ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවට යොමු කරනු ලැබිය හැකි ය.

**9.** **දැනට පවත්නා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 58 ඉවත් කර ඒ වෙනුවට මතු සඳහන් නව ස්ථාවර නියෝගය ආදේශ කිරීමට:-**

58. පනත් කෙටුම්පතක් විශේෂ කාරක සභාවකට හෝ ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවට යොමු කරනු ලැබූ අවස්ථාවක දී, එම කාරක සභාව විසින් ඒ පනත් කෙටුම්පත සම්බන්ධයෙන් වාර්තා කරන තෙක් ඒ පිළිබඳව කිසිම ඉදිරි පියවරක් ගනු නොලැබිය යුත්තේ ය.

**10.** **දැනට පවත්නා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 68 ඉවත් කර ඒ වෙනුවට මතු සඳහන් නව ස්ථාවර නියෝගය ආදේශ කිරීමට:-**

68. පනත් කෙටුම්පතක් යොමු කරනු ලැබ ඇති ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාව හෝ විශේෂ කාරක සභාව හෝ විසින් සිය නිර්දේශ සඳහන් වාර්තාවක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, එම වාර්තාවේ පිටපතක් සෑම මන්ත්‍රීවරයකුට ම බෙදා දෙනු ලැබිය යුත්තේ ය.

**11.** **දැනට පවත්නා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 70 ඉවත් කර ඒ වෙනුවට මතු සඳහන් නව ස්ථාවර නියෝගය ආදේශ කිරීමට:-**

70. පනත් කෙටුම්පතක් පිළිබඳ ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවේ හෝ විශේෂ කාරක සභාවේ වාර්තාව සභාපතිවරයා විසින් ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, පාර්ලිමේන්තුව නියම කරනු ලබන දිනක දී සලකා බැලීම සඳහා කටයුතු කරනු ලැබිය යුත්තේය. ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවේ හෝ විශේෂ කාරක සභාවක හෝ වාර්තාව සලකා බැලීමෙන් අනතුරුව පාර්ලිමේන්තුව විසින් සලකා බැලිය යුත්තේ කාරක සභාව විසින් කරන ලද සංශෝධන ඇතොත් එපමණය. එහෙත් එම සංශෝධන තවදුරටත් සංශෝධනය කරනු ලැබිය හැකි ය. එම වාර්තාව සලකා බලනු ලැබීමෙන් අනතුරුව පාර්ලිමේන්තුව විසින් පිළිගන්නා ලද කාරක සභා සංශෝධනවලට ආනුෂංගික වන්නා වූ සංශෝධන හැර කිසිම අලුත් සංශෝධනයක් පාර්ලිමේන්තුව විසින් කරනු නොලැබිය යුත්තේ ය. එහෙත් එම කාරක සභාව විසින් කරන ලද සංශෝධන සම්බන්ධයෙන් පනත් කෙටුම්පත නැවතත් එම කාරක සභාවටම යොමු කරනු ලැබිය හැකි ය.

**12.** **දැනට පවත්නා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 72 ඉවත් කර ඒ වෙනුවට මතු සඳහන් නව ස්ථාවර නියෝගය ආදේශ කිරීමට:-**

72. (1) පනත් කෙටුම්පතක් සංශෝධන රහිතව ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාව හෝ විශේෂ කාරක සභාවක් විසින් පාර්ලිමේන්තුවට වාර්තා කරනු ලැබ ඇති විට, එය සලකා බැලීමට නියම කරන ලද දිනයේ දී වහා ම තුන්වැනි වර කියවා සම්මත කරනු ලැබිය හැකි ය; නැතහොත්, පාර්ලිමේන්තුව විසින් එසේ විධාන කරනු ලබන්නේ නම්, තුන්වැනි වර කියවීම කල් දමනු ලැබිය හැකි ය.

(2) පනත් කෙටුම්පත ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාව හෝ විශේෂ කාරක සභාවක් හෝ විසින් සංශෝධනය කර තිබේ නම්, කාරක සභාව මඟින් කරන ලද සංශෝධන පාර්ලිමේන්තුව විසින් සලකා බැලීම අවසන් කළ වහාම පනත් කෙටුම්පත තුන්වැනි වර කියවා සම්මත කරනු ලැබිය හැකි ය, නැතහොත්, පාර්ලිමේන්තුව විසින් එසේ විධාන කරනු ලබන්නේ නම්, තුන්වැනි වර කියවීම කල් දමනු ලැබිය හැකි ය.

**13.** **දැනට පවත්නා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 111 ඉවත් කර ඒ වෙනුවට මතු සඳහන් නව ස්ථාවර නියෝගය ආදේශ කිරීමට:-**

111. (1) තේරීම් කාරක සභාව විසින් නිශ්චය කරනු ලබන විෂයයන් සහ කාර්යයන් පැවරෙන ආංශික අධීක්ෂණ කාරක සභා විස්සකට නොවැඩි සංඛ්‍යාවක් තිබිය යුත්තේ ය.

(2) ආංශික අධීක්ෂණ කාරක සභා පාර්ලිමේන්තුවේ කාලය තුළ දී ක්‍රියාත්මක විය යුතු අතර, පාර්ලිමේන්තුවේ යම් කල් තැබීමක් හෝ වාරාවසාන කිරීමක් නොසලකා එහි විමර්ශන කටයුතු පවත්වාගෙන යනු ලැබිය යුත්තේ ය.

(3) ආංශික අධීක්ෂණ කාරක සභාවලට, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 152 ව්‍යවස්ථාවේ දක්වා ඇති පනත් කෙටුම්පත් හැර කාරක සභාවට යොමු කරනු ලබන වෙනත් යම් පනත් කෙටුම්පතක්, ගිවිසුමක්, කාරක සභාවේ විෂය පථයට යටත් වන ආයතනවල වාර්ෂික වාර්තා සහ කාර්යසාධන වාර්තා ඇතුළත්ව පාර්ලිමේන්තුව විසින් කාරක සභාව වෙත යොමුකරන ලද වාර්තාවක් හෝ කාරණාවක් හෝ යම් කාරක සභාවක් හෝ අමාත්‍යවරයෙකු හෝ විසින් එහි අධිකාර බල සීමාව තුළ ඇති විෂයයන් සහ කාර්යයන්ට අදාළ වෙනත් යම් කාරණයක් විභාග කිරීමට බලය තිබිය යුත්තේ ය.

(4) ඕනෑම අවස්ථාවක දී, ආංශික අධීක්ෂණ කාරක සභාවලට සිය වගකීම් ක්‍රියාත්මක කිරීමේ දී අවශ්‍ය හෝ යෝග්‍ය විය හැකි යැයි එම කාරක සභා විසින් සලකනු ලබන එවැනි විමසීම් සහ විමර්ශන සිදු කරනු ලැබිය හැකි ය.

(5) එක් එක් ආංශික අධීක්ෂණ කාරක සභාව සෑම මාසයකම දින දෙකකට නොඅඩු දින ගණනක් රැස්විය යුත්තේ ය.

(6) ආංශික අධීක්ෂණ කාරක සභාවලට පාර්ලිමේන්තුවේ මතු සඳහන් කාර්යයන් සඳහා පාර්ලිමේන්තුවට සහාය වීම පිණිස පොදු අධීක්ෂණ වගකීම් තිබිය යුත්තේ ය:-

(අ) රජයේ පවතින ප්‍රතිපත්ති අදාළ කර ගැනීම, පරිපාලනය, ක්‍රියාත්මක කිරීම සහ ඒවායෙහි සඵලත්වය පිළිබඳ විශ්ලේෂණය කිරීම, තක්සේරු කිරීම සහ ඇගයීම;

(ආ) විකල්ප ප්‍රතිපත්ති සම්පාදනය කිරීම පිණිස අනාගත පර්යේෂණ සහ පුරෝකථන සඳහා වන ක්‍රියාකාරකම්;

(ඇ) පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලබන නීති සහ යම් නව හෝ අතිරේක නීතියක් පැනවීමේ අවශ්‍යතාව හෝ යෝග්‍යතාව පෙන්නුම් කරනු ලැබිය හැකි තත්ත්වයන් සහ වාතාවරණයන් අදාළ කර ගැනීම, පරිපාලනය, ක්‍රියාත්මක කිරීම සහ ඒවායෙහි සඵලත්වය පිළිබඳ විශ්ලේෂණය කිරීම, තක්සේරු කිරීම සහ ඇගයීම; සහ

(ඈ) යම් නීතියක් සහ අවශ්‍ය හෝ යෝග්‍ය විය හැකි එවැනි යම් අතිරේක නීතියක් සම්පාදනය කිරීම, සලකා බැලීම, පැනවීම හෝ සංශෝධන සිදු කිරීම.

(7) එක් එක් ආංශික අධීක්ෂණ කාරක සභාවට තම අධිකාර බලසීමාව තුළ ඇති ඕනෑම ආයතනයකට කිසියම් තනතුරකට පත් කර ඇති හෝ ඕනෑම තනතුරක නිලතල දැරීමට නම් කර ඇති ඕනෑම තැනැත්තෙකුගේ යෝග්‍යතාවය පරීක්ෂා කර බලා එම පුද්ගලයන් සම්බන්ධයෙන් අදාළ අමාත්‍යාංශයට නිර්දේශ ඉදිරිපත් කළ හැකි ය.

(8) මතු සඳහන් තැනැත්තන් හැර, පාර්ලිමේන්තුවේ සෑම මන්ත්‍රීවරයකුම යම් ආංශික අධීක්ෂණ කාරක සභාවක සාමාජික මන්ත්‍රීවරයන් ලෙස සේවය කිරීමට සුදුසුකම් ලැබිය යුත්තේ ය:-

(අ) කථානායකවරයා;

(ආ) නියෝජ්‍ය කථානායකවරයා;

(ඇ) නියෝජ්‍ය කාරක සභා සභාපතිවරයා;

(ඈ) අග්‍රාමාත්‍යවරයා;

(ඉ) පාර්ලිමේන්තුවේ සභානායකවරයා;

(ඊ) පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකවරයා; සහ

(උ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 43 (1) ව්‍යවස්ථාව යටතේ පත්කරනු ලබන අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයන්.

(9) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 45 (1) ව්‍යවස්ථාව යටතේ පත්කරනු ලබන අමාත්‍යවරයන් සහ නියෝජ්‍ය අමාත්‍යවරයන් කටයුතු කරනුයේ කවර අමාත්‍ය මණ්ඩල අමාත්‍යවරයකුගේ විෂය පථය යටතට ගැනෙන යම් විෂයයක්, කාර්යයක්, දෙපාර්තමේන්තුවක් හෝ ආයතනයක ද, ඒ හා සමාන අධිකාර බලයක් සහ අදාළ කාර්යය සහිත ආංශික අධීක්ෂණ කාරක සභාවක සේවය කිරීම සඳහා සුදුසුකම් නොලැබිය යුත්තේ ය:

[ගරු ප්‍රසන්න රණතුංග මහතා]

එසේ වුවද, පනත් කෙටුම්පතක් ආංශික අධීක්ෂණ කාරක සභාවක සාකච්ඡාවට භාජනය කරනු ලබන අවස්ථාවක දී, විෂය භාර අමාත්‍යවරයා හෝ අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයකු නොවන අමාත්‍යවරයා හෝ නියෝජ්‍ය අමාත්‍යවරයා හෝ එම කාරක සභාවට සහාය වීම පිණිස කැඳවනු ලැබිය හැකි ය.

(10) තේරීම් කාරක සභාව විසින්, ආංශික අධීක්ෂණ කාරක සභාවට සභික මන්ත්‍රීවරයන් නම් කිරීමේ දී පාර්ලිමේන්තුව නියෝජනය කරනු ලබන දේශපාලන පක්ෂවල හා ස්වාධීන කණ්ඩායම්වල නායකයන් විසින් කරනු ලබන නාමයෝජනාවලට අනුකූලව එම දේශපාලන පක්ෂ සහ ස්වාධීන කණ්ඩායම්වල මන්ත්‍රීවරයන් සංඛ්‍යාවට නිසි සැලකිල්ල දක්වමින් කටයුතු කරනු ලැබිය යුත්තේ ය.

(11) අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාවක සාමාජික මන්ත්‍රීවරයකු නොවන යම්කිසි පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු විසින් එවැනි කාරක සභාවක කටයුතු නිරීක්ෂණය කරනු ලැබීමට එම කාරක සභාවේ සභාපතිවරයා විසින් අවසර දෙනු ලැබිය හැකි ය.

(12) එක් එක් ආංශික අධීක්ෂණ කාරක සභාව, සිය පළමුවැනි රැස්වීමේ දී සහ ඉන් අනතුරුව එහි සභාපති ධුරය පුරප්පාඩු වීමෙන් අනතුරුව පවත්වනු ලබන පළමුවැනි රැස්වීමේ දී ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභික මන්ත්‍රීවරයන් අතුරින් සභාපතිවරයකු තෝරා පත්කර ගනු ලැබිය යුත්තේ ය.

(13) යම් ආංශික අධීක්ෂණ කාරක සභාවකින් පූර්ව අවසර ලබා නොගෙන එහි අනුගාමී රැස්වීම් තුනකට නොපැමිණෙන යම් සාමාජික මන්ත්‍රීවරයකු එම කාරක සභාවේ සාමාජිකත්වය අත්හැර ගියාසේ සලකනු ලැබිය යුත්තේ ය.

(14) එක් එක් ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් අවශ්‍ය යැයි සලකනු ලබන අවස්ථාවක දී, එම කාරක සභාව විසින් අවශ්‍ය යැයි සලකනු ලැබිය හැකි යම් කාරණා විභාග කොට එම කාරක සභාවට වාර්තා කරනු ලැබීම සඳහා, එම කාරක සභාවේ සාමාජිකයන්ගෙන් සැදුම්ලත් අනු කාරක සභා පත්කරනු ලැබිය හැකි ය.

(15) පාර්ලිමේන්තුව විසින් අන්‍යාකාරයෙන් විධානය කරනු ලබන්නේ නම් මිස, යම් කාරණයක් ආංශික අධීක්ෂණ කාරක සභාවකට යොමු කිරීමේ දින සිට සති හයක් ඉකුත් වන තෙක්, පාර්ලිමේන්තුව විසින් එම කාරණය සලකා බලනු නොලැබිය යුත්තේ ය. පාර්ලිමේන්තුව විසින් යෝජනා සම්මතයක් මඟින් ඉහත කී කාල සීමාව නිර්ණය කරනු ලැබිය හැකි ය.

(16) සෑම ආංශික අධීක්ෂණ කාරක සභාවක් ම යම් පනත් කෙටුම්පතක් හෝ පොදු වැදගත්කමකින් යුක්ත වෙනත් යම් කාරණයක් සම්බන්ධයෙන් බලපෑමට ලක්ව සිටින හෝ යම් බැඳියාවක් ඇති පාර්ශ්වයකින් සාක්ෂි කැඳවනු ලැබිය හැකි ය.

(17) සෑම ආංශික අධීක්ෂණ කාරක සභාවකට ම තැනැත්තන් කැඳවනු ලැබීමට සහ ලිපි ලේඛන හා වාර්තා ගෙන්වා ගනු ලැබීමට බලය තිබිය යුතු අතර ම, එම කාරක සභාව ඉදිරියේ විමසනු ලබන සාක්ෂිවල කාර්ය සටහන් ද සමඟ සිය මත සහ නිරීක්ෂණ අඩංගු වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබිය යුත්තේ ය.

(18) නීති පැනවීමට හෝ ව්‍යවස්ථාමය නොවන වාර්තාවක් ඉදිරිපත් කිරීම සඳහා ආංශික අධීක්ෂණ කාරක සභාවක් කටයුතු කරනු ලබන අවස්ථාවක දී, අදාළ විෂය පවරනු ලබන සහ අමාත්‍ය වගකීම් දරන කැබිනට් අමාත්‍යවරයා සහ එලෙස පවරා නොමැති අවස්ථාවක අග්‍රාමාත්‍යවරයා විසින් වාර්තාවේ දක්වා ඇති නිර්දේශ සති අටක කාලයක් ඇතුළත ඉටු කළ යුතු අතර, එම නිරීක්ෂණ සම්බන්ධව තමා විසින් ගැනීමට යෝජනා කරන ක්‍රියාමාර්ග පිළිබඳ ප්‍රකාශයක් ද ඉදිරිපත් කළ යුතු ය. නිරීක්ෂණ හෝ නිශ්චිත නිර්දේශ ඉටු කළ නොහැකි යැයි අමාත්‍යවරයාගේ මතය වන්නේ නම්, ඊට අමාත්‍යවරයාගේ හේතු ලිඛිතව පැහැදිලි කළ යුතු අතර අමාත්‍යවරයා විසින් යෝජනා කරන විකල්ප ක්‍රියාමාර්ග සඳහන් කළ යුතු ය. කාරක සභාවට අවශ්‍ය වන්නේ නම් අදාළ අමාත්‍යවරයාට කරුණු පැහැදිලි කිරීම සඳහා කාරක සභාවට පෞද්ගලිකව පැමිණීමට ආරාධනාවක් කළ හැකි අතර, එවැනි කාරණා වලින් පැන නඟින ප්‍රශ්න වලට සති අටක් ඇතුළත පිළිතුරු සැපයිය යුතු ය.

(19) (අ) කාරක සභාව ඉදිරියේ පවතින එක් එක් කරුණු විමසීම් සම්බන්ධයෙන් වයස අවුරුදු 18 සහ 35 අතර වූ තරුණ නියෝජිතයන් පස්දෙනෙකු (5) ට නොවැඩි පිරිසක් කාරක සභාවට සහාය වීම සඳහා සභාපතිවරයාට කැඳවිය හැකි ය.

(ආ) එසේ කැඳවනු ලබන තරුණ නියෝජිතයන්ට සභාපතිවරයාගේ අවසරය ඇතිව කාරක සභාව ඉදිරියේ ඇති ලේඛන පරීක්ෂා කිරීමට සහ සාක්ෂිකරුවන්ගෙන් ප්‍රශ්න කිරීමට අවස්ථාව ලබා දිය හැකි ය:

එසේ වුවද, එකී තරුණ නියෝජිතයන්ට කාරක සභාවේ දී ඡන්දය ප්‍රකාශ කළ නොහැකි ය.

(ඇ) කාරක සභාව විසින් ගනු ලබන ඕනෑම තීරණයකට යටත්ව, තරුණ නියෝජිතයින්ගේ අදහස්, නිරීක්ෂණ සහ මතයන් කමිටු වාර්තාවට අතිරේකයක් වශයෙන් ඇතුළත් කිරීමට සභාපතිවරයාට අවසර දිය හැකි ය.

(ඈ) තේරීම් කාරක සභාව විසින් නියම කරන ලද මාර්ගෝපදේශ මත තරුණ නියෝජනය සඳහා තෝරා ගැනීමේ නිර්ණායක තීරණය කරනු ලැබිය යුතු ය.

**14. දැනට පවත්නා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 112 ඉවත් කර ඒ වෙනුවට මතු සඳහන් නව ස්ථාවර නියෝගය ආදේශ කිරීමට:-**

112. (1) පාර්ලිමේන්තුවේ එක් එක් සභා වාරය ආරම්භයේදීම සහ අවශ්‍යතා මතු වන අයුරින් කලින් කලට තේරීම් කාරක සභාව විසින් පහත සඳහන් සාමාජික මන්ත්‍රීවරයන්ගෙන් සැදුම්ලත්, අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යාංශ සංඛ්‍යාවට සමාන වන්නා වූ "අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා" සංඛ්‍යාවක් පත් කළ යුත්තේ ය:-

(අ) සභාපතිවරයා ලෙස අමාත්‍ය මණ්ඩලයේ අදාළ විෂය භාර අමාත්‍යවරයා;

(ආ) රාජ්‍ය අමාත්‍යවරයා;

(ඇ) නියෝජ්‍ය අමාත්‍යවරයා; සහ

(ඈ) තේරීම් කාරක සභාව විසින් නම් කරන ලද වෙනත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් පස් දෙනෙක්.

(2) අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවකින් තම අත්සන යටතේ වූ ඉල්ලීමක් මඟින් පූර්ව අවසරය ලබා නොගෙන ඒ කාරක සභාවේ අනුගාමී රැස්වීම් වාර තුනකට සහභාගි නොවන යම් සාමාජික මන්ත්‍රීවරයකු ඒ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ සිය සාමාජිකත්වය අතහැර ගියා සේ සලකනු ලැබිය යුතු අතර තේරීම් කාරක සභාවේ එකඟතාවය මත හැර ඒ සාමාජිකයා ඒ සභාවාරය තුළ නැවත ඒ කාරක සභාවට පත් නොකළ යුත්තේ ය:

එසේ වුව ද, ඒ සාමාජික මන්ත්‍රීවරයා පාර්ලිමේන්තුවෙන් නොපැමිණීමේ අවසරය ප්‍රථමයෙන් ලබාගෙන පාර්ලිමේන්තු රැස්වීම්වලට නොපැමිණෙන කාලසීමාවක් තුළ යෙදෙන දිනයකදී ඒ කාරක සභාවක යම් රැස්වීමක් පවත්වනු ලබන්නේ නම්, ඉහත කී විධිවිධාන අදාළ නොවිය යුත්තේ ය.

(3) ඕනෑම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුට තමා සාමාජිකයකු නොවන අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවක රැස්වීම්වලට ඒ කාරක සභාවේ සභාපතිවරයාගේ අවසරය පරිදි සහභාගි වීමට අවකාශ ඇති අතර සභාපතිවරයා විසින් ඉල්ලා සිටිනු ලබන අවස්ථාවකදී ඒ මන්ත්‍රීවරයා ඉන් ඉවත් විය යුත්තේ ය.

(4) ඕනෑම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු විසින් කාරක සභාවට යොමු කරනු ලබන කාරණා සලකා බැලීම සහ සභාපතිවරයා හෝ පාර්ලිමේන්තුව විසින් කාරක සභාවට යොමු කරනු ලබන යෝජනා, නියෝග හෝ ලේඛන ඇතුළුව කවර හෝ කරුණු පිළිබඳ විමසා බලා ඒ සම්බන්ධයෙන් වාර්තා කිරීම අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවක කාර්යය විය යුත්තේ ය.

(5) (අ) කාරක සභා රැස්වීම් කැඳවීම අදාළ අමාත්‍යාංශයේ ලේකම්වරයා සමඟ සාකච්ඡා කර සිදු කළ යුත්තේය.

(ආ) පනත් කෙටුම්පතක් හෝ යෝජනාවක් අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ සභාපතිවරයා මඟින් කාර්යාරම්භ කිරීමේ බලය අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවකට තිබිය යුත්තේ ය.

(6) සභාපතිවරයා විසින් කැඳවනු ලබන කවර හෝ අවස්ථාවක එක් එක් අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව රැස්විය යුත්තේ ය. සභාපතිවරයා සහ පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා සමඟ සාකච්ඡා කර සභාපතිවරයා විසින් යටත් පිරිසෙයින් මාසයකට වරක් හෝ රැස්වීමක් කැඳවා අර්ථවත් වැඩසටහනක් සකස් කරන බවට වගබලා ගැනීම, සෑම අමාත්‍යාංශ ලේකම්වරයකුගේම කාර්යය වන අතර කලින් කලට එහි නිර්දේශ පාර්ලිමේන්තුවට වාර්තා කළ යුත්තේය:

එසේ වුව ද, එබඳු අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවක යටත් පිරිසෙයින් සාමාජික මන්ත්‍රීවරයන් තුන් දෙනකුගේ ලිඛිත ඉල්ලීමක් මත හැකිතාක් ඉක්මනින් රැස්වීමක් කැඳවනු ලැබිය යුත්තේ ය.

(7) කාරක සභාව ඉදිරියට තැනැත්තන් කැඳවා ප්‍රශ්න කිරීමට ද, ලියකියවිලි සහ වාර්තා ගෙන්වා පරීක්ෂා කිරීමට ද, තැනින් තැනට යෑමටද, තමන් වෙත යොමු කෙරෙන කරුණු පූර්ණ ලෙස සලකා බැලීම සඳහා අවශ්‍ය සියලු ක්‍රියාවන් කිරීමට ද, පාර්ලිමේන්තුව කල් තබනු ලැබ ඇති විටක වුව ද රැස්වීමට ද, එක් එක් අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවට බලය තිබිය යුත්තේ ය.

(8) අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවක ගණපූරණය සාමාජික මන්ත්‍රීවරයන් තිදෙනකුගෙන් සමන්විත විය යුතු අතර නියමිත ගණපූරණය නොමැතිව කටයුතු නොකිරීම ඒ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ සභාපතිවරයාගේ කාර්යය විය යුත්තේ ය.

කාරක සභා සඳහා වන පොදු රීති අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා සඳහා ද අදාළ විය යුත්තේ ය.

**15.** **දැනට පවත්නා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119 ඉවත් කර ඒ වෙනුවට මතු සඳහන් නව ස්ථාවර නියෝගය ආදේශ කිරීමට:-**

119. (1) තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරුන් නොවන සාමාජික මන්ත්‍රීවරයන් දහසය දෙනෙකුගෙන් සමන්විත රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව යනුවෙන් හඳුන්වනු ලබන කාරක සභාවක් තිබිය යුත්තේ ය.

මහජන වියදම් සඳහා පාර්ලිමේන්තුව විසින් ප්‍රදානය කරනු ලබන මුදල් විසර්ජනය කිරීම පෙන්නුම් කරන ගිණුම් ද රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සුදුසු යැයි සලකනු ලැබිය හැකි පාර්ලිමේන්තුව ඉදිරියේ තබනු ලබන වෙනත් යම් ගිණුම් ද විගණකාධිපතිවරයාගේ සහාය ඇතිව පරීක්ෂා කරනු ලැබීම රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ කාර්යය විය යුත්තේ ය.

(3) රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින්, සෑම මාස තුනකට වරක්, පරීක්ෂා කරන ලද ගිණුම්, මූල්‍ය, මූල්‍ය කාර්ය පටිපාටි හා යම් දෙපාර්තමේන්තුවක, පළාත් පාලන ආයතනයක කාර්ය සාධනය හා සාමාන්‍ය කළමනාකරණය ගැන ද ඉන් පැන නඟින යම් කාරණයක් සම්බන්ධයෙන් ද පාර්ලිමේන්තුවට වාර්තා කරනු ලැබිය යුත්තේ ය. රාජ්‍ය මූල්‍ය නිසි පරිදි පරිහරණය කිරීම සහතික කරලනු වස්, ඊට අදාළ කාරණාවලට විසඳුම් සැපයෙන ක්‍රියාමාර්ග පිළිබඳ නිරීක්ෂණ සහ නිර්දේශ මෙම වාර්තාවට අඩංගු විය යුත්තේ ය.

පාර්ලිමේන්තුවේ සභාගත කරන ලද රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ යම් වාර්තාවක් මුදල් විෂය භාර අමාත්‍යවරයාට සහ ආයතන භාර අමාත්‍යවරයන්ට යොමු කරනු ලැබිය යුතු අතර, එවිට, මුදල් විෂය භාර අමාත්‍යවරයා සහ ආයතන භාර අමාත්‍යවරයන් විසින් ඒ සම්බන්ධයෙන් සිය නිරීක්ෂණ සහ ගන්නා ලද පියවර සති අටක් ඇතුළත දී, පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, එම නිරීක්ෂණ සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳ ප්‍රකාශයක් ඉදිරිපත් කිරීම හෝ එම නිර්දේශ සම්පූර්ණ නොකළ හැකි බව අමාත්‍යවරයාගේ අදහස නම්, රාජ්‍ය මුදල් නිසි ලෙස භාවිතා කිරීම පිළිබඳ ගතයුතු විකල්ප ක්‍රියාමාර්ග පිළිබඳ ලිඛිතව හේතු පැහැදිලි කළ යුතු අතර, එම නිරීක්ෂණ සම්බන්ධව අමාත්‍යවරයා විසින් ගැනීමට යෝජනා කරන ක්‍රියාමාර්ග පිළිබඳ ප්‍රකාශයක් ද ඉදිරිපත් කළ යුතුය. නිරීක්ෂණ හෝ නිශ්චිත නිර්දේශය ඉටු නොකළ හැකි යැයි අමාත්‍යවරයාගේ මතය වන්නේ නම්, ඊට අමාත්‍යවරයාගේ හේතු ලිඛිතව පැහැදිලි කළ යුතු අතර අමාත්‍යවරයා විසින් යෝජනා කරන විකල්ප ක්‍රියාමාර්ග සඳහන් කළ යුතුය. කාරක සභාවට අවශ්‍ය වන්නේ නම් අදාළ අමාත්‍යවරයාට කරුණු පැහැදිලි කිරීම සඳහා කාරක සභාවට පෞද්ගලිකව පැමිණීමට ආරාධනාවක් කළ හැකි අතර එවැනි කාරණා වලින් පැන නඟින ප්‍රශ්න වලට සති අටක් ඇතුළත පිළිතුරු සැපයිය යුත්තේ ය.

(5) (අ) කාරක සභාව විසින් නියෝග කරනු ලබන යම් දෙපාර්තමේන්තු සහ පළාත් පාලන ආයතනවල සියලු ගිණුම් හා මුදල් සහ කළමනාකරණය සම්බන්ධව පරීක්ෂාකොට වාර්තා කිරීම සඳහා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් අවශ්‍ය යැයි සලකනු ලබන පරිදි සිය සාමාජිකයන්ගෙන් සමන්විත අනු කාරක සභා පත්කරනු ලැබිය හැකි ය.

(ආ) රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ හෝ කාරක සභාව විසින් පත් කරන ලද ඕනෑම අනු කමිටුවක් අවශ්‍ය පරිදි පාර්ලිමේන්තුවේ හෝ කාරක සභාව විසින් තීරණය කරනු ලබන ඕනෑම අදාළ ආයතනයක රැස්වීම් පැවැත්වීම සඳහා ඉඩ දෙනු ලැබිය හැකි ය.

(ඇ) රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සභාපතිවරයාගේ අවසරය ඇතිව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සාමාජිකයන් නොවන වෙනත් යම් මන්ත්‍රීවරයන්ට එම කාරක සභාවේ කටයුතු නිරීක්ෂණය කිරීම සඳහා ඉඩ දෙනු ලැබිය හැකි ය.

(6) රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් හෝ එහි යම් අනු කාරක සභාවක් විසින් සිය කාර්යය ඉටුකරනු ලැබීම සඳහා යම් තැනැත්තකු එම කාරක සභාව ඉදිරියට කැඳවනු ලැබීමට සහ ප්‍රශ්න කරනු ලැබීමට ද, යම් ලියකියවිලි, පොත්, වාර්තා හෝ වෙනත් ලේඛන ගෙන්වා ගෙන පරීක්ෂා කරනු ලැබීමට ද, ගබඩා සහ දේපළවලට ප්‍රවේශ වීමට ද බලය තිබිය යුත්තේ ය.

(7) රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ ගණපූරණය සාමාජිකයන් පස් දෙනෙකුගෙන් සංයුක්ත විය යුතු ය. පිළිගත හැකි හේතුවක් මත කාරක සභාවේ අවසර ලබා නොගෙන එහි අනුගාමී රැස්වීම් තුනකට නොපැමිණෙන යම් සාමාජික මන්ත්‍රීවරයකු එම කාරක සභාවේ සාමාජිකත්වය අත්හැර ගියාසේ සලකනු ලැබිය යුත්තේ ය.

[ගරු ප්‍රසන්න රණතුංග මහතා]

**16. දැනට පවත්නා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 120 ඉවත් කර ඒ වෙනුවට මතු සඳහන් නව ස්ථාවර නියෝගය ආදේශ කිරීමට:-**

120. (1) තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරුන් නොවන සාමාජික මන්ත්‍රීවරයන් දහසය දෙනෙකුගෙන් සමන්විත පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව යනුවෙන් හඳුන්වනු ලබන කාරක සභාවක් තිබිය යුත්තේ ය.

(2) රාජ්‍ය සංස්ථා සහ මුළුමනින්ම හෝ කොටසක් ආණ්ඩුව විසින් අරමුදල් සපයනු ලබන ආයතනවල ගිණුම් සහ යම් ලිඛිත නීතියක් මඟින් ආණ්ඩුවට පවරා ගන්නා ලද යම් ව්‍යාපාරයක් හෝ වෙනත් පැවරීමක් සම්බන්ධව පාර්ලිමේන්තුව ඉදිරියේ තබනු ලබන ගිණුම්, විගණකාධිපතිවරයාගේ සහාය ඇතිව පරීක්ෂා කිරීම පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ කාර්යය විය යුත්තේ ය.

(3) යම් රාජ්‍ය සංස්ථාවක හෝ යම් ලිඛිත නීතියක් මඟින් ආණ්ඩුවට පවරන ලද ව්‍යාපාරයක හෝ වෙනත් පැවරීමක පරීක්ෂා කරන ලද ගිණුම් සම්බන්ධයෙන් සහ ඉන් පැන නඟින යම් කාරණයක් සම්බන්ධයෙන් අයවැය හා වාර්ෂික ඇස්තමේන්තු, මූල්‍ය, මූල්‍ය කාර්ය පටිපාටිය, කාර්ය සාධනය හා සාමාන්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින්, සෑම මාස තුනකට වරක්, පාර්ලිමේන්තුවට වාර්තා කරනු ලැබිය යුත්තේ ය. රාජ්‍ය මූල්‍ය නිසි පරිදි පරිහරණය කිරීම සහතික කරලනු වස්, ඊට අදාළ කාරණාවලට විසඳුම් සැපයෙන ක්‍රියාමාර්ග පිළිබඳ නිරීක්ෂණ සහ නිර්දේශ මෙම වාර්තාවට අඩංගු විය යුත්තේ ය.

(4) පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ යම් වාර්තාවක් පාර්ලිමේන්තුවේ දී සභාගත කරන ලද අවස්ථාවක දී, එම වාර්තාව මුදල් විෂය භාර අමාත්‍යවරයාට සහ ආයතන භාර අමාත්‍යවරයන්ට යොමු කරනු ලැබිය යුතු අතර, ඉන් අනතුරුව මුදල් විෂය භාර අමාත්‍යවරයා සහ ආයතන භාර අමාත්‍යවරයන් විසින් ඒ සම්බන්ධයෙන් සිය නිරීක්ෂණ සහ ගන්නා ලද පියවර සති අටක කාල සීමාවක් ඇතුළත දී, පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, එම නිරීක්ෂණ සම්බන්ධයෙන් ගතයුතු ක්‍රියාමාර්ග පිළිබඳ ප්‍රකාශයක් ඉදිරිපත් කිරීම හෝ එම නිර්දේශ සම්පූර්ණ නොකළ හැකි බව අමාත්‍යවරයාගේ අදහස නම්, රාජ්‍ය මුදල් නිසි ලෙස භාවිතා කිරීම පිළිබඳ ගතයුතු විකල්ප ක්‍රියාමාර්ග පිළිබඳ ලිඛිතව හේතු පැහැදිලි කළ යුතු අතර, එම නිරීක්ෂණ සම්බන්ධව අමාත්‍යවරයා විසින් ගැනීමට යෝජනා කරන ක්‍රියාමාර්ග පිළිබඳ ප්‍රකාශයක් ද ඉදිරිපත් කළ යුතුය. නිරීක්ෂණ හෝ නිශ්චිත නිර්දේශය ඉටු නොකළ හැකි යැයි අමාත්‍යවරයාගේ මතය වන්නේ නම්, ඊට අමාත්‍යවරයාගේ හේතු ලිඛිතව පැහැදිලි කළ යුතු අතර අමාත්‍යවරයා විසින් යෝජනා කරන විකල්ප ක්‍රියාමාර්ග සඳහන් කළ යුතුය. කාරක සභාවට අවශ්‍ය වන්නේ නම් අදාළ අමාත්‍යවරයාට කරුණු පැහැදිළි කිරීම සඳහා කාරක සභාවට පෞද්ගලිකව පැමිණීමට ආරාධනාවක් කළ හැකි අතර එවැනි කාරණ වලින් පැන නඟින ප්‍රශ්න වලට සති අටක් ඇතුළත පිළිතුරු සැපයිය යුත්තේ ය.

(5) (අ) පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් නියම කරනු ලබන කවර හෝ රාජ්‍ය සංස්ථාවක හෝ කිසියම් ලිඛිත නීතියක් යටතේ ආණ්ඩුවට පැවරී ඇත්තා වූ යම් ව්‍යාපාරයක හෝ වෙනත් පැවරීමක සියලුම ගිණුම්, අයවැය හා වාර්ෂික ඇස්තමේන්තු මූල්‍ය තත්ත්වය සහ කළමනාකාරිත්වය පරීක්ෂාකර කාරක සභාවට වාර්තා කරනු ලැබීම පිණිස පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවට අවශ්‍ය යැයි හැඟී ගිය අවස්ථාවක දී, කාරක සභාවේ සාමාජික මන්ත්‍රීවරයන්ගෙන් සමන්විත අනු කාරක සභා පත්කරනු ලැබිය හැකි ය.

(ආ) පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ හෝ කාරක සභාව විසින් පත් කරන ලද ඕනෑම අනු කමිටුවක් අවශ්‍ය පරිදි පාර්ලිමේන්තුවේ හෝ කාරක සභාව විසින් තීරණය කරනු ලබන ඕනෑම අදාළ ආයතනයක රැස්වීම් පැවැත්වීම සඳහා ඉඩ දෙනු ලැබිය හැකි ය.

(ඇ) පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සභාපතිවරයාගේ අවසරය ඇතිව පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සාමාජිකයන් නොවන වෙනත් යම් මන්ත්‍රීවරයන්ට එම කාරක සභාවේ කටයුතු නිරීක්ෂණය කිරීම සඳහා ඉඩ දෙනු ලැබිය හැකි ය.

(6) පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් හෝ එහි යම් අනු කාරක සභාවක් විසින් සිය කර්තව්‍ය ඉටුකරනු ලැබීම සඳහා යම් තැනැත්තකු එම කාරක සභාව ඉදිරියට කැඳවනු ලැබීමට සහ ප්‍රශ්න කරනු ලැබීමට ද යම් ලියකියවිලි, පොත්, වාර්තා හෝ වෙනත් ලේඛන ගෙන්වා ගෙන පරීක්ෂා කරනු ලැබීමට ද, ගබඩා සහ දේපලවලට ප්‍රවේශ වීමට ද බලය තිබිය යුත්තේ ය.

(7) පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ ගණපූරණය සාමාජිකයන් පස් දෙනෙකුගෙන් සංයුක්ත විය යුත්තේ ය. පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ අවසර ලබා නොගෙන එහි අනුගාමී රැස්වීම් තුනකට නොපැමිණෙන යම් සාමාජික මන්ත්‍රීවරයකු එම කාරක සභාවේ සාමාජිකත්වය අත්හැර ගියා සේ සලකනු ලැබිය යුත්තේ ය.

**17. දැනට පවත්නා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 121 ඉවත් කර ඒ වෙනුවට මතු සඳහන් නව ස්ථාවර නියෝගය ආදේශ කිරීමට:-**

121. (1) සභාපතිවරයා විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරයකු විය යුත්තේ ය යන්නට යටත්ව, තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරුන් නොවන සභාපතිවරයකු හා සාමාජික මන්ත්‍රීවරයන් එකොළොස් දෙනකුගෙන් සමන්විත රජයේ මුදල් පිළිබඳ කාරක සභාව යනුවෙන් හඳුන්වනු ලබන කාරක සභාවක් තිබිය යුත්තේ ය.

(2) මතු සඳහන් දේ පරීක්ෂා කරනු ලැබීම රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ කර්තව්‍ය විය යුත්තේ ය:-

(අ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 ව්‍යවස්ථාව යටතේ ආදායම් එකතු කිරීම;

(ආ) ඒකාබද්ධ අරමුදලෙන් කරනු ලබන ගෙවීම්;

(ඇ) නීතිය මගින් යම් විශේෂ කාර්ය සඳහා මහජන අරමුදල් භාවිතා කිරීම;

(ඈ) රජයේ අරමුදල් යෙදවීම;

(ඉ) පවත්නා වර්ෂය සඳහා විසර්ජන පනතේ අඩංගු විසර්ජනවල ආර්ථික අවපාත, විසර්ජන මාරු කිරීම සහ අනපේක්ෂිත ශේෂය;

(ඊ) පවත්නා වර්ෂය සඳහා විසර්ජන පනත ක්‍රියාත්මක කිරීම;

(උ) රාජ්‍ය ණය සහ ණය සේවා;

(ඌ) 2003 අංක 3 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම) පනත යටතේ වාර්තා සහ ප්‍රකාශන; සහ

(එ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 152 ව්‍යවස්ථාව යටතේ පනත් කෙටුම්පත්, යෝජනා, යෝජනා සම්මතයන් සහ නියෝග.

(3) පාර්ලිමේන්තුව හෝ යම් කාරක සභාවක් හෝ අමාත්‍යවරයකු හෝ විසින් ඕනෑම කාරණයක් සලකා බලා වාර්තා කිරීම පිණිස රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට යොමු කරනු ලැබිය හැකි ය.

(4) කාරක සභාව විසින්, ඉහත (2) සහ (3) ඡේදයේ දක්වා ඇති කාරණා වලින් පැන නඟින ගැටලු, කලින් කලට, පාර්ලිමේන්තුවට වාර්තා කරනු ලැබිය යුත්තේ ය.

(5) විසර්ජන පනත් කෙටුම්පතේ කාරක සභා අවස්ථාව ආරම්භ වීමට පෙර කාරක සභාව විසින්-

(i) මුළු ඇස්තමේන්තුගත වියදම් හා ආදායම් සඳහා පදනම ලෙස භාවිතා කෙරෙන බදුකරණය, මූල්‍ය සහ ආර්ථික උපකල්පන පිළිබඳව; සහ

(ii) මුදල් වෙන් කිරීම ආණ්ඩුවේ ප්‍රතිපත්ති සමඟ අනුකූල වන්නේ ද යන්න පිළිබඳව;

වාර්තාවක් ඉදිරිපත් කරනු ලැබිය යුත්තේ ය.

(6) රජයේ මුදල් පිළිබඳ කාරක සභාව යම් වාර්තාවක් පාර්ලිමේන්තුවේ සභාගත කරන ලද අවස්ථාවක දී, එම වාර්තාව මුදල් විෂය භාර අමාත්‍යවරයාට යොමු කරනු ලැබිය යුතු අතර, ඉන් අනතුරුව මුදල් විෂය භාර අමාත්‍යවරයා විසින් ඒ සම්බන්ධයෙන් සිය නිරීක්ෂණ සහ ගන්නා ලද පියවර සති අටක කාල සීමාවක් ඇතුළතදී, පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබිය යුත්තේ ය.

(7) රජයේ මුදල් පිළිබඳ කාරක සභාව විසින් යම් තැනැත්තන් කැඳවීමට සහ ලියකියවිලි හා වාර්තා ගෙන්වා ගැනීමට බලය තිබිය යුතු අතර, යෝජනා සහ නිරීක්ෂණ ඇතුළත් වාර්තාව සාක්ෂි සටහන් සමඟ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු ය.

(8) කාරක සභාවේ ගණපූරණය සාමාජිකයින් හතර දෙනෙකුගෙන් සංයුක්ත විය යුත්තේ ය.

**18. දැනට පවත්නා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 122 ඉවත් කර ඒ වෙනුවට මතු සඳහන් නව ස්ථාවර නියෝගය ආදේශ කිරීමට:-**

122. (1) තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයන් නොවන සාමාජික මන්ත්‍රීවරයන් පහළොස් දෙනෙකුගෙන් සමන්විත මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව යනුවෙන් හඳුන්වනු ලබන කාරක සභාවක් තිබිය යුත්තේ ය.

(2) 30 වැනි ස්ථාවර නියෝගයේ (10) වැනි ඡේදයේ දක්වා ඇති විධිවිධාන යටතේ කාරක සභාවට යොමු කරනු ලබන පෙත්සම් සලකා බැලීම මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ කාර්යය විය යුත්තේ ය.

(3) රජයේ නිලධරයකු හෝ රාජ්‍ය සංස්ථාවක, පළාත් පාලන අධිකාරියක හෝ එවැනි වෙනත් යම් ආයතනයක නිලධරයකු විසින් සිදු කරන ලද මූලික අයිතිවාසිකමක් කඩ කිරීම හෝ වෙනත් යම් අසාධාරණයක් යම් පෙත්සමක් මගින් අනාවරණය වන බව මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ මතය වන අවස්ථාවක, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව විසින් එම පෙත්සම විභාග කරනු ලැබීම හෝ විභාගකොට වාර්තා කරනු ලැබීම සඳහා එය පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයා (ඔම්බුඩ්ස්මන්) වෙත යොමු කරනු ලැබිය හැකි ය.

(4) කාරක සභාව විසින් පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයාට (ඔම්බුඩ්ස්මන්වරයාට) යොමු කරනු ලැබූ පෙත්සමක් සම්බන්ධයෙන් ඔහු විසින් කාරක සභාවට ඉදිරිපත් කරන ලද වාර්තාවක් කාරක සභාව විසින් සලකා බැලීමෙන් අනතුරුව ඒ වාර්තාව පිළිබඳව ගත යුතු ක්‍රියාමාර්ගය සම්බන්ධයෙන් හෝ කාරක සභාව විසින් සලකා බලනු ලැබූ පෙත්සමක් සම්බන්ධයෙන් ස්වකීය මතය පාර්ලිමේන්තුව වෙත වාර්තා කරනු ලැබිය හැකි ය.

(5) මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරන ලද පෙත්සම් සම්බන්ධයෙන් කාරක සභාව විසින් සුදුසු යැයි සලකනු ලබන වෙනත් නිරීක්ෂණ ද සමඟ ගත යුතු පියවර සම්බන්ධයෙන් සිය මතය, සෑම මාස තුනකට වරක්ම, පාර්ලිමේන්තුවට වාර්තා කරනු ලැබිය යුත්තේ ය.

(6) වාර්තාව පාර්ලිමේන්තුවේදී සභාගත කළ විට, කථානායකවරයා විසින් එම වාර්තාවේ අන්තර්ගත කරුණු අදාළ වන යම් අමාත්‍යවරයකුගේ නිරීක්ෂණ සඳහා එම අමාත්‍යවරයාට යවනු ලැබීමට පියවර ගනු ලැබිය යුතු අතර, එම අමාත්‍යවරයා විසින් තම නිරීක්ෂණ සති අටක කාල සීමාවක් ඇතුළත දී කථානායකවරයා වෙත ලිඛිතව ඉදිරිපත් කරනු ලැබිය යුත්තේ ය.

අදාළ යම් අමාත්‍යවරයකුගේ නිරීක්ෂණ ලැබීමෙන් අනතුරුව, එම නිරීක්ෂණවල පිටපතක් කථානායකවරයා විසින් කාරක සභාවේ සභාපතිවරයාට සහ පෙත්සම ඉදිරිපත් කරනු ලැබූ මන්ත්‍රීවරයාට යොමු කරනු ලැබිය යුත්තේ ය: ඒ අනුව ලබා දී ඇති පිළිතුරු සම්බන්ධව සෑහීමකට පත් නොවන්නේ නම්, සුදුසු ප්‍රතිකර්ම යොදන ලෙස අමාත්‍යවරයාගෙන් ඉල්ලා සිටිය යුතුය. අමාත්‍යවරයා මාසයක් ඇතුළත අවශ්‍ය පරිදි කටයුතු කළ යුතු අතර, එම කාර්ය ඉටුනොකිරීමට කරුණු ලිඛිතව ඉදිරිපත් කර සලකා බලනු ලබන විකල්ප ක්‍රියාමාර්ගය සඳහන් කළ යුතුය.

මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව විසින් අවශ්‍ය යැයි සලකනු ලබන විටක, කාරක සභාව විසින් නියම කරනු ලැබිය හැකි පරිදි වූ මහජන පෙත්සම් හෝ වාර්තා සම්බන්ධයෙන් විභාග කරනු ලැබ කාරක සභාවට වාර්තා කිරීම සඳහා මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ සාමාජික මන්ත්‍රීවරයන්ගෙන් ම සමන්විත අනු කාරක සභා පත්කරනු ලැබිය හැකි ය.

මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව විසින් හෝ එහි යම් අනු කාරක සභාවක් විසින් කාරක සභාවේ කාර්යය ඉටු කරනු ලැබීම සඳහා කාරක සභාව ඉදිරියට යම් තැනැත්තකු කැඳවා ප්‍රශ්න කිරීමට ද යම් ලියකියවිලි, පොත් හෝ වෙනත් ලේඛන ගෙන්වා පරීක්ෂා කරනු ලැබීමට ද ගබඩා සහ දේපළවලට ප්‍රවේශ වීමට ද බලය තිබිය යුත්තේ ය.

(10) මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ ගණපූරණය සාමාජිකයන් පස් දෙනෙකුගෙන් සංයුක්ත විය යුත්තේ ය. මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ අවසර ලබා නොගෙන එහි අනුගාමී රැස්වීම් තුනකට නොපැමිණෙන යම් සාමාජික මන්ත්‍රීවරයකු එම කාරක සභාවේ සාමාජිකත්වය අත්හැර ගියාසේ සලකනු ලැබිය යුත්තේ ය."

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග සංශෝධනය කිරීම පිළිබඳ සාකච්ඡාව අද දින විවාදයෙන් පසුව වෙනත් දිනයකට කල් තැබීමට මා යෝජනා කරනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

විවාදය ආරම්භ කිරීම, ගරු (මහාචාර්ය) රංජිත් බණ්ඩාර මැතිතුමා.

[අ.භා. 1.48]

**ගරු (මහාචාර්ය) රංජිත් බණ්ඩාර මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ரஞ்சித் பண்டார)
(The Hon. (Prof.) Ranjith Bandara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග සංශෝධනය කිරීම පිළිබඳ විවාදයට අප එකතු වන්නේ ඉතාම සතුටින්. අප මේ පාර්ලිමේන්තුවට නවකයන්. ස්ථාවර නියෝග පිළිබඳව අපට වඩා අවබෝධයක් ඇති පිරිස් මෙම පාර්ලිමේන්තුව නියෝජනය කර තිබෙනවා. ඒ වාගේම අද ද මේ

[ගරු (මහාචාර්ය) රංජිත් බණ්ඩාර මහතා]

පාර්ලිමේන්තුව නියෝජනය කරනු ලබනවා. ඒ නිසා, ස්ථාවර නියෝග මඟින් එක්තරා ආකාරයකට පාර්ලිමේන්තුවේ කටයුතු සංවිධානාත්මක රාමුවකට ඉතිහාසය පුරා ම අපි අරගෙන ඇවිත් තිබෙනවාය කියා මා විශ්වාස කරනවා. ඒ වාගේම මේ සංවිධානාත්මක රාමුව තවදුරටත් ශක්තිමත් කළ යුතුයි, පුළුල් කළ යුතුයි කියා අපි විශ්වාස කරනවා. මෙම යෝජනා කර ඇති සංශෝධනයේ දී මූලික වශයෙන් දැනට පවත්නා ස්ථාවර නියෝග 143න් වගන්ති කිහිපයක් ඉවත් කර ඒ වෙනුවට ඉතා වැදගත් සංශෝධන යෝජනා කර තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ සියලු සංශෝධන මඟින් අපි උත්සාහ කරන්නේ, පාර්ලිමේන්තුවත්, පාර්ලිමේන්තුව නියෝජනය කරන සියලුම මහජන නියෝජිතයනුත් එක්තරා ආකාරයකට වඩා ඵලදායී ලෙස රටේ ව්‍යවස්ථාදායක ක්‍රියාවලිය තුළට එකතු කර ගැනීමටයි. අවාසනාවකට, එවැනි එකතු කරගැනීම් වෙනුවට ව්‍යවස්ථාදායකය තුළ විටින් විට කෙරෙන සාකච්ඡාවන් බොහෝ වෙලාවට ඉතාම හරසුන් බව අපි දකිනවා. මට පෙර කථා කළ ගරු මහජන මන්ත්‍රීතුමා, - එතුමා හරි හෝ වැරදි හෝ - තමන්ට ලැබුණු කාලය පාවිච්චි කළේ, තමන්ගේ පෞද්ගලික මතය ඉදිරිපත් කරමින් ජ්‍යෙෂ්ඨ අමාත්‍යවරයෙකුට කිසියම් ආකාරයක අපහාස උපහාසයක් කරන්නයි. ඒ කථාවට සමහර අය හිනා වුණා; උඩගෙඩි දුන්නා. නමුත්, නවක පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු විධියට මා විශ්වාස කරනවා, මේ ගරු සභාවේ කාලය අපි පාවිච්චි කළ යුත්තේ එවැනි කාර්යයන් සඳහා නොවෙයි කියලා. මීට මාස එකහමාරකට, දෙකකට ඉස්සෙල්ලා ගාලු මුවදොර පිටියට රැස්වුණු විශාල පිරිසක් මේ 225දෙනාම ගෙදර යන්න ඕනෑය කියලා එක්තරා විධියක නියෝගයක්, එක්තරා විධියක අරගළයක් කරගෙන යනවා, අපි දුටුවා. එම අරගළයට මේ ගෞරවනීය සභාව නියෝජනය කරන සමහර මන්ත්‍රීවරුනුත් සහභාගි වුණා අපි දැක්කා. ඇයි, අපි මෙවැනි දේවල් දකින්නේ? මේ රටේ තරුණයන්ගේ ප්‍රශ්නය, මේ රටේ වැඩිහිටියන්ගේ ප්‍රශ්නය, මේ රටේ ගොවීන්ගේ ප්‍රශ්නය, මේ රටේ කම්කරුවන්ගේ ප්‍රශ්නය සාකච්ඡා කරන්න අවශ්‍ය කරන පසුබිම සකසන්නේ වක්‍ර ප්‍රජාතන්ත්‍රවාදය තුළ මේ පාර්ලිමේන්තුවයි කියලා මා විශ්වාස කරනවා. එම නිසා මේ ප්‍රශ්නය පිළිබඳව පාර්ලිමේන්තුවේ සාකච්ඡා කරන්න මහජන නියෝජිතයන් විධියට අපට වගකීමක් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෑතකදී සාකච්ඡාවට ගැනුණු ඉතා වැදගත් කාරණයක් සම්බන්ධයෙන් දැනුවත් කළොත් හොඳයි කියා මා විශ්වාස කරනවා. ඒ තමයි, පාර්ලිමේන්තු නියෝජිතයන් මීට වඩා සක්‍රිය ලෙස ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලියට සම්බන්ධ වෙන්නට ඕනෑය කියන කාරණය. එක්තරා මතයක් විධියට එය ඉදිරිපත් වුණත්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුට මළ ගෙදරකට, මඟුල් ගෙදරකට යනවාට වඩා ලොකු රාජකාරියක් තමන්ගේ ඡන්ද දායකයන් වෙනුවෙන් කළ යුතුව තිබෙනවා කියලා මා පෞද්ගලිකව විශ්වාස කරනවා. සාමාන්‍යයෙන් නම්, "පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුට කළ හැකි කිසිවක් නොමැත" කියන අදහස තමයි සමාජය තුළ ප්‍රචලිතව පවතින්නේ. එහි යම් කිසි ඇත්තක් තිබෙනවා. අපේ සමහර පාර්ලිමේන්තු මන්ත්‍රීවරු දුක්ගැනවිලි ඉදිරිපත් කරනවා. ඒ දුක්ගැනවිලිවල තිබෙන්නේත් තමන්ගේ ඡන්ද දායකයන්ගේ ඕනෑ එපාකම් ඉෂ්ට කර ගැනීම පිළිබඳ ප්‍රශ්න පමණයි. එම නිසා බොහෝ අවස්ථාවල මහජනයා සමඟ තිබෙන සම්බන්ධතා පවත්වා ගැනීම සඳහා පමණක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ කටයුතු ලඝු වෙනවා. ඒ නිසා තමයි, පාර්ලිමේන්තු රැස්වීම් නැති සතිය පුරාම මළ ගෙවල්වලට, මඟුල් ගෙවල්වලට, උත්සව අවස්ථාවලට පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සහභාගි වෙන්නේ. සමහර අවස්ථාවල අපට පෙනෙනවා, පාර්ලිමේන්තුවට ආවත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුට ව්‍යවස්ථාදායකයේ කටයුතුවලට සම්බන්ධ වෙන්නට තිබෙන අවස්ථාව ඉතාම අල්පයි කියලා. එම නිසා, මේ යෝජනා කර ඇති සංශෝධන හරහා අගමැතිතුමා, කථානායකතුමා, නියෝජ්‍ය කථානායකතුමා වැනි පිරිස් හැර අනෙක් සියලුම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට පාර්ලිමේන්තු කාරක සභාවල සාමාජිකයන් බවට පත් වෙන්නට අවස්ථාව ලැබෙනවා. පාර්ලිමේන්තුව තුළ සෑම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුටම ව්‍යවස්ථා සම්පාදන ක්‍රියාවලියට සම්බන්ධ වෙන්නට වැඩි කාලයක්, ඉඩ ප්‍රස්ථාවක් ලැබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම නිසා ව්‍යවස්ථාදායකයේ කටයුතුවලට එකතු වෙන්නට අප සියලු දෙනාටම මෙය හොඳ අවස්ථාවක්.

මහජන මන්ත්‍රීවරයකුගේ වටිනාකම පිළිබඳව පසුගිය කාල සීමාව තුළ කෙරුණු කථා බහ නැවත මතක් කර ගත්තොත් අපට පෙනෙනවා, එම වටිනාකම මුළුමනින්ම හෑල්ලුවට ලක් වුණා කියන එක බොහෝ අය විශ්වාස කරන බව. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේක අරගළය නිසාම සිදු වෙච්ච එකක් නොවෙයි. රැකියා දෙන, රැකියා ලබා ගැනීමට ලියුම් දෙන, ශාඛා සමිති සංවිධානය කරන, පක්ෂයේ කටයුතුවලට පමණක් වෙහෙස -මහන්සි වෙන, තමන්ගේ ඊළඟ මැතිවරණය වෙනුවෙන් කටයුතු කරන පිරිසක් වශයෙන් දීර්ඝ කාලයක් තිස්සේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරු ලඝු වුණා. අදත් අපි ඒක අත්දකිනවා. සමහර දිස්ත්‍රික්කවල ප්‍රධානීන් බොහෝ වෙලාවට උත්සාහ කරන්නේ ඊළඟ මැතිවරණයේදී මම දිස්ත්‍රික්කයේ පළමුවෙනියාට එන්නේ කොහොමද කියලා බලන්නයි. මට පස්සේ එන කෙනා මට වඩා කොච්චර අඩු ඡන්ද සංඛ්‍යාවකින් දෙවැනියා විය යුතුද කියලා ඔවුන් හිතනවා. මේ කාරණාවලට ලඝුවීම හරහා තමයි ක්‍රමානුකූලව පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුට තිබුණු වැදගත්කම, ගෞරවය විනාශ කරගෙන තිබෙන්නේ. ක්‍රමානුකූලව හා සැලකිලිමත්ව ඉතිහාසය විමසා බැලුවොත් අපට පෙනෙනවා, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ වගකීම තමන්ගේ ඡන්ද දායකයා පිනවීමෙන් එහාට ගිය එකක් බව. විශේෂයෙන්ම මේ වක්‍ර ප්‍රජාතන්ත්‍රවාදය තුළ තමන්ගේ මහජන මන්ත්‍රීවරයා තමන් වෙනුවෙන් ව්‍යවස්ථාදායකය තුළ කටයුතු කරන්නේ කවර ආකාරයටද කියන එක පිළිබඳව පෙරට වඩා සැලකිල්ලෙන් මිනිස්සු දැන් බලාගෙන ඉන්නවා. අපි දන්නවා, පාර්ලිමේන්තුවේ කෙරෙන විවාද රූපවාහිනී නාළිකා මඟින් සජීවීව විකාශය කරන බව. ඒ විතරක් නොවෙයි. විවිධ සමාජ මාධ්‍ය මඟිනුත් පාර්ලිමේන්තුවේ කෙරෙන විවාද ප්‍රචාරය කරනවා. එතකොට පාර්ලිමේන්තු මන්ත්‍රීවරයාත් කිසියම් ආකාරයකට පෙරට වඩා ජනතාවගේ ඇස්වලට කිට්ටු වෙන කෙනකු බවට පත් වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ස්ථාවර නියෝග සංශෝධනය කිරීම හරහා අපි වෙහෙසෙන්නේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් ව්‍යවස්ථාදායකයේ කටයුතුවලට වැඩිපුර සම්බන්ධ කර ගැනීමට පමණක් නොවෙයි, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ රාජකාරිය පිළිබඳව අලුත් අත්දැකීමක් අපි හැමෝටම ලබා ගන්න පුළුවන් අවස්ථාවකුත් නිර්මාණය කර ගන්නයි. ඒ නිසාම මම විශ්වාස කරනවා, මේ ගෞරවනීය සභාව නියෝජනය කරන, නියෝජනය කිරීමට අපේක්ෂා කරන, නියෝජනය කළ සියලුදෙනාටම කිසියම් ආකාරයක වග කීමක් පාර්ලිමේන්තු කටයුතු සම්බන්ධයෙන් පැවරෙන බව.

පාර්ලිමේන්තුවේ මේ විවාදය පැවැත්වෙන අවස්ථාව ගත්තාම අපට පෙනෙනවා, පාර්ලිමේන්තුවේ නියෝජනය පිළිබඳව. මට ඉස්සෙල්ලා කථා කරපු ආණ්ඩු පක්ෂයේ ම ගරු මන්ත්‍රීතුමන්ලා ප්‍රකාශ කළා, "මෙතැන ඇමතිතුමා හිටියා නම් හොඳයි" කියන

අදහස. සමහර අවස්ථාවල අපට පෙනෙනවා, සමහර ගැටලු නිරාකරණය කර ගන්න, සමහර කාරණා පිළිබඳව සංවාදශීලී විවාදයකට යන්න අවශ්‍ය ඉඩ ප්‍රස්ථා සැලසෙන්නේ නැහැ කියලා. නම නොකියා මඩ ගැසීමට පමණක් මේ පාර්ලිමේන්තුවේ විවාද බොහෝ අවස්ථාවල ලඝු වන බව අපි දැක තිබෙනවා. මම පෙරදී සඳහන් කළ ආකාරයට අපි මේ පාර්ලිමේන්තුවට අලුත් අය. අපට තිබෙන පාර්ලිමේන්තු අත්දැකීම්, මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන ජ්‍යෙෂ්ඨ මැති ඇමැතිවරුන්ට තිබෙන පාර්ලිමේන්තු අත්දැකීම්වලට වඩා අඩුයි. නමුත් අපට පෙනෙනවා, කොතැන හෝ විශාල වැරැද්දක් සිද්ධ වෙලා තිබෙන බව. ඒක නිවැරැදි කර ගැනීම කළ හැක්කේ අපට පමණයි. එහෙම නැත්නම් මේ ප්‍රශ්නය මේ ආකාරයටම ඊළඟ පරම්පරාවට අපි අරගෙන යනවාද කියන කාරණය අපි සලකා බලන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි උදෑසන ප්‍රශ්න අසන අවස්ථාව ගත්තොත් අපට පෙනෙනවා, සමහර වෙලාවට හිතාමතාම ගරු මන්ත්‍රීවරු අසන ප්‍රශ්න මෙවැනි ගෞරවනීය සභාවක ඇසිය යුතු ප්‍රශ්න නොවෙයි කියලා. ඊට වඩා වැදගත්, තීරණාත්මක ප්‍රශ්න තිබෙනවා, මේ ගෞරවනීය සභාව තුළ සාකච්ඡාවට ගත යුතු. හැබැයි, එක්තරා විධියකට කාලය ගත කිරීම පමණක් ඒ හරහා සිද්ධ කෙරෙන බව අපට පෙනෙනවා. සමහර මන්ත්‍රීවරු සමහර ප්‍රශ්න අහනවා, "අහවල් ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරු කී දෙනෙක් ඉන්නවාද?" කියලා. ඒ වාගේම "අහවල් රජයේ පාසලේ උළු කැට දෙකක් ගැලවිලා තිබෙනවා. ඒක වඳුරෝ ද ගැලෙව්වේ?" කියලාත් සමහර මන්ත්‍රීවරු අහනවා. ඉතින්, මෙවැනි ප්‍රශ්න මෙවැනි ගෞරවනීය සභාවක ඇසිය යුතු ප්‍රශ්නදැයි කියන්න මම දන්නේ නැහැ.

ඒ වාගේම සමහර අවස්ථාවල ඉතා වැදගත්, තීරණාත්මක විවාද පාර්ලිමේන්තුව තුළ පැවැත්වෙන ආකාරයත් අපි දැක තිබෙනවා. නමුත්, "යන්නෙ කොහෙද? මල්ලෙ පොල්" වැනි විවාදවලට තමයි අපට බොහෝ වෙලාවට සවන් දෙන්න සිද්ධ වෙන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මහජන ගැලරිය විවෘතව තිබෙන වෙලාවක මේ විවාද සිද්ධ වෙනවා නම්, එහි පැමිණෙන පිරිස් අපට හිනාවෙන එක නවත්වන්න පුළුවන් වෙන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි මේ යෝජනා කරන ස්ථාවර නියෝග සංශෝධන හරහා මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන වර්තමාන මහජන නියෝජිතයන්ටත්, අනාගතයේ මේ පාර්ලිමේන්තුව නියෝජනය කිරීමට අපේක්ෂා කරන මහජන නියෝජිතයන්ටත් අවස්ථාව ලැබෙනවා, ව්‍යවස්ථාදායකයේ කටයුතුවලට සෘජුවම සම්බන්ධ වෙන්න. ඒක තමයි පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුගේ රාජකාරිය විය යුත්තේ. මළ ගෙවල්වලට ගියාට කමක් නැහැ, මඟුල් ගෙවල්වලට ගියාට කමක් නැහැ, උත්සවවලට ගියාට කමක් නැහැ, හැබැයි පාර්ලිමේන්තුව පැවැත්වෙන දිනවල මන්ත්‍රීවරයෙකුගේ වගකීම පිළිබඳව නැවත විමසා බැලීමක් තමයි මේ ස්ථාවර නියෝග සංශෝධන හරහා කිරීමට සිදු වෙලා තිබෙන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම නිසා මා මේක එක්තරා සන්ධිස්ථානයක් විධියට දකිනවා. වර්තමාන පාර්ලිමේන්තු මන්ත්‍රීවරු විසින් ගනු ලබන මෙවැනි තීන්දු-තීරණ හරහා අපට පුළුවන්, අනාගතයේ යහපත්, ප්‍රජාතන්ත්‍රවාදී වටිනාකම් ආරක්ෂා කරන පාර්ලිමේන්තුවක් ස්ථාපනය කර ගන්න. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු මයන්ත දිසානායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි නවයක කාලයක් තිබෙනවා.

[2.00 p.m.]

**ගරු මයන්ත දිසානායක මහතා**
(மாண்புமிகு மயந்த திசாநாயக்க)
(The Hon. Mayantha Dissanayake)

Hon. Deputy Speaker, there have to be checks and balances in any government. That is why the last Parliament, under the Hon. Karu Jayasuriya, changed the Standing Orders and ensured that certain checks and balances are there. ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාව හරහා ස්ථාවර නියෝග වෙනස් කරලා, we ensured that there are checks and balances.

But, what happened when 6.8 million people voted and elected this Government, giving them a two-thirds majority? I have the privilege and honour of being in the Committee on Standing Orders chaired by the Hon. Speaker. What was the first Motion introduced in Parliament? That was to suspend certain sections of the Standing Orders of Parliament. They suspended the Sectoral Oversight Committee system; Standing Orders අත්හිටුවා Sectoral Oversight Committee ක්‍රමවේදය සම්පූර්ණයෙන්ම අත්හිටෙව්වා. I went for the First Meeting of that Committee, Sir. Seated next to me is the Hon. Sujith Sanjaya Perera, who is also a Member of the Committee on Standing Orders. We represented the Opposition and went for that Meeting. At that Meeting, the Government Members said, “We are definitely not going to allow the Sectoral Oversight Committee system to operate. We want to revert to the old system”. එහෙම තමයි කිව්වේ. ගරු කථානායකතුමාගෙන් අවසර ලබා ගෙන, I submitted a report to the Committee on Standing Orders on the good aspects of having a Sectoral Oversight Committee system versus those of having the Ministerial Consultative Committee system. We recommended to have both systems going. The Minister chairs the relevant Ministerial Consultative Committee and can solve certain problems. But, to make Parliament more democratic and the system more open, we recommended to have the Sectoral Oversight Committees in Parliament. In the last Parliament, I was acting as a Chairman of a certain Sectoral Oversight Committee. We even went on study tours overseas and studied the Sectoral Oversight Committee systems in other countries: in the United States, Canada, England and in Europe.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Order please! මේ අවස්ථාවේදී කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

*අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා මූලාසනාරූඪ විය.*

*அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத் தினின்று அகலவே, மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. DEPUTY SPEAKER *left the Chair, and* THE HON. SHANAKIYAN RAJAPUTHIRAN RASAMANICKAM *took the Chair.*

ගරු මයන්ත දිසානායක මහතා
(மாண்புமிகு மயந்த திசாநாயக்க)
(The Hon. Mayantha Dissanayake)
Hon. Presiding Member, we studied how the Sectoral Oversight Committee system works in other countries, the pluses and the minuses of it and how we can change and improve it. However, Sir, when this Government came in, immediately they suspended the Sectoral Oversight Committee system.

Now, things have changed. The Hon. Ranil Wickremesinghe has become the President of the country and the Head of this Government. There is a saying, Sir, that there are no permanent friends or enemies in politics. So, after the Hon. Ranil Wickremesinghe became the President of this country, once again, the Sectoral Oversight Committee system is going to be brought back. Remember, the same group belonging to that same political party who hold the two-thirds majority in this House is still in control. That same group who suspended the Standing Orders of Parliament and the Sectoral Oversight Committee system completely have, today, agreed to change the Standing Orders of Parliament and bring back that Committee system.

That is leadership. It is the same number of MPs with the same two-thirds majority, but today, because the Hon. Ranil Wickremesinghe, as the President of the country, wants to bring back the Sectoral Oversight Committees and have checks and balances in Parliament, we are having this Debate to pass the new Standing Orders in Parliament. It is a good thing; it is not a bad thing. For the last one and a half to two years, as a Member of the Committee on Standing Orders, I have been fighting to have this Sectoral Oversight Committee system in Parliament. Anyway, people can change; sometimes, things change; power comes and goes. Remember, there is a Government or a party that has a two-thirds majority in Parliament, which can govern and rule. Tomorrow, there can be an election and the people of this country could decide who would govern thereafter. But if we, the Samagi Jana Balawegaya or the SJB - it can be an alliance - comes to power, we will ensure that this system is actually enshrined even in the Constitution. Sir, for the last one and a half years, the Hon. Lakshman Kiriella, on behalf of the SJB and the Opposition, has always been asking the Speaker or whoever who was chairing Parliament to please bring back - it has been an appeal - the Sectoral Oversight Committees.

Sir, there was agreement between the Opposition, the Government and the Speaker to have the Chairmanship of the Committee on Public Finance given to the Opposition. That has happened. With this change in the Standing Orders, it would be enshrined that the Opposition would have the Chairmanship of the Committee on Public Finance. However, what happened to the agreement that we had on the Chairmanships of the COPE and COPA? There was agreement reached that the Chairmanships of all three financial Committees of Parliament will be given to the Opposition. Sadly, here, the Chairmanships of the COPE and COPA are not given to the Opposition; it is not reflected in these changes to the Standing Orders moved today.

I wish to read from the Draft that was given to the Committee on Standing Orders, which states, "….nominated by the Committee of Selection, provided that the Chair shall be a Member of the Opposition". That is, in relation to the Committee on Public Accounts. Sir, I wish to table this with your consent.

Also, the same wordings are there with regard to the Committee on Public Enterprises: "….the Committee of Selection, provided that the Chair shall be a Member of the Opposition". So, these Amendments moved are in clear violation of that agreement. I do not know what happened. At the Committee on Standing Orders, there was agreement, but it went before the Committee on Parliamentary Business and now, that Committee, I believe, had changed it.

Sir, youth representation is a good thing. There is proviso in the Standing Orders that a certain number of youth could be invited to the Sectoral Oversight Committees. My recommendation to Parliament is that Youth Parliamentarians or young provincial councillors between the ages of 18 and 35 be invited to be a part of this system.

Sir, with your consent, I **table*** my Report to the Committee on Sanding Orders on the Sectoral Oversight Committee system.

If the Government, without suspending the Standing Orders, kept the Sectoral Oversight Committees, I think Gotabaya Rajapaksa would have still been in power, Mahinda Rajapaksa would have been in power, Basil Rajapaksa and the rest of the Rajapaksa family would have been in power. There would not have been the *"aragalaya"*. There would have been checks and balances; there would have been a system where Parliamentarians can air their views openly.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, please wind up.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු මයන්ත දිසානායක මහතා**
(மாண்புமிகு மயந்த திசாநாயக்க)
(The Hon. Mayantha Dissanayake)
Sir, may I have two more minutes from the time of the Opposition, please?

So, if we had that system, there would have been debates in Parliament over important issues. Take for example, the fertilizer crisis in this country. යල-මහ කන්න දෙකම අපට වැඩ කර ගන්න බැරි වුණා. දැන් මේ රටේ විශාල ආහාර අර්බුදයක් ඇති වෙලා තිබෙනවා. හැබැයි, එම කමිටු ක්‍රමය තිබුණා නම්, එ් ගැන සාකච්ඡාවක් ඇති කර ගන්න අපට තිබුණා; ඒ ගැන පාර්ලිමේන්තුව තුළ පුළුල් සංවාදයක් ඇති කර ගන්න අපට පුළුවන්කම තිබුණා. හැබැයි ඒක වුණේ නැහැ. මොකක්ද වුණේ? දොස්තර පාදෙණිය මැතිතුමා ඇතුළු GMOA එකයි, වියත් මඟේ කට්ටියයි ජනාධිපතිතුමාට උපදෙස් දුන්නා to get rid of chemical fertilizer from this country.

Then, during the last Parliament, there was also the issue of the PTA and the CTB - the Prevention of Terrorism Act versus the Counter Terrorism Bill. Again, there was an agreement and it was debated in the Sectoral Oversight Committee and reports were issued.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, please wind up.

**ගරු මයන්ත දිසානායක මහතා**
(மாண்புமிகு மயந்த திசாநாயக்க)
(The Hon. Mayantha Dissanayake)
Let me make one more point, Hon. Presiding Member. I must state that these new Standing Orders are coming in as a result of the "a*ragalaya*". If not for the "a*ragalaya*", the Standing Orders would not have been amended.

The last point I wish to make is with regard to the media. I also **table*** the Hon. Ranil Wickremesinghe's proposal, which clearly states that we must open up Parliament, have a system of accountability and those who are answerable to the people have to be held accountable.

Now, with 20 Sectoral Oversight Committees coming into play, who will be appointed as Chairmen and who are the Members who will be representing them? Therefore, we need to have a broader consensus in that regard in Parliament so that we could have a successful Sectoral Oversight Committee system.

Thank you.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Next, the Hon. D.B. Herath. You have 13 minutes.

[අ.භා. 2.12]

**ගරු ඩී.බී. හේරත් මහතා (පශු සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு டீ.பீ. ஹேரத் - கால்நடை வளங்கள் அபிவிருத்தி இராஜாங்க அமைச்சர்)
(The Hon. D.B. Herath - State Minister of Livestock Development)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද පාර්ලිමේන්තුවේ සාකච්ඡා කරන, ස්ථාවර නියෝග සංශෝධනය කිරීම පිළිබඳ අදහස් ප්‍රකාශ කරන්න අවස්ථාවක් ලැබීම ගැන මම සතුටු වෙනවා. පාර්ලිමේන්තුව, ප්‍රජාතන්ත්‍රවාදයේ පදනම හැටියට සලකන නිසා, පාර්ලිමේන්තුවේ සිදුවෙන ක්‍රියාකාරකම් පිළිබඳව කිසියම් සංයමයක්, විනයක් සහ වගකීමක් ඇතුව තමයි මේ පාර්ලිමේන්තුව තුළ අප හැසිරිය යුත්තේ. දීර්ඝ කාලයක් තිස්සේ මේ ස්ථාවර නියෝග පාර්ලිමේන්තුව තුළ ක්‍රියාත්මක වෙනවා. කාලයට ගැළපෙන විදියට, මේ සභාව නියෝජනය කරන සියලු මහජන මන්ත්‍රීවරුන්ගේ මතය එකට කැටි කරලා තමයි මේ ස්ථාවර නියෝග සකස් කරලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පාර්ලිමේන්තුව නියෝජනය කරන අපි හැම කෙනෙක්ම එක් එක් දේශපාලන කඳවුරුවලට අයිතිවෙලා තිබෙනවා. ඒ වාගේම එකිනෙකාට පරස්පර වෙච්ච විවිධ මතවාද අප තුළ තිබෙනවා. නමුත්, පාර්ලිමේන්තුවට ආවාම අපි හැමදෙනාම එකට එකතු වෙලා කටයුතු කරන්නේ කොහොමද කියන කාරණාවත්, එක තැනකට ඒමේ වගකීමත් අපි හැමදෙනා තුළම තිබෙන දෙයක්. පාර්ලිමේන්තු ස්ථාවර නියෝග අපි අනුගමනය කරනවාද කියන කාරණාව සැලකිල්ලට ගන්න තිබෙන හොඳම වෙලාව තමයි මේ වෙලාව. පාර්ලිමේන්තුවේ කථා කරන දේවල්, පාර්ලිමේන්තුව පිළිබඳව මහජනතාව දරන මතය පිළිබඳව විශේෂයෙන් සැලකිල්ලට ගත යුතුයි කියලා මම විශ්වාස කරනවා. මම එහෙම කියන්නේ, ප්‍රජාතන්ත්‍රවාදය වල් වැදෙන්න ගිය වෙලාවක, මේ රටේ මහජනතාව ප්‍රජාතන්ත්‍රවාදය නාමයෙන් පාලන තන්ත්‍රයක් පත් කර ගත්තාම, ඒකේ දිශානතිය කොයිබටද තිබෙන්නේ කියන කාරණාව පිළිබඳව මහජනතාව අවදියෙන් ඉන්න නිසායි. අපට වගකීමක් තිබෙනවා, අපි මේ තැන්වලට පත් කරපු ජනතාව වෙනුවෙන් පෙනී සිටින්න; ඒ ජනතාවගේ මතය ප්‍රකාශ කරන්න. ඒ අනුව තමයි අද මේ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග සංශෝධන පිළිබඳව කථා කරන මොහොතේදී අප දරන මතය ප්‍රකාශ කරන්න අපි උත්සුක වෙන්නේ.

පසුගිය මහ මැතිවරණයේදී ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ ආසන 143ක් දිනාගෙන පාර්ලිමේන්තුව තුළ තුනෙන් දෙකක බලයක් තහවුරු කරගත්තා. ඊට එහා කාලය තුළ මේ රටේ තිබුණු පාලන තන්ත්‍ර තුළ රටේ ජනතාවට ගැළපෙන ක්‍රමවේද තිබුණා ද කියන කාරණාව පිළිබඳව සැලකිල්ලට ගත යුතුව තිබුණා. එවන් පසුබිමක් තුළ, මුළු ලෝකයේම ඇතිවුණු ව්‍යසන, ආර්ථික ගැටලු එක්ක බැලුවාම, අපේ පාර්ලිමේන්තුව කුණාටුවකට හසු වුණා කියලා මම හිතනවා. ඡන්දයක් තුළින් මහ ජනතාවගේ මතය සනාථ කරන්න උත්සාහ කරලා, ඔවුන් ඒ ඡන්ද ප්‍රතිඵල විග්‍රහ කරන්න දායක වෙලා, ඔවුන් බලාපොරොත්තු වුණු දේ මේ පාර්ලිමේන්තුව තුළින් ඉටුකර ගැනීමේ වගකීමට අපි කොච්චර දුරට හවුල් වෙනවා ද කියන එක තමයි මා හමුවේ තිබෙන ප්‍රශ්නය.

ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමවේදය තුළ ප්‍රජාතන්ත්‍රවාදය සුරක්ෂිත කිරීමේ වගකීම අපට තිබෙනවා. 1971 වර්ෂයේදී සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියට ප්‍රජාතන්ත්‍රවාදය කියන කාරණාව සුරක්ෂිත කරන්නට සිදු වුණා. ඊට පසු 1988-1989 එක්සත් ජාතික

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු ඩී.බී. හේරත් මහතා]

පක්ෂ ආණ්ඩුව තිබුණු කාලයේ ප්‍රජාතන්ත්‍රවාදය කියන කාරණාව ආරක්ෂා කරන්නට ඒ ආණ්ඩුවට සිදු වුණා. වර්තමාන පාර්ලිමේන්තුව නියෝජනය කරන පක්ෂ, විපක්ෂ අපි හැමදෙනාටමත් ඒ වගකීම ඒ අයුරින්ම තිබෙනවාය කියලා මම විශ්වාස කරනවා. මේ පාර්ලිමේන්තු ක්‍රමවේදය තුළ ප්‍රජාතන්ත්‍රවාදයෙන් තොරව අපට ඉස්සරහට යන්න පුළුවන්කමක් නැහැ. අපිට හැම වෙලාවකම සැලකිල්ලට ගන්න වෙන්නේ මහජන මතය. විශේෂයෙන්ම මේ කාරණාවත් එක්ක ඇතිවුණු දේශපාලන අර්බුදය කොහොමද විසඳන්නේ කියන කාරණාව, මේ රටේ මහජනතාව දරන මතයට සාපේක්ෂ කරන්නේ කොහොමද කියන කාරණාව තමයි මැත භාගයේ අපට විසඳන්න තිබුණේ. ඒ අනුව ගත්තාම අපි ප්‍රාර්ථනා නොකරපු සංයුතියක් මේ පාර්ලිමේන්තුව තුළ නිර්මාණය වෙනවා. එතකොට ඒ කාරණාවේදී විවිධ අය, විවිධ කඳවුරුවලට බෙදෙනවා. හැබැයි, මම විශ්වාස කරනවා, අපි මොන කඳවුරකට බෙදුණත් මේ රටේ මහජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිය වෙනුවෙන් මේ ස්ථානය තුළ අපි පෙනී සිටින්නට ඕනෑ කියලා. ඒ වෙනුවෙන් කටයුතු කරන්න අපට වගකීමක් තිබෙනවා.

අපි පාලක පක්ෂය බවට පරිවර්තනය වෙලා පාර්ලිමේන්තුවට ඇවිල්ලා ජනතාවගේ දැවෙන ප්‍රශ්නවලට විසඳුමක් දෙන්න බැරි වුණා නම්, අපි එතැන දී අසාර්ථක වෙනවා. දැවෙන ප්‍රශ්නයකට විසඳුමක් හොයා ගන්න යන වෙලාවෙදි මහජනතාවගේ නාමයෙන්, නොගැළපෙන තීන්දු රටට ගැළපෙන විධියට සකස් කරන්න අපට බුද්ධිය පාවිච්චි කරන්න සිදු වෙනවා. ඒ අනුව සියලු කාරණා කටයුතු නිර්මාණය කරමින් යන වෙලාවක් තමයි මේ වෙලාව. මේ කාරණා එක්ක ඇතිවුණු දේශපාලන ව්‍යාකූල බවත් එක්ක අපේ පාර්ලිමේන්තුව තුළ බොහෝ දෙනෙක් කථා කළා. විශේෂයෙන් පක්ෂ නායකවරු සර්ව පාක්ෂික ආණ්ඩු පිළිබඳව, ජාතික ආණ්ඩු පිළිබඳව කථා කළා. ඇයි එහෙම කථා කළේ? මම විශ්වාස කරනවා, හැම කෙනාටම වුවමනාවක් තිබුණා කියලා මේ රටේ උන්නතිය වෙනුවෙන් දායක වෙන්න. රට ගොඩනඟන වැඩ පිළිවෙළට අපි කොච්චර දුරට දායක වෙන්න ඕනෑ ද කියන ඒ උත්තරීතර කාරණය ඒ අයගේ මනස තුළ තිබුණා. නමුත් දේශපාලන ක්‍රියාකාරිත්වය තුළ තමුන් දරපු දේශපාලන කඳවුරෙහි තිබෙන ප්‍රශ්නයක් නිසා ඔවුන් මේ සර්ව පාක්ෂික ආණ්ඩුවට එකතු වුණේ නැහැ. ඔවුන් හැම වෙලාවකම උත්සාහ කළේ අසාර්ථක තැනක් කොහේ හරි තිබුණා නම්, ඒක ප්‍රතිවිරුද්ධ කණ්ඩායම් වෙත බැර කිරීමටයි. ඒ කාරණාව එහෙම නොකර සර්ව පාක්ෂික ආණ්ඩුවක් හදලා රට ගොඩගන්න වැඩ පිළිවෙළකට එකතු වුණා නම් එය කොච්චර දුරට ආකර්ෂණීය ද? අපට ඒ තැනට එන්න නොලැබීම පිළිබඳව තිබෙන්නේ බලවත් කනගාටුවක්. පාර්ලිමේන්තු තුළ ස්ථාවර නියෝග සංශෝධනය කරලා ආංශික අධීක්ෂණ කාරක සභා පිළිබඳව කථා කරනවා; විවිධ සංයුතීන් පිළිබඳව කථා කරනවා. ඒ හැම එකක්ම අපට රටේ උන්නතියට දායක කරගන්න පුළුවන් නම් කොච්චර වටිනවාද? මම විශ්වාස කරනවා, මේ රටේ මහජනතාවගේ නාමයෙන් අපි ඒක කළ යුතුයි කියලා.

අපි මැත භාගයේ දී අපේ වගකීම පැහැර හැරියා. මේ රටේ ජනතාවගේ ජීවන ප්‍රශ්න විසඳන්න යනකොට පක්ෂ, ප්‍රතිපක්ෂ කියලා මතයක් නැහැ. අපි හුඟාක් වෙලාවලදී ඒ ගැන කථා කරනවා. අද උදේ මේ රටේ දරුවන්ගේ මන්දපෝෂණය පිළිබඳව කථා කළා. ඒ වාගේම ආර්ථික අහේනිය, ආහාර අහේනිය පිළිබඳව කථා කරනවා. මේ කථා කරන හැම කාරණාවකම බර පැන ප්‍රතිවිරුද්ධ පාර්ශ්වයට බැර කරන්නයි අපි උත්සාහ කරන්නේ. එහෙම නොකර, මනුෂ්‍යත්වයේ නාමයෙන් මේ කාරණා සියල්ලම අපේ ප්‍රශ්න හැටියට සලකලා, මෙතැනදීවත් අපට එකට එකතු වෙන්න පුළුවන් නම් මම විශ්වාස කරනවා මේ කාල වකවානුව තුළ අපි කළ යුතු කාර්ය භාරය ඒකයි කියලා. ඒ කාරණාව එහෙම නිර්මාණය කරනකොට, මැත භාගයේ රටට, රටේ ආර්ථිකයට කවුරු හෝ හානි කළා නම්, සමාජ පැවැත්මට හානියක් කළා නම් අපි හදපු ඒ සංයුතිය -එකට එකතු වෙලා කළ ඒ ප්‍රාර්ථනාව, ඒ ජාතික ආණ්ඩුව, ඒ සර්ව පාක්ෂික ආණ්ඩුව- ඒක කළා කියලා වැරදිකරුවන් නිදහස් කිරීමේ වුවමනාවකුත් අපට නැහැ. ඒ ස්ථානය තුළ ඉඳගෙන වඩා නිවැරැදි දේ මොකක්ද කියලා විනිශ්චයට භාජන කරන්න අපට පුළුවන්කම තිබුණා. ඒ තුළ, නැවත වතාවක් මේ රට තුළ නරක පූර්වාදර්ශ දෙන ක්‍රමවේද ක්‍රියාත්මක නොකරයි කියන විශ්වාසය අප තුළ තිබුණා. ඒ සියලු කාරණාත් අපි මේ වෙලාවේදී කල්පනා කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හුඟක් අය කල්පනා කරනවා මැතිවරණයකට යන්න හොඳම වෙලාව මේකයි කියලා. මේක මැතිවරණයකට යන්න හොඳ වෙලාව නොවෙයි. මේ රටේ අහිංසක මිනිසුන්ට දේශපාලන නායකත්වයක් තෝරා ගැනීමේ වුවමනාවක් ගෙනෙන්න සුදුසු පසුබිමක් මේ සමාජය තුළ අපට දකින්න පුළුවන්කමක් නැහැ. අපි තැන් තැන්වලදී එක එක්කෙනාගේ පටු න්‍යායයන්, එහෙම නැත්නම් ජාත්‍යන්තර කුමන්ත්‍රණකාරයන්ගේ වුවමනා ඉටු කරන අවස්ථා දැක්කා. ඒ විතරක් නොවෙයි. ඔවුන්ගේ අරමුණු කරා ළඟා වෙන්න මේ සමාජය තුළ විවිධ විනාශකාරී ක්‍රියාකාරකම්වලට හවුල් වුණු හැටිත් අපි දැක්කා. මේ තත්ත්වය තුළ අපට පුළුවන්කමක් නැහැ, මේ අයගේ මානසික මට්ටම කුමන ස්ථානයකද තිබෙන්නේ කියන එක පිළිබඳව තක්සේරුවකට එළැඹෙන්න. එවන් පසුබිමක් තුළ පාර්ලිමේන්තුව නියෝජනය කරන පක්ෂ-විපක්ෂ අපි සියලුදෙනාම තේරුම් ගන්න ඕනෑ මේ මහ පොළොව මත ක්‍රියාත්මක වෙන්නේ මොකක්ද කියලා.

ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමවේදය තුළ මේ රටේ පාර්ලිමේන්තුව නියෝජනය කරන අපට ලොකු වගකීමක් තිබෙනවා, ප්‍රජාතන්ත්‍රවාදය සුරක්ෂිත කරන්න. ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ කථා කරනකොට අප ළඟ තිබෙන ප්‍රධානම ලියවිල්ල තමයි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව. එතැනින් එහාට තීන්දු ගන්න අපට පුළුවන්කමක් නැහැ. හුඟක් අය කල්පනා කරනවා මේක විප්ලවීය විධියට වෙනස් කරන්න පුළුවන් කියලා. නමුත් ශිෂ්ට සම්පන්න සමාජය තුළ විප්ලවයට වටිනාකමක් නැහැ. එම නිසා අපි ශිෂ්ට සම්පන්න සමාජයක් හදන්න යන ගමනට අවතීර්ණ වෙලා තිබෙනවා. මේ සමාජය තුළ පිරිහුණු තැනක් තිබෙනවා නම් ඒවා නිවැරැදි කිරීමටත්, ඒ වාගේම තාවකාලිකව හෝ අපේ දේශපාලන මතවාද පැත්තකින් තියලා රටේ උන්නතිය වෙනුවෙන් අපි එකතු වෙන්නත් අවශ්‍යයි.

හුඟක් වෙලාවට අපි අපේ ඉතිහාසය අමතක කරනවා. අපට අවුරුදු 2,500ක ලිඛිත ඉතිහාසයක් තිබෙනවා, ගෞරවනීය ඉතිහාසයක් එක්ක තමයි අපි ගොඩනැඟෙන්නේ කියලා කියනවා. මැත භාගයේ මේ රටේ 28,000ක් තරුණ සොල්දාදුවන් අප වෙනුවෙන් ජීවිත පූජා කළා. අපි ඔවුන් වෙනුවෙන් යමක් කරනවාද? අපේ මුතුන් මිත්තන් අපේ රට වෙනුවෙන් ජීවිත කැප කළා. ඒ වාගේම මැත ඉතිහාසයේ තරුණ ජීවිත 28,000ක් කැප කළා; සදාකාලික අබ්බගාත පිරිස් බිහි වුණා. ඔවුන් කරපු ඒ කැප කිරීමට වටිනාකමක් දෙන්න අපි අපේ කාර්ය භාරය නියම විධියට ඉටු කරනවාද කියන කාරණය පිළිබඳව මට නම් තිබෙන්නේ බරපතළ ප්‍රශ්නයක්. ඒ නිසා අපි ඔක්කොම එකතු වෙලා අපි වෙනුවෙන් ජීවිත පූජා කළ අය වෙනුවෙන් යමක් කරන්න ඕනෑ.

අපි අවුරුදු 30ක කාලයක් යුද්ධ කළා. අපේ ආර්ථිකය කඩාගෙන වැටුණා. ඒ වාගේම වැරදි ක්‍රියාකාරකම් තුළ රට විවිධ පැතිකඩවලට අරගෙන ගියා. අපි එක එක්කෙනාට ඇඟිල්ල දික්

කරමින් ඔවුන්ව ඒකේ වූදිතයෝ බවට පත් කරන්න උත්සාහ කරනවා. එවන් පසුබිමක් තුළ, මේ කාල වකවානුව තුළ අපි මේ උත්තරීතර සභාව තුළ ඉඳගෙන කරන්න ඕනෑ රාජකාරිය මොකක්ද කියලා හෘදය සාක්ෂියට එකඟව විග්‍රහ කළ යුතු, විවරණය කළ යුතු අවස්ථාවකට ඇවිල්ලා තිබෙනවා.

අපිත් දකින හුඟක් තැන්වල බොහෝදෙනෙක් තමන්ගේ වාසිය වෙනුවෙන් පෙනී සිටිනවා. කොහේ හරි තැනකින් තමුන්ට අඩු පාඩුවක් සිද්ධ වෙනවා නම් අනිවාර්යයෙන්ම ඔවුන් වෙනත් මතවාදයක් තුළ ගොඩනැඟීමේ ස්වභාවයක් තිබෙනවා. ඊට පස්සේ ඔවුන්ගේ මතය වෙන පැත්තකට අරගෙන යනවා. හැබැයි, යටි අරමුණ වෙන්නේ තමන්ට වෙච්ච පාඩුව පිළිබඳ තක්සේරුවයි. මෙන්න මේ වාගේ කාරණා එක්ක මේ සමාජය තුළ සමාජ ක්‍රියාකාරීන්ගේ ස්වරූපය, ඔවුන්ගේ මතය අපි හරියට තේරුම් ගන්න ඕනෑ. ඒ නිසා මම විශ්වාස කරනවා මේ කාල වකවානුව තුළ අපි විප්ලවීය විධියට හිතනවාට වඩා රටට ගැළපෙන විධියට හිතලා, රට ගොඩනඟන මාර්ගයකට හැම දෙනාම අවතීර්ණ වෙන්න අවශ්‍යයි කියලා. ඒ සඳහා මේ උත්තරීතර පාර්ලිමේන්තුව තුළ විනයක් තිබෙන්න ඕනෑ. අපි දන්නවා මේ පාර්ලිමේන්තුව තුළ බොහොම අත්දැකීම් සහිතව දේශපාලන භූමිකාවේ ඉතා වැදගත් ප්‍රකාශ සිදු කරන බව. හැබැයි, මාධ්‍ය තුළින් ඒ එක ප්‍රකාශයකටවත් වටිනාකමක් ලබා දෙන්නේ නැහැ. මේ ගරු සභාව තුළ, රට වෙනුවෙන් කැප කිරීම් කරන විශාල පිරිසක් ඉන්නවා. ඔවුන්, ඔවුන්ගේ අත්දැකීම් මේ ගරු සභාව තුළදී හුවමාරු කර ගන්නවා. නමුත්, මාධ්‍ය තුළ ඒ තත්ත්වය දකින්න නැහැ. මේ ගරු සභාව තුළ කවුරු හෝ අසංවර විධියට හැසිරුණොත්, අසංවර විධියට කථා කළොත් ඒක මාධ්‍ය තුළින් දකින්න ලැබෙනවා. පවතින දේශපාලන භූමිකාව තුළ මනාප ක්‍රමවේදය එක්ක පාර්ලිමේන්තුව නියෝජනය කරන බොහෝ දෙනෙකු උත්සාහ කරනවා, රාත්‍රී කාලයේ මාධ්‍යයෙන් තමන්ගේ ඡායාරූප පළ කර ගැනීමට අවශ්‍ය කරන සටන් පාඨ ඉදිරිපත් කරන්න. නමුත්, හැම කෙනෙකුම සංයමයකින් යුතුව, නීත්‍යනුකූලව මේ ගරු සභාව තුළ හැසිරෙමින් රටේ අනාගතය ගොඩ නඟන්න උත්සාහ කරනවා නම් ඒකට වඩාත් උචිතම කාල පරිච්ඡේදය මෙය බව මං විශ්වාස කරනවා.

ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Next, the Hon. Field Marshal Sarath Fonseka. You have 12 minutes.

[අ.භා. 2.26]

**ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා**
(பீல்ட் மார்ஷல் மாண்புமிகு சரத் பொன்சேகா)
(The Hon. Field Marshal Sarath Fonseka)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කථා කරන්න අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වනවා. ස්ථාවර නියෝග සංශෝධනය කිරීම ගැන අද ගරු මන්ත්‍රීතුමන්ලා ඉදිරිපත් කළ කාරණා මම අහගෙන හිටියා. තුන්වැනි වතාවටත් පාර්ලිමේන්තුවට තේරී පත් වෙලා ඇවිත් ලැබූ අත්දැකීම් අනුව නම්, ස්ථාවර නියෝග පිළිබඳව කොච්චර කථා කළත්, ස්ථාවර නියෝග කොච්චර වෙනස් වුණත්, ඒවාට Amendments ගෙනාවත් පාර්ලිමේන්තුව හැම දාම එකම විධියකට පවත්වා ගෙන ගියා. පාර්ලිමේන්තුවෙන් රටට සේවයක් වනවාට වඩා රට කඩා වැටීමට පාර්ලිමේන්තුව දායක වන බව තමයි මම දැක්කේ. "උත්තරීතර පාර්ලිමේන්තුව" කියමින් අපි කොච්චර ආඩම්බර වෙන්න හැදුවත් රටේ ජනතාව ඒ කාරණය පිළිගන්නේ නැති තැනකට අද වනකොට රට තල්ලු වෙලා තිබෙනවා.

පසුගිය දවස්වල මේ ගරු සභාවේදී මන්ත්‍රීවරු ජාතික සභාව ස්ථාපිත කිරීම ගැන කථා කළා. ජාතික සභාව ස්ථාපිත කිරීම ගැන ගරු මන්ත්‍රීවරු වාගේම රටේ ජනතාව විවිධ මත දරනවා, ගරු බන්දුල ගුණවර්ධන ඇමතිතුමනි. මේ අවස්ථාවේදී පක්ෂ එකතු වෙලා, මන්ත්‍රීවරු පත් කරලා ජාතික සභාව ස්ථාපිත කරන්න හදන එකට සමහර පාර්ලිමේන්තු මන්ත්‍රීවරු විරුද්ධයි. රටේ ජනතාව නම් හිතන්නේ ජාතික සභාව මහ ජනතාවගේ නියෝජනත්වයෙන් පත් වෙන්න ඕනෑය කියායි. ජාතික සභාව නියෝජනය කරන්න මන්ත්‍රීවරු පත් වෙලා හිටියොත් එතුමන්ලා පක්ෂ නායක න්‍යාය පත්‍රය අනුව ජාතික සභාව මෙහෙයවන්න උත්සාහ කරාවි. මහ ජනතාව ඒ ජාතික සභාව නියෝජනය කරන්න පත් වුණොත් එතැනදීත් ප්‍රශ්න මතු වෙන්න ඉඩ තිබෙනවා. ඒ තමයි, මහ ජනතාව අතුරින් ඒ අය තෝරා එවන්නේ කොහොමද, ඒ ගොල්ලන් පරිණතද, ඒ ගොල්ලන්ට ජාතික ප්‍රශ්න වැටහෙනවාද, ජනතාවගේ හද ගැස්ම තේරෙනවාද, ඔවුන් ජනතාව අතර ගැවසී තිබෙනවාද, බිම් මට්ටමින් තිබෙන නොයෙක් ක්ෂේත්‍රවල ගැටලු මේ ගොල්ලන් අත්දැකීම්වලින් දන්නවාද, දැක තිබෙනවාද කියන කාරණා. ඒ නිසා ජාතික සභාව ස්ථාපිත කිරීම කියන කටයුත්ත හදිසි වෙලා කරන්න බැහැ, ගරු ඇමතිතුමනි. මේ පිළිබඳව හුඟක් දුරට අධ්‍යයනය කරලා, නිසි පිළිවෙළකට අනුව කටයුතු නොකළොත් මේකත් තව දේශපාලන නාඩගමක් පමණක් වෙයි කියලා තමයි මට හිතෙන්නේ.

ශ්‍රීලන්කන් ගුවන් සේවා සමාගම හා ඊට අදාළ යම් යම් කාරණා ගැන අද ගරු මන්ත්‍රීතුමන්ලා කථා කළා. මම අහලා, දැකලා තිබෙන කරුණු අනුව ශ්‍රීලන්කන් ගුවන් සේවා සමාගම කියන්නේ මේ රටේ ආර්ථික කඩා වැටීමට විශාල වශයෙන් දායක වෙච්ච ආයතනයක්. ආණ්ඩු මාරු වුණත් එම සමාගම රටට යහපතක් කරනවාට වඩා අයහපතක් තමයි හැම දාම සිදු කළේ. පසුගිය කාලයේ එම ආයතනය වර්ෂයකට රුපියල් කෝටි 6,500ක් පාඩු ලබපු තත්ත්වයක් අපට දකින්න ලැබුණා. ඊට කලින්, තමුන්නාන්සේලාගේ රජය තිබියදීත් එම ආයතනය රුපියල් කෝටි 5,500ක් පාඩු ලබපු කාලයක් තිබුණා. මේ ආයතනයේ සිදු වුණු දේවල් ලෝකයේ ශීලාචාර, සදාචාරාත්මක වැඩ සිදු වන රටවල සිදු වෙලා නැහැ. ශ්‍රීලන්කන් ගුවන් සේවා සමාගමේ සභාපති හැටියට වතාවක් එවකට හිටපු ජනාධිපතිතුමාගේ මස්සිනා -ආර්යාවගේ සහෝදරයා- කටයුතු කරනවා අපි දැක්කා. ඒ කාලයේ එම සමාගම රුපියල් කෝටි 5,500ක් විතර පාඩු ලැබුවා. නමුත්, එහි සභාපතිතුමාගේ වැටුප රුපියල් ලක්ෂ 50යි. ඊළඟට, යහ පාලන ආණ්ඩුව බලයට පත් වුණා. ඒ ආණ්ඩුව යටතේ සභාපති කෙනෙකු පත් කළා. ඔහුගේ වැටුප රුපියල් ලක්ෂ 100යි. යහ පාලන ආණ්ඩුව කාලයේ ඒ සමාගමට අධ්‍යක්ෂවරයෙක් පත් කරලා හිටියා. ඔහු හමුදාවේ අවුරුදු 20ක් සේවය කරලා විශ්‍රාම ගිය කෙනෙක්. ඔහුට වෙන සුදුසුකම් මොනවත් තිබුණේ නැහැ. ඔහුගේ විශ්‍රාම වැටුප රුපියල් 15,000යි. ඔහු ශ්‍රීලන්කන් ගුවන් සේවා සමාගමේ අධ්‍යක්ෂවරයෙකු හැටියට යහ පාලන ආණ්ඩුව කාලයේ කටයුතු කළා. අපි ඒ ගොල්ලන් ගෙනැල්ලා ප්‍රශ්න කළා, "ඔබතුමන්ලාගේ ආදායම් කොහොමද, වැටුප හා දීමනා කොහොමද?" කියලා. ඔහු වීරයෙක් වාගේ අත් දෙක බැඳගෙන මගේ මුහුණ බලාගෙන කිව්වා, "මම ඒ ආයතනයෙන් වැටුප් ගන්නේ නැහැ" කියලා. මම ඇහුවා, ඔබතුමා Working Director කෙනෙක් නේ, වැටුප් නොගෙන වැඩ කරන්නේ කොහොමද කියලා. "මම දීමනා විතරක් ගන්නවා" කිව්වා. දීමනා කීයද කියලා ඇහුවාම, දීමනාව රුපියල් ලක්ෂ 30යි කිව්වා. ශ්‍රීලන්කන් ගුවන් සේවා සමාගම ගැනයි මේ කියන්නේ. ගරු නාමල් රාජපක්ෂ මැතිතුමා මේ වෙලාවේ සභාවේ නැහැ. ශ්‍රී ලන්කන් ගුවන් සේවා සමාගමෙන් වැටුප් ගන්න, ගුවන් දීමනාවත් ගන්න ගුවන් සේවිකාවක් එතුමාගේ කාර්යාලයේ සේවිකාවක් හැටියට වැඩ කරනවා පසුගිය දවස්වල අපි දැක්කා. 2010-2015 රජයේ හිටපු ජනාධිපතිතුමා

[ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා]

එතුමාට පාවිච්චි කරන්න එම සමාගමේ ගුවන් යානයකට විශේෂ වැසිකිළියක් සවි කරන්න රුපියල් බිලියන 6ක මුදලක් -රුපියල් කෝටි 600ක මුදලක්- වෙන් කළා. ඒ වැසිකිළිය මොනවායින්ද දන්නේ නැහැ හදලා තිබුණේ. කොමොඩ් එකේ පෙරාපු රත්තරන්, දියමන්ති එහෙමත් අල්ලලා තිබුණාද දන්නේ නැහැ. ඒ කරපු දේවල් අපි අහෝසි කළා. ඊට අමතරව, කපිල චන්ද්‍රසේන කියන ශ්‍රී ලන්කන් ගුවන් සේවා සමාගමේ හිටපු විධායක නිලධාරියා ගුවන් බස් - airbuses - ගන්න ගිවිසුම්වලින් ඩොලර් මිලියන 20ක පගාවක් ගහලා ඒ සල්ලි ගියේ කාගේ ගිණුම්වලටද කියන ප්‍රශ්නය ආවා.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

ගිණුමටත් ගිය බව ඔප්පු වෙලා තිබුණා, සාක්ෂි, කරුණු-කාරණා ඇතිව. මේ ගුවන් සමාගම තුළින් අනිවාර්යයෙන්ම රටට අභේනියක් වුණා. දේශපාලනඥයෝ, හිටපු නායකයෝ මේවා හරහා හොරකම් කරලා ජනතාවගේ මුදල් කොල්ලකෑවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රටේ වර්තමාන තත්ත්වය ගැනත් මම කථා කරන්න ඕනෑ. අපේ රටේ වර්තමාන තත්ත්වය ඉතා කනගාටුදායකයි. ඒක තමුන්නාන්සේලා දන්නවා. තමුන්නාන්සේලා ජනතා නියෝජිතයෝ. මෙතැන පිටුපස පේළියේ වාඩි වෙලා ඉන්න මහාචාර්යතුමා මට කලින් කථා කළා. මළ ගෙවල්වල යන්න එපා, අරවා මේවා කථා ගොඩක් එතුමා කිව්වා. එතුමාට ඒවා ගැන තේරෙන්නේ නැහැ, ජාතික ලැයිස්තුවෙන් පාර්ලිමේන්තුවට ආපු හින්දා. ආර්ථික විශේෂඥයෝ වුණාට රටේ ජනතාවගේ දුක, බඩේ ගින්න, ඒ ජනතාව ජීවත් වෙන හැටි ඒ වාගේ මන්ත්‍රීවරුන්ට තේරෙන්නේ නැහැ.

අපි දන්නවා, මේ කාලයේ බඩු මිල ඉතා ඉහළ ගොස් ඇති බව. සාමාන්‍ය දෙයක් වන ඉටිපන්දමකින් පටන් ගත්තාම රූපවාහිනී යන්ත්‍රයක්, ගුවන් විදුලි යන්ත්‍රයක් දක්වාම ගන්න කඩේකට ගියොත් ජනතාවට ඒ බර දරන්න බැහැ. කඩවලුත් වැහීගෙන යනවා. අද කඩයකට ගිහිල්ලා බඩුවක් ගන්න බැහැ. සපත්තු කුට්ටමක්, මේස් බැනියමක් ගන්න ගියාම ඒවායේ මිල තුන් ගුණයක්, හතර ගුණයක් වෙලායි තිබෙන්නේ. ඒවායේ මිල ජනතාවට දරන්න බැරි තත්ත්වයේ රටක් දැන් තිබෙන්නේ. කෑම බීම පැත්තෙන් ගත්තොත්, බිත්තරයක ඉඳලා කුකුල් මස් කිලෝව දක්වාම මිල වැඩි වෙලා තිබෙනවා. තෝරා මාළු කිලෝවක්, සාලයෝ, ලින්නෝ මාළු කිලෝවක්, එළවලු ටිකක් ගන්න ගියත් ලොකු වියදමක් දරන්න වෙලා තිබෙනවා. ජනතාවට කන්න බොන්න බැහැ මේ කාලයේ. දැන් සංඛ්‍යාලේඛනවලින් ඔප්පු වෙලා තිබෙනවා, මේ රටේ සියයට 79ක් පමණ ජනතාව පෝෂ්‍යදායී ආහාර ගැනීමෙන් වළකිනවා, ලාභ කෑම අරගෙන බඩ පුරවා ගන්න උත්සාහ කරනවා කියලා. අද අපේ රට එතැනට ගිහිල්ලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ජනතාවට ගන්න වාහන නැහැ. ගරු ඇමතිතුමනි, වාහනයේ ටයර් එකක් ගියොත්, මාස හතරක පඩිය ඕනෑ ටයර් එක දමන්න. රුපියල් 25,000කට තිබුණු කාර් එකක ටයර් එක අද රුපියල් ලක්ෂයයි. රුපියල් 50,000කට තිබුණු ජීප් එකක ටයර් එක අද රුපියල් ලක්ෂ 2යි. කාර් එකක ටයර් හතර මාරු කළොත්, රුපියල් ලක්ෂ 4ක් ඕනෑ එය දමන්න. ජීප් එකකට නම් රුපියල් ලක්ෂ 8ක් ඕනෑ. එතකොට කොහොමද මේ රටේ මිනිස්සු ගමන්-බිමන් යන්නේ? රුපියල් 7,000ට, 8,000ට තිබුණු ත්‍රී වීලර් ටයර් එක දැන් රුපියල් 20,000යි. අනාගතයේදී ප්‍රවාහන පද්ධතිය අනිවාර්යයෙන්ම කඩාගෙන වැටේවි. ගමන්-බිමන් යෑම ගැන කථා කරන්නවත් හම්බ වෙන්නේ නැහැ. එතැනින් එහාට, තෙල් මිල හතර ගුණයකින් වැඩි වුණු බව තමුන්නාන්සේලා දන්නවා. ගෑස් මිල, විදුලි බිල, ජල බිල වැඩි වෙලා තිබෙනවා. විදුලි බිල ගෙවාගන්න බැරුව ස්වාමීන් වහන්සේලා -පූජ්‍ය පක්ෂය- පාරට බැහැලා තිබෙනවා. රජය ඒවාට මුනිවත රකිනවා. රජයට ඒවාට පිළිතුරු නැහැ, පිළියම් නැහැ. IMF, IMF කිය කියා හිටියාට හරියන්නේ නැහැ. රටේ මිනිසුන්ට ජීවත් වෙන්න බැරි නම්, අපි IMF එක තම්බාගෙන කන්නද? IMF එකෙන් ඇමෙරිකානු ඩොලර් බිලියන 2.9ක් දෙනවා ලු. එහෙමයි කියලා කන්න බොන්න නැතුව බඩගින්නේ ඉඳගෙන, අඳින්න-පළඳින්න නැතුව, ගෙවල්-දොරවල් නැතුව, බෙහෙත් නැතුව මේ රටේ මිනිස්සු ජීවත් වෙන්නේ කොහොමද? තමුන්නාන්සේලාගේ රජයට අනිවාර්යයෙන් බිම් මට්ටමට ගිහිල්ලා මේවා තේරුම් ගන්න වෙනවා. නැත්නම් ජනතාව කැරලි ගහන එක නවත්වන්න බැහැ. කැරලි ගැසීම ගැන මෙතැන විවේචනයෙන් කථා කළා. මේ සියල්ලම නැති වුණාම ජනතාවට ගෙදරට වෙලා ඇනුම් හරිමින් හුළං බිබී ඉන්නද කියන්නේ? ජනතාව අනිවාර්යයෙන්ම කැරලි ගහයි, මහ පාරට ඒවි. පාර්ලිමේන්තුව උත්තරීතර වුණා කියලා ජනතාවගේ බඩ පිරෙන්නේ නැහැ. මේක අපි තේරුම් ගන්න ඕනෑ. තමුන්නාන්සේලා මේවා ගැන ගැඹුරින් හිතන්න.

මේ විධියට මිල වැඩි වෙනකොට ජීවන මට්ටම පවත්වාගෙන යන්න තියා මිල අඩුම දේවල් ලබා ගන්නවත් ජනතාවට ආදායම් නැති වනවා. කුලී වැඩ කරන්න රැකියා නැහැ. ඉදිකිරීම් ක්ෂේත්‍රයේ සියයට 90ක් කඩා වැටිලා ලු. ඒ නිසා දෛනිකව කුලී වැඩ කරලා ජීවත් වෙන ලක්ෂ 6ක ජනතාවට ජීවත් වෙන්න විධියක් නැති වෙලා තිබෙනවා ලු. අපි මේවා මාධ්‍ය හරහා දකිනවා. තමුන්නාන්සේලා කවුරුවත් ඒවාට අභියෝග කරන්නේ නැහැ.

අපි දන්නවා, ත්‍රිරෝද රථ රැකියාව කරන දරුවෙකුට අද ඒකෙන් ජීවත් වෙන්න බැරි බව. එක පැත්තකින් ඉන්ධන ප්‍රමාණවත්ව ලැබෙන්නේ නැහැ. ඒ රස්සාවෙන් ලබන ආදායමෙන් ජීවත් වෙන්න බැහැ. ඒ වාගේම, පොලිස් නිලධාරින් ගැන බලන්න. අපට වාගේම ඔබතුමන්ලාටත් ආරක්ෂාවට පොලිස් නිලධාරින් ඉන්නවා. SI කෙනෙකුගේ පඩිය රුපියල් 60,000ක්, 65,000ක් පමණ මුදලක්. කොහොමද ඒ මුදලින් පවුලක් නඩත්තු කරන්නේ? සාමාන්‍යයෙන් පවුලක ළමයි තුන්දෙනෙක් විතර ඉන්නවා. කොහොමද ඒ දරුවන් පාසල් යවන්නේ? මේ පසෙකින් වාඩි වෙලා ඉන්නවා, අපේ මේ සභා ගර්භයේ සේවය කරන මහත්වරු. මම එක මහත්මයෙකුගෙන් තොරතුරු ඇහුවා. එතුමා අවුරුදු 18ක් රැකියාව කර තිබෙනවා ලු. වැටුප රුපියල් 75,000යි ලු. ඒ මහත්මයාට අපොස (සාමාන්‍ය පෙළ), අපොස (උසස් පෙළ) පන්තිවල ඉගෙන ගන්නා ළමයින් අඩු ගණනේ තුන්දෙනෙක්වත් ඇති. ඒ අයගේ පාසල් වෑන්වලට ගෙවන්න ඕනෑ; නිල ඇඳුම් අරගෙන දෙන්න ඕනෑ; සපත්තු, මේස් අරගෙන දෙන්න ඕනෑ. මේවා කරන්නේ කොහොමද? IMF හෝදලා, තම්බලා බිව්වාට මේවා කරන්න විධියක් නැහැ. ජනතාවට කැරලි ගහනවා ඇරෙන්න වෙනත් විකල්පයක් නැති වන තැනට මේ රට දැන් ගමන් කරනවා.

අපි දන්නවා, ගොවියාට මොකද වුණේ කියලා. පොහොර නැති නිසා ගොවියාට කන්න බොන්න නැති වුණා; ගොවියා අනාථ වෙලා ගියා. තමුන්නාන්සේලාගේ රජයේ ඉන්න සමහරු තවමත් කථා කරනවා, කාබනික පොහොර ගැන. ඒ අයට ලජ්ජාව කියන දේ ගෑවිලාවත් නැහැ. ගෝඨාභය රාජපක්ෂට ගෙදර යන්න වුණා, කාබනික පොහොර ප්‍රශ්නය හින්දා. කෘෂිකර්ම ඇමතිතුමා සද්භාවයෙන් කියනවා මම දැක්කා, "වී ටික මිලදී ගන්න ආණ්ඩුව මට සල්ලි දෙන්නේ නැහැ. ඒ සඳහා බිලියන දෙකක් ඕනෑ" කියලා. ආණ්ඩුව සල්ලි දෙන්නේ නැත්නම්, කෘෂිකර්ම ඇමති

මරාගෙන කෑවා කියලා වැඩක් නැහැ. කෘෂිකර්ම ඇමති අසරණ වෙලා ඉන්නවා. තමුන්නාන්සේලා මේවාට පිළියම් යොදන්න ඕනෑ. හැම දාම ගොවීන්ට එක එක පොරොන්දු දුන්නත් ඒවා ඉෂ්ට කරන්නේ නැහැ. ධීවරයන්ට මුහුදු යන්න බැහැ. මොකද, භූමිතෙල් මිල දරාගන්න බැහැ. මාළු කිලෝ එකක් දැනට තිබෙන මිලට වඩා හතරපස් ගුණයක මිලට විකුණුවාම මිනිස්සු ඒවා ගන්නේ නැහැ. එතකොට ඒ අයට තම පවුල් නඩත්තු කරන්න බැහැ. තමුන්නාන්සේලා මේ හැම දේම තේරුම් ගන්න.

අද සංචාරක ක්ෂේත්‍රය කඩා වැටිලා. තමුන්නාන්සේලා දන්නවා, ඒ අංශය සම්පූර්ණයෙන් කඩා වැටී තිබෙන බව. ඒ වාගේම, කුඩා පරිමාණයේ ව්‍යාපාර කඩා වැටිලා. ඒවා පවත්වාගෙන යන්න අවශ්‍ය අමු ද්‍රව්‍ය නැහැ; විදුලි බලය නැහැ; අවශ්‍ය අනෙකුත් සම්පත් නැහැ. ඒ නිසා ඒ ක්ෂේත්‍රය සම්පූර්ණයෙන් කඩා වැටිලා. මේ සියල්ලට හේතු සාධකය හැටියට අප දකින දෙයක් තිබෙනවා. මේ පාර්ලිමේන්තුවේ දූෂිත දේශපාලන සංස්කෘතියෙන් ආපු දේශපාලනඥයන් ඉන්නවා, සියයට 50ක් විතර. මෙතැන ඇවිල්ලා එක එක කථා පැවැත්වූවාට මේ දේශපාලනඥයන්ට දැක්මක් නැහැ; දර්ශනයක් නැහැ. කසිප්පු පෙරලා හෝ සල්ලි හම්බ කරගෙන එනවා. ඒ ගොල්ලන්ගේ බඩ වඩාගන්නවා; ව්‍යාපාර කරගන්නවා. දැක්මක් නැති නිසා මේ රට හැම දාම අගාධයෙන් අගාධයට ගියා; මේ රටේ ආර්ථිකය හැම දාම කඩා වැටුණා. කොච්චර පම්පෝරි ගැහුවත්, කොච්චර දේවල් කළත් මේ රටේ ආර්ථිකය කඩා වැටුණා. අපි දැක්කේ නැහැ, මේ රටේ ජනතාවට තිබෙන ප්‍රශ්න අඩු වුණු බවක්. සමෘද්ධි සහනාධාරය අවශ්‍ය පිරිස වැඩි වුණා. සමෘද්ධි සහනාධාරය වැඩි පිරිසකට දීලා පම්පෝරි ගැහුවා. අද වන කොටත් මේ රටේ ඉන්නවා වතුරෙන් තම්බා ගත්ත එළවලු ටිකක් එක්ක බත් කාලා ජීවත් වන දරුවෝ. මාළු කෑල්ලක් කන්න ඒ අයට සල්ලි නැහැ. අද සමහර පවුල්වලට ටකරමක් ගන්න සල්ලි නැහැ. ජල බිල ගෙවාගන්න බැරි පවුල් ඉන්නවා. අපේ ආසනවල ජනතාවගෙන් සියයට 50ක් විතර ඉන්නවා, ඒ විධියට ජීවත් වන. තමුන්නාන්සේලා මේ ගැටලු විසඳන්න කිසිම පියවරක් ගන්නේ නැහැ. තමුන්නාන්සේලාට ඒ ගැන හිතන්න බැහැ. තමුන්නාන්සේලාට ඒකට හැකියාවක් නැහැ. තමුන්නාන්සේලා සම්ප්‍රදායානුකූල දේශපාලනය තුළ ජීවත් වනවා පමණයි. ආයෙත් ඡන්දයක් තියලා ආණ්ඩුව මාරු වුණත්, ඇමතිවරුන් මාරු වුණත් තමුන්නාන්සේලා සම්ප්‍රදායානුකූල දේශපාලනය තුළ ජීවත් වනවා. අරගළය අනිවාර්යයෙන් කෙරෙන්න ඕනෑ. එය ඉදිරියට එන්න ඕනෑ. මේ දූෂිත දේශපාලනඥයන්ගෙන් රට ගලවා ගන්නම ඕනෑ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට නියමිත කාලය අවසන්.

**ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා**
(பீல்ட் மார்ஷல் மாண்புமிகு சரத் பொன்சேகா)
(The Hon. Field Marshal Sarath Fonseka)
මට තවත් විනාඩියක් දෙන්න.

ඡන්ද පැවැත්වූවාට මේ දූෂිත දේශපාලනඥයන් ගෙදර යවන්න බැහැ. මේ ගොල්ලෝ අරගළයට විතරයි බය. අරගළය පැවැත්වෙන කොට මේ ගොල්ලෝ හැංගිලා පිටුපස දොරෙන් එළියට ගියා; කුඩා කුඩා කාර්වල ගමන් කළා; ලොකු ලොකු සන්දර්ශන දැම්මේ නැහැ; මල්මාලා දාගන්න ගියේ නැහැ; බෝඩ්වල තමන්ගේ නම් ගැහුවේ නැහැ. අරගළය රටට හොඳක් කළා. අනාගතයේදී මුළු රටම ඒකට එකතු වෙන්න ඕනෑ. "අරගළය" කියන වචනය අයින් කරලා, ඒකට කියන්න ඕනෑ, 'නිරායුධ, නිර්පාක්ෂික, රටට ආදරේ ජනතාවගේ විප්ලවයක්' කියලා. එතැනදී දෙමව්පියෝ, ආච්චිලා, සීයලා, දරුවෝ ඔක්කෝම එහි හිටගන්න ඕනෑ. එහෙම කරලා මේ දූෂිත දේශපාලනඥයන්ට ජනතාව ඉදිරියට එන්න බැරි, ජනතාවට මුහුණ දෙන්න බැරි, ජනතාව ඉස්සරහට ඇවිල්ලා බොරු කියන්න බැරි රටක් බවට මේ රට කවදා හෝ පත් කරන්න ඕනෑ. එහෙම වුණොත් තමයි මේ රට කොහොම හරි ඉදිරියට ගෙන යන්න පුළුවන් වන්නේ.

මේ දවස්වල වෛද්‍යවරු අපට කථා කරනවා. ඒ ගොල්ලන්ටත් ප්‍රශ්නයක් තිබෙනවා. වයස අවුරුදු 60ට වැඩි වෛද්‍යවරුන් විශ්‍රාම යැවීම ගැන ප්‍රශ්නයක් තිබෙනවා, ගරු ඇමතිතුමනි. අනෙක් පැත්තෙන්, තරුණ වෛද්‍යවරු කියනවා, වයස වැඩි විශේෂඥ වෛද්‍යවරු ඉන්න නිසා තමන්ට ඉදිරියට එන්න බැහැ කියලා. අවුරුදු 60න් විශ්‍රාම ගැන්වීමේ යෝජනාව ක්‍රියාත්මක වුණොත් විශේෂඥ වෛද්‍යවරු 200ක් පමණ එකවර විශ්‍රාම යනවා; medical officersලා 500ක් පමණ එකවර විශ්‍රාම යනවා. ඔය හැම ආයතනයකම, හැම අංශයකම දැනටත් පුරප්පාඩු තිබෙනවා. Surgeonsලා ගත්තත්, thoracic surgeonsලා ගත්තත්, psychiatristsලා ගත්තත් හැම අංශයකම සියයට 30ක විතර පුරප්පාඩු දැනටත් තිබෙනවා. ඒ නිසා මේවා මේ ආර්ථිකය ගැන කථා කරලා විතරක් ගන්න පුළුවන් තීන්දු තීරණ නොවෙයි. තරුණ වෛද්‍යවරුන්ටත් කථා කරලා, GMOA එකටත් කථා කරලා, පළපුරුද්ද තිබෙන වෛද්‍යවරුන්ටත් කථා කරලා, හරියාකාරව තීන්දු තීරණ අරගෙන මේ ගැටලුවලට තමුන්නාන්සේලා විසඳුම් සොයන්න. මේ ඔක්කෝම ගැටලු ගැන කථා වන විටත්, මේ රට කඩා වැටිලා තිබියදීත් තමුන්නාන්සේලා ජාවාරම් නවත්වන්නේ නැහැ; හොර ව්‍යාපාර නවත්වන්නේ නැහැ. සීනි බදු වංචාවෙන් දැනට පාඩුව රුපියල් බිලියන 45ක් බව කියනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට නියමිත කාලය අවසන් වනවා.

**ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා**
(பீல்ட் மார்ஷல் மாண்புமிகு சரத் பொன்சேகா)
(The Hon. Field Marshal Sarath Fonseka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ කාරණයත් කියලා මම කථාව අවසන් කරන්නම්.

මියන්මාරයෙන් ගෙනාපු හාල්වලින් මෙට්‍රික් ටොන් එකකින් ඩොලර් 100 ගණනේ හොරකම් කළා. *[බාධා කිරීමක්]* ඇමතිතුමා, ඔබතුමා කලිනුත් උත්තර දුන්නා. Sinopharm vaccines හැම එකකින්ම තමුන්නාන්සේලා ඩොලර් 5ක් බැගින් හොරකම් කළා. ගෑස්වලින් හොරකම් කරනවා; ගල් අඟුරුවලින් හොරකම් කරනවා. මේ ආකාරයට හැම අංශයකින්ම හොරකම් කරන එක දැන්වත් නවත්වන්න. තමුන්නාන්සේලාට කකුල් අල්ලා වඳින්න ඕනෑ නම් වඳින්න අපට පුළුවන්. හැබැයි, එහෙම වැඳලා අපට පාරට නම් බහින්න බැරි වේවි. පාරේදී මිනිස්සු අපට ගහලා එළවාවි. තමුන්නාන්සේලා හැදෙන්නේ නැහැ. තමුන්නාන්සේලාට හැදෙන්න වුවමනාවක් නැහැ. හැදෙනවා කියන්නේ, ශීලාචාරකම ඇති කරගැනීම සහ හොරකම නැති කරගැනීම. ඒ වුවමනාව තමුන්නාන්සේලාගේ ඇඟේ නැහැ. අරගළයට ජය වේවා! අරගළය හරහා මේ රට බේරාගන්නා ජනතාවට ජය වේවා!

**ගරු ශාන්ත බණ්ඩාර මහතා**
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පැහැදිලි කිරීමක් කරන්න මට විනාඩියක් දෙන්න.

[ගරු ශාන්ත බණ්ඩාර මහතා]

ගරු ගයන්ත කරුණාතිලක මැතිතුමා කථා කරමින් වැදගත් අදහස් රාශියක් ඉදිරිපත් කළා. අපි එතුමාට ගරු කරනවා. එතුමා කථා කළ වෙලාවේ අග්‍රාමාත්‍යතුමා සමඟ අපේ ගරු කැබිනට් අමාත්‍යතුමාත්, මමත් මේ සභාවෙන් පිටත සාකච්ඡාවක නිරත වෙලායි හිටියේ. නමුත්, අපි එතුමාගේ කථාව සම්පූර්ණයෙන් ඇහුවා. එතුමා ඉදිරිපත් කළ කාරණාවලට අප සම්පූර්ණ අවධානය යොමු කරන බව කියනවා. එතුමාගේ කථාවේදී කිව්වා, කැබිනට් අමාත්‍යවරයාත්, රාජ්‍ය අමාත්‍යවරයාත් මේ සභාවේ නැහැ කියන කාරණය.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු සාගර කාරියවසම් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 13ක කාලයක් තිබෙනවා.

Order, please! Before he starts, will an Hon. Member propose the Hon. Velu Kumar to the Chair?

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardana)
Sir, I propose that the Hon. Velu Kumar do now take the Chair.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු වේලු කුමාර් මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு* வேலு குமார் *அவர்கள் தலைமை வகித்தார்கள்.*

Whereupon THE HON. SHANAKIYAN RAJAPUTHIRAN RASAMANICKAM *left the Chair, and* THE HON. VELU KUMAR *took the Chair.*

[අ.භා. 2.42]

**ගරු සාගර කාරියවසම් මහතා**
(மாண்புமிகு சாகர காரியவசம்)
(The Hon. Sagara Kariyawasam)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවලට කිසියම් වූ සංශෝධන කිහිපයක් ගෙන එන මේ වෙලාවේ ඒ සම්බන්ධයෙන් කථා කරන්න අවස්ථාව ලබා දීම ගැන මා ප්‍රථමයෙන් ස්තුතිවන්ත වෙනවා. ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ක්‍රමය තුළ උත්තරීතරම ආයතනය හැටියට සලකා අප කථා කරන්නේ පාර්ලිමේන්තුව ගැනයි. පාර්ලිමේන්තුවට මේ උත්තරීතරභාවය රැකගෙන තමන්ගේ වග කීම වන නීති සම්පාදනය කිරීමට අවශ්‍ය නම්, එය සිදු කරන ආකාරය දක්වා තිබෙන්නේ ස්ථාවර නියෝග තුළයි. ඒ කියන්නේ, මේ රටේ උත්තරීතරම ආයතනයට වඩාත් ඵලදායී ලෙස හා විශ්වසනීය ලෙස සිය කර්තව්‍යය ඉටු කිරීම සඳහා අවශ්‍ය මාර්ගෝපදේශ ලබා දී තිබෙන්නේ ස්ථාවර නියෝග මඟින්. ස්ථාවර නියෝග කියන්නේ, පාර්ලිමේන්තු සම්ප්‍රදායයේ ඉතා වැදගත් අංගයක්. ඒ වාගේම, නීති සම්පාදනය කරන මේ ආයතනය කෙරෙහි රටේ ජනතාවගේ විශ්වසනීයත්වය ගොඩ නැඟීම සඳහා සහ ගෞරවය ලබා ගැනීම සඳහා මෙම ස්ථාවර නියෝග නිසි පරිදි ක්‍රියාත්මක වීම ඉතාම වැදගත්.

අපේ පාර්ලිමේන්තු ඉතිහාසය ගත්තොත්, මුල් වතාවට ලංකාවේ ස්ථාවර නියෝග පනවා තිබෙන්නේ, 1912 වර්ෂයේදී බ්‍රිතාන්‍ය යටත් විජිතයක් හැටියට පැවැති ලංකාවේ ව්‍යවස්ථාදායක කවුන්සලය තුළයි. ඒ, බ්‍රිතාන්‍ය සම්ප්‍රදායට අනුව යමින්. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ, 1979 වසරේ හඳුන්වා දුන් ස්ථාවර නියෝග වරින් වර සංශෝධනය කරමින් අපි දැනට භාවිත කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පොදු රාජ්‍ය මණ්ඩලීය රටවල පාර්ලිමේන්තු මූලධර්මයක් ලෙස සලකන ලැටිමර් හවුස් මූලධර්මවල කියන එක මූලික කරුණක් තමයි, කිසිදු නීති විරෝධි බලපෑමකින් තොරව පාර්ලිමේන්තුවට සිය ව්‍යවස්ථාදායක කටයුතු සිදු කිරීමේ හැකියාව තිබිය යුතුයි කියන කාරණය. ඒ කාරණය ඉටු කරගැනීම සඳහා අවශ්‍ය වන යන්ත්‍රණය ලෙස තමයි මේ ස්ථාවර නියෝග කියන ක්‍රමවේදය හඳුන්වා දී තිබෙන්නේ. ඒ අනුව, පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය තුළ ස්ථාවර නියෝග ඉතාම වැදගත් කාර්ය භාරයක් ඉටු කරනවා. ඒ වාගේම පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය විශ්වාස කරන මහජන නියෝජිතයන් මෙම ස්ථාවර නියෝගවලට ගරු කිරීමත්, ඒවා පිළිපැදීමත් මේ රටේ ජනතාවගේ විශ්වාසය ඇති කිරීමක්. ඒ කාරණය ඉතා වැදගත්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වුණාට ඉතාම කනගාටුදායක තත්ත්වයකුත් තිබෙනවා. මේ පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය තුළින් මෙම ගරු සභාවට පැමිණෙන බොහෝ මන්ත්‍රීවරුන් මෙම ස්ථාවර නියෝගවලට පටහැනි ආකාරයෙන් ප්‍රකාශ නිකුත් කරනවා. මෙවැනි ප්‍රකාශ නිකුත් කිරීම හරහා ව්‍යංගාකාරයෙන්, පාර්ලිමේන්තු ක්‍රමය කෙරෙහි රටේ ජනතාව තුළ තිබෙන විශ්වාසය බිඳ හෙළීමට කටයුතු කරනවාද කියන සැකය ඇති වෙමින් තිබෙනවා. මම කථා කරන්න කලින් විරුද්ධ පක්ෂයේ ගරු මන්ත්‍රීවරයෙකුත් මේ පිළිබඳව කිව්වා. ඒ සම්බන්ධයෙන් තවදුරටත් කරුණු කියන්න මම කැමැතියි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ පාර්ලිමේන්තු කාරක සභා දෙකක් තිබෙනවා. එකක් පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව, එහෙම නැත්නම් අපි ඒකට COPE කියලා කියනවා. අනෙක් එක, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව. අපි එය COPA ලෙස හඳුන්වනවා. මේ COPE සහ COPA කාරක සභා දෙක පවත්වාගෙන යෑම සඳහා වන සියලු නීති රීති ස්ථාවර නියෝග තුළින් සකස් කර තිබෙනවා. ස්ථාවර නියෝග 119, 120 අනුව මේ කාරක සභා පිහිටුවලා තිබෙනවා. ඒ වාගේම ස්ථාවර නියෝග 127 (1) යටතේ, මේ කාරක සභාවල සභාපතිවරුන් පත් කළ යුතු ආකාරය ඉතා පැහැදිලි ලෙස සඳහන් කර තිබෙනවා. නමුත් කියන්න කනගාටුයි, විපක්ෂයේ මන්ත්‍රීවරයකු අදත් මේ සභාවේ ප්‍රකාශ කර සිටියා, "මේ කාරක සභාවල සභාපතිත්වය විරුද්ධ පක්ෂයට ලබා දෙන්න එකඟ වුණා, නමුත් ඒක ලබා දීම සිදුකළේ නැහැ" කියලා. හිතාමතාම මෙවැනි කාරණා ප්‍රකාශ කිරීම තුළින් ඒ අය බලාපොරොත්තු වෙන්නේ මොකක්ද? මේ ගරු සභාව කෙරෙහිත්, මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳවත් ජනතාවගේ තිබෙන විශ්වසනීයත්වය නැති කරලා විනාශ කරන්න කරන කුමන්ත්‍රණයක්ද මේ කරන්නේ කියන ප්‍රශ්නය අපට ඇති වෙනවා. මොකද, මේ සම්බන්ධයෙන් විවිධ සාකච්ඡා ඇති වුණා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එහිදී අපි ඉතා පැහැදිලිව කියා සිටියා, "COPE සහ COPA කාරක සභා දෙකට විරුද්ධ පක්ෂයෙන් සභාපතිවරුන් පත් කිරීමක් සම්බන්ධයෙන් ස්ථාවර නියෝගවල කිසිම තැනක සඳහන් වන්නේ නැහැ, ස්ථාවර නියෝග අනුව කටයුතු කරමින්, පාර්ලිමේන්තුවේ පිළිගත් ක්‍රමවේදය අනුව කටයුතු කරමින් මෙය සිදුකළ යුතුයි" කියලා. නමුත් මේ රැස්වීමට සම්බන්ධ වෙච්ච, අවුරුදු 20ක්, 30ක් මේ පාර්ලිමේන්තුවේ හිටපු විපක්ෂයේ ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරු පාර්ලිමේන්තුවෙන් එළියට බහිනකොට, එළියේ මයික් එකක් අල්ලාගෙන සිටින මාධ්‍යවේදීන් හමුවේ කියනවා, ශ්‍රී ලංකා

පොදුජන පෙරමුණ විපක්ෂයට මේ කමිටුවල සභාපති ධුර දෙනවාට විරුද්ධ වුණා කියලා. මේක තමයි මේ පාර්ලිමේන්තුවේ අද තිබෙන ප්‍රජාතන්ත්‍රවාදය. ඒ කියන්නේ ස්ථාවර නියෝගවලට කිසිදු ගරු කිරීමක් නැහැ. ස්ථාවර නියෝග පිළිගන්නේ නැතිව, ස්ථාවර නියෝගවලට පටහැනි ප්‍රකාශ පිටතදී සිදු කරමින් ඒ සම්බන්ධයෙන් කිසියම් වූ දේශපාලන වාසියක් ලබා ගන්න උත්සාහ කරනවා. එය ඉතාම කනගාටුදායක තත්ත්වයක්. මෙහෙම කිව්වාට පස්සේ පහුවෙනිදා පත්තරේ මුල් පිටුවේ වැටෙනවා. ඊට පස්සේ උදේ ප්‍රවෘත්ති නාළිකාවල පත්තර කියවන අය මේ ප්‍රවෘත්තියට අතිනුත් කැලි එකතු කරලා රස කරලා කියනවා. මේක අහගෙන ඉන්න ජනතාව හිතනවා, මේ රටේ පාර්ලිමේන්තුව කියන්නේ ආණ්ඩු පක්ෂය සහ විපක්ෂය කඹ ඇද ගන්නා, පිස්සු නටන තැනක් කියලා. මේ මතය ඇති කරන්න තමයි මේ උත්සාහ දරන්නේ.

ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ වෙනුවෙන් අපි කරපු එකම ඉල්ලීම තමයි, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අනුව මෙම කාරක සභාවල කටයුතු කරන්න කියන එක. මෙවැනි පදනම් විරහිත, සත්‍යතාවෙන් තොර ප්‍රකාශ කළාම ඒ ප්‍රකාශ තුළින් පහර වැදෙන්නේ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණට නොවෙයි, පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදයට සහ පාර්ලිමේන්තු ක්‍රමයටයි. ඒ නිසා විපක්ෂයේ ගරු මන්ත්‍රීවරු පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය විනාශ කිරීමේ කුමන්ත්‍රණයකට හිතාමතාම දායක වෙලා මේ විධියට කටයුතු කරනවාද කියලා අපට සැකයක් තිබෙනවා.

**ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මහතා**
(மாண்புமிகு இம்தியாஸ் பாகிர் மாகார்)
(The Hon. Imthiaz Bakeer Markar)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Yes, Hon. Imthiaz Bakeer Markar?

**ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මහතා**
(மாண்புமிகு இம்தியாஸ் பாகிர் மாகார்)
(The Hon. Imthiaz Bakeer Markar)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු මන්ත්‍රීතුමාගේ කථාවේ සඳහන් කාරණයක් ගැන පැහැදිලි කිරීමක් කරන්න ඔබතුමාගෙන් ගෞරවයෙන් අවසර ඉල්ලනවා. එදා විපක්ෂයේ මන්ත්‍රීවරයකුව සිටි බර්නාඩ් සොයිසා මහත්මයා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සභාපතිවරයා ලෙස කටයුතු කළා. ගරු සුනිල් හඳුන්නෙත්ති මහත්මයාත් පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සභාපති ලෙස කටයුතු කළා. විපක්ෂයේ අයට ඒ කාරක සභාවල සභාපතිකම දීලා තමන්ගේ අව්‍යාජ බව, ප්‍රශ්න කිරීමට තිබෙන අයිතිය එදා පාලක පක්ෂය පෙන්නුවා. ඒ පිළිබඳව ආණ්ඩු පක්ෂයේ ස්ථාවරය මොකක්ද?

**ගරු සාගර කාරියවසම් මහතා**
(மாண்புமிகு சாகர காரியவசம்)
(The Hon. Sagara Kariyawasam)
ඔබතුමා මගේ වෙලාව නේ ගන්නේ, ගරු මන්ත්‍රීතුමා. ඔබතුමාගේ කථාවේදී ඔය කාරණා කියන්න. මට මතක ඇති කාලයේ COPE එකේ සභාපති හැටියට ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයකු වන විජයදාස රාජපක්ෂ මැතිතුමා හිටියා. ඊට පසුව ඩිව් ගුණසේකර මැතිතුමා හිටියා. එතුමා ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයෙක්. ඊට පසුව පසුගිය යහ පාලන ආණ්ඩුව කාලයේ ඔබතුමන්ලා සුනිල් හඳුන්නෙත්ති මහත්මයාව පත් කළා. හැබැයි, ජනතා විමුක්ති පෙරමුණ යහ පාලන ආණ්ඩුවේ පංගුකාරයෙක් වෙලා එක්සත් ජාතික පක්ෂයත් එක්ක හිටියේ. එතකොට ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයෙක් තමයි පසුගිය යහ පාලන ආණ්ඩුව කාලයේ COPE එකේ සභාපති ධුරයට පත් කළේ. ගරු මන්ත්‍රීතුමනි, අපි දන්නා මෑත ඉතිහාසයේ නම් COPE එකේ සභාපති ධුරය දීලා තිබුණේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයෙකුට මිස විපක්ෂයේ මන්ත්‍රීවරයෙකුට නොවෙයි. ඩිව් ගුණසේකර මැතිතුමා ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයෙක්. විජයදාස රාජපක්ෂ මැතිතුමා ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයෙක් හැටියටයි ඒ කර්තව්‍යය ඉටු කළේ. ඒ විතරක් නොවෙයි. සුනිල් හඳුන්නෙත්ති මැතිතුමාත් ඒ කාර්ය කළේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයෙක් හැටියටයි කියන කාරණය මම ඉතා වගකීමෙන් කියනවා.

මේ කියන දේවල්වලින්, වගකීම් විරහිත ප්‍රකාශවලින් මේ රටේ නෛතික ව්‍යුහය, ආයතනික ව්‍යුහය කඩා වට්ටලා, මේ රට අරාජික කරලා, මේ රට කුමන්ත්‍රණවල ගොදුරක් බවට පත් කරන්නද හදන්නේ කියන ප්‍රශ්නය මම ඔබතුමන්ලාගෙන් අහන්න කැමතියි. අද වෙනකොට මේ රට ඉතා විශාල කුමන්ත්‍රණයක ගොදුරක් වෙලා තිබෙන බව අපි දන්නවා. මේ කුමන්ත්‍රණයේ පළමුවැනි පියවර වෙන්නේ ප්‍රජාතන්ත්‍රවාදය සුරකින ආයතන පද්ධතිය විනාශ කිරීමයි. ඒක ඉතා සූක්ෂ්මව කරනවා. මේ විධියට පදනම් විරහිත චෝදනා නඟමින් මේ ආයතන පද්ධතිය කෙරෙහි ජනතා විශ්වාසය නැති කරලා, ඒවා විනාශ කිරීමේ කර්තව්‍යය සමාජ මාධ්‍ය සහ වෙනත් මාධ්‍ය භාවිත කරමින් ඔබතුමන්ලා බොහොම ලස්සනට කරනවා.

මෙම කුමන්ත්‍රණයේ දෙවැනි පියවර හැටියට මේ රටේ ජාතික බලවේගය විනාශ කිරීමේ කොන්ත්‍රාත්තුව තමුන්නාන්සේලා කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජාතික බලවේගය කියලා මම අදහස් කරන්නේ ජාතිවාදී බලවේගයක් නොවෙයි. මේ රටට ආදරය කරන සිංහල, දමිළ, මුස්ලිම්, බර්ගර් කියන සියලු ජාතීන් එකතු කර ගත්ත, ජාතිය වෙනුවෙන්, රට වෙනුවෙන් එකතු වෙච්ච ජාතික බලවේගයක්. ශ්‍රී ලාංකීය ජාතිය වෙනුවෙන් ඇති වෙච්ච බලවේගයක්. මෙන්න මේ ජාතික බලවේගය විනාශ කිරීමේ කොන්ත්‍රාත්තුව තමයි ඔබතුමන්ලා මේ කරන්නේ. ඒ ජාතික බලවේගයට නායකත්වය දීපු නායකයින්ට අද මඩ ගසමින්, අවලාද නඟමින් සිටිනවා. ඒ ජාතික බලවේගයට නායකත්වය දීපු පක්ෂවලට අනිවාර්යෙන් පදනම් විරහිත -කිසිම පදනමක් නැති- චෝදනා නඟමින් ඉන්නවා. ඒක අපි මේ ළඟදී දැක්කා. ඒ ජාතික බලවේගයේ එක් ප්‍රධාන කොටසක් වන මහා සංඝරත්නය, ඒ ජාතික බලවේගයට එරෙහිව කටයුතු කරන යම් පුද්ගලයින් සමඟ එකතු වෙලා මේ රටට විරුද්ධව කටයුතු කරනවා. ඒ පුද්ගලයින්ගේ පසුබිම පිළිබඳව සොයා බැලුවොත්, ඔවුන් NGOsවලට සම්බන්ධ, මේ රටට ආදරයක් නැති, මේ රට විනාශ කිරීමට කටයුතු කළ පුද්ගලයන්. දැන් මේ කාරණය ගැන හිතන්න තරුණ පරපුරට වෙලාව ඇවිත් තිබෙනවා කියලායි මම හිතන්නේ. මේ සම්බන්ධයෙන් නැවත වතාවක් හිතලා, හරි දේ මොකක්ද කියලා තීරණය කරලා, අන්න ඒ තීරණය මත නිවැරැදි දේ කරන්න තරුණ පරපුරට දැන් කාලය ඇවිත් තිබෙනවාය කියන කාරණය මතක් කරමින්, මගේ කථාව අවසන් කරනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
நன்றி. அடுத்து கௌரவ முஜிபுர் ரஹுமான் அவர்கள், உங்களுக்கு 5 நிமிடங்கள் இருக்கின்றன.

[අ.භා. 2.55]

**ගරු මුජීබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග සංශෝධනය කිරීම සම්බන්ධයෙන් කථා කිරීමට මටත් අවස්ථාවක් ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

මේ ස්ථාවර නියෝගවලින් වැදගත්ම එක තමයි, COPE එකට අදාළ ස්ථාවර නියෝගය. හැම ආණ්ඩුවක් යටතේම COPE එකේ සභාපති ධුරය විවිධ පක්ෂ නියෝජනය කරන මන්ත්‍රීවරුන්ට ලබා දී තිබෙනවා. මට කලින් කථා කළ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ මහ ලේකම්තුමා කිව්වා, විජයදාස රාජපක්ෂ මැතිතුමා, ඩිව් ගුණසේකර මැතිතුමා COPE එකේ සභාපති ධුරයේ හිටපු බව. එ්ක ඇත්ත. නමුත් එතුමාට අමතක ඇති, මහින්ද රාජපක්ෂ මැතිතුමා විසින් විජයදාස රාජපක්ෂ මැතිතුමා COPE එකේ සභාපති ධුරයෙන් ඉවත් කළ බව. මහින්ද රාජපක්ෂ මැතිතුමා විසින් පාර්ලිමේන්තුව වාර අවසාන කළා, prorogue කළා. පාර්ලිමේන්තුව වාර අවසාන කරලා විජයදාස රාජපක්ෂ මැතිතුමා සභාපති ධුරයෙන් ඉවත් කළා. ඒ ඉවත් කළේ, වෙන මොකක්වත් නිසා නොවෙයි. එදා විජයදාස රාජපක්ෂ මැතිතුමා තමුන්නාන්සේලාගේ ආණ්ඩුව යටතේ COPE එකේ සභාපති හැටියට කටයුතු කරද්දී මහින්ද රාජපක්ෂ මහත්මයාගේ ආණ්ඩුවේ සිදු වුණු දූෂණ ගණනාවක් හෙළිදරව් වුණු නිසායි එතුමා එම ධුරයෙන් ඉවත් කළේ. එහෙම ඉවත් කළ නිසා තමයි විජයදාස රාජපක්ෂ මැතිතුමා එදා විපක්ෂයට ඇවිල්ලා වාඩි වුණේ.

ඊළඟට, යහ පාලන ආණ්ඩුව කාලයේදී COPE එකේ සභාපති ධුරය අපි ජනතා විමුක්ති පෙරමුණේ සුනිල් හඳුන්නෙත්ති මැතිතුමාට දුන්නා. මහ බැංකුවේ සිදු වුණාය කියන වංචාව පිළිබඳව එවක පැවැති COPE එකෙන් සම්පූර්ණ පරීක්ෂණයක් කළා, එතුමාගේ මූලිකත්වයෙන්. එදා අපි බහුතරයක් COPE එකේ සාමාජිකයන් විධියට හිටියා. එදා අපට ඒ කටයුත්ත අඩාළ කරන්න අවස්ථාව තිබුණා. නමුත්, අපි එහෙම කළේ නැහැ. මොකද, අප විශ්වාස කරන ආකාරයට පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය තුළ විපක්ෂය යම් කාර්ය භාරයක් කළොත් තමයි රටේ වංචාව, දූෂණය අවම කර ගන්න පුළුවන් වෙන්නේ. ඒ නිසා තමයි අපි කියන්නේ, රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ, COPE එකේ සභාපති ධුර විපක්ෂයට දෙන්න කියලා. එම තනතුරු විපක්ෂයට දුන්නාම ආණ්ඩුවේ වංචා, දූෂණ සිදු වෙනවා නම් ඒවා අල්ලා ගන්න පුළුවන්, මොන ආණ්ඩුව බලයේ හිටියත්. ඒකයි අපි එහෙම යෝජනා කරන්නේ. අපි දන්නවා, අද COPE එක වංචා, දූෂණ කොයි තරම් ප්‍රමාණයක් හොයා ගත්තත්, ඒ සම්බන්ධයෙන් ඉදිරියට ක්‍රියාත්මක වෙන්න ඒ කමිටුවට බලයක් නැහැ කියලා. අඩු ගණනේ නීතිපති දෙපාර්තමේන්තුවට යවලා නඩු පවරන්නවත් මේ කමිටුවලට බලය ලබා දෙන්න ඕනෑ. මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව ගත්තත් ඒ වාගේමයි. එහිදීත් යම් යම් කරුණු වරු ගණන් විභාග කරනවා. හැතැප්ම 100, 150 දුර ඉඳලායි මිනිස්සු ඒ සඳහා සහභාගි වන්න පාර්ලිමේන්තුවට එන්නේ. මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවෙන් නියෝගයක් දුන්නාම අමාත්‍යාංශවල ලේකම්වරු කවුරුවත් ගණන් ගන්නේ නැහැ. මොකද, එහි කිසිදු නීතිමය බලයක් නැහැ. ඒ නිසා එහෙම කමිටු රැස් වෙලා වැඩක් නැහැ. යම් නීතිමය බලයක් තිබෙන කමිටුවක් විධියට මේ කමිටු රැස් වෙන්න ඕනෑ. අපි කියනවා නේ, මේ රටේ ප්‍රධාන ආයතනය පාර්ලිමේන්තුව කියලා. එහෙම නම්, පාර්ලිමේන්තුවේ තිබෙන කමිටුවලට අනිවාර්යයෙන්ම ඒ බලය ලබා දෙන්න ඕනෑ. කිසිදු ආකාරයේ බලයක් නැතිව එම කමිටු ක්‍රියාත්මක කිරීම තුළ ජනතාව රස්තියාදු වීම විතරයි සිදු වෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආංශික අධීක්ෂණ කාරක සභා මඟිනුත් අපට හුඟක් කරුණු හොයා ගන්න පුළුවන්. ක්‍රීඩා විෂයය සම්බන්ධයෙන් වන ආංශික අධීක්ෂණ කාරක සභාවටත් ඉදිරියේදී යම් විශේෂ කාර්ය භාරයක් කරන්න සිදු වෙනවා. ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනය කාලෙකින් වාර්ෂික සම්මේලනය පවත්වා නැහැ. හරි නම් ඒ ගොල්ලන් පසුගිය මැයි 31වැනි දා වාර්ෂික සම්මේලනය පවත්වන්න ඕනෑ. නමුත්, පවත්වා නැහැ. එවකට සිටි ක්‍රීඩා ඇමතිතුමා එය අගෝස්තු මාසයේ 31වැනි දාට කල් දමා තිබෙනවා. ඊළඟට, වර්තමාන ක්‍රීඩා ඇමතිතුමා සැප්තැම්බර් මාසයේ 15වැනි දා වනතෙක් ඒක දීර්ඝ කර තිබෙනවා. නමුත්, සැප්තැම්බර් මාසයේ 15වැනි දා කියන්නේ පසුගිය සතියේ දිනයක්. එදිනත් එය පැවැත්වුණේ නැහැ. මේ සම්බන්ධයෙන් දැන් අලුත් ගැසට් නිවේදනයක් ඇවිල්ලා තිබෙනවා. ඒ ගැසට් නිවේදනයට අනුව ඔක්තෝබර් මාසයේ 30වැනි දා වෙනකම් මෙම සම්මේලනය පැවැත්වීමේ දිනය දීර්ඝ කරලා තිබෙනවා. මේ ගැසට් නිවේදනය නිකුත් කරලා තිබෙන්නේ සැප්තැම්බර් මාසයේ 17වැනි දා. මේ ගැසට් නිවේදනයේත් විශේෂ දෙයක් තිබෙනවා. ඒ තමයි, මේ ගැසට් නිවේදනයට ක්‍රීඩා ඇමතිතුමා අත්සන් නොකිරීම. ඒ කියන්නේ ක්‍රීඩා ඇමතිතුමා දන්නේත් නැහැ, ක්‍රීඩා අමාත්‍යාංශයේ ඉන්න අධ්‍යක්ෂ ජනරාල්වරයා ක්‍රීඩා ඇමතිතුමාගේ scanned signature එක අරගෙන මේ සම්මේලනය පවත්වන්න ඕනෑ දිනය ඔක්තෝබර් මාසයේ 30වැනි දා වෙනකම් දීර්ඝ කරලා ගැසට් නිවේදනයක් නිකුත් කර තිබෙනවා. මට ආරංචියක් ආවා, ක්‍රීඩා ඇමතිතුමා මේ සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වනවා කියලා. පරීක්ෂණයක් කරන්න නොවෙයි, හරි නම් ඇමතිතුමා විසින් වහාම ඒ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ වැඩ තහනම් කරන්න ඕනෑ. මොකද, ඇමතිතුමාගේ අත්සන නැතිව scanned signature එකක් ගහලා, ඇමතිතුමාත් නොදැනුවත්වයි මේක කරලා තිබෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එහෙම නම් මේ වාගේ දෙයක් කරන්න බලය තිබෙන පුද්ගලයා කවුද? එහෙම නම් මේ ක්‍රීඩා ඇමතිතුමා

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ක්‍රීඩා ඇමතිතුමාට ඉහළින් ඉන්න කවුරු හරි ක්‍රීඩා අමාත්‍යාංශයේ ලේකම්වරුන්ට, අධ්‍යක්ෂ ජනරාල්වරුන්ට උපදෙස් දීලා, ඒ ගොල්ලන් වර්තමාන ක්‍රීඩා ඇමතිතුමාටත් නොදන්වා යම් යම් ගැසට් නිවේදන නිකුත් කරනවා නම්, අපට පේන්න තිබෙන දේ තමයි, තවමත් හිටපු අමාත්‍යවරුන්ගේ අවතාර මේ රටේ වැඩ කරනවා කියන එක. ඒ නිසා අපට කියන්න වෙන්නේ හිටපු ක්‍රීඩා ඇමතිවරයකුගේ අවතාරය තවමත් ක්‍රීඩා අමාත්‍යාංශයේ වැඩ කරන බව තමයි. ඒ දේවල් වර්තමාන ක්‍රීඩා ඇමතිවරයාටත් පාලනය කර ගන්න බැහැ. අපට මේවා ගැන කියන්නත් ලජ්ජයි.

ක්‍රීඩා අමාත්‍යාංශයේ, විශේෂයෙන්ම ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනයේ රුපියල් කෝටි ගණන් මුදල් තිබෙනවා. ඒ මුදල් වැය කරන හැම වැඩක්ම දැන් බාර දෙන්නේ LSR කියන ආයතනයටයි. කිසිදු ආකාරයක ටෙන්ඩර් පටිපාටියක්වත් නැතිව, ඒකේ තිබෙන සියලු කටයුතු, රුපියල් කෝටි ගණන් මුදල්, ඒ ඔක්කෝම පරිහරණය කරන්න දෙනවා, Lanka Sportreizen කියන ආයතනයට. ඒ ආයතනය මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන මන්ත්‍රීවරයකුගේ මාමා කෙනෙකුගේ ආයතනයක්. ඒක තමයි ඒ සියලු දේවල් ඒ ආයතනයට දෙන්නේ. මේ හරහා අපට දෙයක් තේරෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ තමයි, රනිල් වික්‍රමසිංහ මැතිතුමා ජනාධිපති වෙලා, මේ පාර්ලිමේන්තුවේ අලුත් ආණ්ඩුවක් බිහි වුණා කියලා පරණ කිසිම දෙයක් වෙනස් වෙලා නැහැ කියන එක. රාජපක්ෂලාගේ අවතාර තවමත් මේ

අමාත්‍යාංශවල නොයෙක් ක්‍රියාකාරකම් කරගෙන යනවා. ඒ හින්දා තමයි අපි කියන්නේ මේ වැඩේ හරියන්නේ නැහැ කියලා. මේ විධියට තව ඉදිරියට යන්න යන්න තවත් විනාශයටම තමයි මේ රට ගමන් කරන්නේ.

ස්තුතියි.

[අ.භා. 3.02]

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardana)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග සංශෝධනය කිරීම පිළිබඳ කථා කරන මේ මොහොතේ, මටත් ඒ ගැන කථා කරන්න අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

මේ සභාව අපේ රටේ තිබෙන උත්තරීතර සභාවයි. මක්නිසාද යත්, යහපත් සමාජයක් සඳහා මූලික කුලුනු තුනක් රටක පවතිනවා. එම කුලුනු තුන වන්නේ, ව්‍යවස්ථාදායකය, විධායකය සහ අධිකරණයයි. ව්‍යවස්ථාදායකය කියන්නේ නීති හදන තැනයි. ව්‍යවස්ථාදායකය විසින් සකස් කරන නීති අනුව තමයි අධිකරණය විසින් යුක්තිය පසිඳලීමේ කාර්යය කරන්නේ. එතකොට අධිකරණය කෙරෙහි අන්‍යෝන්‍ය විශ්වාසයක්, ගෞරවයක් තිබෙනවා. විනිශ්චයකාරවරුනුත්, ඒ හා සම්බන්ධිත අධිකරණ කටයුතුවල නියැළෙන නීතිඥවරුනුත් කටයුතු කරන ආකාරය අනුව අධිකරණය කෙරෙහි ලොකු විශ්වාසයක් සහ ගෞරවයක් ඇති කරගෙන තිබෙනවා. ඒ නිසා ශ්‍රේෂ්ඨාධිකරණය තුළ හෝ වෙනත් විනිශ්චය සභාවක් තුළ විත්තියේ සහ පැමිණිල්ලේ නීතිඥවරු කවර තර්ක මතු කළත්, මූලාසනයේ නියෝගයට ගරු කරලා ඒ පිළිබඳ කිසිදු ප්‍රශ්න කිරීමකින් තොරව කටයුතු කරන අතර, අධිකරණයේ ගෞරවය ආරක්ෂා කිරීම සඳහා වෙනම නීති පද්ධතියක් තිබෙනවා. ඒ නිසා තමයි, අධිකරණයට අපහාසයක් වෙන වචනයක් හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුගේ මුවෙන් පිටවුණොත් ඊට විරුද්ධව අධිකරණය ක්‍රියා කරන්නේ. උදාහරණයක් වශයෙන්, අපේ රටේ පාර්ලිමේන්තුව තුළ දීර්ඝ කාලීන අත්දැකීම් සහිත, අමාත්‍ය ධුර රැසක් දරපු එස්.බී. දිසානායක මැතිතුමා, ඊළඟට, මන්ත්‍රීවරයකු ලෙස සිටි රන්ජන් රාමනායක මැතිතුමා යන අය අධිකරණයේ ගෞරවය ආරක්ෂා නොවන ලෙස හැසිරුණු අවස්ථා තිබුණා. එවැනි දේවල් සිදුවන නිසා අධිකරණයට අපහාස කිරීම සම්බන්ධයෙන් ක්‍රියා කරන ආකාරය ගැන වෙනම නීති පවා හදලා තිබෙනවා.

මම මීට අවුරුදු 33කට පෙර, එනම් 1989දී තමයි පාර්ලිමේන්තුවට තේරී පත් වුණේ. අපේ ඉම්තියාස් බාකීර් මාකාර් මැතිතුමා මේ කරුණු දන්නවා. එතුමාගේ පියා මේ පාර්ලිමේන්තුවේ කථානායකවරයෙකු ලෙස හිටියා. ඒ කාලය තුළදී පාර්ලිමේන්තුව තුළ ආණ්ඩුවේත්, විපක්ෂයේත් මන්ත්‍රීවරු අන්‍යෝන්‍ය වශයෙන් ඉතා විශාල ගෞරවයකින් තමයි කටයුතු කළේ. කවදාවත් මන්ත්‍රීවරයෙක් තවත් මන්ත්‍රීවරයෙකුට අපහාස කළ බවක් අපි දැක්කේ නැහැ. චෝදනාවක් තිබුණා නම් ඒ චෝදනාව නිසි ආකාරයෙන් ඔප්පු කිරීම සඳහා මිසක්, අවලාදයක් සඳහා හෝ මඩ ගැසීම සඳහා මේ ගරු සභාවේ වරප්‍රසාද කවදාවත් පාවිච්චි කළේ නැහැ. බාකීර් මාකාර් මැතිතුමා ඉස්ලාම් භක්තික මුස්ලිම් ජාතිකයෙක්. ඒ වාගේම, ගරු කථානායකවරයා ලෙස කටයුතු කළ එම්.එච්. මොහොමඩ් මැතිතුමාත් ඉස්ලාම් ආගම ඇදහූ නායකයෙක්. අපි හැමෝම එදා පාර්ලිමේන්තුවේ මූලාසනයට ඉතාම අසීමිත ලෙස ගෞරව කළා. ඒ කාලයේ, මීට වඩා විශාල ප්‍රශ්න තිබුණා. එදාත් අද වාගේම පාර්ලිමේන්තුව හෑල්ලු කිරීම සඳහා කටයුතු කළා. මුළු පාර්ලිමේන්තුවම හොර පාර්ලිමේන්තුවක්, පාර්ලිමේන්තුවට එන්නේ පල් හොරු, හොර පාර්ලිමේන්තුව වර්ජනය කරවු! පාර්ලිමේන්තු මැතිවරණයට ඉදිරිපත් වන අයට දඬුවම මරණයයි! ඡන්දය දෙන්න යන පළමු පස්දෙනා මරනවා! කියන තැනට එනකම් මේ පාර්ලිමේන්තුව පහළට වට්ටලා තිබුණා. අපි පාර්ලිමේන්තුවට පත් වුණු මැතිවරණයේදී ඡන්දය දෙන්න ගිය පළමු පස්දෙනා මැරුවා. ඒ මරපු අය දණිස්සෙන් පහළට තියාගෙන අරගෙන පාර දිගේ ගෙනිහින් වළලන්න කිව්වා. මනුස්සකම දණිස්සෙන් පහළට ගිහිල්ලා අවසානය වෙනකොට මේ රටේ තරුණයෝ 60,000කගේ ජීවිත විනාශ වෙලා, දේපළ විනාශ වෙලා මේ රටේ ඉතිහාසය ලේවලින් ලිව්වා. ඒ තත්ත්වයෙන් පසුව 1989දී තේරී පත් වුණු පාර්ලිමේන්තුවට පුළුවන්කම ලැබුණා නැවත ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කරන්න. එදා මේ පාර්ලිමේන්තුවේ තත්ත්වය පාලනය කරන්න, මොහොමඩ් කථානායකතුමාගේ කාලයේ කිසිම මන්ත්‍රීවරයෙකුටවත්, පක්ෂ නායකවරයෙකුටවත් නිසි ස්ථාවර නියෝග නැත්නම් නැඟිට බාධා කරන්නවත්, කථා කරන්නවත් අවසර දුන්නේ නැහැ. ඒ පූර්වාදර්ශය අරගෙන බලන්න, හැන්සාඩ් වාර්තාවලින්.

එදා රට තුළ මහ භීෂණයක් තිබියදී අපි විපක්ෂයේ ඉඳිමින් ආණ්ඩු පක්ෂය සමඟ මොන තරම් පාර්ලිමේන්තුව තුළදී හැපුණත්, රන්ජන් විජේරත්න හිටපු ආරක්ෂක ඇමතිතුමා සෑම මන්ත්‍රීවරයෙකුගේම ආරක්ෂාව හා ගෞරවය වෙනුවෙන් කරන්න පුළුවන් හැම කටයුත්තක්ම කළා. මන්ත්‍රීවරුන්ගේ ජීවිත හා දේපළ ආරක්ෂා කළා. ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කිරීම සඳහා මන්ත්‍රීවරුන්ට තිබෙන නිදහස රැක්කා. එහෙම තමයි මේ පාර්ලිමේන්තු ක්‍රමය පැවතුණේ. ඒ සියල්ල වුණේ ස්ථාවර නියෝගවලට ගරු කිරීම නිසා.

මම මේ සභාවේ නැති අවස්ථාවේදී නවක මන්ත්‍රීවරයකු වන උද්දික ප්‍රේමරත්න මන්ත්‍රීවරයා හුදු නොදැනුවත්කම තුළ ප්‍රකාශ ගණනාවක් කළාය කියලා මගේ පුරාණ ශිෂ්‍ය, මම ඉගැන්වූ මහාචාර්ය රංජිත් බණ්ඩාර මන්ත්‍රීතුමා කිව්වා. එතුමාට අසාගෙන ඉන්න බැරි වුණා කිව්වා මොනවාද මේ කියන්නේ කියලා. තවත් මන්ත්‍රීවරු මෙතැන ඉන්නවා, මගේ ගෝලයෝ. මම ඒ අයට උගන්වා තිබෙනවා. මිනිස්සුන්ට ආත්ම ගෞරවයක් තිබෙනවා. ඒ ආත්ම ගෞරවය නැති, කොහේ හරි ඉඳලා ආපු කෙනෙක් පාර්ලිමේන්තුවේ සම්ප්‍රදාය හා නීති රීති දන්නේ නැතුව ස්ථාවර නියෝගවලට පටහැනිව කටයුතු කරනවා නම්, කථානායකතුමාගේ - මූලාසනයේ - යුතුකම තමයි එවැනි දේ නැවැත්වීම. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පාර්ලිමේන්තු ස්ථාවර නියෝගවල තිබෙනවා, පාර්ලිමේන්තුව තුළ කථා කිරීමේදී මන්ත්‍රීවරයන් විසින් පිළිපැදිය යුතු රීති. ඒ අනුව ස්ථාවර නියෝග 91. (උ) යටතේ මෙසේ සඳහන් වෙනවා:

> "කථා කරමින් සිටින හෝ සභාවේ පැමිණ සිටින යම් මන්ත්‍රීවරයකු විසින්, අපහාසාත්මක හෝ අනිසි වචන පාවිච්චි කරනු ලැබුවහොත්, කථානායකවරයා විසින් ඒ මන්ත්‍රීවරයාට රීත්‍යනුකූල වන ලෙස නියෝග කරනු ලැබිය යුතු අතර, එම සඳහන් කිරීම පාර්ලිමේන්තුවේ හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරන ලෙස නියෝග කරනු ලැබිය යුත්තේ ය."

ඒ වගන්තියට අනුව, උද්දික ප්‍රේමරත්න නමැති මන්ත්‍රීවරයා විසින් ප්‍රකාශ කරනු ලැබූ ඒ සියල්ල හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරන්න කියා මා ඉල්ලා සිටිනවා.

දෙවනුව, ස්ථාවර නියෝග 91. (ඌ) යටතේ මෙසේ සඳහන් වනවා:

> "කිසි ම මන්ත්‍රීවරයකු වෙනත් මන්ත්‍රීවරයකුට අයුතු ආරෝපිත චෝදනාවක් කිරීම හෝ වෙනත් මන්ත්‍රීවරයකුගේ පෞද්ගලික කටයුතු සම්බන්ධයෙන් සඳහන් කිරීම හෝ කරනු නොලැබිය යුත්තේ ය."

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමනි, කෙටියෙන් කථාව අවසන් කරන්න.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardana)
ස්ථාවර නියෝග 91.(එ) යටතේ තවදුරටත් මෙසේ සඳහන් වෙනවා;

"මන්ත්‍රීවරයකු විසින් පාර්ලිමේන්තුව ඉදිරියේ ඇති විෂයය කරුණට අදාළ වන ලෙස කථා කරනු ලැබිය යුත්තේ ය."

ඒ අනුව, මගේ පාර්ලිමේන්තු මන්ත්‍රී වරප්‍රසාද සම්පූර්ණයෙන් කඩවෙලා තිබෙනවා. අයුක්ති සහගතව, අසාධාරණව, ද්වේශ සහගත වැරැදි තොරතුරු ඇතුළත් විශාල ප්‍රකාශයක් විනාඩි ගණනක් තුළ කරලා තිබෙනවා. ඒ නිසා මේ කාරණය වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට වහාම යොමු කරන්න. මෙය බරපතළ කාරණයක්. මන්ත්‍රීවරයකුට පාර්ලිමේන්තුව ඇතුළේ හැසිරෙන්න දන්නේ නැත්නම්, අඩු මානසික තත්ත්වය හා අයහපත් මානසික තත්ත්වය යටතේ හැසිරීමෙන් සිදුවන තත්ත්වය වැළැක්වීම සඳහා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා වශයෙන් ඔබතුමා අවශ්‍ය පියවර ගන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමනි, එම ඉල්ලීම ගරු කථානායකතුමාට යොමු කරනවා.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardana)
පාර්ලිමේන්තුවේ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවේදී මේ පිළිබඳව සම්පූර්ණයෙන් විභාග කරලා, නිවැරැදි දේ මේ ගරු සභාවට දන්වන්නය කියා ඉල්ලා සිටිමින් මගේ වචන කිහිපය අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නිමල් පියතිස්ස මන්ත්‍රීතුමා.

[අ.භා. 3.10]

**ගරු නිමල් පියතිස්ස මහතා**
(மாண்புமிகு நிமல் பியதிஸ்ஸ)
(The Hon. Nimal Piyathissa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා හිතන හැටියට අද අපි විශේෂ විවාදයකට සහභාගිවෙලා ඉන්නවා. පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග සංශෝධනය කිරීම පිළිබඳ විවාදය පැවැත්වෙන මේ අවස්ථාවේ ඒ සම්බන්ධව යම් අදහසක් පළ කිරීම සඳහා අවස්ථාව ලැබීම පිළිබඳව සතුටු වනවා.

මේ මොහොත වනකොට රට තුළ තිබෙන ආර්ථික අර්බුදය, දේශපාලන වශයෙන් මතුවෙලා තිබෙන මේ ස්වභාවය, ඒ වාගේම අසහනයෙන් දැවෙන, වේදනාවෙන් මුසපත්වෙලා ඉන්න ජන සමාජයකට පාර්ලිමේන්තුව හරහා කඩිනමින් විසඳුම් සහ පිළිතුරු බලාපොරොත්තු වෙමින් සිටින මොහොතක, පසුගිය වකවානුව තුළ ඒකට ගැළපෙන ම ආකාරයේ ප්‍රබුද්ධ සංවාදයක් මෙෙතනදී වුණාද කියන එක පිළිබඳව ගැටලු තත්ත්වයක්, ප්‍රශ්නාර්ථයක් තිබෙනවා. එවන් අවස්ථාවක විශේෂයෙන් මේ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග සංශෝධනය කළ යුතු සහ අතීතයට වඩා වර්තමානයට හා අනාගතයට සාපේක්ෂව අපේ රටේ පවතින නීති රීති විශාල ප්‍රමාණයකුත් වෙනස් විය යුතු, වෙනස් කළ යුතු යුගයක් ඇවිල්ලා තිබෙනවාය කිව්වොත් නිවැරැදියි.

පාර්ලිමේන්තුව ගත්තාමත්, ප්‍රධාන වශයෙන් මේ ස්ථාවර නියෝග අපට අත්‍යවශ්‍ය වන්නේ, පාර්ලිමේන්තුව විධිමත්ව පවත්වාගෙන යෑමටත්, කථානායකතුමා පත් කර ගැනීම, නියෝජ්‍ය කථානායකතුමා පත් කර ගැනීම, නියෝජ්‍ය කාරක සභාපතිවරයකු පත් කර ගැනීමේ සිට පාර්ලිමේන්තු කටයුතු ඉදිරියට පවත්වාගෙන යෑමේදී විනය පවත්වාගෙන යෑමට සහ විධිමත් ආකාරයට සැලසුමකට අනුව පාර්ලිමේන්තුවේ කටයුතු ඉදිරියට පවත්වාගෙන යෑමටයි.

ඒ විතරක් නොවෙයි. ප්‍රජාතන්ත්‍රවාදය රැකෙන ප්‍රධාන ම ස්ථානය බවට පාර්ලිමේන්තුව පත් වෙනවා. මැතිවරණයකින් පස්සේ පාර්ලිමේන්තුව හරහා ස්ථාපිත වන ආණ්ඩුව මත, මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන මන්ත්‍රීවරුන් 225දෙනා මත පැවරෙන ප්‍රධාන ප්‍රබල වග කීමක් තිබෙනවා. ප්‍රතිපත්ති සම්පාදකයන් කියලා තමයි පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට කියන්නේ. ව්‍යවස්ථාදායකය තුළ කාරක සභා ගණනාවක් තිබෙනවා. COPA, COPE සහ මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව ගත්තත්, මේ ස්ථාවර නියෝග හරහා ඒ කාරක සභාවල කටයුතු කොයි තරම් ප්‍රමාණයක් ඉදිරියට යනවාද, ප්‍රශ්නවලට අවසාන විසඳුම් ඒ කාරක සභාවලින් කොයි තරම් ප්‍රමාණයකට ලැබෙනවාද, විශේෂයෙන්ම මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ ගනු ලබන තීන්දු තීරණ මොන ආකාරයට ක්‍රියාත්මක වෙනවාද කියන එක පිළිබඳවත් ආපස්සට හැරිලා බලද්දී අපට ගැටලුවක් තිබෙනවා. මා හිතන හැටියට, ඒ ගැටලුවලට සාපේක්ෂව මේවා සංශෝධනය වෙන්න ඕනෑ; නිවැරැදි වෙන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතිහාසයේ සුද්දා හදපු අධ්‍යාපන ක්‍රමය තවම වෙනස් කර ගන්න අපට බැරිවෙලා තිබෙනවා. සුද්දා හදපු නීති, අධිකරණ ක්‍රියාවලිය අපේ රටට ගැළපෙන විධියට, අපට උචිත විධියට ප්‍රතිසංස්කරණය කර ගන්න අපට තවමත් බැරිවෙලා තිබෙනවා. සුද්දාගේ කාලයේ හදපු වැඩ පිළිවෙළ තුළ තමයි රට තවම ගමන් කරන්නේ. ඒ නිසා යල් පැනපු, මලකඩ කාපු ක්‍රියාවලියක් තුළින් මේ රටේ ජනතාව බලාපොරොත්තු වන මේ රටේ අනාගත අභියෝගවලට ගැළපෙන විධියේ විසඳුම් ලබා දෙන්න මේ පාර්ලිමේන්තුව සමත්වෙලා නැහැ කිව්වොත් ඒකත් නිවැරැදියි.

සුද්දාගේ අධ්‍යාපනය, සුද්දාගේ පරිපාලනය, සුද්දාගේ නීතිය මත තමයි තවමත් අපේ රටේ තිබෙන්නේ. ඒ ගැන අපි ලජ්ජා වෙන්න ඕනෑ. අපේ රටට උචිත අධ්‍යාපන ක්‍රමයක්, අපේ රටට උචිත නීති-රීති පද්ධතියක්, අපේ රටට ගැළපෙන පරිපාලනයක් අපි තවම ස්ථාපිත කර ගෙන නැහැ. ආපස්සට හැරිලා බලද්දී, ඒක අපි ලජ්ජා වෙන්න ඕනෑ කාරණයක්. මේ නිසා අද ජනතාව ඉතාම අවාසනාවන්ත තත්ත්වයකට මුහුණ දෙනවා. ආර්ථික අර්බුදය ඉතා බරපතළයි. ලාම්පු තෙල් ටික ගන්න බැරි, ලුණු පැකට් එක ගන්න බැරි, දෛනික ආහාර ටික, පරිභෝජන අවශ්‍යතා ටික සම්පූර්ණ කර ගන්න බැරි තත්ත්වයක අද ජනතාව ඉන්නවා. ආදායම් අඩු වෙලා, වියදම් වැඩි වෙලා, බඩු මිල රොකට් එකක වේගයෙන් ඉහළට ගිහිල්ලා තිබෙනවා. අනික් පැත්තෙන්, ව්‍යාපාරික ප්‍රජාව අසරණ වෙලා, කර්මාන්ත සියල්ල බිඳ වැටිලා ඉතාම නරක තත්ත්වයක් තිබෙන්නේ. ඊළඟට, සංචාරක කර්මාන්තය අඩපණ වෙලා, ඒ හරහා ලැබෙන ආදායම් අපට අහිමි

වෙලා තිබෙනවා. ඒ වාගේම අපනයනය පදනම් කර ගත් ආදායම් මාර්ග විශාල වශයෙන් ඇහිරිලා තිබෙනවා. අපි ප්‍රබුද්ධ සංවාදයක් හරහා, අසහනයට පත් වෙලා සිටින මේ රටේ ජනතාවගේ ප්‍රශ්නවලට කඩිනම් විසඳුම් ලබා දීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කරන්න ඕනෑ කියා මම හිතනවා. අපේ රටේ රුපියල් හිඟයත්, අනෙක් පැත්තෙන් ඩොලර් හිඟයත් නිසා මේ වනකොට විශාල වශයෙන් රට ප්‍රපාතයට ඇද වැටෙමින් තිබෙනවා. තුන් වේල කන්න බැරි අහිංසක ජනතාවක් රට තුළ දිගින් දිගටම බිහි වෙනවා කියන එක තමයි අපි හැම කෙනෙකුටම දකින්න තිබෙන්නේ.

අද මේ රට ලෝකය ඉදිරියේ බංකොලොත් රාජ්‍යයක් විධියට ප්‍රසිද්ධ වෙනකොට, මේ රට අභ්‍යන්තරයේ සිටින ත්‍රස්ත කල්ලි මේ ආර්ථික අර්බුදය තමන්ගේ අරමුණු වෙනුවෙන් පාවිච්චි කරනවා. NGO කාක්කෝ, ඒ වාගේම දෙස් විදෙස් වර පුරුෂ සේවයේ ඉත්තෝ, ගැත්තෝ, කුක්කෝ ඩොලර් මත පීනනවා. ඒ වාගේම ඒ ත්‍රස්ත කල්ලි නියෝජනය කරන

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

ඉන්නවා. සැබෑ අරගළයට අපි කැමැතියි. සැබෑ අරගළයත් එක්ක අපිත් අත්වැල් බැඳ ගන්නවා. හැබැයි, පසුගිය කාලයේ අරගළය මුවාවෙන් ව්‍යාජ ත්‍රස්ත කල්ලි ටිකක්, NGO කල්ලි ටිකක්, ඇමෙරිකන් චිත්‍රපටයේ චරිත රඟපාපු පිරිසක් සිටියා. මීට කලින් පාර්ලිමේන්තුවේ වරප්‍රසාදවලට මුවාවෙලා කථා කරපු ෆීල්ඩ් මාර්ෂල් සරත් ෆොන්සේකා මහත්මයා හැමදාම අරගළකරුවන්ට ආශිර්වාද කළා.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

ඒ විතරක් නොවෙයි, පසුගිය වකවානුව තුළ ඇමෙරිකානු තානාපතිනිය ඉතා ප්‍රබලව මැදිහත් වෙලා මේ කටයුත්ත දියත් කෙරුවා. මේ පාර්ලිමේන්තුව ඇතුළේත් එවන් චරිත සිටිනවා. ත්‍රස්තවාදීන් මේ මුළු මහත් රට තුළ තිබෙන අර්බුදය පාවිච්චි කරලා මේ රට අරාජික කරලා, ලේ ගංගාවක් හරහා අරගෙන ගිහිල්ලා, විදෙස් සාම සාධක හමුදාව නමින් එන්න හදනවා. මේ රටේ සම්පත් ටික මංකොල්ල කන්න, භූමිය මංකොල්ල කන්න අවශ්‍ය කරන,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු නිමල් පියතිස්ස මහතා**
(மாண்புமிகு நிமல் பியதிஸ்ஸ)
(The Hon. Nimal Piyathissa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට විනාඩි 11ක් නේද තිබුණේ?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඒක විනාඩි 9ක් දක්වා අඩුවෙලා තිබෙනවා.

**ගරු නිමල් පියතිස්ස මහතා**
(மாண்புமிகு நிமல் பியதிஸ்ஸ)
(The Hon. Nimal Piyathissa)
මෙන්න මේ තත්ත්වය තුළ අපි හඳුනා ගන්න ඕනෑ, මේ අර්බුදය පාවිච්චි කරමින් මේ රට අරාජිකත්වය කරා ගෙන යන්න, ඒ සඳහා අවශ්‍ය කරන ඩොලර් ටික පොම්ප කරන්නේ කවුද කියලා. ෆීල්ඩ් මාර්ෂල්කමත් තිබෙනවා, ඒකෙන් ලබා ගන්නා වැටුප්, වරප්‍රසාද ඔක්කොමත් තිබෙනවා. ඒවා අක්‍රිය වෙලා නැහැ. පසුගිය කාලයේ වාගේ තවමත් හමුදාවේ සමහර අයට නියෝග කරමින්, ඒ අය බිය වද්දන තැනට පත් කරලා තිබෙනවා. ඒ ත්‍රස්ත කල්ලිවලට ආශිර්වාද කරලා, ඒ ත්‍රස්ත කල්ලි හරහා ඇමෙරිකාව ප්‍රමුඛ බටහිර රටවල වුවමනාවට කටයුතු කරන්න මේ පාර්ලිමේන්තුව පාවිච්චි කරනවා. අර තානාපතිනිය හරහා මේ කැස කව කවා ඉන්නේ, දත කට මැද මැද ඉන්නේ, ඒ ලේ ගංගාව හරහා රාජ්‍ය පාලනයේ නායකයා වෙන්නයි. ඒ සඳහා පසුගිය කාලයේ උත්සාහ ගත්තා. නමුත් ඒක අසාර්ථක වුණා.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

පසුගිය වකවානුව තුළ -ඉතිහාසය පුරා- හැසිරුණු විධියත්, ඒ වාගේම මේ මොහොත වෙනකොට හැසිරෙන විධියත් අපි දන්නවා. ඒ නිසා මේ රටේ තරුණ ප්‍රජාවගෙන්, ජනතාවගෙන් මා ඉල්ලනවා, ඇමෙරිකාවේ වුවමනාව වෙනුවෙන්, බටහිර රටවල වුවමනාව වෙනුවෙන් මේ රට අරාජික කරලා, හතර ගාතෙන් ඇද වට්ටන තැනකට පත් කරලා, අපේ රට ලිබියාවක්, ඉරාකයක්, සිරියාවක් කරන තැනට කටයුතු කරන මේ කුමන්ත්‍රණකාරයන්ගෙන් පරෙස්සම් වෙන්න කියලා. එම නිසා අද වෙනකොට ජාතිවාදීන්, ආගම්වාදීන්, මූලධර්මවාදීන් ටික ඔක්කෝම එකට එකතු වෙලා මේ රටට මේ සාහසික අපරාධය කරනවාය කියන එකත් අපි බය නැතුව කියනවා. මේ අතරේ මැතිවරණයකුත් ඉල්ලනවා. අපිත් කැමතියි, ඒකට. මැතිවරණයක් ඕනෑ තමයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. හැබැයි මේ වෙලාවේ මැතිවරණයක් පවත්වනවා නම් රුපියල් බිලියන 10ක පමණ මුදලක් ඕනෑ. මේ වෙලාවේ බිලියන 10ක මුදලක් අපි සොයා ගන්නේ කොහොමද? බිලියන 10ක් තිබෙනවා නම් මේ රටේ ජනතාවගේ ආර්ථික අසහනයට විසඳුම් ලබා දෙන්න පුළුවන්. විශේෂයෙන්ම මහ මැතිවරණය මේ වෙලාවේ ජනතාව ඉල්ලන දෙයක් නොවෙයි. එම නිසා මේ වෙලාවේ මැතිවරණයක් ඉල්ලන අයට මම එක දෙයක් කියන්න කැමැතියි. ඉදිරි මැතිවරණයකින් පස්සේ මේ රටේ දුර්වලම ආණ්ඩුවකටත් වඩා අරාජික වෙලා, ආණ්ඩුවක් හදන්න බහුතරයක් නැති තත්ත්වයට පත්වෙලා, විවිධ ආගම්වාදීන්, මූලධර්මවාදීන්, බෙදුම්වාදීන්, ජාතිවාදීන් කේවල් කිරීමේ බලය අතට ගන්න තමයි මේ උත්සාහ කරන්නේ. එම නිසා අනාගතයේදී මේ බියකරු අභියෝගය පරාජයට පත් කරලා, ඒකෙන් පියමං කරලා ඉදිරියට යන වැඩසටහනක් ක්‍රියාත්මක කරන්න වෙනවා. අවසාන වශයෙන්, අපේ පාර්ලිමේන්තුවට උචිත විධියට ස්ථාවර නියෝග වෙනස් කිරීමට අවශ්‍ය සහයෝගය අපි ලබා දෙනවාය කියන කාරණයත් ප්‍රකාශ කරමින් මා නිහඬ වෙනවා.

[අ.භා. 3.20]

**ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා**
(மாண்புமிகு கே. சுஜித் சஞ்ஜய பெரேரா)
(The Hon.K. Sujith Sanjaya Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග සංශෝධනය කිරීම පිළිබඳ කථා කරන මේ මොහොතේ, ඒ සම්බන්ධයෙන් අදහස් දක්වන්න අවස්ථාව ලැබීම ගැන මම සතුටු වෙනවා.

[ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා]

ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාවේ සාමාජිකයෙක් හැටියට මම සතුටු වෙනවා, ප්‍රමාද වෙලා හෝ මේ සංශෝධන කිහිපය ගෙන එන්නට කටයුතු කිරීම ගැන. ස්ථාවර නියෝග සංශෝධනය කිරීමට හේතු වුණු කාරණා කිහිපයක් තිබෙන බව අපි දන්නවා. එකක් තමයි, පසුගිය දවස්වල ගත්ත වැරදි ආර්ථික තීරණ. ඒ වාගේම වැරදි ක්‍රියාදාමයන් නිසා තමයි මේ රටේ ලොකු අරගළයක්, එහෙම නැත්නම් ජනතා නැගිටීමක් සිද්ධ වුණේ. එහි ප්‍රතිඵලයක් හැටියට තමයි, මේ සංශෝධන සියල්ලම නොවුණත් යම් යම් සංශෝධන ගෙන එන්නට කටයුතු කළේ. විශේෂයෙන්ම මේ ආණ්ඩුවේ වර්තමාන ජනාධිපතිතුමා පත් වුණාට පස්සේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුනුත්, ඒ වාගේම ජනාධිපතිතුමාත් හැම අවස්ථාවේම පුන පුනා විපක්ෂයෙන් ඉල්ලීම් කළා, "අපි ජාතික ආණ්ඩුවක් හදන්න ඕනෑ. මේ අර්බුදවලට මුහුණ දීලා, ඒ වාගේම මේ ජාතික ප්‍රශ්නයට මුහුණ දීලා මේ රට හරි මහට ගන්න අපි වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න ඕනෑ" කියලා. එහෙම තමයි හැම අවස්ථාවේදීම ප්‍රකාශ කළේ. ඒ වාගේම විපක්ෂ නායක ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමාගෙනුත්, විපක්ෂයේ කණ්ඩායම් සියල්ලෙනුත් ඉල්ලීම් කළා, ජාතික ආණ්ඩුවක් හදන්න අනිවාර්යයෙන්ම ඉදිරිපත් වෙන්න කියලා. නමුත්, ඒ අවස්ථාවේදී විපක්ෂ නායක ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමාත්, ඒ වාගේම විපක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රී කණ්ඩායම හැටියට අපිත් පැහැදිලිව ප්‍රකාශ කළේ, "අපට ආණ්ඩුවේ මැති ඇමැතිකම් ගන්න අවශ්‍යතාවක් නැහැ, ඒ වාගේම ආණ්ඩුවේ තනතුරු ගන්න අවශ්‍යතාවක් නැහැ, විශේෂයෙන්ම පාර්ලිමේන්තු කාරක සභා ක්‍රමය ශක්තිමත් කරලා ඒ කාරක සභා හරහා විපක්ෂයේ ඉඳගෙන ආණ්ඩුව ගෙන යන වැඩ පිළිවෙළට දායකත්වය දක්වන්නත්, ආණ්ඩුවේ ක්‍රියාදාමය ඉදිරියට ගෙන යෑම සඳහාත්, ආණ්ඩුව කරන හොඳ වැඩවලට සහයෝගය ලබා දෙන්නටත් අපට පුළුවන්" කියලායි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එහි ප්‍රතිඵලයක් හැටියට විවිධ අවස්ථාවල අප ඉල්ලීම් කළා, පාර්ලිමේන්තුවේ ක්‍රියාත්මක වන වැදගත් කාරක සභා කිහිපයක සභාපති ධුර අපට ලබා දෙන්න කියලා. විශේෂයෙන්ම රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේත්, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේත්, ඒ වාගේම රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේත් සභාපති ධුර අපට ලබා දෙන්න කියලා අප ඉල්ලා සිටියා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාවේ වර්තමාන රජයට කියන්න තිබෙන්නේ මේකයි. ජනාධිපතිතුමාටත්, ආණ්ඩු පක්ෂය නියෝජනය කරන කණ්ඩායමටත් අවංක වුවමනාවක් තිබෙනවා නම්, විශේෂයෙන්ම ඔවුන් ජාතික ආණ්ඩුවක් පිහිටුවන සංකල්පයේ ඉන්නවා නම්, ඒ වාගේම මේ ආණ්ඩුවට අපේ දායකත්වය ලබා ගන්න ඕනෑය කියන හැඟීමත් තිබෙනවා නම්, දැන් තිබෙන හොඳම කටයුත්ත තමයි මේ වැදගත් කාරක සභාවල සභාපති ධුර විපක්ෂයට ලබා දීම. මට මතකයි, විශේෂයෙන්ම සාගර කාරියවසම් මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා, ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාව නියෝජනය කරන මන්ත්‍රීවරයෙකුත් මේ සම්බන්ධයෙන් වැරදි මතයක් ඉදිරිපත් කළා කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කියනවා, විශේෂයෙන්ම පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ, එහෙම නැත්නම් අනෙකුත් වැදගත් කාරක සභාවල සභාපති තනතුරු සම්බන්ධයෙන් අපි ඒ අවස්ථාවේ තීන්දුවක් ගත්තේ නැහැ කියලා. නමුත්, අපි එතැනදී ඉල්ලීමක් කළා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අනිවාර්යයෙන්ම ආදර්ශයක් දෙන්න මේක හොඳ අවස්ථාවක්. මොකද, මේක "ජාතික රජයක්" කියන සංකල්පය ගැන කථා කරන අවස්ථාවක් නිසාත්, ආණ්ඩුවට හොඳ පූර්වාදර්ශයක් දෙන්න අවස්ථාවක් නිසාත්, අපට මේ තනතුරු ලබා දෙන්න කියන ඉල්ලීම විතරක් අපි කළා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සම්බන්ධයෙන් රජයට, විශේෂයෙන්ම ජනාධිපතිතුමාටත්, තමුන්නාන්සේලාටත් අවංක වුවමනාවක් තිබෙනවා නම්, ඒ වාගේම මේ කටයුත්ත සඳහා විපක්ෂයේ සහයෝගය ලබා ගන්න ඕනෑ නම්, එම තනතුරු ටික අපට ලබා දෙන එක ඉතාම කාලෝචිතයි කියන එකයි මට නැවත වරක් කියන්න තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊට අමතරව මට තවත් කාරණයක් කියන්න තිබෙනවා. මේ රජය බලයට පත් වෙනකොට ආංශික අධීක්ෂණ කාරක සභා අහෝසි කළා. පසුගිය රජය කාලයේ එම කාරක සභා ක්‍රියාත්මක වුණා. තමුන්නාන්සේත් දන්නවා, ඒ කාලයේ ආංශික අධීක්ෂණ කාරක සභා ක්‍රියාත්මක වුණු බව. වර්තමාන ජනාධිපතිතුමාගේ සංකල්පයක් අනුවයි 2015 ඉඳන් අවුරුදු 05ක් පැවැති අපේ ආණ්ඩුව තුළ එය ක්‍රියාත්මක කරන්න කටයුතු කළේ. නමුත්, වර්තමාන රජය බලයට පත් වුණාට පසු ආංශික අධීක්ෂණ කාරක සභා ක්‍රමය පැය 24න් අහෝසි කළා. හැබැයි, ඊයේ පෙරේදා ස්ථාවර කාරක සභාවට ඉදිරිපත් වුණා, නැවතත් ඒ කාරක සභා ටික ස්ථාපිත කරන්න ඕනෑ කියන කාරණය. මා දන්නේ නැහැ, මේ රටේ මේ ප්‍රතිපත්තිය මොකක්ද, මේ පවත්වාගෙන යන පාර්ලිමේන්තු සම්ප්‍රදාය මොකක්ද කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ කාරක සභා අහෝසි කරන්න කටයුතු කරන අවස්ථාවේ අපි කිව්වා, "මේවා මෙතෙක් කල් -අවුරුදු 5ක්- ක්‍රියාත්මක වුණා. ඒ නිසා අපි මේ කාරක සභා දිගටම ක්‍රියාත්මක කරමු" කියලා. නමුත්, ඒ වෙලාවේ මේ සම්බන්ධයෙන් ආණ්ඩු පක්ෂයේ කිසිම එකඟතාවක් ලැබුණේ නැහැ. නමුත්, වර්තමාන ජනාධිපතිතුමාට පින් සිදු වෙන්න, ඒ ගොල්ලන්ගේ ප්‍රතිපත්තිය මාරු වෙලා දැන් නැවත වරක් ආංශික අධීක්ෂණ කාරක සභා පිහිටුවන්න කටයුතු කරලා තිබෙනවා. මා හිතන හැටියට මේක හොඳ වැඩක්. මේක අනිවාර්යයෙන්ම කෙරෙන්න ඕනෑ කටයුත්තක්.

මේ රටේ සිදු වන වංචා හා දූෂණ ගැන හැමදාම අපි කථා කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. නමුත්, අමාත්‍යාංශ ඇතුළු විවිධ රාජ්‍ය ආයතනවල මෙතෙක් කල් තිබුණු වංචා හා දූෂණ සම්බන්ධයෙන් සොයා බලා කටයුතු කරන්න කිසිම වැඩ පිළිවෙළක් නැහැ. ඒ සම්බන්ධයෙන් වග වීමක් නැහැ. අදටත් මේ පාර්ලිමේන්තුවේ වාද-විවාදවල දී බොහෝ දුරට කථා කරන්නේ යම් යම් ආයතනවල සිදුවන වංචා හා දූෂණ සම්බන්ධවයි. ඒවා නිසා මේ රටට අහිමි වන මහජන ධනය සම්බන්ධව, ඒවා හොරකම් කරපු උදවියට කිසිම දඬුවමක් ක්‍රියාත්මක නොවීම ගැන තමයි බොහෝ වෙලාවට කථා කරන්නේ. ආංශික අධීක්ෂණ කාරක සභා ක්‍රමය ක්‍රියාත්මක වන විට විපක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට අවස්ථාව තිබෙනවා මේවා සම්බන්ධව හොයා බලන්න. අමාත්‍යාංශවල යම් කිසි අක්‍රමිකතාවක් තිබෙනවා නම්, වංචා හා දූෂණ තිබෙනවා නම්, වැරදි ගමනක් යනවා නම් ඒවා හරි මහට ගෙනයන්න ඒ අයට අවස්ථාව ලැබෙනවා.

අනෙක, වංචා හා දූෂණ සම්බන්ධව මේ කාරක සභාවලදී කොයි තරම් නම් කථා කළාද? උදාහරණයක් විධියට පසුගිය දවස්වල රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේදී, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේදී, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේදී - මේ හැම කාරක සභාවකදීම- විවිධ අමාත්‍යාංශවල, විවිධ ආයතනවල සිදු වුණු වංචා හා දූෂණ සම්බන්ධව නොයෙකුත් ආකාරයෙන් කථා කළා. අපි ඒ දේවල් දැක්කේ පුවත් පත්වලින්. නමුත්, ඒවාට ගත යුතු ක්‍රියාමාර්ග ගැන සාකච්ඡා කළේ නැහැ. ඒ නිසා කාරක සභාවලට බලයක් තිබෙනවා ද, නැද්ද කියන එක ගැන අද ලොකු ගැටලුවක් තිබෙනවා. එහෙම නම් මුදල් වියදම් කරලා, විවිධ නිලධාරීන් වාර ගණනක් කැඳවා මේ කාරක සභාවල මේවා ගැන සාකච්ඡා කිරීමේ ප්‍රතිඵලයක් නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ නිසා මේ ගෙනෙන සංශෝධනවලදී අනිවාර්යයෙන්ම මේ ගැනත් අවධානය යොමු කළ යුතුයි කියා මා හිතනවා. මේකෙදී අපේ පක්ෂ නායකයෝ හැම කෙනාම සාකච්ඡා

කර කටයුතු කළා නම් හොඳයි. මොකද, කාරක සභාව විතරක්, අපි විතරක් තීන්දු කරලා මේ කටයුත්ත කරන්න පුළුවන්කමක් නැහැ. අනිවාර්යයෙන්ම පක්ෂ නායකයෝ මේ ගැන සාකච්ඡා කර, නීති කෙටුම්පත් අංශයත් එක්ක කථා කරලා, නීතිපති දෙපාර්තමේන්තුවත් එක්ක කථා කරලා අඩුම ගානේ මේ කාරක සභාවලට යම්කිසි නීතිමය බලයක්; නීතිය පැත්තෙන් යම්කිසි පියවරක් ගන්න පුළුවන් බලයක් ලබා දෙන්න පුළුවන් නම් එය ඉතා වැදගත්.

මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව සම්බන්ධයෙන් වන තත්ත්වයක් ඒකයි. අපි දන්නවා, අගතියට පත් පාර්ශ්ව එම කාරක සභාව හමුවට එනවා. සමහරු දුර බැහැර ඉඳන් දවස් ගානක් එනවා. ඉතින්, ඒ අයගේ ප්‍රශ්න සම්බන්ධයෙන් අපි ඇතිකර ගන්නා යම් යම් එකඟතා ක්‍රියාත්මක වෙන්නේ නැහැ. මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේදී ඇති කර ගනු ලබන ඒ එකඟතා ඒ අදාළ අමාත්‍යාංශවලට, එහෙමත් නැත්නම් අදාළ ආයතනවලට ගියාම ඒවා ක්‍රියාත්මක වන තත්ත්වයක් නැහැ. ඒකත් අපි සලකා බලන්න ඕනෑ කාරණාවක්. එහෙම නොකර, අපි මේ කාරක සභා පිහිටෙව්වාට, මේ සංශෝධන ගෙනාවාට ප්‍රයෝජනයක් නැහැ කියන එක මං කියන්න ඕනෑ.

තවත් එක් කාරණාවක් විතරක් කියලා මම කථාව නතර කරනවා. ඒ, මේ සංශෝධනවලට අදාළ කාරණයක් නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. වැඩිහිටියන්ට, ආබාධිත අයට රජයෙන් දෙන දීමනාව ලබාදෙන අමාත්‍යාංශය මොකක්ද කියලා දැන් හොයාගන්න පුළුවන්කමක් නැහැ. ඒ විෂයභාර ඇමතිතුමා කවුද කියලා මා දන්නේ නැහැ. මුදල් අමාත්‍යාංශය භාරව ඉන්න ඇමතිතුමාය කියලාත් එක පැත්තකින් මට ආරංචියක් ලැබුණා. කෙසේ වෙතත්, මම මේ අවස්ථාවේදී යොමු කරන්නේ පොදු ජනතාව මුහුණ දෙන බලවත් ප්‍රශ්නයක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආබාධිත අය, වැඩිහිටියන් තමන්ට ලබා දෙන ඒ දීමනාව මෙතෙක් කල් ලබා ගත්තේ උප තැපැල් කාර්යාලයෙන් හෝ තැපැල් කාර්යාලයෙන්. දැන් චක්‍රලේඛයක් නිකුත් කර තිබෙනවා, එම දීමනා සමෘද්ධි බැංකුවට ගිහිල්ලා ගන්න කියලා. මේක ප්‍රායෝගිකව කරන්න පුළුවන් වැඩක් නොවෙයි. මේ තුළින් ඒ අය කොයි තරම් අපහසුතාවට පත් වෙනවාද කියන එක අපි දන්නවා. සමහරුන්ට හැතැප්ම 25ක්, 30ක් දුර බැහැර ඉඳලා එන්න සිදු වෙනවා. අද කාලයේ ප්‍රවාහන ගාස්තු දෙස බලන විට ඒ අයට ඒ දීමනාව ලබා ගැනීමෙන් ඵලක් නැහැ. වගකිව යුතු ඇමතිවරයෙක් හැටියට මේ මොහොතේ ගරු සභාවේ ඉන්නේ ප්‍රසන්න රණතුංග අමාත්‍යතුමායි. ගරු ඇමතිතුමනි, ඔබතුමා හෝ මේ ගැන කැබිනට් මණ්ඩලයේදී කථා කරන්න. ඇත්ත වශයෙන්ම මේක අපේ දුගී-දුප්පත් ජනතාවට බලපාන ලොකු ප්‍රශ්නයක්. ඒ නිසා ඔබතුමා හෝ මේ සම්බන්ධව සොයා බලා අදාළ ගරු ඇමතිතුමා දැනුවත් කර, එම චක්‍රලේඛය අවලංගු කර පෙර තිබූ තත්ත්වයට, ඒ කියන්නේ තැපැල් කාර්යාලවලින්ම එම දීමනාව ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සලසා දෙන්න. ඒ ඉල්ලීම කරමින්, මේ අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාටත් ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු එස්.එම්.එම්. මුෂාරෆ් මන්ත්‍රීතුමා.

Order, please! ඊට ප්‍රථම කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු කේ. සුජිත් සංජය පෙරේරා මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු කේ. සුජිත් සංජය පෙරේරා මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මම යෝජනා කරනවා.

**ගරු නිමල් පියතිස්ස මහතා**
(மாண்புமிகு நிமல் பியதிஸ்ஸ)
(The Hon. Nimal Piyathissa)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු වේලු කුමාර් මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு வேலு குமார் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு கே. சுஜித் சஞ்ஜய பெரேரா அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* THE HON. VELU KUMAR *left the Chair, and* THE HON. K. SUJITH SANJAYA PERERA *took the Chair.*

[පි.ප. 3.30]

**ගරු එස්.එම්.එම්. මුෂාරෆ් මහතා**
(மாண்புமிகு எஸ்.எம்.எம். முஸ்ஸாரப்)
(The Hon. S.M.M. Muszhaaraff)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, பாராளுமன்ற நிலையியற் கட்டளைகள் சிலவற்றைத் திருத்துதல் தொடர்பான இந்த விவாதத்தில் எனக்கும் பேசக்கிடைத்தமையிட்டு மகிழ்ச்சியடைகின்றேன். உண்மை யிலேயே பாராளுமன்றம் என்பது சட்டங்களை ஆக்குகின்ற சபையாகும். ஒரு நாட்டினுடைய முக்கியமான 3 துறைகளாக நீதித்துறை, சட்டவாக்கத்துறை, நிறைவேற்றுத்துறை என்ப வற்றைச் சொல்வார்கள். அந்தவகையில், இந்த நாட்டுக்குத் தேவையான சட்டங்களை உருவாக்கின்ற சபையாக இந்தப் பாராளுமன்றம் கருதப்படுகின்றது. எனவே, ஒரு நாட்டி னுடைய சட்டத்தை உருவாக்குகின்ற சபையிடமிருந்து முன்மாதிரியான சில விடயங்களைப் பொதுமக்கள் எதிர் பார்ப்பார்கள். பொதுமக்களுக்கான சட்டத்தை உருவாக்கி நடைமுறைப்படுத்துகின்ற இடத்திலிருந்து சட்டத்தை உருவாக்குபவர்களாகிய நாம் நிச்சயமாகச் சமூகத்திற்கு முன்னோடிகளாக இருக்கவேண்டும், ஒழுக்கசீலர்களாக இருக்கவேண்டும் என்ற எதிர்பார்ப்பு மக்கள் மத்தியில் இருக்கின்றது.

பாராளுமன்ற நிலையியற் கட்டளைகளைப் பொறுத்தள விலே, பாராளுமன்ற உறுப்பினர் என்ற அடிப்படையில் இங்குள்ள ஒவ்வொருவருக்கும் சிறப்புரிமைகள் காணப்படு கின்றன. இவ்வாறான சில சிறப்புரிமைகள் மக்கள் பிரதிநிதி யான பாராளுமன்ற உறுப்பினர்களுக்குத் தேவையென்பதை மறுப்பதற்கில்லை. இருந்தபோதிலும், இங்கிருக்கின்ற சில சிறப்புரிமைகள் உண்மையிலே நல்ல விளைவுகளைத் தந்திருக் கின்றனவா அல்லது இந்தச் சிறப்புரிமைகள் மீறப்பட்டு எமது நன்மதிப்புக் கெட்டிருக்கின்றதா? என்பது பற்றிச் சிந்திப்பது அவசியம் என்று நான் நினைக்கின்றேன். ஏனென்றால், இங்கே பாராளுமன்றத்திற்குள் பேசுகின்ற விடயங்கள் தொடர்பாக நீதிமன்றத்தினாற்கூட எந்தவொரு தீர்ப்பும் சொல்லமுடியாத நிலையும், நீதிமன்றத்தில் ஒரு வழக்குத்

[ගරු එස්.එම්.එම්. මුෂාරෆ් මහතා]

தொடரமுடியாத நிலையும் இருக்கின்றது. அந்தளவுதூரம் பாராளுமன்றத்திற்குள் பேசப்படுகின்ற விடயங்கள் தொடர்பாக யாருக்கும் நீதித்துறையை நாடுவதற்கான சந்தர்ப்பம் இல்லை என்பது பாராளுமன்ற உறுப்பினர் ஒருவருக்குக் கிடைக்கின்ற அதியுச்சபட்சச் சலுகையாகும். இந்தச் சலுகையானது, பாராளுமன்றத்திற்குள் பேசுகின்ற பாராளுமன்ற உறுப்பினர்கள் ஒழுக்கசீலர்களாக இருப்பார்கள், சட்டத்தை உருவாக்குகின்ற சபையில் இருப்பவர்கள் சட்டத்தை மதிக்கக்கூடியவர்களாக இருப்பார்கள் என்கின்ற எடுகோள்களின் அடிப்படையில்தான் வழங்கப்பட்டிருக்க வேண்டும். அதன்படிதான் பாராளுமன்ற உறுப்பினர்கள் இந்தப் பாராளுமன்றத்திற்குள் பேசுகின்ற விடயங்கள் தொடர்பாக யாரும் எந்தவொரு நீதிமன்றத்தையும் நாட முடியாது என்கின்ற ஒரு சலுகை காணப்படுகின்றது. ஆனால் இந்த விவகாரம் சரிவர நிறைவேற்றப்படுகின்றதா?

பாராளுமன்றத்திற்குள் நாடாளுமன்ற உறுப்பினர்களுடைய நடவடிக்கைகளாக இருக்கலாம், அவர்கள் பேசுகின்ற வார்த்தைகளாக இருக்கலாம் அல்லது பாராளுமன்றத்திற்குள் அவர்கள் நடந்துகொள்கின்ற நடைமுறைகளாக இருக்கலாம்! இவையனைத்தும் சட்டத்தை ஆக்குகின்ற ஓர் உயரிய சபையிலிருக்கின்ற உறுப்பினர்களுக்குரிய செயல்களாக இல்லை என்ற விமர்சனம் மக்கள் மத்தியில் எழுகின்றபோது, இந்தச் சபை குறித்தான சந்தேகமும் இந்தச் சபையால் உருவாக்கப்படுகின்ற சட்டங்களைத் தாமும் சரிவரப் பின்பற்றவேண்டுமா என்பதான சந்தேகமும் எழுவதைத் தடுக்கமுடியவில்லை. இந்தநிலையில், இன்று நிலையியற் கட்டளைகளிலே சில திருத்தங்கள் கொண்டுவரப்பட்டிருக்கின்றன. ஆனால், இந்தச் சிறப்புரிமைகள் தொடர்பான விடயங்களில் அவதானம் தேவையென்று நினைக்கின்றேன். ஏனென்றால், நினைத்தவற்றைப் பேசுகின்ற ஒரு நிலைமை இன்று இங்கு உருவாகியிருக்கின்றது.

இன்றைய தினத்திலே இந்தப் பாராளுமன்ற நிலையியற் கட்டளைகள் திருத்தம் தொடர்பிலும் இலங்கைத் தொலைக் காட்சிக் கூட்டுத்தாபனம் தொடர்பான திருத்தச் சட்டமூலமும் இங்கே பிரேரிக்கப்பட்டன. எனவே, இந்த ஊடகத்துறை, இந்தப் பாராளுமன்றச் சபை ஆகிய இரண்டையும் ஒட்டியதாகச் சில விடயங்களைப் பேசுவது பொருத்தமென்று நினைக்கின்றேன்.

18ஆம் நூற்றாண்டைப் பொறுத்தளவில் அதிகமான கப்பல்களையும் கப்பல் துறைமுகங்களையும் கொண்டவர்கள் தான் உலகத்தின் ஜாம்பவான்கள் என்ற ஒரு கருத்திருந்தது. 19ஆவது நூற்றாண்டைப் பொறுத்தளவிலே அதிக விமானத் தளங்களைக் கொண்டவர்கள் உலகத்தின் ஜாம்பவான்கள் என்கின்ற நிலையிருந்தது. 20ஆம் நூற்றாண்டுக்குப் பின்னரான நிலை எப்படியென்றால், ஊடகங்கள் யார் வசம் அதிகமாக இருக்கின்றனவோ, அவர்கள்தான் இந்த உலகத்தின் ஜாம்பவான்கள் என்பதைப் பறைசாற்றி நிற்கின்றது. இதற்கு எமது நாடு மாத்திரமல்ல, முழு உலகமுமே ஓர் அத்தாட்சியாக இருக்கின்றது. Wall Streetஇலே எடுக்கப்படுகின்ற தீர்மானங்களின்படிதான் - அங்கே இருக்கின்ற தொலைக்காட்சி நிறுவனங்கள் தீர்மானிக்கின்றவர்தான் அமெரிக்காவினுடைய ஜனாதிபதியாக வரமுடியும் என்ற நிலை காணப்படுகின்றது. அதுபோன்று, இந்த ஊடகத்துறை இன்று தாம் விரும்பியவர்களை ஆட்சியதிகாரத்துக்குக் கொண்டுவருவதற்கும் ஆட்சியிலிருந்து தூக்கி எறிவதற்கும் மிக முக்கிய காரணமாக இருக்கின்றது. கடந்த ஆட்சிக் காலத்தில்கூட நாங்கள் இதனைப் பார்த்திருக்கின்றோம்; அது இந்த ஆட்சிக் காலத்திலும் தொடர்வதைப் பார்க்கின்றோம். ஊடகத்துறையினால், ஊடகங்களினால் பொறுப்புமிக்க செய்திகள் சொல்லப்படுவதை விடுத்து, பொறுப்பற்ற விதத்திலே பரப்பப்படுகின்ற செய்திகள் மக்களைச் சென்றடைகின்றபோது, அந்தச் செய்திகளை நம்புவதன் அடிப்படையில் பிழையான பொருள் கோடலோடு மக்கள் இருக்கின்றார்கள். அது மிக ஆபத்தான ஒரு நிலை என்பதை இங்கே சுட்டிக்காட்ட விரும்புகின்றேன்.

கடந்த தேர்தலுக்கு முன்பான காலகட்டத்திலும்கூட இந்த ஊடகத்துறை வாயிலாக மிகப் பிழையான விடயங்கள், இனவாத ரீதியான கருத்துக்கள் உண்மைகள் போலவே சொல்லப்பட்டன என்பது உங்களுக்குத் தெரியும். உதாரணத்துக்கு Dr. Shafi தொடர்பில் மருத்துவ ரீதியாகக் கூறப்பட்ட விடயத்தை இங்கே ஞாபகப்படுத்த விரும்புகின்றேன். அது மிகப் பிழையான, பொய்யான ஒரு தகவல். ஒரு வைத்தியரால் மீண்டும் பிள்ளை பிறக்காதவாறு கருத்தடையினைச் செய்ய முடியுமென்ற பொய்யான விடயத்தை எல்லாத் தரப்பினரும் முக்கியமான விடயமாகச் சொன்னார்கள். அந்தக் குற்றச்சாட்டை உண்மையான குற்றச்சாட்டு என்பதுபோல ஊடகங்கள் கொண்டுசென்றன. அதேபோன்றுதான் "கொத்து ரொட்டிக்குள் கர்ப்பத்தடை மருந்து" என்பது போன்ற பல பொய்யான விடயங்கள் முன்னெடுத்துச் செல்லப்பட்டதை இங்கே எடுத்துச் சொல்ல முடியும். இவையெல்லாம் பிழையான - தப்பான விடயங்கள்!

கடந்த 'ஈஸ்டர்' தாக்குதலை ஒட்டிக்கூட பல பொய்யான பரப்புரைகள் மேற்கொள்ளப்பட்டன. இந்தப் பொய்யான பரப்புரைகளை ஊடகங்கள் உண்மைபோல மக்களிடம் கொண்டுசெல்கின்றபோது, அந்தப் பரப்புரைகளை நம்பிய மக்கள் பிழையான வழிகளில் செல்கின்ற நிலைமை காணப்படுகின்றது. எனவே, இந்த ஊடகத்துறைக்கு மிகப் பெரிய ஒரு பொறுப்பிருக்கின்றது. வியட்நாம் யுத்தம் நடைபெறுகின்றபோது ஒரு photographer எடுத்த புகைப்படம் அந்த வியட்நாம் யுத்தத்தையே நிறுத்திய வரலாறு உண்டு. எனவே, ஊடகத்துறை ஒரு சரியான சமூகத்தை உருவாக்க வேண்டிய, அதேநேரத்தில் ஒரு நாட்டைச் சரியான திசையில் கொண்டு செல்வதற்கான வாய்ப்பினை வழங்கக்கூடிய பொறுப்புடன் கூடியதாக இருக்கவேண்டும். இன்று ஊடகத்துறை அவ்வாறு நடக்கின்றதா என்றால், இல்லை!

அதேபோன்று இந்தப் பாராளுமன்றத்துக்குள்ளும் நாம் பார்க்கின்றபோது, சில பாராளுமன்ற உறுப்பினர்கள் பெரும் பொய்களை இங்கே கட்டவிழ்த்து விடுகின்றார்கள்; பணப்பரிமாற்றம் தொடர்பான விடயங்களைக் கூறுகின்றார்கள். ஒரு சக பாராளுமன்ற உறுப்பினருடைய சிறப்புரிமையை மதிக்கக்கூடிய அளவுக்குக்கூட இங்குள்ள பாராளுமன்ற உறுப்பினர்களில் பலர் இல்லை என்பது வேதனைக்குரிய ஒரு விடயம். எதைப் பேசவேண்டும் என்பதிலே ஒரு வரையறை இங்கே கிடையாது. எதையும் பேசலாம், எந்தப் பொய்க்குற்றச்சாட்டையும் சொல்லலாம் என்ற ஒரு நிலை இங்கே காணப்படுகின்றது. இந்தப் பாராளுமன்றத்துக்கு நான் வந்து இரண்டரை வருடங்களாகிவிட்டன. பாராளுமன்றத்தில் பல Committees இருக்கின்றன. இந்தக் Committees அனைத்துமே வினைத்திறனாக இயங்குகின்றனவா? என்றால், இல்லை! Committee on Public Petitions பற்றி மக்களிடம் மிகப் பெரிய நம்பிக்கையிருக்கின்றது. அதிலே தங்களுடைய முறைப்பாடுகளைச் செய்தால் தீர்வு கிடைக்கும் என்று மக்கள் காத்துக் கொண்டிருக்கின்றார்கள். பாராளுமன்ற உறுப்பினர்களூடாக அதற்கு விண்ணப்பம் செய்யப்படுகின்றது. நாங்களும் அவ்வாறு செய்யப்பட்ட விண்ணப்பம் தொடர்பில் தீர்வு வேகமாக

வருமா என்று இந்தப் பாராளுமன்ற அவையிலே பார்த்துக் கொண்டிருக்கின்றோம்; அது வருவதாகவே இல்லை. இது போன்று பல விடயங்களை நாம் எடுத்துச் சொல்லலாம். இங்கேயுள்ள பாராளுமன்றக் குழுக்கள், Consultative Committees, பாராளுமன்றத்துக்கு வெளியிலே ஜனாதிபதி யால் அமைக்கப்பட்ட DCC போன்ற குழுக்களின் பல கூட்டங்களுக்கு நாங்கள் செல்கின்றோம்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, your time is over.

**ගරු එස්.එම්.එම්. මුෂාරෆ් මහතා**
(மாண்புமிகு எஸ்.எம்.எம். முஸ்ஸாரப்)
(The Hon. S.M.M. Muszhaaraff)
Okay, Sir. I am going to wind up.

ஆனால், எந்தவொரு கூட்டத்தில் எடுக்கப்படுகின்ற தீர்மானங்களும் ஒரு முடிவைத் தருவதாக இல்லாமல் வெறுமனே காலங்கடத்துகின்ற விடயங்களாக இருப்பது வேதனைக்குரிய ஒரு விடயமாகும். பாராளுமன்றம் என்பது சட்டத்தை ஆக்குகின்ற சபையாகும். இந்தச் சபை உயரிய மதிப்புமிக்க சபையாக இருக்கவேண்டுமாக இருந்தால், இங்கு முன்னெடுக்கப்படுகின்ற ஒவ்வொரு நகர்விலும் அர்த்தமிருக் கவேண்டும். இங்கே உருவாக்கப்படுகின்ற குழுக்களிலே எடுக்கப்படுகின்ற தீர்மானங்கள் நிறைவேற்றப்படவேண்டும். COPE குழு, COPA குழு ஆகியவை ஊடாக எத்தனையோ பேருடைய ஊழல்கள் வெளிவந்தன. எவ்வளவோ மோசடிகள் சம்பந்தமாக reports வந்தன. அவற்றுக்கு என்னவாகியிருக் கின்றது? அவற்றிற்கு என்ன முடிவு எட்டப்பட்டிருக்கின்றது? என்கின்றபோது, இந்த COPE குழு, COPA குழு தொடர்பான எல்லாச் செய்திகளும் வெறுமனே கடந்து செல்கின்ற செய்தி களாகவே இருக்கின்றன. எனவே, பாராளுமன்ற Committee ஆக இருக்கலாம், சபையாக இருக்கலாம், எல்லா இடங்களிலும் இந்த நிலையியற் கட்டளைகள் பேணப்படவேண்டும்.

நான் இறுதியாகச் சொல்லிமுடிக்கின்ற விடயம் என்னவென்றால், தலைமை ஆசனத்திலிருக்கின்ற உறுப்பினர் களுக்குத் தகைமைகள் இருக்கவேண்டும். தலைமை ஆசனத்தி லிருக்கின்ற உறுப்பினர்கள் மலினமான வார்த்தைகளைச் சக பாராளுமன்ற உறுப்பினர்களை நோக்கிப் பேசுவதைப் பார்க்கின்றோம். சில நேரங்களில் அத்துமீறி நடக்கின்ற சம்பவங்களைப் பார்க்கின்றோம். இவ்வாறு மலினமான வார்த்தைகளைப் பேசுபவர்களுக்கு, அத்துமீறி நடப்பவர் களுக்கு அந்தத் தலைமை ஆசனத்தில் அமர்வதற்கான தகுதி இல்லை என்கின்ற விடயம் இந்த நிலையியற் கட்டளைகளில் கொண்டுவரப்பட வேண்டும். அவ்வாறில்லாமல், நிலையியற் கட்டளைகள் ஒருபுறமாக இருக்க, பாராளுமன்ற உறுப்பினர் கள் தான்தோன்றித்தனமாக எப்படியேனும் நடக்கலாம் என் கின்ற நிலைமை இருக்குமாக இருந்தால், இந்தச் சபைக்கும் இந்த நிலையியற் கட்டளைகளுக்கும் இங்கு உருவாக்கப் படுகின்ற குழுக்களுக்கும் அர்த்தமிருக்காது என்பதைத் தெரிவித்து, விடைபெறுகின்றேன். நன்றி.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රෝහණ බණ්ඩාර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි පහක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.38]

**ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)
මූලාසනය හොබවන ගරු මන්ත්‍රීතුමනි, අද දවසේ මේ මොහොත, අපේ පාර්ලිමේන්තුවේ මෙතුවක් කාලයක් කටයුතු කරගෙන ආ ඒ සම්ප්‍රදායට -ස්ථාවර නියෝගවලට- යම්කිසි සංශෝධනයක් ගෙන එන්න සාකච්ඡා කරන මොහොතක්.

ඇයි අපි ස්ථාවර නියෝග සංශෝධනය කරන්න යෝජනා කරන්නේ? අපි මෙතුවක් කාලයක් -වසර ගණනාවක්- ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තුව පවත්වාගෙන ඇවිත් තිබෙනවා. මෙතුවක් කාලයක් මේ පාර්ලිමේන්තුව මේ විධියටම ඉදිරියට ඇවිත් තිබෙනවා. නමුත්, අද මෙසේ ස්ථාවර නියෝග සංශෝධනය කරන්න, -වෙනස් කරන්න- අලුත් කමිටු එකතු කරන්න යෝජනා කරන්නේ, කථා කරන්නේ පසු ගිය යුගය තුළ ආණ්ඩු පක්ෂය නියෝජනය කරපු සියලුදෙනා -ජනාධිපතිවරයා, අගමැතිවරයා සහ කැබිනට් මණ්ඩලය ඇතුළුව ආණ්ඩු පක්ෂය නියෝජනය කරපු සියලු මන්ත්‍රීවරුන්- අසාර්ථක වීම නිසායි. තමන්ගේ ආරක්ෂාව වෙනුවෙන් මේ කමිටු පාවිච්චි කරන එකේ ප්‍රතිඵල තමයි අප දකින්නේ. එතුමන්ලා අසාර්ථක වෙනවා. ඒ අසාර්ථකත්වයට පාර්ලිමේන්තුව තුළින් උත්තර හොයන්න තිබෙන ක්‍රමය හරියාකාරව ක්‍රියාත්මක වන්නේ නැහැ. මේ විධියට අලුත් කමිටු කොච්චර ගෙනාවත්, ඒවාට සභාපතිවරුන් වශයෙන් පත් කරගන්නේ ප්‍රතික්ෂේප වෙච්ච, අසාර්ථක වෙච්ච, තමන්ට බැහැ කියලා දාලා ගිය, ආණ්ඩු පැත්ත නියෝජනය කරන කට්ටියම නම්, ඒ කමිටුවල බහුතරය නිර්මාණය වන්නේ ඒ පැත්තේ අයගෙන්ම නම් ඒවායෙන් මේ පාර්ලිමේන්තුවට කිසිම ඵල ප්‍රයෝජනයක් ලැබෙයි කියලා මම හිතන්නේ නැහැ. පසුගිය කාලයේ විවිධ ප්‍රශ්න මතු වනකොට, රනිල් වික්‍රමසිංහ මැතිතුමා මේ රටේ ජනාධිපති වනකොට, ඒ මොහොත වන කොට රටේ උද්ගත වෙලා තිබිච්ච කැරලි කෝලාහල තත්ත්වය එක්ක සමාජයට බහින්න බැරි වනකොට, විපක්ෂයත් මුල් කරගත් සර්වපාක්ෂික ආණ්ඩු ගැන කථා කළා වාගේම, පාර්ලිමේන්තුවේ බලතල ටිකකුත් විපක්ෂයට ලබා දෙන්න කටයුතු කරනවා කියලා පොරොන්දු වුණා. හැබැයි, දැන් ඒ අරගළය පොඩ්ඩක් දියාරු වී ගෙන යනවා වාගේ දැනෙනවා. අරගළයට, පෙළපාළිවලට ජනතාවට දැන් එන්න බැරි වෙලා තිබෙනවා. ජනතා පීඩනය යම්කිසි ප්‍රමාණයකින් යටපත් වෙලා තිබෙන නිසා තමුන්නාන්සේලාගේ බය දැන් ඇරෙමින් යනවා. පසුගිය කාලයේ චමල් රාජපක්ෂ මැතිතුමා සාටකය නැතුව මේ පාර්ලිමේන්තුවට එනවාත් අපි දැක්කා. හැබැයි, දැන් ආපසු සාටකය දමනවා. රාජපක්ෂවරුන් පාර්ලිමේන්තුවට නැවිත් සිටියා. හැබැයි දැන් ආපසු එනවා. ඒ වාගේම කට අරින්නේ නැතිව සිටියා. දැන් ආපසු ඒ කටවල් ඇරෙනවා.

මේ කමිටුවලට කරන පත් කිරීම් දෙස බලමු. COPE එකේ සහ COPA එකේ සභාපති තනතුරු විපක්ෂයට දෙන්නම් කිව්වා. නමුත්, ඒවා තවම ලබා දීලා නැහැ. ඒ සම්බන්ධයෙන් දැන් ආණ්ඩුව පැත්තෙන් විරෝධතාවක් ගොඩ නැඟෙනවා. ඇයි ඒ? එතුමන්ලා සද්භාවයෙන් වැඩ කටයුතු කරනවා නම්, ඇයි ඒවායේ සභාපති තනතුරු විපක්ෂයට දෙන්න බය? ඒවා විපක්ෂයට දෙන්න බයයි කියන්නේ, එතුමන්ලා තවමත් හැදිලා නැහැ කියන එකයි. තවමත් උත්සාහ කරන්නේ, එතුමන්ලාගේ බලය රැකගෙන, එතුමන්ලාට ඕනෑ කරන ජවනිකා ටික, සෙල්ලම් ටික මේ රටේ මේ විධියටම කරගෙන යන්නයි. ඒ නිසා තමයි අපි ඉල්ලන්නේ මේ රටේ පාර්ලිමේන්තු මැතිවරණයක් පවත්වන්න කියලා. රටේ මුදල් නැහැ කියලා, මේක මේ විධියටම කාගෙන, විනාශ කරගෙන යන්න ඉඩ දෙන්න පුළුවන්ද? අපේ නීති, අණ පනත්

[ගරු රෝහණ බණ්ඩාර මහතා]

ඕනෑ තරම් තිබෙනවා, මැතිවරණයක් පවත්වාගෙන යන්න. මැතිවරණයකදී පෝස්ටර් අලවන්න බැහැ කියනවා. එහෙම කිව්වත්, ඕනෑ තරම් පෝස්ටර් print කරන්න, අලවන්න පුළුවන්. පෝස්ටර් අලවන කෙනා, transport කරන කෙනා අල්ලනවා. හැබැයි, ඒ පෝස්ටරය print කරන ස්ථානය අල්ලන්නේ නැහැ. ඒ කෙසේ වෙතත්, මේ රටේ නීති ඕනෑ තරම් තිබෙනවා. ඒ නීති ක්‍රියාත්මක වනවා නම්, අඩු වියදමකින් මැතිවරණ පවත්වන්න පුළුවන් හැකියාව තිබෙනවා. මැතිවරණයක් නොතියා මේ ප්‍රශ්නය විසඳන්න බැහැ කියන එක අද බොහොම පැහැදිලිව පෙනෙනවා. දැන් ආණ්ඩුවේ බය පොඩ්ඩක් මහ ඇරිලා තිබෙනවා. හැබැයි, තව එක බයක් තිබෙනවා. ඒ මොකක්ද? ආණ්ඩුව මැතිවරණයකට යන්න බයයි. ඉස්සෙල්ලා තිබුණා ජනතාව ගහයි කියන බය; ගෙවල් ගිනි තියයි කියන බය. ඒ නිසා එදා පාරට බහින්න බැරි තැනට පත් වෙලා සිටියා.

සමහරු දැන් ඇමතිකම් අරගෙන ගිහිල්ලාත් ගුටිකාලා තිබෙනවා. එහෙම වෙච්ච අවස්ථා පවා තිබෙනවා. නමුත්, අද ඒ බය යම්කිසි ප්‍රමාණයකට අඩු වී ඇති නිසා ආයෙත් සුපුරුදු තැනටම එනවා. හැබැයි, ආණ්ඩුවේ අය තවම බයයි මැතිවරණයකට යන්න. ඒ නිසා මැතිවරණය කල් දමාගන්න විවිධ උප්පරවැට්ටි මේ සංශෝධන හරහාත් යොදනවා. මම මේ කාරණය ගැන ඊට වඩා කථා කරන්නේ නැහැ. තවත් කොච්චර පනත් කෙටුම්පත් ගෙනාවත්, තිබෙන පනත් කොච්චර සංශෝධනය කළත් යළිත් මේ තිබෙන ක්‍රමයම නම් ක්‍රියාත්මක වන්නේ, මේ සෙල්ලම ම නම් වෙන්නේ, මේ අණ පනත්, සංශෝධනවලින් වැඩක් නැහැ. ස්ථාවර නියෝග සංශෝධනය කරනවා නම්, බලය බෙදී යන විධියටත්, ඒ පත් කරන කමිටු හරහා සාධාරණත්වය ඉෂ්ට වන විධියටත් සංශෝධන කළොත් තමයි ඒවා බල ගැන්වෙන තත්ත්වයට එන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි අද කථා කරන තවත් ප්‍රධාන කාරණයක් තමයි මන්දපෝෂණය. නගර ආසන්න පාසල්වල වෙන්න පුළුවන්, නගරවලට දුර බැහැර පාසල්වල වෙන්න පුළුවන් අපේ රටේ හැම දිස්ත්‍රික්කයකම වාගේ පාසල්වල උදෑසන රැස්වීම පවත්වන විට අපේ දරුවෝ ක්ලාන්ත වෙලා වැටෙනවා. මා ළඟ තිබෙනවා, පුවත් පත්වල පළ වුණු එවැනි සිදුවීම් කීපයක විස්තර. සමහර දරුවන් වේල් දෙකක් නොකා තමයි උදේ ඉස්කෝලෙට ගිහිල්ලා තිබෙන්නේ. ඒ දරුවන්ට අවශ්‍ය පෝෂණය නැති නිසා උදේ රැස්වීමේදී ක්ලාන්ත වෙලා වැටෙනවා.

දැන් යෝජනා කරලා තිබෙනවා පාසල් ළමුන්ට කෑම වේලක් දෙන්න. ඒ සඳහා රුපියල් 60ක් වෙන් කරලා කියනවා, බිත්තරයකුත් එක්ක කෑම එකක් දෙන්න කියලා. වෙළෙඳ පොළේ බිත්තරයක මිල රුපියල් 65ටත් වඩා වැඩි වෙලා තිබෙන්නේ. එහෙම නම්, ඔබතුමන්ලා මේ ක්‍රියාත්මක කරන්නේ සාර්ථක වැඩ පිළිවෙළක් නොවෙයි. මන්දපෝෂණය වළක්වාගැනීම වෙනුවෙන් තවමත් නිසි වැඩ පිළිවෙළක් නැහැ. මන්දපෝෂණය වළක්වාගන්න ත්‍රිපෝෂ ටිකක් දීගෙන යනවා. පසුගිය කාලයේ crude coconut oil ගෙනැල්ලා aflatoxin කියන පිළිකාකාරක සමාජගත කළා. මන්දපෝෂණයෙන් පෙළෙන දරුවන් ඒ තත්ත්වයෙන් ගලවා ගැනීම සඳහා දිරිගැන්වීමක් විධියට ලබා දෙන මේ රටේ තිබෙන ත්‍රිපෝෂවලත් aflatoxin තිබෙනවා කියලා අද සොයාගෙන තිබෙනවා. ගර්භිණී මාතාවට, අපේ ළදරුවාට දෙන ත්‍රිපෝෂවලත් aflatoxin තිබෙනවා නම්, අපේ හෙට දවස නිර්මාණය කරන දරුවා හෝ ඒ දරුවා නිර්මාණය කරන මව පිළිකා රෝගයට ලක් වෙන්න පුළුවන්; තවත් ළමයින් ඒ තත්ත්වයට පත් වෙන්න පුළුවන්. නගරය ආසන්නයේ ජීවත් වන සමහර පාසල් දරුවන් දවල් කෑමට කුරුම්බා ලොඳ ගෙනැවිත් තිබෙන ප්‍රවෘත්ති පවා අපි දැක්කා. ඒ ප්‍රශ්නවලට පිළියම් හොයන්න කටයුතු කරන්න කියා අපි බොහොම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. එහෙම නොකළොත් අවසානයේදී මේ කථා කරන හැම දෙයකින්ම අපට වැඩක් වන්නේ නැති වෙයි.

අපි බොහොම ගෞරවයෙන් තවත් කාරණයක් මතක් කරනවා. අද මේ රටේ සැබෑ ජන මතයක් පෙන්වන්න අවශ්‍යයි, ලෝකයේ රටවලින් අපට උදව් උපකාර ගන්න නම්. පළාත් පාලන මැතිවරණය පවත්වන්න දැන් කාලය හරි කියලා මැතිවරණ කොමසාරිස්තුමා දැනුම් දීලා තිබෙනවා. ඔබතුමන්ලා තුළ කොච්චර බයක් තිබුණත්, මැතිවරණයට බයේ හැංගෙන්නේ නැතිව මේ රටේ ආර්ථිකය නිසි පරිදි කළමනාකරණය කරලා මැතිවරණයක් පවත්වා මේ රටේ සැබෑ ජන මතය පිළිබිඹු කරන්න අවස්ථාව ලබා දෙන්න කියන ඉල්ලීම කරමින් මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු සුරේන් රාඝවන් රාජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි පහක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.44]

**ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා (උසස් අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) சுரேன் ராகவன் - உயர் கல்வி இராஜாங்க அமைச்சர்)
(The Hon.(Dr.) Suren Raghavan - State Minister of Higher Education)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි.

මේ විවාදයේදී කථා කළ යුතු බොහෝ දේවල් තිබෙනවා. නමුත්, කථා කරන්න කැමැති අයට වැඩි වෙලාවක් දෙන, අදහස් තිබෙන අයට අඩු වෙලාවක් දෙන පාර්ලිමේන්තු සංස්කෘතියක් තමයි අපේ පාර්ලිමේන්තුව තුළ තිබෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් එහි වූදිතයෙකු බව මම දන්නවා. අපි සියල්ලන්ම මෙහි වූදිතයන් වෙලා ඉන්නේ. ඒ නිසා අපට නීතියක් ගෙනෙන්න සිදු වෙනවා, අලුතින් අදහස් කියන්න බැරි නම් පාර්ලිමේන්තුවේ කථා කරන්න එපා කියලා. සමහරු දන්නා දේ ම නැවත නැවතත් කියනවා. ඒක නොවෙයි පාර්ලිමේන්තුවක විය යුත්තේ. ප්‍රචණ්ඩත්වය දක්වා ගමන් කරමින් පාර්ලිමේන්තුවට පිටතින්, මහ පොළොවේ සිටින අයගෙන් හඬක් නැඟී තිබෙනවා, 'පාර්ලිමේන්තුව වෙනස් විය යුතුයි' කියලා. මම මේ පාර්ලිමේන්තුවට ඇවිත් තවම අවුරුදු දෙකයි. මේ පාර්ලිමේන්තුව අවුරුදු 45ක් තිස්සේ නියෝජනය කරන මන්ත්‍රීවරුත් ඉන්නවා. අපි ඒ අයගෙන් ආයාචනාත්මකව ඉල්ලා සිටින්නේ, පාර්ලිමේන්තුව කථා සාප්පුවක් කරන්න එපා, කෝපි කඩයක් කරන්න එපා කියලායි. මේක ජාතියේ ඉරණම, දිශානතිය, අනාගතය තීරණය කරන සභාව නම්, ඒ අනුව ක්‍රියා කරන්න. මේ විවාදයට සහභාගි වෙලා කියන්න හුඟක් දේවල් තිබුණත් මට ලබා දී තිබෙන කාලය ඉතාම කෙටියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වෙනස් වීමට අකමැති වන කවුරුවත් සදාකාලිකව පවතින්නේ නැහැ කියන එකයි බුදු දහමේ කියන්නේ. ආණ්ඩු පක්ෂය වෙනස් වෙන්න කැමැති නැත්නම්, ආණ්ඩුවට ආයුෂ නැහැ. විපක්ෂය වෙනස් වෙන්න කැමැති

නැත්නම්, විපක්ෂයට ආයුෂ නැහැ, මොන කාරණා කිව්වත්. ඒ නිසා වෙනස් වීමක් අවශ්‍යයි. ප්‍රජාතන්ත්‍රවාදයේ ගැඹුර සඳහා වෙනස් වීමක් අවශ්‍යයි. ඒ නිසා කරුණාකර වෙනස් වෙන්න. මේ අවස්ථාවේදීත් වෙනස් වෙන්න අකමැති නම්, අපේ අඳුරු අනාගතය කළු පාට අකුරින් ලියා ගන්නවා හැර වෙනත් විකල්පයක් අපට නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට ඉතිරි වෙලා තිබෙන කාලයෙන් මම මිනිත්තු දෙකක් ගන්නවා, විශේෂ කාරණයක් කියන්න. ඊයේ සහ පසුගිය සතියේ-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ගරු මධුර විතානගේ මන්ත්‍රීතුමාගේ විනාඩි පහක කාලයකුත් ලැබෙනවා.

**ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) சுரேன் ராகவன்)
The Hon. (Dr.) Suren Raghavan
හොඳයි, බොහොම ස්තුතියි. Thank you, Hon. Madhura Withanage, wherever you are.

අලුත් කාරණයට යන්න කලින් ජාතියේ අවධානය යොමු වී තිබෙන විශේෂ කාරණයක් ගැන කථා කරන්න මා කැමැතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

නැවත විශ්වවිද්‍යාල පටන් ගන්න ඕනෑ කියලා මුළු රටම කිව්වා. මේ අවස්ථාවේ මහාචාර්ය චරිත හේරත් මන්ත්‍රීතුමා සභාවේ රැඳෙනවාද, යන්න හදනවාද දන්නේ නැහැ. එතුමා ඉන්නවා නම් හොඳයි. එතුමා පේරාදෙණිය විශ්වවිද්‍යාලයට සම්බන්ධව සිට, දැන් නිදහසේ හිතන, නිදහස පිළිබඳ අරගළ කරන මහාචාර්යවරයකු විධියට පෙනී සිටිනවා. ඊයේ සහ ගිය සතියේ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සහ වවුනියා විශ්වවිද්‍යාලයේ නැවතත් අශිෂ්ටත්වයේ හිස මතු වී තිබෙනවා. අශිෂ්ටත්වය හැම දාමත් තිබුණා. බුදුහාමුදුරුවන් පවා මරන්න හැදුවා නේ. අපි ඒ ඉතිහාසය ගැන දන්නවා. හැම දාම අශිෂ්ටත්වය පරාජය කළේ ශිෂ්ටත්වය තුළින් පමණයි. මාර්ටින් ලූතර් කිං කිව්වා, "The crime of our time is not the criminals, but the silence of the good people" කියලා. මම මේ සභාවට එන්න මොහොතකට කලින් මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන ආචාර්ය, මහාචාර්යවරු 17දෙනෙකුගේ සමාජ මාධ්‍ය තොරතුරු ගැන සොයලා බැලුවා. ඒ එක් කෙනෙකුවත් කියලා නැහැ, නවක වදය හොඳ නැහැයි කියලා. මොකක්ද මේ තත්ත්වය? ඇයි මේ අශිෂ්ටත්වයට අපි භය? අපි විශ්වවිද්‍යාලයේ හිටිය කාලයේත් විශ්වවිද්‍යාලය තුළට නවක වදය ගෙනෙන අය සිටියේ සියයට 5යි. අවුරුදු 40ක් ගියාට පසුව දැන් ඉන්නේත් සියයට 5යි. නමුත්, මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන ආචාර්ය, මහාචාර්යවරු පවා ඒක දැඩි ලෙස විවේචනය කරන්න අකමැතියි. ඇයි ඒ? දේශපාලන චුවමනාවක් තිබෙන නිසා. මම විශ්වවිද්‍යාලයේ සිටියදී ශිෂ්‍යයෙක් වෙනවා හැර මට වෙනත් බලයක් තිබුණේ නැහැ, වගකීමක් තිබුණේ නැහැ. ඊයේ වෙද්දී මේ රටේ බඳු ගෙවන දෙමව්පියන් 218දෙනෙක් මට කථා කරලා තිබෙනවා. මගේ දුරකථන අංකය website එකේ තිබෙන නිසා ඒ අය දන්නවා. ඒ අය මගෙන් ඇහුවා, "අපේ දරුවන්ගේ විභාග ප්‍රතිඵල ඇවිත් තිබෙනවා. අපි දරුවන් විශ්වවිද්‍යාලයට යවන්න ලෑස්ති කරලා තිබෙනවා, දරුවන් විශ්වවිද්‍යාලයට යන්න ඉල්ලනවා. විශ්වවිද්‍යාල කියන්නේ අපේ දරුවන් ආරක්ෂිතව යවන්න පුළුවන් කලාපයක්ද කියන එක මහජන මුදලින් පඩි ගන්න ජනතා නියෝජිතයකු හැටියට ඔබතුමාට කියන්න පුළුවන්ද?" කියලා. ඒක සාධාරණ ප්‍රශ්නයක්. ඒක සියලු දෙමව්පියන් ඇසිය යුතු ප්‍රශ්නයක්. එහෙම නම් අපි මේ විශ්වවිද්‍යාල සාධාරණත්වයේ, බුද්ධියේ, ශිෂ්ටත්වයේ, ආරක්ෂාවේ කලාප බවට පත් කරන්නේ නැත්තේ ඇයි? අපට එතැනදීත් බෙදීමක් අවශ්‍යද? අපි කාටවත් බෙදීමක් අවශ්‍ය නැහැ.

පේරාදෙණිය පොලීසිය විසින් ඊයේ අත්අඩංගුවට ගත් සිසුන් හතර දෙනාට Prohibition of Ragging and Other Forms of Violence in Educational Institutions Act, No. 20 of 1998 යන පනතට විරුද්ධව ඇප දුන්නා. මම තුන් වතාවක් මගේ මිත්‍ර පොලිස්පතිතුමා, - ඔහු කොළඹ විශ්ව විද්‍යාලයේ හිටපු කෙනෙක්; රග්බි සෙල්ලම් කරපු කෙනෙක්; මගේ හොඳ මිතුරෙක් - දුරකථනයෙන් සම්බන්ධ කර ගන්න හැදුවා. මම ඔහුට පණිවුඩයක් යැව්වා, මම මේ ගැන පාර්ලිමේන්තුවේ දී කථා කරනවා කියලා. පේරාදෙණිය පොලීසිය භාරව සිටින නිලධාරියාට, ඔහු භාරව සිටින කොට්ඨාසය භාර අධිකාරිට, මේ පනතට විරුද්ධව ඒ අත්අඩංගුවට ගත් අය ඇප මත මුදා හරින්නට තිබුණු බලය මොකක්ද? එහෙම කරන්නේ ඇයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි? නීතියට අගෞරව කරන හැම මොහොතේදී ම, නීතියට අවමාන කරන හැම මොහොතේදී ම අපි අපරාධකරුවන්ට උදව් කරනවා. විශ්වවිද්‍යාල තුළට නවක වදය ගෙන එන්නේත්, නවක වදය පවත්වාගෙන යන්නේත් මේ රටේ පුරවැසියන් කිහිපදෙනෙකු බව මට අමතක නැහැ. ඒ අයත් ශිෂ්‍යයන් හැටියට රාජ්‍ය විශ්වවිද්‍යාලවලට ඇතුළත් වෙලා ඒ අයගේ අධ්‍යාපනය කර ගන්නවා කියන ප්‍රථම, ප්‍රාථමික පොරොන්දුව උඩයි විශ්වවිද්‍යාලවලට එන්නේ. අවුරුදු දෙකහමාරක් විශ්වවිද්‍යාල වසා තබන විට, ඇයි විශ්වවිද්‍යාල විවෘත කරන්නේ නැත්තේ කියලා මහ හඬින් අපට චෝදනා කළ විපක්ෂයේ කිසිදු කෙනෙක් පෞද්ගලිකව හෝ පොදුවේ මේ නවක වදයට විරුද්ධව ප්‍රකාශයක් කරලා නොමැති වීම ජාතියේ ඛේදවාචකයක් කියලා මා හිතනවා. අඳුරට විරුද්ධව කථා නොකිරීම අඳුරට කරන ආදරය හා ආකර්ෂණයයි. එය නවත්වන්න. අපි දේශපාලනය කළා ඇති. විශ්වවිද්‍යාල 17 සහ උසස් අධ්‍යාපන ආයතන 5 ශිෂ්ටාචාරයේ සංකේත බවට පත් කරන්න ඕනෑ නම් අපි එකමුතු වෙමු; වැරැද්ද, වැරැද්ද හැටියට දකිමු. නවක වදයට උදව් දෙන ආචාර්ය, මහාචාර්යවරු ඉන්නවා. ඒ අයට අපි කියන්නේ නීතියේ ආධිපත්‍යයට ඉඩ දෙන්න කියලායි. විශ්වවිද්‍යාල තවදුරටත් බෝම්බ හදන තැන් බවට පත් කරනවා වෙනුවට බුද්ධිය හදන තැන් බවට පත් කරමු. විශ්වවිද්‍යාල දරුවන්ට ප්‍රශ්න තිබෙනවා නම්, විශ්වවිද්‍යාල ළමයි කිහිපදෙනෙක් හිතනවා නම් IMF එක වහන්න ඕනෑ, පාර්ලිමේන්තුව ගිනි තියන්න ඕනෑ, World Bank එක වහන්න ඕනෑ කියලා අපි ඒ අයත් එක්ක වෙනම සාකච්ඡාවක් කරමු.

නමුත් පුරුෂාධිපත්‍යය පිහිටුවමින්, ආහාර ගැනීමට තිබෙන අයිතිය නැති කරමින් ප්‍රචණ්ඩත්වය මුදා හරින්න කිසි කෙනෙකුට අයිතියක් නැහැ. ඒ අය වෙනුවෙන් අලුත් නීති අවශ්‍ය නැහැ. ඒ අය වෙනුවෙන් පවතින නීතිය ක්‍රියාත්මක කරන්න. අපේ ශරීරයේ කොතැනක හෝ පිළිකාවක් හැදුණොත්, අපි බෞද්ධ වුණත්, ඉස්ලාම් වුණත්, කතෝලික වුණත් ඒ වෙනුවෙන් ගන්න ඕනෑ පියවර තිබෙනවා. මොකක්ද ඒ පියවර? විශේෂඥ වෛද්‍යවරයකුගෙන් අපි අහනවා, පිළිකාව අයින් කර ගන්නේ කොහොමද කියලා. ඒක තමයි සාමාන්‍ය සනාතන නීතිය. ඒ සනාතන නීතිය අනුව, මේ කඩා වැටී තිබෙන දේශය නැවත නඟාසිටුවිය යුතු මොහොතක් වන මෙම අවස්ථාවේදී විශ්වවිද්‍යාල දාහතක් සහ උසස් අධ්‍යාපන ආයතන පහක් අපි නිසි මඟට ගෙන යන්නට අවශ්‍ය වනවා. එය අපේ වගකීමක්ද වනවා. මට කලින් දේශපාලනය කර ඇති, මට කලින් මේ ගරු සභාවේ වාඩි වී පුටු රත් කරමින් කටයුතු කර තිබෙන සියලුදෙනාගෙන් මම දෑත ඔසවා නමස්කාර පූර්වකව ඉල්ලා සිටිනවා, මේ මොහොතේදීවත් කරුණාකරලා,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මන්ත්‍රීතුමාගේ කාලයෙන් තව විනාඩි පහක් දීලා තිබෙනවා, ගරු මන්ත්‍රීතුමා.

**ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) சுரேன் ராகவன்)
(The Hon.(Dr.) Suren Raghavan)
බොහොම ස්තුතියි.

මම මේ ගරු සභාවේ ප්‍රබල කථාවක් කරන නිසාද, දේශකයන් නැති නිසාද දන්නේ නැහැ මට ඒ ගරු මන්ත්‍රීතුමන්ලාගේ කාලය ලබා දෙන්නේ. නමුත්, මට කථා කරන්න කාලය ලබා දුන් ඒ ගරු මන්ත්‍රීතුමන්ලා දෙදෙනාටම මම ගරු කරනවා.

මම ආවේගශීලී වුණා නොවෙයි. නමුත්, මේ කාරණා කියන කොට ආවේගශීලී වෙන්නට ඕනෑ. ගරු විරුද්ධ පක්ෂයේ ප්‍රධාන සංවිධායක ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා මේ අවස්ථාවේ ගරු සභාවේ ඉන්නවා. මම ඉතා ගරු කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් දෙදෙනෙකු වන ගයන්ත කරුණාතිලක මැතිතුමාත්, පාසල් මිතුරෙකු වන, බුද්ධාගම පිළිබඳව විවාද කරන බේරුවල ප්‍රදේශය නියෝජනය කරන බේරුවල පුත්‍රයාත් මේ අවස්ථාවේ ගරු සභාවේ ඉන්නවා.

**ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මහතා**
(மாண்புமிகு இம்தியாஸ் பாகிர் மாகார்)
(The Hon. Imthiaz Bakeer Markar)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,-

**ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) சுரேன் ராகவன்)
(The Hon.(Dr.) Suren Raghavan)
අනේ! මගේ කාලය ගන්න එපා, ගරු මන්ත්‍රීතුමා. මම පින් මන්ත්‍රී. මොකද, පිනට තමයි මට කාලය ලැබෙන්නේ.

**ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මහතා**
(மாண்புமிகு இம்தியாஸ் பாகிர் மாகார்)
(The Hon. Imthiaz Bakeer Markar)
ඔබතුමාගෙන් මම කාරුණිකව ඉල්ලනවා, නවක වදයට විරුද්ධ වුණේ නැහැ කියන කාරණයට අපේ මන්ත්‍රීවරු ඔක්කොටම දොස් කියන්න එපා කියලා. ඒ ගැන සාකච්ඡාවක් මේ සභාවේ පැවැත්වුණේ නැහැ. *[බාධා කිරීමක්]* අපි කවුරුවත් ප්‍රචණ්ඩ නවක වදය අනුමත කරන්නේ නැහැ. ඒකට ආණ්ඩු පක්ෂය, විපක්ෂය කියලා භේදයක් නැහැ.

**ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) சுரேன் ராகவன்)
(The Hon.(Dr.) Suren Raghavan)
Please sit down. I will tell you. I respect you. I am not saying that you are encouraging it; I am saying that you are silent. That itself is wrong; your silence is the biggest crime! *[Interruption.]*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රාජ්‍ය අමාත්‍යතුමා, ඔබතුමා කථාව කරගෙන යන්න.

**ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) சுரேன் ராகவன்)
(The Hon.(Dr.) Suren Raghavan)
I will discuss it with you, Hon. Member. - *[Interruption.]* This is exactly the problem. Why are we fighting? I am saying that all of you are -

**ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මහතා**
(மாண்புமிகு இம்தியாஸ் பாகிர் மாகார்)
(The Hon. Imthiaz Bakeer Markar)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම රීති ප්‍රශ්නයක් ඉදිරිපත් කරන්නේ.

කරුණාකරලා අපේ හැසිරීම් ගැන වැරදි අර්ථ නිරූපණ දෙන්න එපා. අපි අවශ්‍ය අවස්ථාවලදී ඊට විරුද්ධව කථා කරලා තිබෙනවා.

**ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) சுரேன் ராகவன்)
(The Hon.(Dr.) Suren Raghavan)
පොදුවේ විපක්ෂයේ වාඩි වී සිටින මන්ත්‍රීවරුන්ගේ නිහඬභාවය ගැනයි මම කිව්වේ. ඒ නිසා කවුරු හෝ ගරු මන්ත්‍රීවරයෙක් මේ අවස්ථාවේදී කථා කරනවා නම් හොඳයි, දෙවියනේ! මාත් කියන්නේ කවුරු හෝ ගරු මන්ත්‍රීවරයෙක් ඒ ගැන කථා කරන්න කියායි. නිහඬ වෙලා ඉන්න එක තමයි මේ රටේ තිබෙන ලොකුම ප්‍රශ්නය.

**ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මහතා**
(மாண்புமிகு இம்தியாஸ் பாகிர் மாகார்)
(The Hon. Imthiaz Bakeer Markar)
ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, නවක වදය නතර කිරීම තමයි මේ ගරු සභාව විසින් ඉටු කළ යුතු වගකීම වන්නේ. ඒක ඔබතුමන්ලා කරන්න. අපේ සහයෝගය ඒ වෙනුවෙන් ලබා දෙනවා. කථාව වැදගත් නැහැ, කරුණාකරලා එය ක්‍රියාවට නංවන්න.

**ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) சுரேன் ராகவன்)
(The Hon.(Dr.) Suren Raghavan)
අපි විතරක් කළ යුත්තේ ඇයි? විශ්වවිද්‍යාල ආණ්ඩුවේද? විශ්වවිද්‍යාල ආණ්ඩුවේ නොවෙයි, ඒවා ජාතික විශ්වවිද්‍යාල. ඒ නිසා විපක්ෂයත් අපිත් එක්ක එකතු වෙන්න ඕනෑ. ඔබතුමන්ලා නිහඬව සිටීම තමයි ලොකුම වැරැද්ද. කථා කිරීම නොවෙයි, නිහඬව සිටීම තමයි ඔබතුමන්ලා කරන ලොකුම වැරැද්ද!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමා කරුණාකරලා කථාව කර ගෙන යන්න, ගරු රාජ්‍ය අමාත්‍යතුමා.

**ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) சரித்த ஹேரத்)
(The Hon. (Prof.) Charitha Herath)
Sir, I rise to a point of Order.

**ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) சுரேன் ராகவன்)
(The Hon.(Dr.) Suren Raghavan)
දැන් ඔක්කොම ලෑස්ති වනවා, මගේ කථාවට විරුද්ධ වෙන්න. කරුණාකරලා මට කථා කරන්න ඉඩ දෙන්න. There is no point of Order. You read Standing Order No. 91(b). You cannot oppose my speech. Sit down! There is no point of Order. Let me speak.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
What is the point of Order? ගරු චරිත හේරත් මන්ත්‍රීතුමා.

**ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) சரித்த ஹேரத்)
(The Hon. (Prof.) Charitha Herath)
Sir, I rise to a point of Order.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු රාජ්‍ය ඇමතිතුමා කලබල විය යුතු නැහැ. අපි මේ විශ්වවිද්‍යාල පද්ධතියේ හැම දාම හිටපු අය. ඔය ප්‍රශ්නය ගැන ලංකාවේ කථා කළ පළමුවැනියා එතුමා නොවෙයි. අපි ඔක්කොම ඔය ප්‍රශ්නය ගැන කථා කළා. අපි එදා ඉඳලාම ඒ වෙනුවෙන් අරගළ කළා. ඒ නිසා රාජ්‍ය ඇමතිතුමා නිකම් බොරුවට කෑ ගහන්න එපා.

**ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) சுரேன் ராகவன்)
(The Hon.(Dr.) Suren Raghavan)
ඒක point of Order එකක් නොවෙයි, ගරු මන්ත්‍රීතුමා. ඔබතුමා වාඩි වෙන්න, ගරු චරිත හේරත් මන්ත්‍රීතුමා. I do not know why you raised a point of Order then.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමා කථාවට අවතීර්ණ වුණා නම් හරි, ගරු රාජ්‍ය අමාත්‍යතුමා.

**ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) சுரேன் ராகவன்)
(The Hon.(Dr.) Suren Raghavan)
මම කියන්නේ කවුරුවත් කලබල වෙන්න ඕනෑ නැහැ කියායි. පොදු ප්‍රශ්නයක් පිළිබඳවයි මම මේ කථා කරන්නේ. තොප්පිය හරි යනවා කියලා කාට හෝ හිතෙනවා නම් ඒ තොප්පිය දමා ගත්තාට ප්‍රශ්නයකුත් නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රාජ්‍ය අමාත්‍යතුමා, ඔබතුමා කරගෙන ආපු කථාව කළා නම් හොඳයි.

**ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) சுரேன் ராகவன்)
(The Hon.(Dr.) Suren Raghavan)
විශ්වවිද්‍යාල ආණ්ඩුවට අයිති නැහැ; විශ්වවිද්‍යාල විපක්ෂයට අයිතිත් නැහැ. විශ්වවිද්‍යාල තුළ දේශපාලනය කිරීමේ අයිතියක් කාටවත් නැහැ. මෙච්චර වැටිලා තිබෙන මේ දේශය අනාගතය වෙනුවෙන් නැවත ගොඩනැඟීමේ පළමුවැනි බුද්ධිමය පියවර ගත යුතු ස්ථානයක් වන විශ්වවිද්‍යාල තුළ නැවතත් ප්‍රචණ්ඩත්වය දිස්වීම පිළිබඳව අපි කවුරු හරි නිහඬව ඉන්නවා නම්, ඒ සියලුදෙනාම වැරැදිකාරයෝ කියලායි මම කියන්නේ. එම නිසා පොලිස්පතිට මම කියනවා, කරුණාකර නීතියේ ආධිපත්‍යය රකින්න, තිබෙන නීතිය පිළිපදින්න කියලා. විෂය භාර ගරු රාජ්‍ය ඇමතිවරයා මෙම ගරු සභාවේ ඉන්නවා. එතුමාගෙනුත් මා ඉල්ලා සිටින්නේ මේ පිළිබඳව ගත යුතු, ගත හැකි සියලු පියවර ගන්න කියායි. පාර්ලිමේන්තු වරප්‍රසාදවලට හැංගිලා අපට මොන-මොනවා හරි කියන්න පුළුවන්. නමුත්, අපි මේ රටේ පොදු ජනයාට උත්තර දිය යුතුයි. දෙමව්පියෝ බලාපොරොත්තුවෙන් ඉන්නවා, තමන්ගේ දූවා දරුවන් විශ්වවිද්‍යාලවලට යවන්න. එම නිසා ඒ දරුවන්ට ආරක්ෂිත කලාපයක්, බුද්ධි කලාපයක් අපි සැදිය යුතුයි. මේ අවස්ථාවේ මම යෝජනා කරනවා, යම් හෝ පිරිසක් විශ්වවිද්‍යාල නවක වදයට සෘජුවම සම්බන්ධයි කියා පරීක්ෂණයකින් පසුව ඔප්පු වී තිබෙනවා නම්, ඒ අයගේ පන්ති තහනම් කළ යුතුයි, -ඒක දැනටත් තිබෙන නීතියක්- උපාධිය අහිමි කළ යුතුයි කියලා. ඒ නීතිය අපි ක්‍රියාත්මක කරන්න ඕනෑ. ඊට අමතරව මා යෝජනා කරනවා, එවැනි සමාජ විරෝධී, බුද්ධි විරෝධී අයට කිසිම විධියකින් රජයේ රැකියාවක් ගන්න බැරි විධියට ඔවුන් අසාදු ලේඛනගත කළ යුතුයි කියලා. මන්ද යත්, රාජ්‍යයක් ගොඩ නැඟීමේදී කළ හැකි, කළ යුතු අවම පරිත්‍යාගය, දායකත්වය කරන්න බැරි අයට රාජ්‍ය සේවයට ඇතුළු වීමට සුජාතභාවයක් නැහැ කියා මා හිතන නිසා. මගේ යෝජනාව මේකයි. කවුරු හරි තමන්ගේ දේශපාලන වුවමනාවලට හෝ තමන්ගේ අභිප්‍රායයන් ඉටු කර ගන්න මේ පුරවැසියන් මෙහෙයවා එළියෙන් කරගන්න බැරි දේ නැවතත් විශ්වවිද්‍යාල නොසන්සුන් කර, විශ්වවිද්‍යාල තුළින් ඇති විය හැකි ඒ පීඩනය සමාජගත කරලා සමාජය අවුල් කරලා, මරණාසන්නයේ තිබෙන අපේ ආර්ථිකය නැවතත් ගොඩනඟන්න කාර්ය භාරයට සෘජුව හෝ වක්‍රව විරුද්ධ වෙනවා නම්, ජාතියක් හැටියට, බුද්ධිමත් මිනිස්සු හැටියට පාට කණ්ණාඩි අයින් කරලා අපි ඒ අයට විරුද්ධ විය යුතු ය යන්නයි. මම හිතනවා, මේ සභාව එවැනි වූ බුද්ධිමය තීරණයකට එයි කියලා. මගේ යෝජනාව, අපි අපේ දේශපාලන න්‍යාය පත්‍ර පැත්තකින් තියලා හදවතට තට්ටු කර මේ විෂය පිළිබඳව කථා කරමු යන්නයි.

ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (මහාචාර්ය) චරිත හේරත් මැතිතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.59]

**ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) சரித்த ஹேரத்)
(The Hon. (Prof.) Charitha Herath)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විපක්ෂ නායකතුමාටත්, විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාටත් මා බොහොම ස්තුතිවන්ත වෙනවා, මේ වැදගත් අවස්ථාවේ මට විනාඩි 5ක් කථා කරන්න අවස්ථාව ලබා දීම ගැන. සමහරුන්ගේ අනවශ්‍ය ප්‍රශ්නවලට උත්තර දෙන්න ගිහිල්ලා ඒ විනාඩි 5 නැති කරගන්න මම යන්නේ නැහැ. නමුත්, මේ රටේ විශ්වවිද්‍යාල පද්ධතිය ගැන කථා කරන බොහෝ අයට වඩා වැදගත් පදනමක් තිබෙන පුද්ගලයකු විධියට මම කියන්නේ, මේ රටේ විශ්වවිද්‍යාලවල තිබෙන නවක වදය ප්‍රශ්නයක් බවයි. මේ ප්‍රශ්නයෙන් විශ්වවිද්‍යාලය ගලවන්න අපි එදා ඉඳලාම අරගළ කරලා තිබෙනවා, එදා ඉඳලාම වැඩ කරලා තිබෙනවා, anti-ragging movements ඇතුළේ ගුටි කාලා තිබෙනවා. හැබැයි, ඒක ඉවර කරගන්න අපට තවම බැරි වෙලා තිබෙනවා. ඒ නිසා ඔය නිකම් සද්ද-බද්ද දාන එක එච්චර තේරුමක් ඇති වැඩක් නොවෙයි. මම ඒ කාරණය ගැන කරුණු දැක්වීම එතැනින් නිමා කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද කරන්නේ ඉතා වැදගත් විවාදයක්. විපක්ෂයෙන් විනාඩි 5ක් ඉල්ලාගෙන මේ විවාදයට මම සම්බන්ධ වන්නේ ඉතා වැදගත් කරුණු දෙකක්, තුනක් කියන්න අවශ්‍ය නිසායි. ස්ථාවර නියෝග වෙනස් කිරීම සම්බන්ධව පැවැත්වූ සාකච්ඡාවට COPE එකේ හිටපු සභාපතිවරයා වශයෙන්

இன்று எங்களுடைய இலங்கைத் திருநாட்டிலே தமிழர்கள் என்றால் சட்டம் ஒருவிதமாகவும் சிங்களவர்கள் என்றால் இன்னொரு விதமாகவும் நடைமுறைப்படுத்தப்படுகின்றன. அந்த அடிப்படையில்தான் இந்தத் தொல்லியல் திணைக்களத் தின் நடவடிக்கைகளும் இருந்துகொண்டிருக்கின்றன. இவ்வாறு செய்தால், எவ்வாறு நீங்கள் இந்த நாட்டிலே நல்லிணக்கத்தை ஏற்படுத்த முடியும்? என்ற கேள்வி எழுகிறது. இவ்வாறு பழம்பெரும் ஆலயங்களில் நீங்கள் கைவைத்தால், எவ்வாறு இந்த நாட்டில் மத நல்லிணக்கத்தை ஏற்படுத்த முடியும்? எனவே, இந்த ஆலயத்தின் சிறப்பையும் பெருமையை யும் கருத்திற்கொண்டு, எங்களுடைய இந்து மக்களின் மனங்களை வெல்லக்கூடிய வகையில் உங்களுடைய நடவடிக்கைகள் இருக்க வேண்டும் என்ற வேண்டுகோளை அன்புடன் விடுக்கின்றேன். இதேபோன்று பல ஆலயங்கள் தொல்லியல் திணைக்களத்துக்கென அடையாளப்படுத்தப் பட்டு, எங்களுடைய தமிழ் மக்களுடைய தொன்மைகள் அழிக்கப்படுகின்ற செயற்பாடு இப்பொழுது ஆரம்பிக்கப் பட்டிருக்கிறது. இதை நீங்கள் உடனடியாக நிறுத்த வேண்டும். ஏற்கனவே நாம் புண்பட்டவர்களாக இருக்கிறோம். இந்த நாட்டை ஆண்டவர்கள் எம்மை அடிமைகளாக ஆக்கி வைத்திருக்கிறார்கள். அந்த நிலைமையிலிருந்து எங்களுடைய தமிழ் மக்களையும் இந்துக்களையும் மீட்டு, அவர்கள் சுதந்திரமாக வாழ்வதற்கு நீங்கள் வழிவகை செய்யவேண்டும்.

இங்கு கடும்போக்குடைய அரசியல்வாதிகள் இருக்கிறார்கள். அவர்களை நீங்கள் திருத்த வேண்டும். அவர்கள் இந்த நாட்டில் நல்லிணக்கத்தை ஏற்படுத்தக்கூடிய வகையில் எந்தக் கருத்தையும் முன்வைப்பதில்லை. இந்த நாட்டில் வன்முறை தொடர்ந்திருக்க வேண்டும் என்ற அடிப்படையில்தான் அவர்கள் செயற்படுகிறார்கள். அவ்வாறு செயற்படுவதற்கு நாங்கள் ஒருபோதும் அனுமதிக்கப் போவதில்லை. இந்த நாட்டில் சமாதானம் நிலவவேண்டும்; இந்த நாட்டிலே ஒரு சிங்களப் பிரஜையும் ஒரு முஸ்லிம் பிரஜையும் அனுபவிக்கின்ற அனைத்துச் சுதந்திரங்களையும் தமிழர்களும் அனுபவிக்க வேண்டும் என்றுதான் நாங்கள் விரும்புகிறோம். ஆனால், அதை நீங்கள் எங்களுக்கு ஏற்படுத்தித் தருவதாக இல்லை. நீங்கள் தொடர்ச்சியாக எங்களுடைய தமிழர் பிரதேசங்களிலே மத ரீதியான அடக்குமுறையைச் செய்கிறீர்கள். அதேபோன்று, எங்களுடைய வாழ்விடங்களைப் பறிக்கிறீர்கள். இவை யெல்லாம் இந்த நாட்டுக்குப் பொருத்தமானதல்ல. மனிதநேயத்துடன் இந்த நாட்டுக்கு உதவி செய்ய வருபவர்கள் இவ்வாறான செயற்பாடுகளை அறிந்து, எந்தவிதமான உதவியையும் செய்ய முன்வராத ஒரு சூழலே ஏற்படும். ஆகையால், எங்களுடைய கௌரவ உறுப்பினர் சிறீதரன் அவர்களால் கொண்டுவரப்பட்ட இந்த ஒத்திவைப்பு வேளைப் பிரேரணையை இந்த உயரிய சபை ஏற்று, உரிய தீர்வைப் பெற்றுத்தர வேண்டும் என்று கேட்டு, முடித்துக் கொள்கின்றேன். நன்றி.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු සරත් වීරසේකර මැතිතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.55]

**ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා**
(மாண்புமிகு (கலாநிதி) சரத் வீரசேகர)
(The Hon.(Dr.) Sarath Weerasekera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්ත වශයෙන් කියනවා නම් තිරුකෝණේෂ්වරම් කෝවිල තිබෙන්නේ ත්‍රිකුණාමලයේ ෆෙඩ්රික් කොටුව ඇතුළේ. ඒක පුරාවිද්‍යා පරිශ්‍රයක්. එතැන අක්කර තුන්සිය ගණනක් තිබෙනවා. එයින් කෝවිලට අයිති වෙන්නේ අක්කර 18ක පමණ ප්‍රමාණයක්. ඒ කෝවිලට යන පාරේ තමයි මේ කඩ පේළිය තිබෙන්නේ. එතැන කඩ හැට ගණනක් තිබෙනවා. ඒ කඩවලින් සියයට 80කට වැඩි ප්‍රමාණයක් කරන්නේ සිංහල ජාතිකයන්. ඒ කඩ පොලිතීන්වලින් ආවරණය කරලා, ලෑලි ගහලා තිබෙන්නේ. ඒ නිසා එතැනට මුහුද අලංකාරව පෙනෙන්නේ නැහැ. එම නිසා තමයි ඒ ආණ්ඩුකාරතුමිය තීරණය කරලා තිබෙන්නේ කන්ද පැත්තේ ඒ කඩ ඉතා අලංකාර ලෙස ඉදිකරලා ඒ අයටම දෙන්න. ඒකේ කිසිම ප්‍රශ්නයක් නැහැ.

මේ ආණ්ඩුකාරතුමිය ඉතාම සාධාරණව කටයුතු කරන කාන්තාවක්. එතුමිය කාර්යක්ෂමයි, ඒ වාගේම බුද්ධිමත්. එතුමිය කිසිම ජාතියකට වෙනස්ව සලකන්නේ නැහැ; සියලු ජාතීන්ට එක වාගේ සලකන්නේ. ත්‍රිකුණාමලයේ සියයට 33ක් සිංහල අය ඉන්නවා, සියයට 33ක් මුස්ලිම් අය ඉන්නවා, සියයට 33ක් දෙමළ අය ඉන්නවා. ඒ ආණ්ඩුකාරතුමිය සියලු ජාතීන්ට ඉතාම හොඳින් සලකන, ඉතාම සාධාරණව කටයුතු කරන කාන්තාවක්. එතුමිය සියලු බලධාරීන් ගෙන්වා, කෝවිලේ දායක සභාවත් ගෙන්වා තමයි මේ තීරණය ගත්තේ. කෝවිලේ දායක සභාවේ සියලුදෙනා මේ කටයුත්තට කැමැතියි. කෝවිලේ දායක සභාවේ සියලුදෙනා මේ කටයුත්තට කැමැති නම්, මේ මන්ත්‍රීවරයා විතරක් ජාතිවාදය, ආගම්වාදය අවුස්සමින් මෙවැනි සාවද්‍ය යෝජනා ගේන්නේ ඇයි?

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවත් කැමැති නම්, ආණ්ඩුකාරතුමියගේ කාර්ය මණ්ඩලයත් කැමැති නම්, කෝවිලේ දායක සභාවත් කැමැති නම්, මේ කඩ අලංකාර විධියට ඉදිකරන්න ඉඩ නොදෙන්නේ ඇයි කියන ප්‍රශ්නය තමයි මේ අවස්ථාවේ මට අහන්න තිබෙන්නේ. කෝවිල දියුණු කිරීමට පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව අවසර දෙන්නේ නැහැ කියන එකත් පට්ටපල් බොරුවක්; මුසාවක්. ශිව දෙවියන්ගේ ප්‍රතිමාව හදන්න ඔබතුමන්ලාට පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවෙන් අවසර දුන්නා. නන්දි ගවයා හදන්නත් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවෙන් අවසර දුන්නා. මේ මන්ත්‍රීවරයා වක්‍රව කියන්නේ සිංහල කඩ ටික කඩා ඉවත් කරන්න කියලායි. ඒක ද්වේෂ සහගතව කරන ප්‍රකාශයක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලංකාවේ තිබෙන ඕනෑම ආගමකට අදාළ සිද්ධස්ථානයකින් ඒ අවට ඉන්න ගැමියන්ට තමයි ප්‍රතිලාභය ලැබෙන්නේ. උදාහරණයක් හැටියට මුහුදු මහා විහාරයට යන පාරේ තිබෙන්නේ මුස්ලිම් කඩ. ඒවාට කවදාවත් සිංහල අය විරුද්ධ වුණේ නැහැ. සිංහල අය තමයි ඒ කඩවලින් බඩු ගන්නේ. ඒ වාගේම ලංකාපටුන සමුද්‍රගිරි විහාරයට යන පාරේ තිබෙන්නේ දෙමළ කඩ. තිරියායේත් බොහෝදුරට තිබෙන්නේ දෙමළ කඩ. කන්නියා උණුවතුර ළිං අසල සිංහල, දෙමළ, මුස්ලිම් කඩ තිබෙනවා. ඒවා ඒ ප්‍රදේශයේ ඉන්න ජනතාවට ලැබෙන ප්‍රතිලාභයක්. ඒක නවත්වන්න තමයි ඉතාම ද්වේෂ සහගතව මේ කටයුතු කරන්නේ. මෙවැනි යෝජනා තුළින් ජාතිවාදය අවුස්සනවා; ආගම්වාදය අවුස්සනවා. මේ කෝවිල වන්දනාමාන කිරීමට සති අන්තයට 8,000ක් 9,000ක් පමණ එනවා. ඒ නිසා තමයි හොඳ අලංකාර වෙළෙඳ සැල් තිබෙන්න ඕනෑ කියලා කියන්නේ. මම හිතන්නේ ඒක කෝවිලටත් හොඳයි. ඒ නිසා කෝවිලට ලැබෙන ආදායමත් වැඩි වෙනවා. ජාතිවාදය අවුස්සන්න කරන වැඩ නිසා වැරදි අවබෝධයක් තමයි මෙතුමන්ලා ලංකාව ගැන දෙන්නේ.

ඒ වාගේම මෙතුමා කියනවා, ශ්‍රී ලාංකීය ද්‍රවිඩ රජකු වන රාවණේෂ්වරන් විසින් වන්දනාමාන කරන ලද පූජකවරයෙකු වූ තිරිඥාන සම්බන්ධව. එතුමා ස්තෝත්‍ර ගායනා කළ තිරුකෝණේෂ්වරම් කෝවිල දෙමළ ජනතාවගේ පාරම්පරික දේපළක්, ඒක විනාශ කිරීම වැරදියි කියලා කියනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙහෙම කියන්නේ අප ලවා ඇත්ත ඉතිහාසය කියවා ගන්නයි. රාවණේෂ්වරන් කියලා රජෙක් කවදාවත් ඉඳලා නැහැ. ඒ වාගේම රාවණා කියන රජු දෙමළ කියලා කවුරුවත් ලියලාත් නැහැ. ඉතින්, තිරුකෝණේෂ්වරම් කෝවිල කවදාවත් විනාශ කරලාත් නැහැ; අපි විනාශ කරන්න දෙන්නේත් නැහැ; අපි විනාශ කරන්නේත් නැහැ. ඒ නිසා මෙයින් කියන්නේ සම්පූර්ණයෙන් වැරදි අදහසක්. මේ කාරණය වැරදි ලෙස අවබෝධ කර ගන්න එපා කියලා බෞද්ධයෙකු හැටියට මම ලංකාවේ සහ ලෝකයේ ඉන්න සියලු ශිව භක්තිකයන්ගෙන් කාරුණිකව ඉල්ලා සිටිනවා. අද වුණත් ඕනෑ කෙනෙකුට එම ස්ථානය වැඳ පුදා ගන්න පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතිහාසය ගැනත් මම ඉතා කෙටියෙන් කියන්නම්. 1952දී ෆෙඩරල් පක්ෂය ත්‍රිකුණාමලය නගර සභාව ජය ගත්තාට පසුව තමයි නැවත වරක් තිරුකෝණේෂ්වරම් කෝවිල හැදුවේ. එතැන දේවාල හතරක් තිබුණා. ඒ දේවාල හතර තිබුණේ ගෝකන්න විහාරය යටතේ. "කිව්රෝස්" කියන පෘතුගීසි ජාතික පියතුමා තමයි ඒ ගැන ලියා තිබෙන්නේ. එතැන චෛත්‍ය තුනක් තිබුණා. කොත් තුනක් මුහුදට පෙනුණු නිසා තමයි එම ප්‍රදේශය මුලින් "ත්‍රිකෝණමලය" වෙලා තිබෙන්නේ. ඒක තමයි පසු කාලයක "ත්‍රිකුණාමලය" වුණේ. අද වුණත් ඉතාම පැහැදිලි - clear - දවසක ඉහළට ගිහිල්ලා පහළ බලනකොට මුහුද පතුලේ තිබෙන ගල් කණු, කොරවක් ගල්, සඳකඩපහන් සහ ප්‍රතිමා අපට දැක බලාගන්න පුළුවන්. ඒ වාගේම

[ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා]

කොටුව ඇතුළේ සෙල් ලිපියක තිබෙනවා, කන්ගමනාලි උපාසක විසින් පූජා කරන ලද රන් කහවණු සියයකින් එම විහාර පවුරේ සියක් රියනක් හැදුවාය කියලා. ඒ වාගේම මහාවංශයේ තිබෙනවා, තුන්වැනි සියවසේදී මහසෙන් රජු එතැන විහාරයක් කළා, අටවැනි සියවසේදී අග්‍රබෝධි රජු විසින් භාවනානුයෝගීව ඉන්න භික්ෂූන් වහන්සේලාට විහාරයක් හදලා දුන්නාය, නැඟෙනහිර සමුද්‍ර තීරයේ "ගෝකර්ණ" කියලා විහාරයක් තිබෙනවාය කියලා. මේවා අපි කියන්නේ, ප්‍රශ්න ඇති කර ගන්න නොවෙයි. මේවා අපි කියන්නේ, ඔබතුමන්ලා ඉතිහාසය ගැන වැරදි අදහසක ඉන්නා නිසායි. නමුත්, අපට නැවත වරක් එතැන විහාරයක් ඉදිකරන්න ඕනෑ නැහැ. තිරුකෝණේෂ්වරම් කෝවිලට අපිත් යනවා. ඒ නිසා අපි ඒ ස්ථානය විනාශ කරන්නේ නැහැ; ආරක්ෂා කරනවා. අපි මේ ස්ථාන එහෙම ආරක්ෂා කරනවා නම්, තමුන්නාන්සේලාත් තමුන්නාන්සේලාගේ ප්‍රදේශවල තිබෙන කුරුන්දි විහාරය වාගේ ස්ථාන ආරක්ෂා කරන්න ඕනෑ. අපි සමඟියෙන් ඉන්න ඕනෑ එහෙමයි.

ඔබතුමන්ලා කියනවා, අපි ජාතිවාදය අවුස්සනවාය කියලා. නමුත්, ඔබතුමන්ලාම තමයි අපට සුහදව ඉන්න නොදෙන්නේ. ඇත්ත වශයෙන්ම එතැන tourist attraction එකක් තිබෙන ස්ථානයක්. විදේශිකයන් බොහෝ පිරිසක් එතැනට එනවා. එහෙම නම් ඇයි, ලෑලි කෑලිවලින්, පොලිතීන්වලින් හදලා තිබෙන කඩවල් හොඳ ලස්සන කඩ බවට පත් කරලා ඒ ප්‍රදේශයේ ජනතාවට දෙන්න බැරි? ඇයි මේ වාගේ ද්වේෂ සහගත කාරණා කියන්නේ? කෝවිලේ දායක සභාවත් කැමැති නම්, තමුන්නාන්සේලාට තිබෙන රුදාව මොකක්ද කියලා තමයි මට අහන්න තිබෙන්නේ. මෙහෙම ප්‍රශ්න ඇති කරන තමුන්නාන්සේලා කුරුන්දි විහාරයේ සංරක්ෂණ කටයුතු පවා නවත්වා තිබෙනවා. දැනටමත් ද්‍රවිඩ අන්තවාදීන් පුරාවිද්‍යා නිලධාරින්ට පහර දීලා, ඒ අය එතැනින් පලවා හැර තිබෙනවා. මුලතිව්වල මහේස්ත්‍රාත්වරයා පසුගිය ජූලි 19වැනි දා එතැනට ගිහිල්ලා, දුන් නියෝගය අවලංගු කරලා, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට නැවත එම ස්ථානය සංරක්ෂණය කරන්න භාර දීලා තිබෙනවා. කුරුන්දි විහාරය කියන්නේ පුරාවිද්‍යාත්මක වටිනාකමක් සහිත ස්ථානයක්. අවුරුදු දෙදහසක් පැරණි ඒ චෛත්‍යය සංරක්ෂණය කරලා සර්වඥ ධාතූන්වහන්සේලා පූජා කරන්න ගියාම තමුන්නාන්සේලා මොකද කළේ? ඉතාම ලජ්ජා සහගත විධියට කටයුතු කළා. මහා නායක හිමිවරුන්ට එතැන මලක්වත් පූජා කරන්න දුන්නේ නැහැ. ඒක ආගම්වාදී, ජාතිවාදී ක්‍රියාවක්. නමුත්, ඒවා විවේචනය කරන අපට තමයි තමුන්නාන්සේලා "ජාතිවාදීන්" කියන්නේ. ඒ නිසා ඒ වාගේ දේවල් කරන්න එපා. මොකද, මේ රට දියුණු කරන්න නම් අපි සුහදව ඉන්න ඕනෑ. 1938දී ඒ ස්ථානයේ අක්කර අසූවක් තිබුණා. ගවේෂණය කරනකොට තවත් නටබුන් හමු වුණා. බුද්ධ ප්‍රතිමා, කොරවක් ගල්, ගල් කණු, සඳකඩපහන් හමු වුණා. ඒ නිසා තමයි මිනින්දෝරු දෙපාර්තමේන්තුව එම ස්ථානයේ මැනීම් කටයුතු කළේ. ඒ අනුව එළි කරපු භූමියෙන් තවත් අක්කර පහක් පමණයි පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට අයිති වෙන්නේ. තවත් අක්කර හයසියයක් එළි කරලා කුඹුරු වගා කරලා තිබෙනවා. ඒවාට කිසිම විධියකින් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවෙන් ඇඟිලි ගහන්න යන්නේ නැහැ. නමුත්, පුරාවිද්‍යා නටබුන් තිබෙන ප්‍රදේශය වට කළාම, අක්කර පහක් පමණ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට එනවා. ඉතින්, ශ්‍රී ලාංකිකයෝ විධියට අපි හිතන්නේ ඒක රටේ සම්පතක්, ඔබතුමන්ලාගේ සම්පතක්, අපේ සම්පතක් හැටියටයි. මැරයෝ ඇවිල්ලා ඒ ස්තූපය උඩ නැඟලා, අගෞරව කරලා, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ නිලධාරින්ට තර්ජනය කරලා, ඒ ගොල්ලන් පලවා හැර තිබෙනවා. එම නිසා අද වනකොට ඒ කණ්ඩායමත් ගිහිල්ලා තිබෙනවා. ඒ සම්බන්ධයෙන් ඇත්ත වශයෙන්ම අපි ඉදිරියේදී කටයුතු කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවසාන වශයෙන් මා කියනවා, කුරුන්දි විහාරයේ සංරක්ෂණ කටයුතු කාටවත් නවත්වන්න අපි ඉඩ දෙන්නේ නැහැ කියලා. ඒක පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට අයිති කටයුත්තක්. මිනින්දෝරු දෙපාර්තමේන්තුව ඒ භූමිය මැනලා තිබෙනවා. මීට පසුත් ඔබතුමන්ලා මේ කටයුත්ත දිගටම කරයි, නමුත් ඔබතුමන්ලාට ඒක නවත්වන්න සිදුවන අවස්ථාවක් ඉදිරියේදී එයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ගරු මන්ත්‍රීතුමන්ලා තිරුකෝණේෂ්වරම් කෝවිල ගැන කිව්වා. නමුත්, එතැනට යන පාර තිරුකෝණේෂ්වරම් කෝවිලට අයිති නැහැ. ඒක අයිති පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට. ආණ්ඩුකාරතුමිය, කෝවිලේ දායක සභාව, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ නිලධාරින් තීරණය කළ පරිදි අනිවාර්යයෙන්ම ඒ කඩ අලංකාර කරලා ඒ අයටම දිය යුතුයි. ඒ වාගේම එහි පූජනීයත්වයට කිසිම හානියක් සිදු වෙලා නැහැ, හානියක් සිදු වෙන්න දෙන්නේත් නැහැ. එම නිසා ඒ පාරේ තිබෙන කඩ ටික දියුණු කරන එක සම්බන්ධයෙන් ඇඟිලි ගහන්න ඔබතුමන්ලාට කිසිම අයිතියකුත් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා අවසාන වශයෙන් මේ කරුණ කියන්න ඕනෑ. දෙමළ ජාතිකයන්, එහෙම නැත්නම් හින්දු භක්තිකයන් සමඟ අපි ඉතාම සුහදව ඉන්නවා. ඉතාම හොඳ දෙමළ ජාතික මිත්‍රයෝ මට ඉන්නවා. මා ඉස්කෝලේ ගිය 1971 කාලයේ ඉඳලා මට ඉන්න ඉතාම හොඳ දෙමළ ජාතික මිත්‍රයෝ අදටත් මාත් එක්ක මිත්‍රව ඉන්නවා. ඒ අයගෙන් සමහර අය ඉන්නේ එංගලන්තයේ. ඒගොල්ලන් කොළඹ ආවාම නවතින්නේ මගේ ගෙදර. මම එංගලන්තයේ ගියාම නවතින්නේ ඒගොල්ලන්ගේ ගෙදර. අපි අතර කිසිම විරසකයක් නැහැ. මම දෙමළ මිනිසුන්ට ලේ පවා දීලා තිබෙනවා. මම දන්නේ නැහැ, ඔබතුමන්ලා එහෙම ලේ දීලා තිබෙනවාද කියලා. හොඳ සිංහල බෞද්ධයෙකු නම් එහෙමයි කටයුතු කරන්නේ. එම නිසා ඔබතුමන්ලා මේ විධියට ජාතිවාදය, ආගම්වාදය ඇති කරන්න එපා. අපි ඔක්කෝම හොඳින් ඉන්න ඕනෑ. අපේ සිංහල, දෙමළ අය අතර තිබෙන මිත්‍රත්වය නැතිවන විධියට මේ වාගේ අසත්‍ය තොරතුරු ඉදිරිපත් කරලා නැවත වරක් ජාතිවාදය, ආගම්වාදය අවුස්සන්න එපා කියා ඉතාම ආදරයෙන් මම ඔබතුමන්ලාට කියා සිටිනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ගෝවින්දන් කරුණාකරම් මන්ත්‍රීතුමා.

[පි.ප. 5.05]

**ගරු ගෝවින්දන් කරුණාකරම් මහතා**
(மாண்புமிகு கோவிந்தன் கருணாகரம்)
(The Hon. Govindan Karunakaram)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இலங்கையிலே பாடல்பெற்ற ஐந்து ஈச்சரங்களில் ஒன்றான திருக்கோணேஸ்வர ஆலயம் சம்பந்தமான இன்றைய ஒத்திவைப்பு வேளைப் பிரேரணையிலே முன்னாள் அமைச்சர் சரத் வீரசேகர அவர்களுக்குப் பின்னர் உரையாற்றக் கிடைத்த மையையிட்டு மகிழ்ச்சியடைகிறேன். ஏனென்றால், அவருக்குப் பதிலளிக்கவேண்டிய தேவை எனக்கு இருக்கிறது.

தொல்பொருள் என்னும் பெயரில் வரலாற்றுப் பெருமை கொண்ட திருக்கோணேஸ்வரம் என்னும் திருத்தலம் சூறையாடப்பட்டுக்கொண்டிருக்கிறது. அந்த ஆலயத்தின் புகழை வரலாற்றுக்கு முந்திய காலத்திலிருந்தே பல

புராணங்கள் போற்றிப் பாடியுள்ளன. இதற்குச் சிறந்த உதாரணம் தட்சண கைலாச புராணமாகும். இலங்காபுரியை ஆண்ட இராவணன் வழிபட்ட இவ்வாலயத்தின் பெருமையை திருஞானசம்பந்தர் 7ஆம் நூற்றாண்டில் பதிகம்மூலம் பாடியுள்ளார். அதுமாத்திரமன்றி, பல்லவர் மற்றும் சோழர் காலக் கல்வெட்டுக்களிலும் இதன் பெருமை எடுத்துக் கூறப்பட்டுள்ளது.

இந்த ஒத்திவைப்புப் பிரேரணையை முன்மொழிந்த கௌரவ பாராளுமன்ற உறுப்பினர் சிறிதரன் அவர்கள் கூறியதைப்போன்று, போர்த்துக்கேயர் திருகோணமலையை ஆட்சி செய்த காலத்தில் 1624ஆம் ஆண்டு இந்தக் கோயில் உடைக்கப்பட்டது மாத்திரமல்ல, அதிலிருந்த செல்வங்களை எல்லாம் அவர்கள் தங்களது நாட்டுக்கு அள்ளிச்சென்றார்கள். அவ்வாறு உடைக்கப்பட்ட அந்தக் கோயிலின் கற்களைக் கொண்டுதான் பாராளுமன்ற உறுப்பினர் சரத் வீரசேகர அவர்கள் கூறிய 'பிரட்டிக்' கோட்டை1600ஆம் ஆண்டளவில் உருவாக்கப்பட்டது. ஆனால், 1952இல் திருகோணமலையில் மூன்று மதஸ்தலங்கள் இருந்ததாகவும் அவற்றில் இதுவும் ஒன்று என அவர் கூறினார். உண்மையிலேயே 50 வருடங்களுக்கும் மேலாக திருக்கோணேஸ்வரத்தைப் புனித நகராக மாற்றவேண்டுமென்று இந்துக்கள் படாதபாடுபட்டுக் கொண்டிருக்கிறார்கள்.

1965இல் இலங்கைத் தமிழ் அரசுக் கட்சி, இந்த நாட்டு அரசாங்கத்துடன் நல்லிணக்கத்தை ஏற்படுத்த வேண்டும், இலங்கைத் தமிழர்களின் இனப் பிரச்சினைக்கு நிரந்தரத் தீர்வொன்றைக் காண வேண்டும் என்பதற்காக ஆட்சி அதிகாரத்தில் பங்கெடுத்தது. அவ்வரசாங்கத்தில் திருச்செல்வம் அவர்கள் உள்ளூராட்சி அமைச்சராக இருந்தார். அப்போது அவர் திருக்கோணேஸ்வரத்தைப் புனித நகராக மாற்ற வேண்டுமென்று அப்போதைய பிரதமர் டட்லி சேனாநாயக்க அவர்களிடம் கேட்க, அதற்கு அவரும் அனுசரணை கொடுத்திருந்தார். விகாராதிபதிகளின் எதிர்ப்பைச் சமாளிக்க முடியாமல், அமைச்சருக்கே தெரியாமல் அதனுடன் தொடர்புடைய குழுவை இரத்துச்செய்தார். அதனால், திருச்செல்வம் அவர்கள் அமைச்சரவையிலிருந்து வெளியேற வேண்டிய துர்ப்பாக்கிய நிலைமை அப்போது ஏற்பட்டது.

2018ஆம் ஆண்டு நடைபெற்ற திருகோணமலை மாவட்ட அபிவிருத்திக் குழுக் கூட்டத்தில் அரசாங்க அதிபர் உட்பட அப்போதிருந்த நான்கு பாராளுமன்ற உறுப்பினர்களின் முன்னிலையில் திருக்கோணேஸ்வர ஆலய வளாகத்தில் கடைகளை வைத்திருந்தவர்கள் தொடர்பில் முடிவொன்று எட்டப்பட்டது. முன்னாள் அமைச்சர் அவர்கள் கூறியதைப் போன்று, அங்கு கடைகளை வைத்திருந்த 45 பேரும் அந்தக் கோயிலையோ அல்லது அந்தப் பிரதேசத்தையோ சுற்றியிருந்தவர்கள் அல்லர். மாறாக, அன்று இரத்தினபுரி யிலிருந்து திருகோணமலைக்கு வந்து பாராளுமன்றத் தேர்தலில் போட்டியிட்ட சுசந்த புஞ்சிநிலமே அவர்கள், தான் சார்ந்த பிரதேசத்திலிருந்தும் தம்புள்ளை, குருநாகல், பொலன்னறுவை போன்ற பிரதேசங்களிலிருந்தும் தன்னுடைய தேர்தல் அடாவடி வேலைகளுக்காகக் கொண்டுவரப்பட்டு அங்கு குடியேற்றப்பட்டவர்கள். வாழ்வாதாரத்திற்காகவே அவர்களுக்கு அந்தக் கோயில் அமைந்துள்ள பிரதேசத்தில் தற்காலிகக் கடைகள் அமைத்துக் கொடுக்கப்பட்டதென்பதை இந்தச் சபை உணர்ந்து கொள்ளவேண்டும்.

இன்று அந்தக் கோயில் நிருவாகத்தினர் என்ன கூறுகிறார்கள்? அவர்கள் மனச்சாட்சி அற்றவர்கள் அல்லர். 2018இலே நடைபெற்ற மாவட்ட அபிவிருத்திக் குழுக் கூட்டத்திலே எடுக்கப்பட்ட தீர்மானத்தின் அடிப்படையில், அவர்களை அங்கு தங்கவைப்பது தொடர்பில் தங்களுக்கு எந்தவிதமான ஆட்சேபனையும் இல்லையென்று அவர்கள் கூறுகிறார்கள். தொல்பொருள் திணைக்களமானது, இந்த நாட்டின் தொல்பொருள் சின்னங்களைப் பாதுகாப்பதற்காக உருவாக்கப்பட்டது. தொல்பொருளைப் பாதுகாக்கவேண்டிய இத்திணைக்களம், திருக்கோணேஸ்வர ஆலயப் பிரதேசத்தில் மாத்திரம் வேற்று மதத்தவர்களை, வேற்று இனத்தவர்களை, அந்தக் கோயிலை வழிபடாதவர்களை நிரந்தரமாகக் குடிய மர்த்துவதற்கான முயற்சிகளை எடுத்துக் கொண்டிருக்கிறது.

கிழக்கு மாகாண ஆளுநரும் தொல்பொருள் திணைக்கள அதிகாரியும் அவ்வாலய நிருவாகத்தினரை அழைத்து, "நாங்கள் உங்களிடம் ஆலோசனை பெறுவதற்காக அழைக்க வில்லை; அறிவுறுத்தல் வழங்குவதற்காகவே அழைத்திருக் கிறோம்" என்று கூறியிருக்கிறார்கள். அங்குள்ளவர்களுக்கு நிரந்தரக் கடைகளை அமைத்துக்கொடுக்கப் போவதாக அவர்கள் கூறுகிறார்கள். அவர்கள் போட்டுக்காட்டிய ஒளிப்பதிவிலுள்ள கடைகளின் வடிவத்தைப் பார்க்கும்போது, கடையின் அமைப்பிலல்லாது குடியேற்றத்துக்கான வீடுகள் போன்றே அவை காணப்பட்டன. இவ்விடயத்துக்குப் பொறுப்பான கௌரவ அமைச்சர் அவர்கள் இங்கு இருக்கிறார். நீங்கள் இந்த விடயத்திலுள்ள நியாயத்தைப் புரிந்து நடக்க வேண்டும். நேற்று முன்தினமும் இவ்விடயம் தொடர்பில் எங்களுடைய பாராளுமன்ற உறுப்பினர்கள் உங்களுடன் பேசியிருக்கிறார்கள்.

கிழக்கு மாகாணத்துக்கென தொல்பொருள் செயலணி ஒன்றை இதற்கு முன்னைய அரசாங்க காலத்தில் அப்போது சனாதிபதியாக இருந்த கோட்டாபய ராஜபக்ஷ அவர்கள் அமைத்திருந்தார். முன்னாள் இராணுவ கட்டளைத் தளபதி கமல் குணரத்ன தலைமையில் அமைக்கப்பட்ட அச்செயலணி யானது, முழுக்க முழுக்க சிங்கள அதிகாரிகளையும் பௌத்த பிக்குகளையும் கொண்டதாகவே காணப்பட்டது. இன்று திருகோணமலையிலுள்ள திருக்கோணேஸ்வரத்தில் சிங்கள மொழியை மட்டும் பேசக்கூடிய பல்கலைக்கழக மாணவர் களினாலேயே தொல்பொருள் ஆராய்ச்சி மேற்கொள்ளப் படுகிறது. அப்படியென்றால், இந்த நாட்டில் தொல்பொருள் ஆராய்ச்சி சம்பந்தமாகப் படிக்கின்ற ஏனைய மதத்தவர்கள் இல்லையா?

100 சதவீதம் சிங்களவர்களைக் கொண்ட இந்தத் தொல்பொருள் செயலணியும் தொல்பொருள் சம்பந்தமாக ஆராய்ச்சி செய்யும் பல்கலைக்கழக மாணவர் குழாமும் கிழக்கு மாகாணத்தில் எதைச் செய்ய முற்படுகின்றன? அங்கு சிங்களப் புராதனச் சின்னங்கள் மாத்திரம்தான் இருக்கின்றன என்பதை உறுதிப்படுத்துவதற்கு முயற்சிக்கின்றனவா? ஏனைய மதத்தைச் சேர்ந்தவர்களையும் அந்தச் செயலணிக்குள் உள்ளடக்க வேண்டும். அப்படியில்லாவிட்டால், அந்தச் செயலணி கலைக்கப்பட வேண்டும் என்பதுதான் எங்களுடைய நிலைப்பாடாகும். ஏனெனில், ஏனைய மதத்தவர்கள் அந்தச் செயலணியிலும் அந்தப் பல்கலைக்கழக மாணவர் குழாமிலும் உள்வாங்கப்பட்டால்தான் அங்கு இருப்பவை எந்த மதத்தைச் சேர்ந்த, எந்த மதத்தினர் வழிபட்ட புராதனப் பொருட்கள் என்பது தெரியவரும். நாங்கள் இந்த நாட்டில் நல்லிணக்கத்தை விரும்புகிறோம். நான் ஒன்றை மட்டும் கூறிக்கொள்ள விரும்புகிறேன். நீங்கள் தமிழர்களுக்கு இரத்தம் கொடுத்திருக்கலாம்; குறிப்பிட்ட தமிழர்களுடன் சேர்ந்து வாழ்ந்திருக்கலாம்! ஆனால், கடந்த அமைச்சரவையில் இனவாதிகளும் இருந்திருக்கிறார்கள் என்பதை நான் உறுதிபடக் கூறுகிறேன். இந்த நாட்டைச் சில இனவாதிகள்

[ගරු ගෝවින්දන් කරුණාකරම් මහතා]

அழித்திருக்கிறார்கள். அவர்களில் கே.எம்.பி. ராஜரட்ண, ஆர்.ஜி. சேனாநாயக்க, சிறில் மத்தியு ஆகியோர் மிகவும் துவேசமான இனவாதிகள்! இந்த மூன்று இனவாதிகளையும் ஒன்றுதிரட்டிய ஒரேயாளாக இங்குள்ள ஒருவர் இருக்கிறார். அங்கு சுற்றிவர இருக்கின்றவர்களுக்கு முக்கிய இடம் வழங்கப்பட வேண்டும் என்றும் நாங்கள் இந்த நாட்டில் நல்லிணக்கத்தோடு வாழவேண்டுமென்றும் அவர் கூறுகிறார். கடந்த காலங்களில் இந்த நாட்டிலே நடைபெற்றவைகளுக்கு அவரும் முக்கிய காரணகர்த்தாவாக இருந்திருக்கிறார் என்பதை நான் இங்கு கூறிக்கொள்கின்றேன்.

ஏழாம் நூற்றாண்டில் பாடல்பெற்ற இந்தத் திருக்கோணேஸ்வர ஆலயமானது, 340 ஏக்கர் பரப்பளவைக் கொண்டதாகும். 1971ஆம் ஆண்டு சிறிமாவோ பண்டாரநாயக்காவின் ஆட்சிக் காலத்தில் அது தொல்பொருள் திணைக்களத்திற்கு வழங்கப்பட்டிருந்தாலும், தற்பொழுது 18 ஏக்கருக்கு உட்பட்ட காணியே அக்கோயிலுக்குச் செந்தமானதாக இருக்கிறது. அந்தப் பிரதேசத்திலுள்ள தொல்பொருட்களை நாங்கள் பாதுகாக்க வேண்டுமானால், அந்தக் கோயிலை அபிவிருத்தி செய்யவேண்டும். மேலும், அந்தக் கோயில் பாடல்பெற்ற ஒரு தலமாகும். அந்தக் கோயிலுக்கு ஓர் இராஜகோபுரம் இல்லை. ஆகையால், அதை அமைக்க வேண்டும். உண்மையிலேயே வெளிநாட்டு சுற்றுலாப் பயணிகள் எமது நாட்டுக்கு வரும்போது, இங்குள்ள முக்கியமான இடங்களைப் பற்றி அறிந்துகொண்டுதான் வருகிறார்கள். சிலர் இந்த நாட்டில் இடம்பெற்ற சோழர், பல்லவர் காலத்து ஆட்சியைப் பற்றியும் அறிந்துகொண்டு வருகிறார்கள். அதனடிப்படையில் அவர்கள் திருகோணமலை யிலுள்ள திருக்கோணேஸ்வர ஆலயத்துக்குச் செல்கிறார்கள். அவர்கள் செல்லும் வழியிலே கடைகள் அமைக்கப்பட்டிருப்ப தால் அவர்கள் வழிபடுவதற்கும் ஆராய்ச்சி செய்வதற்கும் இடையூறு ஏற்படுகின்றது. எனவே, இந்து சமயத்திற்குப் பாதிப்பு ஏற்படாத வகையிலும் சுற்றுலாப் பயணிகளைக் கவரக்கூடிய வகையிலும் இவ்வாலயம் தொடர்பான பிரச்சினைக்கு நல்லதொரு முடிவைப் பெற்றுத்தர கௌரவ அமைச்சர் அவர்கள் ஆவன செய்ய வேண்டுமெனக் கேட்டு, விடைபெறுகின்றேன். நன்றி.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, පිළිතුරු කථාව, ගරු විදුර වික්‍රමනායක ඇමතිතුමා.

[අ.භා. 5.16]

**ගරු විදුර වික්‍රමනායක මහතා (බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு விதுர விக்கிரமநாயக்க - புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சர்)
(The Hon. Vidura Wickramanayaka - Minister of Buddhasasana, Religious and Cultural Affairs)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවුරුදු දහස් ගණනක් තිස්සේ මේ රටේ මිනිස්සු ජීවත් වුණා. යම් යම් කාල වකවානුවලදී ප්‍රශ්න ඇති වුණා. ඒවා අපි "නැහැ" කියන්නේ නැහැ. අපි අද ඉන්නේ දියුණුයි කියන කාලයක. අපි දියුණුයි නම් ආගම්වලට බෙදිලා, ජාතින් වශයෙන් එකිනෙකාට ඇඟිල්ල දිගු කර ගැනීමෙන් මේ දියුණුව අනාගතයට කොයිතරම් දුරට වලංගු වෙයි ද? අවාසනාවකට වාගේ තම තමන්ගේ -කණ්ඩායමක් වේවා, කල්ලියක් වේවා, පුද්ගලයෙක් වේවා- පෞද්ගලික න්‍යාය පත්‍ර ඉස්සරහට දාලා කටයුතු කරනවා නම්, ඒවායේ පැවැත්ම බොහොම අඩුයි. ඒවාට ජනතාවගෙන් ආශිර්වාදයක් ලැබෙන්නේ නැහැ. මා විශ්වාස කරනවා, එවැනි වැඩවලට දෙවියන්ගෙන්වත් ආශිර්වාදයක් ලැබෙන්නේ නැහැ කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ප්‍රශ්නයට තුඩු දීලා තිබෙන තිරුකෝණේෂ්වරම් කෝවිල සම්බන්ධ කාරණාව අද ගරු ශ්‍රීතරන් මැතිතුමා ඉදිරිපත් කරලා තිබෙනවා. මේකේ ඉතිහාසය ගැන මම කථා කරන්න යන්නේ නැහැ. විරුද්ධ පක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා, ගරු සරත් වීරසේකර මැතිතුමා මේකේ ඉතිහාසය ගැන කිව්වා. විරුද්ධ පක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා ඒ අයගේ ස්ථාවරයට අවශ්‍ය කරන සාධක පෙන්වනවා. අපටත් එවැනි සාධක පෙන්වන්නට පුළුවන්. හැබැයි, ඒක නොවෙයි නේ ප්‍රශ්නය. ප්‍රශ්නය ඒක නොවෙයි. ඉතිහාසය පිළිබඳ ගැටලුවක් නොවෙයි, වර්තමානය පිළිබඳ ගැටලුවක් අපට තිබෙන්නේ. දැන් තිබෙන ප්‍රශ්නයට දැන් තමයි විසඳුම් හොයන්න ඕනෑ. අපට ඉතිහාසය ගැන කරුණු කාරණා ඕනෑ තරම් කියන්න පුළුවන්.

Sir, there have been a lot of expeditions conducted. Mike Wilson, Sir Arthur C. Clarke and Peter Throckmorton had conducted certain undersea expeditions and they had found a lot of artefacts and antiquities. There are Buddhist relics as well as Hindu relics.

Archaeology is a science. It is based on certain principles and it is an art because you need skills too to engage in that. Since it is a science which is based on principles and evidence - we have to acknowledge that - whether we like it or not and even if it does not suit our thinking pattern, nevertheless, if there is something proven according to scientific facts, we have to adhere to that, unless or otherwise the Act related to archaeology is revised; that is, the Antiquities (Amendment) Act passed by this Parliament is revised. So, until such time, we have to adhere to the present Act.

Sir, now, I would like to answer the pertinent questions raised by the Hon. Members of the Opposition. They have been questioning the validity of the Department of Archaeology, to my understanding. Sir, though we may have different political leanings and different political orientations, that does not mean that we should not uphold the law of this country. An Act is a law; we have to abide by that. I am sorry to say these things. Do not distort facts; you are distorting facts. I also can do that very well, but I will not go to that extent. The problem faced by the Kovil Committee has to be resolved. Very soon, I would like to make a personal visit to Thirukoneswaram Kovil and let us sit down and discuss this. I am willing to sit down with that Committee. You cannot shake hands with a clenched fist. We are extending our hands.

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)
Sir, I rise to a point of Order.

**ගරු විදුර වික්‍රමනායක මහතා**
(மாண்புமிகு விதுர விக்கிரமநாயக்க)
(The Hon. Vidura Wickramanayaka)
You cannot raise a point of Order at this juncture.- *[Interruption]* No, you cannot raise points of Order.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, if only the Hon. Minister agrees, I can allow you.

ගරු විදුර වික්‍රමනායක මහතා
(மாண்புமிகு விதுற விக்கிரமநாயக்க)
(The Hon. Vidura Wickramanayaka)
Sir, according the Standing Orders, can he raise a point of Order now?

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Minister, you continue.

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)
கௌரவ அமைச்சர் அவர்களே, நீங்கள் சொன்ன விடயம் தொடர்பில் என்னுடைய கருத்தைச் சொல்ல வேண்டும். அதற்காகத்தான் சந்தர்ப்பம் கேட்கிறேன்.

ගරු විදුර වික්‍රමනායක මහතා
(மாண்புமிகு விதுற விக்கிரமநாயக்க)
(The Hon. Vidura Wickramanayaka)
Okay, Sir, I am willing give him way.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Okay. Yes, Hon. Member?

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)
கௌரவ அமைச்சர் அவர்களே, நீங்கள் நியாயமாகச் செயற்படக்கூடியவர் என்று நான் கருதுகிறேன். நீங்கள் சொல்லுகின்ற விடயங்கள் சரியானவை, நியாயமானவை என்பதனால்தான் நாங்கள் இன்று இந்தச் சபையிலே இந்தப் பிரேரணையைக் கொண்டுவந்திருக்கிறோம். நான் இங்கு எதையும் திணிப்பதற்கோ, திரிப்பதற்கோ முற்படுபவன் அல்லன். அவ்வாறே, வரலாற்றை மழுங்கடிப்பவனும் அல்லன். எனக்குத் தெரிந்த வரலாறு மற்றும் ஆய்வுகளின் அடிப்படையில்தான் நான் இங்கு கருத்துக்களைச் சொன்னேன்.

நீங்கள் ஆலய நிர்வாகத்தோடு கதைப்பதற்கு அங்கு வருவதாகக் குறிப்பிட்டீர்கள். அதன்போது எங்களையும் அழைத்தால் அதற்கு நாங்கள் தயாராக இருக்கிறோம். ஆலய நிர்வாகத்தினர் மட்டுமல்ல, அந்த ஆலயத்தோடு தொடர்புடைய இந்துக்களும் மிகவும் மனம் குழம்பிப்போய் இருக்கிறார்கள். நீங்கள் சொல்வதுபோல, இவ்விடயத்தில் எங்களுக்கு நீதி வழங்கப்படுமானால், அதை நாங்கள் ஏற்கத் தயாராக இருக்கிறோம். ஆனால், இதில் எந்தவிதத் திரிப்போ, திணிப்போ இல்லை. அவ்வாறே, எங்களிடம் இனவாதமும் இல்லை. இது வரலாற்று ரீதியான, பாரம்பரியமான இந்துக்களுடைய ஓர் ஆலயமாகும். இதற்குப் பல ஆண்டு கால வரலாறு உண்டு. ஆகவே, இதை யாரும் திணிக்கவேண்டிய அவசியமில்லை. இந்த விடயத்தில் நாங்கள் சொல்வதுதான் சரி அல்லது உங்களுடைய பக்கத்தில்தான் நியாயம் இருக்கிறது என்பதல்ல முக்கியம்! நிலையியற் கட்டளையின் பிரகாரம் ஒத்திவைப்புப் பிரேரணைமீதான விவாதத்தில் உரிய அமைச்சர் பதிலுரை வழங்கும்போது, பிரேரணையைக் கொண்டுவந்தவருக்கு குறித்த விடயம் தொடர்பிலான சந்தேகங்களைக் கேட்டுத் தெளிவுபடுத்திக் கொள்வதற்கு வாய்ப்பு இருக்கிறது. நான் இங்கு பிரசாரம் செய்வதற்கு வரவில்லை.

கௌரவ அமைச்சர் அவர்களே, நாங்கள் உங்களை நம்புகிறோம். நீங்கள் நியாயமாக நடக்கக்கூடிய ஓர் அமைச்சர்; கௌரவமானவர் என்ற அடிப்படையில், இந்த விடயத்தைச் சரியாகக் கையாளுவீர்கள் என்ற நம்பிக்கையோடுதானே நாங்கள் இந்தப் பிரேரணையைக் கொண்டுவந்தோம். நான் இங்கு இனவாதம் பேசுவதற்காக வரவில்லை. ஏனெனில், நான் சரத் வீரசேகர அல்லன். *[இடையீடு]*

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Minister, you can clarify now.

ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා
(மாண்புமிகு (கலாநிதி) சரத் வீரசேகர)
(The Hon.(Dr.) Sarath Weerasekera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, -

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කියන්න, ගරු මන්ත්‍රීතුමා.

ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා
(மாண்புமிகு (கலாநிதி) சரத் வீரசேகர)
(The Hon.(Dr.) Sarath Weerasekera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමා කියනවා, දායක සභාවට අමතරව එතුමන්ලාටත් එන්න අවසර දෙන්න කියලා. නැඟෙනහිර පළාත් ආණ්ඩුකාරතුමිය මට ඉතා පැහැදිලිව කිව්වා, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවත්, අනෙකුත් බලධාරින් සියලු දෙනා සහ එම කෝවිලේ දායක සභාවත් ගෙන්වා තමයි මේ තීරණය ගත්තේ කියලා. කෝවිලේ දායක සභාව ඒ කටයුත්තට සම්පූර්ණයෙන්ම කැමැතියි නම්, මේ පැත්තක ඉන්න මන්ත්‍රීවරු ඇවිල්ලා මේකට involve වෙන්නේ මොකද? ඒ කියන්නේ, මේක සම්පූර්ණයෙන්ම ජාතිවාදය අවුස්සන්න කරන දෙයක්. කෝවිලේ දායක සභාව සම්පූර්ණයෙන්ම ඒ කටයුත්තට කැමැතියි නම්, ඒ පාර දෙපැත්තේ තිබෙන කඩවල් හොඳින් නවීකරණය කර අලංකාරවත්ව ඉදිකරනවාට කැමැතියි නම්, ඔබතුමන්ලා මේකට involve වෙලා මේවා සම්පූර්ණයෙන් කඩාකප්පල් කරන්න හදන්නේ ඇයි, ගරු මන්ත්‍රීතුමා? ඒක සම්පූර්ණයෙන්ම අසාධාරණ දෙයක්.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු විදුර වික්‍රමනායක ඇමතිතුමනි, ඔබතුමාගේ අදහස් ඉදිරිපත් කරන්න. *[බාධා කිරීමක්]*

ගරු විදුර වික්‍රමනායක මහතා
(மாண்புமிகு விதுற விக்கிரமநாயக்க)
(The Hon. Vidura Wickramanayaka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රට ඉස්සරහට යන්නේ කොහොමද කියන එක පිළිබඳව මටත් ගැටලුවක් තිබෙනවා. අපි හැම දාම දෙපැත්තට බෙදිලා, තුන්පැත්තට බෙදිලා කටයුතු කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකයි ඉතිරිව තිබෙන්නේ.

**ගරු විදුර වික්‍රමනායක මහතා**
(மாண்புமிகு விதுர விக்கிரமநாயக்க)
(The Hon. Vidura Wickramanayaka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ වේලාවෙන් ශ්‍රීතරන් මන්ත්‍රීතුමාටත් කාලය දුන්නා, ගරු සරත් වීරසේකර මැතිතුමාටත් කාලය දුන්නා. ඒ නිසා මට වැඩිපුර කාලයක් ලබා දෙන්න කියා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

අපි එක තැනකට ඇවිල්ලා සියලු දෙනාම එකට එකතු වෙලා තමයි මේ රට ගැන බලන්න ඕනෑ. ගරු මන්ත්‍රීතුමනි, ඔබේ ප්‍රදේශයේ ඉතිහාසය ගැන මට ආඩම්බරයි. ඔබේ ප්‍රදේශයේ උරුමයන් රකින්න අපගේ අමාත්‍යාංශය කටයුතු කරනවා. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව එහි වගකීම දරනවා. ඔබේ දරුවන්ගේ උරුමය, අනාගත ශ්‍රී ලාංකිකයන්ගේ උරුමය රැකිය යුතුයි. සිංහලද, දමිළද, මුස්ලිම්ද කියන එක හෝ බෞද්ධද, හින්දුද, කතෝලිකද, ඉස්ලාම්ද කියන එක නොවෙයි එහිදී වැදගත් වන්නේ. කොයි තරම් දේවල් අවුරුදු දහස් ගණනක් තිස්සේ වෙනස් වෙලා තිබෙනවාද? ඒ පරිවර්තන සිද්ධ වෙච්චි අනාගතයේත්. අපිට ඒවා වළක්වන්න බැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අමාත්‍යතුමනි, සභාවේ නියමිත කාලය අවසන් වෙලා තිබෙන්නේ.

**ගරු විදුර වික්‍රමනායක මහතා**
(மாண்புமிகு விதுர விக்கிரமநாயக்க)
(The Hon. Vidura Wickramanayaka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට ලබා දී තිබුණු කාලයෙන් තමයි ගරු ශ්‍රීතරන් මන්ත්‍රීතුමාටත් ලබා දුන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
එතුමන්ලා ලබා ගත් කාලය ඔබතුමාට දීලායි තිබෙන්නේ, ගරු ඇමතිතුමනි.

**ගරු විදුර වික්‍රමනායක මහතා**
(மாண்புமிகு விதுர விக்கிரமநாயக்க)
(The Hon. Vidura Wickramanayaka)
මම බොහොම සරලව කියන්නේ. මේවා ගැන වැඩිය දුරදිගට කථා කරන්න ඕනෑ නැහැ. අපි මේවා හෝද හෝදා මඩේ දමන්න ඕනෑත් නැහැ. මේ ප්‍රශ්නවලට නිශ්චිත විසඳුම් තිබිය යුතුයි. If there is a problem, there should be an answer, there should be a solution and we are willing to give that. I will visit there, talk to the Kovil Committee and let us see what we can do.

Thank you.

***එකල්හි වේලාව අ.භා. 5.30 වූයෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.***
***පාර්ලිමේන්තුව ඊට අනුකූලව, 2022 සැප්තැම්බර් 23වන සිකුරාදා පූ.භා. 9.30 වන තෙක් කල් ගියේ ය.***
*அப்பொழுது, பி.ப. 5.30 மணியாகிவிடவே மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.*
*அதன்படி பாராளுமன்றம், 2022 செப்ரெம்பர் 23, வெள்ளிக்கிழமை மு.ப. 9.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*
*It being 5.30 p.m.,* THE HON. PRESIDING MEMBER *adjourned Parliament without Question put.*
*Parliament adjourned accordingly until 9.30 a.m. on Friday, 23rd September, 2022.*

# ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු
## வினாக்களுக்கு எழுத்துமூல விடைகள்
## WRITTEN ANSWERS TO QUESTIONS

### ශ්‍රීලංගම සේවක මණ්ඩල කළමනාකරුවන්/ ප්‍රධාන මානව සම්පත් කළමනාකරුවන්: විස්තර
### இ.போ.ச.வின் ஆளணி முகாமையாளர்கள்/ பிரதான மனிதவள முகாமையாளர்கள்: விபரம்
### STAFF MANAGERS/ CHIEF HUMAN RESOURCE MANAGERS OF SLTB: DETAILS

2589/2022

**1. ගරු තිස්ස අත්තනායක මහතා**
(மாண்புமிகு திஸ்ஸ அத்தநாயக்க)
(The Hon. Tissa Attanayake)
ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය ආරම්භ කරන ලද දිනයේ සිට මේ දක්වා එහි ප්‍රධාන කාර්යාලයට පත් කරන ලද එක් එක් සේවක මණ්ඩල කළමනාකාරවරයාගේ/ප්‍රධාන මානව සම්පත් කළමනාකාරවරයාගේ නම, ඔහුගේ/ඇයගේ අධ්‍යාපන සුදුසුකම්, සේවා කාලය සහ ඔහුට/ඇයට ගෙවන ලද මාසික වැටුප, දීමනා හා වෙනත් පහසුකම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) ඉහත එක් එක් නිලධාරියා එම තනතුරින් ඉවත්වීමට හේතු වූ කරුණු වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම නිලධාරීන් අතර රජයන් වෙනස්වීම හේතුවෙන් තනතුරින් ඉවත් කරන ලද නිලධාරීන් සිටින්නේද;

(iv) එසේ නම්, එම එක් එක් නිලධාරියාගේ නම හා තනතුරින් ඉවත් කරන ලද දිනය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) ඉහත (අ) (iii) හි සඳහන් නිලධාරීන් අතරින් මේ වනවිට සේවයේ යෙදී සිටින නිලධාරීන් සඳහා යම් සාධාරණයක් ඉටු කිරීමට පියවර ගන්නේද;

(ii) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

போக்குவரத்து மற்றும் நெடுஞ்சாலைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கைப் போக்குவரத்துச் சபை ஆரம்பிக்கப் பட்ட நாள் முதல் இதுவரை அதன் தலைமை அலுவலகத்துக்கு நியமிக்கப்பட்டுள்ள ஒவ்வோர் ஆளணி முகாமையாளரது/பிரதான மனிதவள முகாமையாளரது பெயர், அவரது கல்வித் தகைமைகள், சேவைக் காலம் மற்றும் அவருக் குச் செலுத்தப்பட்ட மாதாந்தச் சம்பளம், கொடுப்பனவுகள் மற்றும் ஏனைய வசதிகள் வெவ்வேறாக யாவை;

(ii) மேற்குறிப்பிட்ட ஒவ்வோர் உத்தியோகத்தரும் குறிப்பிட்ட பதவியிலிருந்து விலகுவதற்கு ஏதுவான காரணங்கள் வெவ்வேறாக யாவை;

(iii) மேற்குறிப்பிட்ட உத்தியோகத்தர்களில் அரசாங்க மாற்றம் காரணமாகப் பதவியிலிருந்து நீக்கப் பட்ட உத்தியோகத்தர்கள் உள்ளார்களா;

(iv) ஆமெனில், மேற்படி ஒவ்வோர் உத்தியோகத் தரினதும் பெயர் மற்றும் பதவியிலிருந்து நீக்கப்பட்ட திகதி என்பன வெவ்வேறாக யாவை;

என்பதை அவர் இச்சபைக்குத் தெரிவிப்பாரா?

(ஆ) (i) மேற்படி (அ)(iii)இல் குறிப்பிடப்பட்டுள்ள உத்தியோகத்தர்களில் தற்போது சேவையில் ஈடுபட்டுள்ள உத்தியோகத்தர்களுக்கு ஏதேனும் நியாயத்தை நிலைநாட்டுவதற்கு நடவடிக்கை மேற்கொள்வாரா;

(ii) இன்றேல், அதற்கான காரணங்கள் யாவை;

என்பதை அவர் இச்சபைக்குத் தெரிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Transport and Highways:

(a) Will he inform this House -

(i) separately, the name, his/her educational qualifications, service period, monthly salary and allowances paid to him/her and other facilities given to each Staff Manager/ Chief Human Resource Manager appointed to its Head Office since the establishment of the Sri Lanka Transport Board up to now;

(ii) separately, the reasons for the resignation of each of the aforesaid officer;

(iii) whether there are any officers who had been evicted from the post due to change of governments; and

(iv) if so, separately, the name and the date of eviction of each of the said officer?

(b) Will he also inform this House -

(i) whether steps will be taken to deliver justice to a certain level for officers who are currently in service, among the officers mentioned in (a) (iii) above; and

(ii) if not, reasons for that?

(c) If not, why?

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardana)

(අ) (i)

| # | නම | අධ්‍යාපන සුදුසුකම් | ප්‍රධාන මානව සම්පත් කළමනාකාර තනතුරේ සේවා කාලය | මූලික වැටුප (රු.) | දීමනා (රු.) | මුළු වැටුප (රු.) | වෙනත් පහසුකම් |
|---|---|---|---|---|---|---|---|
| 01 | එස්.යූ.ආර්. වනිගසේකර මිය | ශාස්ත්‍රවේදී උපාධිය | සේවයෙන් විශ්‍රාම ගොස් ඇත | 19,560.00 | 4,656.00 | 24,216.00 | ප්‍රවාහන පහසුකම් |
| 02 | එම්. කරුණාතිලක මයා | - | සේවයෙන් විශ්‍රාම ගොස් ඇත | දත්ත සොයාගත නොහැක | | | |
| 03 | යූ.ආර්. පෙරේරා මයා | අ.පො.ස. (සා/පෙළ) සමත්/ අ.පො.ස. (උ/පෙළ) | 2010.07.01-2012.04.17 | 23,860.00 | 13,515.00 | 37,375.00 | ප්‍රවාහන පහසුකම් |
| 04 | පී.ඩී. බාලසූරිය මයා | ශාස්ත්‍රවේදී උපාධිය | 2008.07.01-2010.06.30 | 27,855.00 | 23,656.35 | 51,511.35 | ප්‍රවාහන පහසුකම් |
| 05 | පී. ප්‍රේමලාල් පීරිස් මයා | වාණිජවේදී (විශේෂ) උපාධිය | 2012.11.15 - (ආවරණ) 2014.09.01 (ස්ථිර) 2018.10.26 ඉල්ලා අස්වීම | 37,065.00 | 30,119.50 | 67,184.50 | ප්‍රවාහන පහසුකම් |
| 06 | කේ.ජේ. නිරෝෂා තරංගනී මෙය | ශාස්ත්‍රවේදී උපාධිය/මානව සම්පත් කළමනාකරණ උසස් ඩිප්ලෝමාව | 2018.10.29-2018.12.16 | 22,400.00 | 27,405.00 | 49,805.00 | ප්‍රවාහන පහසුකම් |
| 07 | එච්.පී.ජී. සරත් වල්ගම්පාය මයා | ශාස්ත්‍රවේදී උපාධිය | 2018.12.17-2020.02.24 | 24,965.00 | 36,489.50 | 61,454.50 | ප්‍රවාහන පහසුකම් |
| 08 | එච්.ජී. සමන්ත කුමාර මයා | විද්‍යාවේදී (ව්‍යාපාර අධ්‍යයන) උපාධිය | 2020.02.24-2020.10.12 | 29,900.00 | 39,655.00 | 69,555.00 | ප්‍රවාහන පහසුකම් |
| 09 | ජී.වී. චම්පිකා මල්කාන්ති මිය | ව්‍යාපාර පරිපාලනවේදී උපාධිය (මානව සම්පත් විශේෂ) | 2020.10.13 සිට මේ දක්වා | 19,490.00 | 45,725.00 | 65,215.00 | ප්‍රවාහන පහසුකම් |

(ii)

| # | නම | තනතුරින් ඉවත්වීමට හේතු වූ කරුණු |
|---|---|---|
| 01 | එස්.යූ.ආර්. වනිගසේකර මිය | පෞද්ගලික ලිපිගොනුව නොමැති බැවින් දත්ත සොයාගත නොහැක |
| 02 | එම්. කරුණාතිලක මයා | පෞද්ගලික ලිපිගොනුව නොමැති බැවින් දත්ත සොයාගත නොහැක |
| 03 | යූ.ආර්. පෙරේරා මයා | අවුරුදු 60 සම්පූර්ණ වීම මත විශ්‍රාම ගොස් ඇත |
| 04 | පී.ඩී. බාලසූරිය මයා | ප්‍රධාන පුහුණු උපදේශක තනතුරට පත් කිරීම |
| 05 | පී. ප්‍රේමලාල් පීරිස් මයා | 2018.10.26 දින තනතුරෙන් ඉල්ලා අස්වීම |
| 06 | කේ.ජේ. නිරෝෂා තරංගනී මෙය | 2018.12.16 දින තනතුරෙන් ඉවත් කිරීම (දින 52) |
| 07 | එච්.පී.ජී. සරත් වල්ගම්පාය මයා | මහනුවර බහුතාක්ෂණික බස්රථ හුවමාරු මධ්‍යස්ථානයේ අධීක්ෂණ නිලධාරි තනතුර සඳහා පත් කිරීම |
| 08 | එච්.ජී. සමන්ත කුමාර මයා | 2020.10.13 දින සිට නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (පාලන) තනතුරට ආවරණ පත්වීමක් ලබා දීම |
| 09 | ජී.වී. චම්පිකා මල්කාන්ති මිය | දැනට සේවයේ යෙදී සිටී. |

(iii) නැත.

(iv) අදාළ නොවේ.

(ආ) (i) අදාළ නොවේ.

(ii) අදාළ නොවේ.

(ඇ) අදාළ නොවේ.

(அ) (i)

| # | பெயர் | கல்வித் தகைமைகள் | பதவியின் சேவைக்காலம் | அடிப்ப டைச் சம்பளம் (ரூ.) | கொடுப்ப னவுகள் (ரூ.) | மொத்தச் சம்பளம் (ரூ.) | ஏனைய வசதிகள் |
|---|---|---|---|---|---|---|---|
| 01 | திருமதி எஸ்.யு.ஆர். வணிகசேக்கர | இளமானிப் பட்டம் | பணியிலிருந்து ஓய்வு பெற்றுள்ளார் | 19560.00 | 4656.00 | 24216.00 | போக்குவரத்து வசதிகள் |
| 02 | திரு. எம். கருணாதிலக்க | - | பணியிலிருந்து ஓய்வு பெற்றுள்ளார் | தரவு கிடைக்கவில்லை | | | |
| 03 | திரு. யு.ஆர். பெரேரா | க.பொ.த.(சா/த) சித்தி/ க.பொ.த.(உ/த) | 2010.07.01 - 2012.04.17 | 23860.00 | 13515.00 | 37375.00 | போக்குவரத்து வசதிகள் |
| 04 | திரு. பி.டீ. பாலசூரிய | இளமானிப் பட்டம் | 2008.07.01 - 2010.06.30 | 27855.00 | 23656.35 | 51511.35 | போக்குவரத்து வசதிகள் |
| 05 | திரு. பி. பிரேமலால் பீரிஸ் | வணிகமானி (விசேட) பட்டம் | 2012.11.15-(க.நி) 2014.09.01 (நிரந்தர) 2018.10.26 இராஜினாமா செய்தல் | 37065.00 | 30119.50 | 67184.50 | போக்குவரத்து வசதிகள் |
| 06 | திரு.கே.ஜே. நிரோஷா தரங்கனி | இளமானிப் பட்டம்/ மனிதவள முகாமைத்துவ டிப்ளோமா | 2018.10.29 - 2018.12.16 | 22400.00 | 27405.00 | 49805.00 | போக்குவரத்து வசதிகள் |
| 07 | திரு. எச்.பி.ஜீ. சரத் வல்கம்பாய | இளமானிப் பட்டம் | 2018.12.17 - 2020.02.24 | 24965.00 | 36489.50 | 61454.50 | போக்குவரத்து வசதிகள் |
| 08 | திரு. எச்.ஜி. சமந்த குமார | விஞ்ஞானமானி (வணிகக்கல்வி) பட்டம் | 2020.02.24- 2020.10.12 | 29900.00 | 39655.00 | 69555.00 | போக்குவரத்து வசதிகள் |
| 09 | திருமதி ஜி.வி. சம்பிகா மல்காந்தி | வியாபார நிர்வாக இளமானிப் பட்டம் (மனிதவள விசேட) | 2020.10.13 முதல் இதுவரை | 19490.00 | 45725.00 | 65215.00 | போக்குவரத்து வசதிகள் |

| # | பெயர் | பதவிலிருந்து இராஜினாமா செய்வதற்கான காரணங்கள் |
|---|---|---|
| 01 | திருமதி எஸ்.யு.ஆர். வணிகசேக்கர | தனிப்பட்ட கோப்பு இல்லாததால் தரவைக் கண்டறிய முடியவில்லை |
| 02 | திரு. எம். கருணாதிலக்க | தனிப்பட்ட கோப்பு இல்லாததால் தரவைக் கண்டறிய முடியவில்லை |
| 03 | திரு. யு.ஆர். பெரேரா | 60 வயது பூர்த்தியடைந்த நிலையில் ஓய்வுபெற்றுள்ளார் |
| 04 | திரு. பி.டீ. பாலசூரிய | தலைமைப் பயிற்சி ஆலோசகர் பதவிக்கு நியமித்தல் |
| 05 | திரு. பி. பிரேமலால் பீரிஸ் | 2018.10.26ஆம் திகதி பதவியை இராஜினாமா செய்துள்ளார் |
| 06 | திரு. கே.ஜே. நிரோஷா தரங்கனி | 2018.12.16ஆம் திகதி பதவி நீக்கம் (52 நாட்கள் சேவையின் பின்னர்) |
| 07 | திரு. எச்.பி.ஜீ. சரத்வல்கம்பாய | கண்டி பல்மாதிரி தொழில்நுட்பப் பேருந்துப் பரிமாற்ற நிலையத்தின் மேற்பார்வை அதிகாரி பதவிக்காக நியமித்தல் |
| 08 | திரு. எச்.ஜி. சமந்த குமார | 2020.10.13ஆம் திகதி முதல் பிரதிப் பொதுமுகாமையாளர் (நிர்வாகம்) பதவிக்குக் கடமைகளை நிறைவேற்றுவதற்காக நியமனம் வழங்குதல் |
| 09 | திருமதி ஜி.வி. சம்பிகா மல்காந்தி | தற்போது சேவையிலுள்ளார் |

(iii) இல்லை. (ஆ) (i) பொருந்தாது. (இ) பொருந்தாது.
(iv) பொருந்தாது. ii) பொருந்தாது.

(a) (i)

| # | Name | Educational Qualifications | Period of service in the post | Basic salary | Allow-ances (Rs.) | Gross Salary (Rs.) | Other facilities |
|---|---|---|---|---|---|---|---|
| 01 | Mrs. S.U.R. Vanigasekera | Bachelor of Arts Degree | Retired from service | 19560.00 | 4656.00 | 24216.00 | Transport facilities |
| 02 | Mr. M. Karunathilaka | | Retired from service | Data cannot be found | | | |
| 03 | Mr. U.R. Perera | G.C.E. (O/L) passed G.C.E. (Advanced Level) | 01.07.2010-17.04.2012 | 23860.00 | 13515.00 | 37375.00 | Transport facilities |
| 04 | Mr. P.D. Balasuriya | Bachelor of Arts Degree | 01.07.2008-30.06.2010 | 27855.00 | 23656.35 | 51511.35 | Transport facilities |
| 05 | Mr. P. Premalal Peiris | Bachelor of Commerce (Special) Degree | 15.11.2012-(covering) 01.09.2014 (confirmation in post) 26.10.2018 resig-nation) | 37065.00 | 30119.50 | 67184.50 | Transport facilities |
| 06 | Ms. K.J. Nirosha Tharangani | Bachelor of Arts Degree/ Human Resources Management Ad-vanced Diploma | 29.10.2018-16.12.2018 | 22400.00 | 27405.00 | 49805.00 | Transport facilities |
| 07 | Mr. H.P.G. Sarath Walgampaya | Bachelor of Arts Degree | 17.12.2018-24.02.2020 | 24965.00 | 36489.50 | 61454.50 | Transport facilities |
| 08 | Mr. H.G. Samantha Kumara | Bachelor of Science (Business Studies) | 24.02.2020-12.10.2020 | 29900.00 | 39655.00 | 69555.00 | Transport facilities |
| 09 | Mrs. G.V. Champika Malkanthi | Bachelor of Business Administra-tion (Human Resource-Special) | From 13.10.2020 to date | 19490.00 | 45725.00 | 65215.00 | Transport facilities |

**(ii)**

| # | Name | Reason for resignation |
|---|---|---|
| 01 | Mrs. S.U.R. Vanigasekera | The data cannot be found due to non-availability of the personal file |
| 02 | Mr. M. Karunathilaka | The data cannot be found due to non-availability of the personal file |
| 03 | Mr. U.R. Perera | Retirement on completion of 60 years of age |
| 04 | Mr. P.D. Balasuriya | Appointment to the post of Chief Training Instructor |
| 05 | Mr. P. Premalal Peiris | Resignation from the post on 26.10.2018 |
| 06 | Ms. K.J. Nirosha Tarangani | Dismissal from service on 16.12.2018 (after 52 days in service) |
| 07 | Mr. H.P.G. Sarath Walgampaya | Appointment to the post of Supervisory Officer of the Kandy Multimodal Transport Hub |
| 08 | Mr. H.G. Samantha Kumara | Appointment to cover the duty of the post of Deputy General Manager (Administration) from 13.10.2020 |
| 09 | Mrs. G.V. Champika Malkanthi | Currently in service |

(iii) No. (b) (i) Not applicable. (c) Not applicable.
(iv) Not applicable. (ii) Not applicable.

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය කථාවල නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන
නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා
**හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் தமது உரையின் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களை தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print of their speeches should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

**Contents of Proceedings :**

**Final set of manuscripts Received from Parliament :**

**Printed copies dispatched :**

**හැන්සාඩ් වාර්තා**
**කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි**
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන්**
**මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන්**
**බාගත හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள
அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில்
பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து
பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.